325 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 325 - இல. 10
Volume 325 - No. 10

2026 මාර්තු 05 වන බ්‍රහස්පතින්දා
2026 மார்ச் 05, வியாழக்கிழமை
Thursday, 05th March, 2026



# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම [තීරුව 1755]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1757-1791]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

උතුරු පළාතේ ගවයින් විශාල ලෙස මිය යාම [තීරුව 1791]

රාජ්‍යය සම්බන්ධිත උල්ලංඝනයන් සම්බන්ධයෙන් යුක්තිය සහ වගවීම [තීරුව 1796]

**කොළඹ ආරක්ෂක සමුළුව මඟින් සපයන අවස්ථාවන් සැලසුම්සහගතව භාවිත කිරීම:**

ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1798]

**කල්තැබීමේ යෝජනාව:**

කාන්තා දායකත්වය අගයන ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් සකස් කිරීම [තීරු 1813 - 1924]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරුව 1925 - 1926]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

தித்வா புயலை எதிர்கொள்வதற்காக முன்னாயத்தத்துடன் இருக்கவில்லை என்பது தொடர்பில் முழுமையாக ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பிலான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு: உறுப்பினர்கள் நியமனம் [ப: 1755]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1757-1791]

**தனி அறிவித்தல் மூல வினா:**

வடக்கு மாகாணத்தில் கால்நடைகளின் பாரிய இறப்பு [ப: 1791]

அரசு தொடர்புடையதாகக் கூறப்படும் மீறல்களுக்கான பொறுப்புக்கூறலும் நீதியும் [ப: 1796]

**கொழும்பு பாதுகாப்பு மாநாடுமூலம் வழங்கப்பட்ட வாய்ப்புகளைத் திட்டமிட்டபடி பயன்படுத்தல்:**

பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று [ப: 1798]

**ஒத்திவைப்புப் பிரேரணை:**

பெண்களின் வகிபாகத்தை அங்கீகரிக்கும் தேசிய பராமரிப்புக் கொள்கையை வகுத்தல் [ப: 1813 - 1924]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 1925 - 1926]


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Select Committee of Parliament to Conduct a Comprehensive Study on the Lack of Preparedness to Face Cyclone Ditwah and Report to Parliament and Submit its Proposals and Recommendations in that Regard: Nomination of Members [Col. 1755]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1757-1791]

QUESTION BY PRIVATE NOTICE:

Large-scale Cattle Deaths in Northern Province [Col. 1791]

Justice and Accountability for Alleged State-connected Violations [Col.1796]

PROACTIVE UTILIZATION OF OPPORTUNITIES PROVIDED BY COLOMBO SECURITY CONCLAVE:

Statement by Deputy Minister of Defence [Col. 1798]

ADJOURNMENT MOTION:

Formulation of National Care Policy Recognizing Women’s Role [Cols. 1813 - 1924]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 1925 - 1926]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2026 මාර්තු 05 වන බ්‍රහස්පතින්දා*
*2026 மார்ச் 05, வியாழக்கிழமை*
*Thursday, 05th March, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
### தித்வா புயலை எதிர்கொள்வதற்காக முன்னாயத்தத்துடன் இருக்கவில்லை என்பது தொடர்பில் முழுமையாக ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பிலான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு: உறுப்பினர்கள் நியமனம்
### SELECT COMMITTEE TO CONDUCT A COMPREHENSIVE STUDY ON THE LACK OF PREPAREDNESS TO FACE CYCLONE DITWAH AND REPORT TO PARLIAMENT AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"දිට්වා" සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සේවය කිරීම පිණිස ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතාගේ සභාපතිත්වයෙන් යුතුව මතු සඳහන් මන්ත්‍රීවරයන් මවිසින් පත් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
ගරු ඇන්ටන් ජයකොඩි මහතා
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
ගරු කන්දසාමි ප්‍රභු මහතා
ගරු රුවන් මාපලගම මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2025 අංක 23 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව 2026.01.06 සිට 2026.01.29 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන කටයුතු වැඩසටහනින් වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන. - [අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, අනුරාධපුර, ජයසිරිපුර, අංක 189 යන ලිපිනයෙහි පදිංචි ඩී.ජී. ජගත් පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩී.වී. චානක මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ගරු කථානායකතුමනි, වරකාපොළ, දොරවක, ගනේගම, අංක බී/55 යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්. නිරෝෂා කුමුදුනී රත්නායක මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, පොළොන්නරුව, කදුරුවෙල, 4 ඇළ, අංක 79/4 යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්.සී.එස්. අලහකෝන් මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
ගරු කථානායකතුමනි, අලව්ව, හුම්බුළුව, ඉදිගොල්ලවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.පී. පද්මා චන්ද්‍රලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -1185/2025- (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා.- *[සභා ගර්භය තුළ නැත.]*

### මුලතිව් දිස්ත්‍රික්කයේ බහුකාර්ය කාර්යාල: ජලය, විදුලිය සහ වැසිකිළි පහසුකම්
### முல்லைத்தீவு மாவட்டத்திலுள்ள பல்தேவை சேவை அலுவலகங்கள்: நீர், மின்சார மற்றும் மலசலகூட வசதிகள்
### MULTI-PURPOSE SERVICE CENTRES IN MULLAITIVU DISTRICT: WATER, ELECTRICITY AND TOILET FACILITIES

1453/2025

**2. ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ග්‍රාම නිලධාරි කොට්ඨාස 136 අතරින්, ග්‍රාම නිලධාරින්, සංවර්ධන නිලධාරින් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා භාවිත කළ හැකි බහුකාර්ය කාර්යාල (සේවා පියස) නොමැති ග්‍රාම නිලධාරි කොට්ඨාස තිබේද;

(ii) එසේ නම්, තාවකාලිකව විකල්ප ස්ථානවල ක්‍රියාත්මක වන කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රතිසංස්කරණය කළ යුතු කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iv) වැසිකිළි, ජල සහ විදුලි පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(v) විදුලිය විසන්ධි කර ඇති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම අඩුපාඩු හේතුවෙන් මහජනතාවට ගුණාත්මක සේවාවක් සැපයීමට අපහසුතා පවතින බව දන්නේද;

(ii) ගුණාත්මක හා කඩිනම් සේවාවක් සැපයීම සඳහා අදාළ අඩුපාඩු සපුරාලීමට ඇති සැලැස්ම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மாவட்டத்திலுள்ள 136 கிராம அலுவலர் பிரிவுகளில், கிராம அலுவலர்கள், அபிவிருத்தி அலுவலர்கள் மற்றும் சமுர்த்தி அபிவிருத்தி அலுவலர்கள் பயன்படுத்தக்கூடிய பல்தேவை சேவை அலுவலகங்கள் (சேவாபியஸ) இல்லாத கிராம அலுவலர் பிரிவுகள் உள்ளனவா;

(ii) ஆமெனில், தற்காலிகமாக மாற்று இடங்களில் இயங்கிவரும் அலுவலகங்களின் எண்ணிக்கை யாது;

(iii) புனரமைக்கப்பட வேண்டிய அலுவலகங்களின் எண்ணிக்கை யாது;

(iv) மலசலகூடங்கள், நீர் மற்றும் மின்சார வசதிகள் இல்லாத அலுவலகங்களின் எண்ணிக்கை யாது;

(v) மின்சாரம் துண்டிக்கப்பட்டுள்ள அலுவலகங் களின் எண்ணிக்கை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) (i) மேற்படி குறைபாடுகள் காரணமாக பொது மக்களுக்குத் தரமான சேவையை வழங்குவதில் அசௌகரியங்கள் காணப்படுவதை அவர் அறிவாரா;

(ii) தரமான மற்றும் துரிதமான சேவையை வழங்கும்பொருட்டு மேற்படி குறைபாடுகளை நிவர்த்தி செய்வதற்குள்ள திட்டம் யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether there are any Grama Niladhari Divisions, out of the 136 Grama Niladhari

Divisions in the Mullaitivu District, which do not have multi-purpose service centres (Seva Piyasa) that can be used by the Grama Niladharis, Development Officers and Samurdhi Development Officers;

(ii) if so, the number of offices that are temporarily housed in alternative buildings;

(iii) the number of offices that need to be renovated;

(iv) the number of offices that do not have toilet, water and electricity facilities; and

(v) the number of offices to which the electricity supply has been disconnected?

(b) Will he also inform this House -

(i) whether he is aware that there are difficulties in providing quality services to the public due to such shortages; and

(ii) the plan that is in place to address the said shortages in order to provide quality and expeditious services to the public?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) අදාළ නැත.

(iii) 92යි.

(iv)

වැසිකිළි පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව - 46

ජල පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව - 60

විදුලි පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව - 22

(v) විදුලිය විසන්ධි කර ඇති කර්යාල සංඛ්‍යාව 17යි.

(ආ) (i) ඔව්.

(ii) 2026 වසරේ අය වැය ප්‍රතිපාදන මඟින් මුලතිව් දිස්ත්‍රික්කයේ පවතින නිලසෙවන කාර්යාල අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් මිලියන 07ක ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින්, එම ප්‍රතිපාදන යොදවා පවතින අඩුපාඩු ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்கள் வழங்கிய பதிலின்படி, பாரிய தேவைப்பாடுகள் முல்லைத்தீவு மாவட்டத்தில் இருக்கின்றன. இதற்கு 7 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருப்பதென்பது மிகவும் குறைந்த தொகையாகும். எனவே, குறைநிரப்புப் பிரேரணை ஒன்றைக் கொண்டுவந்தாவது இதற்கான நிதியைப் பெற வேண்டும். இது தொடர்பில் கடந்த காலங்களில் பல முயற்சிகள் எடுக்கப்பட்டாலும், அந்த நேரத்தில் இருந்த பொருளாதார நெருக்கடி காரணமாக அது சாத்தியப் படவில்லை. முல்லைத்தீவு மாவட்டம் என்பது கடைசியாக யுத்தம் நடைபெற்ற பின்தங்கிய ஒரு மாவட்டமாகும். அந்த அடிப்படையில், இந்த நிதி ஒதுக்கீடு போதாது. அதாவது, குறித்த 7 மில்லியன் ரூபாயை வைத்து இந்த அலுவலகங் களுக்கான உட்கட்டமைப்பு வசதிகளைச் செய்வதென்பது இயலாத காரியம். எனவே, இதற்கான நிதி ஒதுக்கீட்டைக் கூட்டி, அவற்றை விரைவாக செய்து கொடுப்பதற்குரிய ஏற்பாடுகள் ஏதேனும் இருக்கின்றதா? என கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ආකාරයට මිලියන හතක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව පිළිගන්නවා. නමුත් ක්‍රමිකව ඒ ප්‍රමාණය වැඩි කර ගන්න පුළුවන් අවස්ථා තිබෙනවා නම් අපි ඒ අනුව කටයුතු කරනවා. ඉදිරි වර්ෂයේදී මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරනවා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் 17 அலுவலகங்களில் electricity connection துண்டிக்கப்பட்டு இருப்பதாகக் கூறினீர்கள். அந்தப் பிரதேசத்திலுள்ள மக்களின் வாழ்க்கைத் தரம் மிகவும் பின்தங்கிய நிலையிலே இருக்கின்றது. GS உட்பட பல அரச உத்தியோகத்தர்கள் கடமையாற்றும் இந்த அலுவலகங்களில் மின் இணைப்பு துண்டிக்கப்பட்டமைக்கான காரணத்தை அறிந்து, அவற்றுக்கு மின் இணைப்பை உடனடியாகப் பெற்றுக்கொடுப்பதற்குரிய ஏற்பாடுகளை அவசரமாக செய்ய முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ඒ කාරණය නිවැරැදි කිරීම සඳහා - විදුලි සම්බන්ධතා නැවත ලබා දීම සඳහා - අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතිනවා.

## 2015 සිට සුළු අපනයන භෝග අපනයනය: ආදායම
## 2015 இலிருந்து சிறு ஏற்றுமதிப் பயிர்கள் ஏற்றுமதி: வருமானம்
## EXPORT OF MINOR EXPORT CROPS SINCE 2015: REVENUE

1501/2025

**3. ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන සුළු අපනයන භෝග කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා සුළු අපනයන භෝග අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

**[ගරු බී. ආරියවංශ මහතා]**

(iii) සුළු අපනයන භෝග අපනයනය කිරීම තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் பிரதான சிறு ஏற்றுமதிப் பயிர்கள் யாவை என்பதையும்;

(ii) 2015ஆம் ஆண்டு தொடக்கம் தற்போதுவரை மேற்படி சிறு ஏற்றுமதிப் பொருட்களை ஏற்றுமதி செய்வதன்மூலம் ஈட்டிய வருமானம் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) சிறு ஏற்றுமதிப் பயிர்களின் ஏற்றுமதியை மேலும் மேம்படுத்துவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) main minor export crops in Sri Lanka;

(ii) revenue earned from the export of these minor export crops from 2015 to date, separately for each year; and

(iii) measures taken to further promote the export of minor export crops?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) කුරුඳු, ගම්මිරිස්, කෝපි, කොකෝවා, කරාබු නැටි, සාදික්කා, වැනිලා, කරදමුංගු, ගොරකා, පුවක්, බුලත්, කහ, ඉඟුරු, පැඟිරි, සේර යන භෝග අයත් වේ.

(ii) ඇමුණුම 01 සහ ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

ඇමුණුම 01

**Export Value(Rs.mn) of Export Agriculture Crops, 2015-2025**

| CROP | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Pepper | 19,542.52 | 10,530.53 | 12,767.97 | 12,074.02 | 8,272.04 | 9,128.97 | 22,669.34 | 23,464.15 | 29,329.45 | 51,523.95 | 31,004.66 |
| Clove | 6,239.11 | 1,869.52 | 6,761.47 | 2,174.69 | 5,059.32 | 2,709.19 | 6,521.12 | 5,946.54 | 13,061.90 | 3,618.54 | 8,303.99 |
| Clove stems | 152.71 | 90.37 | 400.44 | 404.79 | 300.44 | 107.02 | 367.02 | 617.26 | 1,762.79 | 162.70 | 472.57 |
| Nutmeg | 1,525.81 | 1,604.09 | 1,562.10 | 1,671.38 | 2,583.63 | 2,077.92 | 2,468.01 | 4,314.52 | 4,571.05 | 3,761.64 | 4,656.61 |
| Mace | 522.13 | 358.15 | 636.49 | 600.61 | 1,234.10 | 958.51 | 1,051.86 | 1,797.07 | 2,061.71 | 1,741.22 | 1,569.24 |
| Coffee | 24.03 | 20.51 | 29.26 | 46.58 | 63.13 | 58.66 | 62.33 | 172.11 | 145.83 | 176.02 | 221.04 |
| Cocoa | 469.11 | 630.04 | 2,340.82 | 1,205.46 | 1,473.27 | 1,232.19 | 2,273.99 | 4,212.43 | 5,649.86 | 7,648.71 | 7,993.36 |
| Cardamom | 146.64 | 843.27 | 870.52 | 156.33 | 33.80 | 17.56 | 59.03 | 46.04 | 438.99 | 327.83 | 120.36 |
| Ginger | 72.20 | 128.96 | 93.83 | 121.96 | 54.46 | 86.10 | 100.41 | 223.40 | 232.20 | 166.18 | 136.55 |
| Turmeric | 54.73 | 72.23 | 103.12 | 102.67 | 104.60 | 86.30 | 114.41 | 182.06 | 262.40 | 173.43 | 227.37 |
| Garcinia | | | | | | | 156.01 | 234.19 | 220.19 | 267.44 | 381.51 |
| Arecanut | 9,515.29 | 4,949.10 | 5,744.52 | 2,864.19 | 3,828.11 | 8,375.78 | 8,669.64 | 21,187.34 | 19,686.13 | 11,598.35 | 21,313.17 |
| Betel | 1,235.32 | 1,126.13 | 3,164.06 | 2,615.72 | 3,406.46 | 2,942.55 | 3,076.90 | 5,034.53 | 4,856.70 | 2,911.47 | 4,222.74 |
| Vanilla | 8.91 | 18.19 | 27.07 | 63.22 | 24.82 | 25.74 | 30.45 | 49.02 | 456.63 | 325.44 | 71.56 |
| Citronella | 75.86 | 114.29 | 263.16 | 177.33 | 43.27 | 26.16 | 26.44 | 18.14 | 6.49 | 17.38 | 7.45 |
| Lemongrass | 3.75 | 1.11 | 5.01 | 28.59 | 31.28 | 18.74 | 13.96 | 24.54 | 39.53 | 21.05 | 20.26 |
| Oleoresins | 2,035.87 | 3,257.22 | 2,742.72 | 2,064.59 | 2,305.56 | 2,042.71 | 3,903.02 | 3,930.50 | 2,371.56 | 2,522.18 | 3,724.53 |
| Pepper oil | 543.24 | 429.54 | 484.40 | 308.98 | 525.01 | 251.52 | 623.82 | 1,252.76 | 692.53 | 920.80 | 957.26 |
| Clove oil | 52.67 | 52.75 | 84.82 | 130.86 | 103.14 | 179.91 | 92.64 | 144.25 | 168.65 | 220.98 | 701.83 |
| Nutmeg oil | 449.99 | 595.39 | 424.43 | 344.53 | 272.91 | 300.18 | 463.26 | 1,102.37 | 1,152.85 | 885.51 | 434.44 |
| Mace oil | 0.66 | 0.92 | 0.58 | 0.24 | 0.14 | 0.05 | 10.36 | 2.04 | 25.17 | 10.43 | 113.48 |
| Cardamom oi | 27.16 | 25.96 | 22.11 | 12.51 | 70.66 | 92.51 | 126.64 | 104.99 | 56.31 | 144.67 | 173.74 |
| Ginger oil | 28.05 | 47.83 | 100.39 | 87.29 | 121.99 | 141.05 | 165.34 | 104.42 | 109.20 | 70.61 | 48.25 |
| Vanilla oil | 0.76 | 0.07 | 0.42 | 18.50 | 0.31 | 1.44 | 0.58 | 0.73 | 1.34 | 0.39 | 7.93 |
| **Grand Total** | **42,726.52** | **26,766.17** | **38,629.71** | **27,275.02** | **29,912.42** | **30,860.76** | **53,046.59** | **74,165.42** | **87,359.45** | **89,216.89** | **86,883.89** |

ඇමුණුම 02

**Value (Rs.mn) 0f Cinnamon Export 2015-2025**

| Year | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **Value (Rs.mn)** | 17,959 | 23,177 | 30,873 | 34,853 | 31,463 | 38,219 | 45,879 | 71,716 | 70,064 | 67,982 | 79,932 |

(iii) i. අපනයන කෘෂි බෝග නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සකස් කර ගැනීම සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් - GAP - හා යහපත් නිෂ්පාදන පිළිවෙත් - GMP - අනුගමනය කිරීම හා GAP සහතික නිකුත් කිරීම

ii. අපනයන කෘෂි බෝගවල ගුණාත්මය වැඩිදියුණු කර අගය එකතු කළ නිෂ්පාදන දිරිගැන්වීමට අවශ්‍ය පසු අස්වනු තාක්ෂණ ක්‍රියාවලිය සඳහා පසු අස්වනු තාක්ෂණ උපකරණ වෙනුවෙන් ආයෝජන ආධාර ලබා දීම.

iii. අපනයන කෘෂි බෝග නිෂ්පාදන කාබනික නිෂ්පාදන ලෙස විදේශීය වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීම සඳහා වගාව කාබනික වගා බවට පත් කිරීම හා කාබනික නිෂ්පාදන අළෙවිකරණ හා සාධාරණ වෙළෙඳ ක්‍රමය පිළිබඳ සහතිකකරණය මෙන්ම කාබනික වගාවලට අදාළ අනෙකුත් සහතික ලබා ගැනීම සඳහා තාක්ෂණික උපදෙස් හා ආයෝජන ආධාර ලබා දීම.

iv. පවතින වගාවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පාලු පැළ ලබා දීම, ක්ෂුද්‍ර ජල සම්පාදන ඒකක හා පළිබෝධ පාලන ඒකක ලබා දීම සඳහා ආයෝජන ආධාර ලබා දීම.

v. රූපවාහිනී, ගුවන් විදුලි ඇතුළු වෙනත් සන්නිවේදන මාධ්‍ය ඔස්සේ සහ ගොවි සායන, ක්ෂේත්‍ර දින සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් දැනුම ලබා දීම.

vi. අපනයන කෘෂි භෝග නිෂ්පාදන, අපනයනය සඳහා අවශ්‍ය උපදේශන සේවා මෙන්ම සැපයුම්කරුවන් හා ගැනුම්කරුවන් සම්බන්ධ කරදීම.

vii. අපනයන කෘෂි ගම්මාන පිහිටුවීම.

viii. නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා වගා වපසරිය වැඩි කිරීම.

ix. අපනයන කෘෂි භෝග පිළිබඳ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ක්ෂේත්‍රය විශේෂයෙන්ම අපට විශාල අපනයන ආදායමක් ලබන්න පුළුවන් ක්ෂේත්‍රයක්. විශේෂයෙන්ම ගම්මිරිස්, කුරුඳු ඇතුළු ඒ සුළු අපනයන භෝග මේ වෙනකොටත් අපේ රටේ විශාල ඵලදාවක් ලබනවා. මා නියෝජනය කරන රත්නපුරය දිස්ත්‍රික්කයේත් ගම්මිරිස් වගා කරනවා. මාතර, මොනරාගල, බදුල්ල, මහනුවර, මාතලේ වාගේ දිස්ත්‍රික්කවල මේ වෙනකොට ඵලදාව හටගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පසුගිය කාලයේ මේ ඵලදාව ලබනකොට මුලින්ම සිද්ධ වෙච්ච දේ මොකක්ද කියලා අපි දන්නවා. ඒ තමයි, ගොවියා බුබුළු ගම්මිරිස් තමයි මුලින්ම වෙළෙඳ පොළට ලබා දෙන්නේ. ඒ බුබුළු ගම්මිරිස්වලින් විශේෂයෙන්ම ගම්මිරිස් oil නිෂ්පාදනය කරනවා. ඒ oil නිෂ්පාදනය කරන්නේ ඉන්දියාවේ. අපේ රටේ මේ වෙනකොට ඒ oil නිෂ්පාදනය කරන්න අවශ්‍ය plant එකක් කිසිම තැනක ආරම්භ කරලා නැහැ. ගම්මිරිස් අස්වැන්නෙන් සියයට 50ක් විතරම බුබුළු ගම්මිරිස් තමයි වෙළෙඳ පොළට එන්නේ. ඒ එන බුබුළු ගම්මිරිස්වලින් අපේ රටේ ඒ oil නිෂ්පාදනය කරන්න plant එකක් ඉදිකිරීම ඉතාම වැදගත් වනවා. මම මීට ඉස්සෙල්ලාත් මේ ගැන කථා කළා. මේ වනකොට ගොවියාට ඉතාම සුළු මුදලක් තමයි මේ බුබුළු ගම්මිරිස් සඳහා ලැබෙන්නේ. ඒ සඳහා නිසි වැඩ පිළිවෙළක් රජය විසින් සකස් කරලා තිබෙනවාද කියලා මම අහනවා. ඒ වාගේම, ගම්මිරිස් වගාව තුළ මේ වනකොට කොළ කහ වෙන ලෙඩක් හැදිලා තිබෙනවා. මේ ලෙඩේ හැදිලා දැනට අවුරුදු තුන හතරක් වනවා. නමුත් මේ වෙනකම් ඒ සම්බන්ධයෙන් කිසිම පරීක්ෂණයක් කරලා නැහැ. මේ ගැනත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා අහනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මතු කළේ සාධනීය ප්‍රශ්නයක්. ඒක පිළිබඳව ගැටලුවක් නැහැ. ගම්මිරිස් ඇතුළු සුළු අපනයන භෝග ගත්තාම, අපේ නිෂ්පාදනවලට ලෝක වෙළෙඳ පොළේ හොඳ ඉල්ලුමක් තිබෙනවා වාගේම හොඳ වෙළෙඳ පොළක් තිබෙනවා. ඔබතුමා කිව්වා හරි. ගම්මිරිස් ගත්තොත්, වියට්නාම ගම්මිරිස් ඇට හතරක් හපන්න ඕනෑ, අපේ ගම්මිරිස් ඇටයක සැර ගන්න. සුවඳ, සැර ආදී මේ හැම පැත්තකින් ගත්තාමත් අපේ ගම්මිරිස් ඉදිරියෙන් තිබෙනවා. අපේ අනෙකුත් අපනයන භෝග ගත්තාමත් විශේෂත්වයක් තිබෙනවා. හැබැයි, පසුගිය කාලය පුරාවටම විශේෂයෙන්ම ඉන්දුනීසියාව, වියට්නාමය වාගේ රටවලින් මේවා ගෙනැල්ලා ප්‍රතිඅපනයනය කළා. බොහෝදුරට ලංකාවට ගේන්නේත් නැතුව නැවේදීම පරිවර්තනය වෙලා "Made in Sri Lanka" label එක යටතේ ප්‍රතිඅපනයනය කිරීමේ ක්‍රියාවලිය සිදු වුණා. ඒ ඇතුළේ අපේ නිෂ්පාදන විධියට ලෝකයට මේවා ගියා. අපේ ගම්මිරිස්වලින් ලොකු සැපයුමක් ලබා දෙනවා, ඉන්දියාවට. ඒ තත්ත්වය තුළ අපේ රට සම්බන්ධව ඇත්තටම ලොකු කළු පැල්ලම් පවා නිර්මාණය වුණා. ඒ වාගේ අක්‍රමිකතා ගොඩක් පසුගිය කාලයේ සිද්ධ වුණා. මේ වනකොට ඒවා විශාල වශයෙන් වෙනස් කරමින්, අපේ අමාත්‍යාංශය, වෙළෙඳ අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් අමාත්‍යාංශ ඔක්කෝම සම්බන්ධ කරගෙන ආහාර සුරක්ෂිතතා කමිටුව තුළත් සාකච්ඡා කරමින් ඒ සඳහා වැඩ පිළිවෙළක් දියත් කරගෙන යනවා.

ඒ වාගේම අපනයන භෝග ප්‍රවර්ධනය කිරීම සඳහා ගොවි ජනතාවට නොමිලේ පැළ ලබා දෙමින්, මූල්‍යමය ආධාර ලබා දෙමින්, අපනයන ගම්මාන ව්‍යාප්ත කරමින් මේ වනකොට වැඩ පිළිවෙළක් දියත් කරගෙන යනවා. ඔබතුමා කියපු කාරණය පිළිබඳවත් අපේ විශේෂ අවධානය යොමුවෙලා තිබෙනවා. මොකද, අපි තවමත් අමුද්‍රව්‍ය විධියට තමයි අපේ නිෂ්පාදන යවන්නේ. එම නිසා ලෝක වෙළෙඳ පොළට නිමි භාණ්ඩ විධියට අපේ අපනයන භෝග නිදහස් කිරීමට අදාළ වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑකම තිබෙනවා. ඔබතුමා කියපු කාරණය පිළිබඳව අපේ අවධානය යොමුවෙලා තිබෙනවා.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපට මතකයි, පසුගිය කාලයේ ඔබතුමාත් කොළොන්න ප්‍රදේශයට ගිහිල්ලා ගොවීන් හමුවුණු බව. ඒ ගොවීන්ට ගැටලු ගොඩක් තිබෙනවා. අපි දැක්කා, 2025 වසරේදී ගම්මිරිස් ඵලදාව හැදුණේම නැහැ කියලා. අවුරුදු දෙක තුනකට සැරයක් තමයි ගම්මිරිස් ඵලදාව හටගන්නේ. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළින් උපදෙස් ලබා දෙනවා

**[ගරු බී. ආරියවංශ මහතා]**

කිව්වාට, ඒ උපදෙස් හරියට ගමට ලැබෙන්නේ නැහැ. ගම්මිරිස් හැදුණොත් තමයි ගොවියා ඒවා කඩාගන්නේ. මේ වසරේ ඵලදාව තිබෙනවා. ඒ ඵලදාවෙන් උපරිම ප්‍රයෝජනයක් අරගෙන අපේ රටට අපනයන ආදායමක් ගේන්නත්, ගොවියාට සාධාරණ මිලක් ලබා දෙන්නත් -අප්‍රේල් මාසය අවසාන වනකොට අස්වැන්න ලැබෙනවා- ආණ්ඩුව මඟින් යම් වැඩ පිළිවෙළක් සකස් කරනවාද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ඔබතුමා කියපු කාරණය හරි. අපේ ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. විශේෂයෙන්ම මාතලේ දිස්ත්‍රික්කය ගත්තොත්, පසුගිය කාලයේ ගම්මිරිස් හැදුණේම නැහැ. ගම්මිරිස් වැල් නිකම් ඔහේ තිබුණා. එහෙම තත්ත්වයක් තමයි තිබුණේ.

පාරිසරික සහ දේශගුණික විපර්යාස නිසා එහෙම වුණා කියලා තමයි අනාවරණය වුණේ. නමුත්, අද ඒ තත්ත්වය වෙනස් වෙලා ගම්මිරිස් ඵලදාව මේ වනකොට වැඩිවෙලා තිබෙනවා. ඒ අස්වනු මිලදී ගැනීමේදී ගොවියාට සාධාරණ මිලක් ලබා දීම සඳහා අපි මැදිහත්වීමක් කළ යුතුයි. ඒ පිළිබඳව අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. ගොවියාට අසාධාරණයක් නොවන විධියට ගොවියා ආරක්ෂා කර ගැනීම සඳහා අපි අනිවාර්යයෙන්ම මේ සඳහා මැදිහත් වනවා. අපි එක පැත්තකින් වගාව ප්‍රවර්ධනය කරනවා, ගොවියාට ආධාර ලබා දෙනවා, පැළ නොමිලේ ලබා දෙනවා, තාක්ෂණය හඳුන්වා දෙනවා. එහෙම කරනකොට නිෂ්පාදනය වැඩි වනවා. උදාහරණයක් විධියට මේ සංඛ්‍යාලේඛනවලට අනුව කලින් වසරවලට සාපේක්ෂව 2025 වසරේ අපනයන භෝග ආදායම වැඩි වෙලා තිබෙනවා. 2015 වසරේ ඉඳලා මේ දක්වා කාලය ගත්තොත්, 2025 වසරේ -ගිය වසරේ- අපනයන භෝග ආදායම වැඩි වෙලා තිබෙනවා. එය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විධියට අපි මැදිහත් වනවා නම්, ගොවියාගේ නිෂ්පාදනවලටත් අපි අනිවාර්යයෙන්ම මැදිහත් වන්න ඕනෑ. අපි ඒක වගකීමක් හැටියට මේ වන විට හඳුනාගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය පිළිබඳවත් අපි අවධානය යොමු කරන බව මම ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1543/2025- (1), ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අම්පාර දිස්ත්‍රික්කයේ ගවයින්: ප්‍රමාණවත් තෘණ භූමි නොමැතිවීම
### அம்பாறை மாவட்டத்திலுள்ள கால்நடைகள்: போதியளவு மேய்ச்சல் தரைகள் காணப்படாமை
### CATTLE IN AMPARA DISTRICT: INADEQUATE GRAZING FIELDS

1550/2025

**5. ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, සත්ව පාලනයේ නිරත වන විශාල පිරිසක් සිටින අතර ඔවුන් සතු ගවයින් සඳහා ප්‍රමාණවත් තෘණ භූමි නොමැති බව දන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ පොතුවිල් ඇතුළු අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගවයින් සඳහා තෘණ භූමි සකසා දීම සඳහා කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා පවතින බාධා කවරේද;

(iv) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නවීන පන්නයේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම මඟින් කිරි නිෂ්පාදනය වැඩි කර සත්ව පාලනයේ නිරතවන්නන්ගේ ආදායම ඉහළ නැංවීම තුළින් රටේ ආර්ථික සංවර්ධනයට දායක කරගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தில் அதிகளவானோர் கால்நடை வளர்ப்பில் ஈடுபட்டுள்ளதுடன், அவர்களது கால்நடைகளுக்கான மேய்ச்சல் தரைகள் போதியளவில் காணப்படாமை பற்றி அவர் அறிவாரா என்பதையும்;

(ii) அம்மாவட்டத்தில் பொத்துவில் உட்பட ஏனைய பிரதேச செயலாளர் பிரிவுகளில் கால்நடைகளுக்கான மேய்ச்சல் தரைகளை ஏற்பாடு செய்து தருவதற்காக நடவடிக்கை மேற்கொள் ளப்படுமா என்பதையும்;

(iii) இன்றேல், அதற்கான தடைகள் யாவை என்பதையும்;

(iv) பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் நவீனரக பால் சேகரிப்பு நிலையமொன்றை அமைப்பதன்மூலம் பால் உற்பத்தியை அதிகரித்து, கால்நடை வளர்ப்பாளர்களின் வருமானத்தை அதிகரிப்பதன் ஊடாக நாட்டின் பொருளாதார அபிவிருத்திக்குப் பங்களிப்புச் செய்வதற்கு நடவடிக்கை மேற்கொள்ள முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that there is a large number of people engaged in animal husbandry in the Ampara District and that adequate grazing fields are not available for their cattle;

(ii) whether steps will be taken to provide grazing fields for the cattle in the areas of the Pottuvil and the other Divisional Secretaries' Divisions in the Ampara District;

(iii) if not, the obstacles that hinder such action; and

(iv) whether steps will be taken to establish a state-of-the-art milk collection centre in the Pottuvil Divisional Secretary's Division in order to increase the milk production and the income of those engaged in animal husbandry in the said area thereby contributing to the growth of the country's economy?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) තණ බිම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කළද, ඒ සඳහා පවතින බාධා පහත පරිදි වේ.

1. අතීතයේදී ගොවීන්ට තෘණ භූමිවල පදිංචි වීමට ඉඩ සැලසුණු අතර, ඒවා ඉවත් කිරීම ඔවුන්ගේ ජීවනෝපායට තර්ජනයක් වන බැවින් සංකීර්ණ සමාජ - ආර්ථික ගැටලුවක් නිර්මාණය වී ඇත.

2. සමහර තෘණ භූමි සම්බන්ධ ගැටලු අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී. ලබා දෙන අධිකරණ තීරණ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරේ.

3. යල සහ මහ කන්නවලදී ඉඩම් සඳහා දැඩි තරගකාරිත්වයක් ඇති වේ. එයට හේතුව වන්නේ වියළි කාලයේදී ජල සැපයුම සහිත භූමි ප්‍රමාණය, වැසි සහිත කාලයට පවතින භූමි ප්‍රමාණයට වඩා අඩු වීමයි. එබැවින් වී ගොවීන් සහ සත්ත්ව පාලන ගොවීන් යන කාණ්ඩ දෙකම ජලය සැපයුම සහිත සාරවත් භූමි භාවිත කිරීම සඳහා තරග කිරීම දැකිය හැකි වේ.

(iv) පොතුවිල් ප්‍රදේශයේ සාමාන්‍ය දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 4,500ක් පමණ වේ.

දැනට මිල්කෝ සමාගම සතුව ලීටර් 6,000ක ධාරිතාවක් සහිත කිරි එකතු කිරීමේ සහ ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පොතුවිල් ප්‍රදේශයේ ස්ථාපිත කර ඇත. තවද, පෞද්ගලික ආයතන සතුව ලීටර් 6,000ක ධාරිතාවක් සහිත කිරි එකතු කිරීමේ සහ ශීත කිරීමේ මධ්‍යස්ථාන තුනක් පොතුවිල් ප්‍රදේශයේ ස්ථාපිත කර ඇත.

දැනට පවතින කිරි එකතු කිරීමේ සහ ශීත කිරීමේ මධ්‍යස්ථානවල ධාරිතාව දෛනික කිරි නිෂ්පාදනය එකතු කිරීම සඳහා ප්‍රමාණවත් වේ. ඉදිරියේදී දෛනික කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට සාපේක්ෂව අවශ්‍යතාව පරිදි කිරි එකතු කිරීමේ සහ ශීත කිරීමේ මධ්‍යස්ථානවල ධාරිතාවද ඉහළ නැංවීමට කටයුතු කළ හැකිය.

(ආ) පැන නොනඟී.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
கௌரவ பிரதி அமைச்சர் அவர்களுக்கு நன்றி!

கௌரவ சபாநாயகர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

அம்பாறை மாவட்டமானது பால் உற்பத்திக்கு அதிகம் பங்களிப்புச் செய்கின்ற ஒரு மாவட்டமாகும். இம்மாவட்டத்தில் பொத்துவில் உட்பட பல பிரதேச செயலாளர் பிரிவுகளிலும் மேய்ச்சல் தரை இல்லாமல் இருப்பதால் பால் உற்பத்தியைப் பூரணமாக அதிகரிக்க முடியாமல் உள்ளது. மாவட்டத்தில் மாட்டுத்தீனை உற்பத்தி செய்வதற்காக புல், சோளம் என்பவற்றை விதைத்து, அவற்றை அரிந்து பொதி செய்து விநியோகிப்பதற்கென silage unit ஒன்றை அமைத்துத் தர முடியுமாக இருந்தால், அம்பாறை மாவட்டத்தில் பால் உற்பத்தியை மென்மேலும் அதிகரிக்க முடியுமென நம்புகின்றேன். இதனை அரசு மேற்கொள்ள முடியும் அல்லது இதனை மேற்கொள்ள தனியாரை ஊக்கப்படுத்த முடியும். இதனை ஆரம்பிக்க சுமார் 5 ஏக்கர் நிலம் போதுமானதாகும். எனவே, அம்பாறை மாவட்டத்துக்கென silage unit ஒன்றை ஏற்படுத்தித் தர முடியுமா? என கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළ කාරණය පිළිබඳව අපට අවධානය යොමු කරන්න පුළුවන්. ඒ පිළිබඳව සාකච්ඡා කරලා, අපි වැඩ පිළිවෙළක් සකස් කරමු. කොහොමත් පොදුවේ ගත්තාම, අපේ දෛනික කිරි නිෂ්පාදනය තිබෙන්නේ ලීටර් ලක්ෂ 10ක විතර ප්‍රමාණයක්. 2029 අවුරුද්ද පහු කරනකොට අපේ ඉලක්කය වන්නේ කිරි ලීටර් ලක්ෂ 30කට යෑමයි. ඒ ඉලක්කය මූලික කරගෙන අපි මේ වනකොට කිරි නිෂ්පාදන මධ්‍යස්ථාන - dairy hubs - පදනම් කර ගනිමින් සියලුම කිරි ගොවීන් සම්බන්ධ කරගෙන සංවිධාන ව්‍යූහයක් හදනවා. කාට කිරි දුන්නත් අපට ප්‍රශ්නයක් නැහැ. ඒ සංවිධාන මඟින් කිරි ගොවීන්ට කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමට අදාළ දායකත්වය සහ උදවු ලබා දීමට මේ වනකොට වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. නොමිලයේ සතුන් එන්නත් කිරීම සඳහා මේ වනකොටත් රුපියල් ලක්ෂ 25,000ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී ගොවීන්ට විශේෂයෙන්ම තෘණ භූමි සකස් කර ගැනීමට,

[ගරු නාමල් කරුණාරත්න මහතා]

සාන්ද්‍ර ආහාර ලබා ගැනීමට සහ ශීතකරණ පහසුකම් ලබා දීමට කටයුතු කරනවා. විශේෂයෙන්ම මේ වනකොටත් පාකිස්තානයෙන් අපි හොඳම වර්ගයේ නාම්බෝ 7දෙනෙක් ගෙනැවිත් තිබෙනවා. ඒ නාම්බෝ මේ වනකොට නිරෝධායන කටයුතුවලට භාජන කරලා තිබෙනවා. ඒ සතුන්ගේ ශුක්‍රාණු අරගෙන අපේ වැස්සියන්ට සම්බන්ධ කරලා දියුණු වැස්සි පැටව් නිර්මාණය කර ගැනීමේ සැලසුමකුත් අපි ක්‍රියාත්මක කරමින් තිබෙනවා. කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මේ වාගේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වෙනවා.

ඒ වාගේම ලබන අවුරුද්ද මැද විතර වනකොට බඩල්ගම කිරි ෆැක්ටරිය විවෘත කරන්න තමයි අපි සැලසුම් කරගෙන යන්නේ. ගරු මන්ත්‍රීතුමනි, එහෙම වුණොත් ඒ සඳහා දවසකට කිරි ලීටර් ලක්ෂ 2ක් අවශ්‍ය වෙනවා. ඒ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න අපි කිරි නිෂ්පාදනය අනිවාර්යයෙන්ම ප්‍රවර්ධනය කරන්න ඕනෑ. ඔබතුමාගේ යෝජනාව අපි භාර ගන්නම්. අපි ඒ ගැන සාකච්ඡා කරලා, ඉදිරියේදී එය ක්‍රියාවට නඟන්නේ කොහොමද කියන එක පිළිබඳවත් ක්‍රමයක් සකස් කර ගනිමු.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
கௌரவ பிரதி அமைச்சர் அவர்களுக்கு நன்றி!

கௌரவ சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

அம்பாறை மாவட்டத்தின் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவிலுள்ள முஹம்மதிய்யா கால்நடை வளர்ப்பு இயக்கத்தின் அங்கத்தவர்களான Al-Haj K.P.M. Sheriff, A.K. Aboobucker, S. Moosa Lebbe, Y.M. Mohamed Lebbe, A.M. Aliyar, M. H. A. Cader, Mohamed Ismail, K.P.A. Majeed, K.Yoosuf Lebbe, A. Adam Lebbe, M. C. M. A. Wahab, I. Sinnappillai போன்றோரின் பங்களிப்புடன் ஆரம்பிக்கப்பட்டு, தற்போது பாவிக்கப்படாமலுள்ள அம்பாறை மாவட்டம் சார்பாக கனகர் கிராமத்தில் இருந்த காளை நிலையத்தை மீண்டும் ஆரம்பிக்க முடியுமாக இருந்தால், அதனை அம்பாறை மாவட்டத்தில் பண்ணை விருத்தி மையமாகச் செயற்படுத்தி, அம்மாவட்டம் முழுவதும் மாட்டினது விருத்தியை மேற்கொள்ள முடியுமென அம்மாவட்ட மக்கள் நம்பிக்கை தெரிவிக்கின்றார்கள். எனவே, அம்பாறை மாவட்டம் சார்பாக பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் கனகர் கிராமத்தில் ஏற்கனவே இருந்த காளை நிலையத்தை மீண்டும் ஏற்படுத்தி, அதனை ஒரு பண்ணை விருத்தி மையமாகச் செயற்படுத்த நடவடிக்கை எடுக்க முடியுமா? என கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමට අදාළ යෝජනා තමයි ගේන්නේ. ඒවාත් එක්ක අපට විවාදයක් නැහැ. මා ළඟම පුටුවේ ඉන්නේ අම්පාරේ ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා. අපි සාකච්ඡා කරලා සාධනීය ලෙස කළ හැකි ඔබතුමාගේ සෑම යෝජනාවක්ම ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ පිළිවෙළක් ඉදිරියේදී සකස් කරමු. ඔබතුමාගේ මැදිහත්වීම අපි අගය කරනවා.

## මිය ගිය ත්‍රිවිධ හමුදා නිලධාරින්ගේ යැපෙන්නන්ට ගෙවනු ලබන දීමනා: ප්‍රමාදය
### உயிரிழந்த முப்படை அங்கத்தவர்களின் தங்கி வாழ்வோருக்கு கொடுப்பனவு வழங்கல்: தாமதம்
### ALLOWANCES PAID TO DEPENDENTS OF DECEASED TRI-FORCE PERSONNEL: DELAY

1677/2025

**6. ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) රාජකාරියේදී මිය ගිය ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ වැන්දඹුවන්/ යැපෙන්නන් සඳහා ලබා දෙමින් පැවති වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් හෝ දීමනා ගෙවීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(ii) එම ප්‍රමාදවීම් වළක්වා ගැනීමට ගනු ලබන පියවර කවරේද;

(iii) ආබාධිත හේතුව මත සේවයෙන් ඉවත්වීමෙන් පසුව විවාහවූ හමුදා සාමාජිකයන් මිය ගිය පසු ඔවුන්ගේ වැන්දඹුවන්/යැපෙන්නන් සඳහා ගෙවනු ලබන වැටුප් හා දීමනා කවරේද;

(iv) ඔවුන් සඳහා දීමනා නොගෙවන්නේ නම්, එයට හේතු කවරේද;

(v) එම වැටුප් හෝ දීමනා ගෙවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2009.05.19 දිනට පෙර බඳවාගත් හමුදා සාමාජිකයන්ගෙන් 85%ක විශ්‍රාම වැටුප් හිමිකමක් නොලබන සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්‍රාම වැටුප් හිමිකම නොගෙවීම සඳහා හේතු කවරේද;

(iii) ඔවුන් සඳහා 85%ක විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සුදුසු බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ට එම විශ්‍රාම වැටුප් හිමිකම ගෙවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடமையின்போது உயிரிழந்த முப்படை அங்கத்தவர்களின் விதவைகள்/தங்கி வாழ்வோருக்கு வழங்கப்பட்டு வந்த விதவைகள் மற்றும் அனாதைகள் ஓய்வூதியம் அல்லது கொடுப்பனவுகள் செலுத்தும் நடவடிக்கைகள் தாமதமாகின்றமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி தாமதங்களைத் தடுப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) அங்கவீன நிலைமை காரணமாக சேவையிலிருந்து விலகிய பின்னர் திருமணம் முடித்த இராணுவப்படை அங்கத்தவர்கள் உயிரிழந்த

பின்னர் அவர்களின் விதவைகள்/தங்கி வாழ்வோருக்கு செலுத்தப்படும் ஊதியங்கள் அல்லது கொடுப்பனவுகள் யாவை என்பதையும்;

(iv) அவர்களுக்கு கொடுப்பனவுகள் செலுத்தப் படவில்லை எனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி ஊதியங்கள் அல்லது கொடுப்பனவு களைச் செலுத்துவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2009.05.19ஆம் திகதிக்கு முன்னர் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட இராணுவப் படை அங்கத்தவர் களில் 85% ஓய்வூதிய உரித்தைக் கொண்டிராத வர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி ஓய்வூதிய உரித்துச் செலுத்தப்படா மைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) அவர்களுக்கு 85% ஓய்வூதிய உரித்து வழங்கப் பட வேண்டியது பொருத்தமானது என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) ஆமெனில், அவர்களுக்கு மேற்படி ஓய்வூதிய உரித்தைச் செலுத்துவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House-

(i) the reasons for the delay in the payment of Widows' and Orphans' Pensions or allowances that are being paid to the widows/dependents of the members of the three armed forces who died in the line of duty;

(ii) the steps that will be taken to prevent such delays;

(iii) the salaries and allowances paid to the widows/dependents of the members of the armed forces who married after leaving the service due to disability, upon the death of that member;

(iv) if allowances are not paid to them, the reasons for that; and

(v) the steps that will be taken to pay those salaries or allowances?

(b) Will he also inform this House-

(i) the number of military personnel who are not entitled to 85 per cent pension, out of those recruited before 19.05.2009;

(ii) the reasons for not paying the said pension entitlement;

(iii) whether he accepts that it is appropriate to grant them the 85 per cent pension entitlement; and

(iv) if so, the measures that will be taken to grant the said pension entitlement to them?

(c) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)

(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) රාජකාරියේ යෙදී සිටියදී මිය ගිය විවාහක හමුදා සාමාජිකයන්ගේ වැන්දඹු බිරිඳ/ දරුවන්හට වැන්දඹු / අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී ඒ සඳහා අවශ්‍ය ලියකියවිලි ඔවුන් අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලබා ගැනීමෙන් පසු අයදුම්පත් සම්පූර්ණ කර කඩිනමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල විසින් යොමු කරනු ලබයි. එකී ක්‍රියාවලිය තුළ ප්‍රමාදවීම් සිදු විය හැකි අවස්ථා පහත පරිදි හඳුනා ගෙන ඇත. එනම්,

- යැපෙන්නන් විසින් ලියකියවිලි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමේදී සිදු වන ප්‍රමාදයන්.
- මිය ගිය සෙබළා විවාහ කිහිපයකට ඇතුළත්ව ඇති අස්ථාවල නීත්‍යනුකූල බිරිඳ තහවුරු කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයකින් විස්තර ගෙන්වා ගැනීමට සිදුවීම.
- අදාළ හමුදා පුද්ගලයාගේ මරණය සම්බන්ධයෙන් විවෘත නඩු තීන්දුවක් ලබා දුන් අවස්ථාවක මරණ සහතිකය ලබා දීම ප්‍රමාද වීම.
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් සිදු කරන කාර්යයන් සඳහා ගත වන කාලය.

(ii) මෙම ප්‍රමාදවීම් සිදු වන හේතූන් අතරින් ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු අවස්ථා වේ නම් ඒවා හඳුනාගෙන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණයෙන් මෙම අමාත්‍යාංශය එම ප්‍රතිපත්තිමය තීරණවලට එළඹීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

එවැනි අවස්ථාවලදී මෙම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් උක්ත ආයතන සමඟ සාකච්ඡා පවත්වා කඩිනම් විසඳුම්වලට එළඹීම සිදු කෙරේ.

මීට අමතරව එක් එක් යැපෙන්නන්හට සුවිශේෂී වන නීතිමය හා අනෙකුත් ගැටලු විසඳා ගැනීම සඳහා අදාළ හමුදා සාමාජිකයා අනුයුක්තව සේවය කරන ලද ඒකකය හරහා අවශ්‍ය සහය හා මඟ පෙන්වීම ත්‍රිවිධ හමුදා විසින් සිදු කරනු ලැබේ.

(iii) 20029.05.19 දිනට පෙර පැවති යුද්ධයේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත වී සේවයෙන් ඉවත්වීමෙන් අනතුරුව විවාහ වූ හමුදා සාමාජිකයන් මියගිය පසු ඔවුන්ගේ යැපෙන්නන් සඳහා පහත පරිදි වැටුප් හා දීමනා හිමිගන්වනු ලබයි.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

- අදාළ හමුදා පුද්ගලයා ජීවත්ව සිටියා සේ සලකා ඔහුගේ වයස අවුරුදු 55 දක්වා යැපෙන්නන් වෙත වැටුප් දීමනා හිමිගන්වනු ලබයි.
- හමුදා පුද්ගලයාගේ වයස අවුරුදු 55 සපිරෙන දිනට ලද වැටුප නොවෙනස්ව වයස අවුරුදු 55න් පසුවත් යැපෙන්නා ජීවත් වන තෙක් ස්ථාවර මාසික දීමනාවක් ලෙස හිමිගන්වනු ලබයි.
- ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත වී සේවයෙන් ඉවත් වීමෙන් අනතුරුව විවාහ වූ හමුදා සාමාජිකයන් මිය ගිය පසු ඔවුන්ගේ යැපෙන්නන් වෙත වැන්දඹු/අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමට හැකි වන පරිදි, 1970 අංක 18 දරන වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ හමුදා) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පනත යටතේ වන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය හා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය එක්ව ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෙටුම්පත් කර එය ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරමින් පවතියි.

(iv) අදාළ නොවේ.

(v) ත්‍රස්තවාදි හේතූන් මත ආබාධිතව සේවයෙන් ඉවත් වීමෙන් පසුව විවාහ වූ හමුදා සාමාජිකයන්ගේ යැපෙන්නන් වෙත වැන්දඹු/අනත්දරු විශ්‍රාම වැටුප හිමිගැන්වීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර මුදල් අමාත්‍යාංශ අනුමැතිය සඳහා මේ වනවිට යොමු කර ඇති අතර, එය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලැබෙන අනුමැතිය මත අදාළ හිමිකම් ලබා දීමට ප්‍රතිපාදන සැලසේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු කථානායකතුමනි, වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ හමුදා) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පනත යටතේ රෙගුලාසි සංශෝධනය සඳහා කෙටුම්පත් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයේ වර්තමාන තත්ත්වය කොහොමද කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා දැනගන්න කැමතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමිය, අප එම කැබිනට් පත්‍රිකාව හදලා තිබෙනවා. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් එයට එකඟත්වය පළ කර තිබෙනවා. ඒ වාගේම එම කෙටුම්පතට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ එකඟතාවත් ලැබී තිබෙනවා. ගරු ජනාධිපතිතුමාගේ සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයාගේ අත්සන් යොදලා දැන් තිබෙන්නේ ඒක එතැනින් උඩට යැවීමයි. එය අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අපි දැන් කටයුතු කරමින් පවතිනවා. නුදුරේදීම එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න තමයි අපි කටයුතු සකස් කර තිබෙන්නේ.

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, යම් යම් අවස්ථාවලදී අපට වාර්තා වන කාරණාවක් තමයි, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රමාද වීම් සිදු වෙනවා කියන එක. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එම ප්‍රමාදයන් වළක්වා ගැනීමට මේ වන විට යම්කිසි ක්‍රියාමාර්ග ගෙන තිබෙනවාද, එහෙම නම් ඒ මොනවාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, මිය ගිය විවාහක සෙබළුන්ගේ යැපෙන්නන් සඳහා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ලබා ගැනීමේදී අපේ අමාත්‍යාංශය තුළින් යම් යම් අත්‍යවශ්‍ය ප්‍රමාදයන් සිදු වෙනවා. මගේ කාර්යාලය තුළ පවත්වාගෙන යන මහජන දිනයන්හිදීත්, විශේෂයෙන් ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මහජන දිනයන්හිදීත් ඔවුන් ගෙන්වා ඒ ගැටලු කඩිනමින් නිරාකරණය කිරීමට විධිමත් වැඩසටහනක් - වැඩ පිළිවෙළක්- අපි පසුගිය අවුරුද්ද පුරා සිදු කළා; දැනටත් එම කටයුතු සිදු වෙනවා. එමඟින් මේ කියන ප්‍රමාද වීම් වළක්වා ඉක්මනින් එම වැඩ කටයුතු කර දෙන්න අපි දැන් කටයුතු සලස්වා තිබෙනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -1786/2025- (1), ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ගම්පහ සණස බැංකුවේ තැන්පත්කරුවන්ට සිදු වී ඇති අසාධාරණය: විස්තර
கம்பஹா சணச வங்கியில் வைப்பாளர்களுக்கு இழைக்கப்பட்டுள்ள அநீதி: விபரம்
INJUSTICE CAUSED TO DEPOSITERS OF GAMPAHA SANASA BANK: DETAILS

1810/2026

**8. ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගම්පහ සණස බැංකුවේ මුදල් තැන්පත්කරුවන් සම්බන්ධයෙන් ගැටලුවක් පවතින බව දන්නේද;

(ii) එම බැංකුවේ මුදල් තැන්පත් කොට අසාධාරණයට ලක් වූ තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තැන්පත්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම තැන්පත්කරුවන් වෙනුවෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ගවල ප්‍රගතිය කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கம்பஹா சணச வங்கியில் நிதியை வைப்பிலிட்டவர்கள் தொடர்பான பிரச்சினையொன்று நிலவுவதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி வங்கியில் நிதியை வைப்பிலிட்டு அநீதிக்குள்ளாகியுள்ள வைப்பாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அவ்வைப்பாளர்களால் வைப்பிலிடப்பட்ட நிதி எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி வைப்பாளர்களுக்காகக் கூட்டுறவு அபிவிருத்தித் திணைக்களத்தால் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) அந்நடவடிக்கைகளின் முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) whether he is aware that an issue has arisen concerning the depositors of the Gampaha Sanasa Bank;

(ii) the number of depositors who suffered injustice by depositing money at the said bank;

(iii) the amount of money deposited by the depositors mentioned above;

(iv) the actions that the Department of Co-operative Development has taken on behalf of those depositors; and

(v) the progress of the aforesaid actions?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

එය "සීමාසහිත ගම්පහ දිස්ත්‍රික්කයේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති සංගමය" ලෙස නිවැරැදි විය යුතුය.

(ii) සාමාජික තැන්පත්කරුවන් - 376

බාහිර තැන්පත්කරුවන් - 3,937

(iii) රුපියල් 3,035,056,181.00 (රුපියල් මිලියන 3,035)

(iv) 2010.01.01 සිට 2019.12.31 දින දක්වා විශේෂ විගණනයක් සිදු කර බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එම විශේෂ විගණන වාර්තාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇත.

2022.12.31 දිනට සංගමයේ ව්‍යවස්ථාපිත විගණනය සිදු කර ඇත. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, මේ වන විට 2023.12.31 දක්වා ව්‍යවස්ථාපිත විගණනය සිදු කරමින් පවතී.

2019.06.20 දින එහි මූල්‍ය අවභාවිතාව සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇත.

බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල අනුව 47(2) විමර්ශනයක් සිදු කර එකී විමර්ශනයේ නිර්දේශ මත කාරක සභිකයන් 16දෙනෙකුට චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර චෝදනා හා ඒ සඳහා ලැබුණු පිළිතුරු මත කාරක සභිකයන් 14දෙනෙකුට වසර 07කට කාරක සභා සඳහා පත්වීම තහනම් කරමින් 2025.02.05 දින බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් නියෝගයක් නිකුත් කර ඇත.

1982 අංක 12 දරන පොදු විෂයෙහි ලා ගැනෙන වැරැදි සම්බන්ධයෙන් ඉදිරි පියවර ගන්නා ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.

බස්නාහිර පළාත් සමුපකාර අමාත්‍යාංශ ලේකම්, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් මඟින් මූල්‍ය අර්බුදය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ නීතිපති උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, එම උපදෙස්වලට අනුව කටයුතු කරන ලෙස සීමාසහිත ගම්පහ

[ගරු වසන්ත සමරසිංහ මහතා]

දිස්ත්‍රික්කයේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති සංගමයේ සභාපතිවරයා වෙත ලිඛිතව දන්වා ඇත.

(v) සීමාසහිත ගම්පහ දිස්ත්‍රික්කයේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති සංගමයේ අරමුදල් ආයෝජනය කර ඇති ආයතනවලින් එම ආයෝජනය කරන ලද අරමුදල් නැවත අය කර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙස සංගමයට ලිඛිත උපදෙස් ලබා දී ඇත.

බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 41 (1) වගන්තිය උල්ලංඝනය කරමින් සංගමය සතු අරමුදල් අනිසිව, අනීතිකව ආයෝජනය කිරීම සඳහා තීරණ ගන්නා ලද වගකිව යුතු කාරක සභිකයන්ට හා නිලධාරින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස සංගමයට ලිඛිතව උපදෙස් ලබා දී ඇත.

මේ වන විට සීමාසහිත ගම්පහ දිස්ත්‍රික්කයේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති සංගමයේ තැන්පත්කරුවන් විසින් අභියාචනාධිකරණයේ නඩු අංක CA/Writ/59/2020 හා CA/Writ/16/2022 යටතේ නඩු ගොනු කර ඇති අතර, CA/Writ/59/2020 දරන නඩුවේදී සීමාසහිත ගම්පහ දිස්ත්‍රික්කයේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති සංගමයේ දේපළ බැහැර කිරීම වළක්වාලමින් අත්හිටුවීමේ නියෝගයක් නිකුත් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

ගරු අමාත්‍යතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ සණස සම්බන්ධයෙන් මම මීට පෙරත් පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් යොමු කළා. ඇත්තටම ඒක යොමු කළේ, මහජන ආරක්ෂක අමාත්‍යතුමාට. මොකද, විශේෂයෙන්ම ඒ සමිතිය සම්බන්ධයෙන් ඒ තැන්පත්කරුවන් විසින් විශාල පැමිණිලි ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා. මම හිතන විධියට, පැමිණිලි 200කට ආසන්න ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා. දැන් මේ වෙද්දී නඩුත් පවරා තිබෙනවා. අර කිව්වා වාගේ, විශාල මුදල් ප්‍රමාණයක ගැටලුවක් තිබෙනවා, ඒ තැන්පත්කරුවන්ට ඒවා නොලැබීම සම්බන්ධව. ඔබතුමාගේ උත්තරයේත් සඳහන් වූ විධියට නීති ප්‍රකාරව නොවන ලෙස, පනතට අනුකූල නොවන විධියට සණස බැංකුව විසින් යම් සමාගම්වල ආයෝජනය කිරීම් සිදු වෙලා තිබෙනවාය කියලා, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සමාලෝචනයක් කරලා, ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. එතකොට මූලිකව ගත්තොත්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පළමුවැනි අවස්ථාවේම වරද්දාගෙන තිබෙනවා, ඒ අවශ්‍ය අධීක්ෂණය හරියාකාරයෙන් සිද්ධ කරන්නේ නැතුව. ඒ නිසා දැන් මේ ගැන එහාට මෙහාට ලියුම් විතරක් යවන එකක් බවට පත් වෙන්නේ නැතුව, නිශ්චිත ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. මොකද, තැන්පත්කරුවන් විශාල ප්‍රමාණයක් අසාධාරණයට ලක් වෙලා ඉන්නවා. ඒ නිසා මොකක්ද, අපට හරියටම ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය? මේ ගැන සම්පූර්ණයෙන්ම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවටම blame කළොත්, ඒ ආයතනයේ ඉන්න නිලධාරින්ට පවා ගැටලුවක් වෙනවා. මොකද, මම හිතනවා අනිවාර්යයෙන්ම පසුගිය දේශපාලන අධිකාරියෙන් ඒවාට විශාල බලපෑම් තිබුණා කියලා. ඒ නිසා තමයි ඒවා කඩාගෙන වැටුණේ. ඒවා කඩා වැට්ටුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

ඒ නිසා අඩුම ගණනේ මේ අසාධාරණයට ලක් වෙච්ච තැන්පත්කරුවන් වෙනුවෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සක්‍රිය දායකත්වය අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සක්‍රිය දායකත්වය ඉක්මන් කර ගන්න අමාත්‍යාංශය විධියට ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු පළමුවන අතුරු ප්‍රශ්නයට පිළිතුර මේකයි.

ගරු කථානායකතුමනි, මේ සණස බැංකුවේ මුදල් ආයෝජනය කරලා තිබෙන්නේ සාමාජිකයන්. ගම්පහ දිස්ත්‍රික්කයේ කුඩා සණස සමිති 379ක් තිබෙනවා. ඒ සාමාජිකයන්ගේ මුදලුත් තිබෙනවා. ඒ වාගේම බාහිර පාර්ශ්ව 3,000කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඒ අනුව තමයි මේ මිලියන 3,000ක් තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා, 2010-2019 අතර කාලයේ වෙච්ච සිදුවීමට අදාළව මම පිළිතුරේ කරුණු සඳහන් කළා. අපි 2025දී තමයි ඒ කාරක සභිකයන් 16දෙනෙකුට අදාළ ක්‍රියාමාර්ග අරගෙන තහනමක් දමන්නේ.

ඔබතුමා සඳහන් කළා වාගේ, ඒ වන කල් සමුපකාර දෙපාර්තමේන්තුවත්, පළාත් සමුපකාරත් ඔවුන්ගේ කාර්යභාරයේ යම් කොටසක් මඟ හැරීමත්, එහෙම නැත්නම් ප්‍රමාණවත් මැදිහත් වීමක් නොකිරීමත් කියන කාරණය එයට හේතු වෙලා තිබෙනවා. නිසි ලෙස විගණනයක් සිදු නොවීම, චෝදනාවට ලක් වූවන්ට නිසි ලෙස නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම, අවශ්‍ය මොහොතේ අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම නිසා තමයි මේ තැන්පතුකරුවන් අර්බුදයට ගිහිල්ලා තිබෙන්නේ. දැනට අපි අමාත්‍යාංශය ලෙස ඒ සිදුවීම් follow කරනවා.

දැනට මේ වාගේ ණය දෙන සමුපකාර සමිති 68ක මූල්‍ය අර්බුද තිබෙනවා. බස්නාහිර පළාතේ මේක විශේෂයි. ඒ තැන්පත්කරුවන්ගේ මුදල් විවිධ ව්‍යාපෘතිවල ආයෝජනය කරලා තිබෙනවා. ඔබතුමා දන්නවා ඇති, එවැනි සමහර තට්ටු නිවාස තිබෙනවා, නමුත් හදලා නැහැ කියන එක. ඒ වාගේ විවිධ ආයෝජන කරලා තිබෙනවා. හැබැයි, ඒ ආයෝජනවල වටිනාකම සහ ඒවායේ පොලී වටිනාකම ලැබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. එම නිසා දැන් නීතිපති උපදෙස් මත අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න අපි කටයුතු කරලා තිබෙනවා. සමුපකාර දෙපාර්තමේන්තුවේ කටයුතු මධ්‍යම රජයේ අපේ කාර්යභාරයක් නිසා අපටත් මේ පැමිණිලි ලැබුණාම, අපි බස්නාහිර පළාතේ සමුපකාර කොමසාරිස්වරයා මඟින් පළාත් අමාත්‍යාංශ හරහා මේ පිළිබඳ අවශ්‍ය මැදිහත් වීම කරමින් ඒ පරීක්ෂණ කඩිනම් කරන්න කටයුතු කරමින් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඒක තමයි අපට මේ

මොහොතේ කඩිනමින්ම කරන්න තිබෙන මැදිහත් වීම. ප්‍රමාද වූ පරීක්ෂණ ගොඩක් තිබෙනවා. අපි දැන් ඒවා කඩිනම් කරමින් යනවා.

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම මේ තැන්පත්කරුවෝ සහ ඊට අමතරව පරිබාහිරව තිබෙන අනෙකුත් සංගම් විසින් අපට නිතර කියන කාරණයක් තමයි, සමුපකාර පනතේ තිබෙන යම් යම් බලතල සහ ඒ පනතේ තිබෙන ගැටලු නිසා සමුපකාර දෙපාර්තමේන්තුව කටයුතු කරද්දී අර්බුද මතු වෙලා තිබෙනවාය කියන කාරණය. විශේෂයෙන්ම සණස සමිති සහ සමුපකාර දෙපාර්තමේන්තුවට අදාළ අනෙකුත් සමිති ව්‍යුහවලට අදාළව. ඒ නිසා අපි පාර්ලිමේන්තුවේත් කථා කළා සමුපකාර පනත සංශෝධනය කළ යුතුයි කියලා. එහි ප්‍රගතිය කොහොමද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, අපේ සමුපකාර කොටස් දෙකකට ක්‍රියාත්මක වනවා. පළමුවැනි එක, මධ්‍යම රජය යටතේ තිබෙන ජාතික මට්ටමේ සමුපකාර. දෙවැනි එක, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු පළාත් සමුපකාර හැටියට තිබෙන ද්විතීය සමුපකාර. ඔබතුමා සඳහන් කළ ආකාරයට ප්‍රඥප්ති හදාගෙන තිබෙනවා ඒ ඒ පළාත් සභාවලින්. ඒ හදපු ප්‍රඥප්ති අනුව ගරු කථානායකතුමනි, සමහර පළාත් සභාවල සමුපකාර හදා ගන්නා අතුරු ව්‍යවස්ථාව හරහා සාමාජිකයන්ට බරපතළ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. එම නිසා අපි ඒ සියල්ල අධ්‍යයනය කරලා කැබිනට් මණ්ඩලය අනුමත කළ කමිටුවක් හරහා සමුපකාර නීතිය සංශෝධනය කරන්න කටයුතු කරමින් තිබෙනවා. ඒ පනත් දෙකම සංශෝධනය කළ යුතුයි. විශේෂයෙන්ම සමුපකාර බැංකු සහ සමුපකාර සමිති සඳහා අවශ්‍ය පනත් සංශෝධන කරන්න තිබෙනවා. මේ වනකොට පනත් කෙටුම්පත - මූලික draft එක - හදලා ඉවරයි. ඒක මේ වනකොට විමර්ශනයට ලක් වනවා. මේ සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කරගන්නත්, සමුපකාර සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගන්නත්, මේ ව්‍යාපාරය ශක්තිමත්ව ගොඩනඟන්නත් අවශ්‍ය නීති සංශෝධනය අපි ඉතාම කඩිනමින් ගෙන එන්න කටයුතු කරනවා. අපි උත්සාහ කරනවා, මේ අවුරුද්ද ඇතුළත ඒ පනත් කෙටුම්පත් දෙක සම්මත කරලා අවසන් කරන්න.

බොහොම ස්තුතියි.

## අනුර ඩැනියෙල් දිස්ත්‍රික් රෝහල, ගලහ සහ පට්ටියගම-පල්ලේගම ප්‍රාදේශීය රෝහල්: පහසුකම් හිඟය

## அநுர டேனியல் மாவட்ட வைத்தியசாலை, கலஹா மற்றும் பட்டியகம-பல்லேகம பிரதேச வைத்தியசாலைகள்: வசதிகள் பற்றாக்குறை

## ANURA DANIEL DISTRICT HOSPITAL, GALAHA AND PATTIYAGAMA-PALLEGAMA DIVISIONAL HOSPITALS: LACK OF FACILITIES

1830/2026

**9. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ඒ ආශ්‍රිත ගම්මානවල ජනතාව මුහුණ දෙන මූලික හා හදිසි සෞඛ්‍ය ගැටලු පිළිබඳව දන්නේද;

(ii) දෙල්තොට අනුර ඩැනියෙල් දිස්ත්‍රික් රෝහල, ගලහ සහ පට්ටියගම-පල්ලේගම ප්‍රාදේශීය රෝහල්වල වත්මන් ශ්‍රේණිගත කිරීම කවරේද;

(iii) එම රෝහල්වල අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය කොපමණද;

(iv) එම රෝහල්වල හදිසි ප්‍රතිකාර, සැත්කම්, දැඩි සත්කාර සහ ප්‍රසව හා නාරිවේද විශේෂඥ සේවා නොමැති වීම හේතුවෙන් රෝගීන් මහනුවර සහ පේරාදෙණිය රෝහල් වෙත මාරු කිරීමේදී මරණයට පත්වන බව දන්නේද;

(v) දෙල්තොට අනුර ඩැනියෙල් දිස්ත්‍රික් රෝහල, මූලික රෝහලක් ලෙස ශ්‍රේණිගත කිරීමටත්, ගලහ සහ පට්ටියගම-පල්ලේගම ප්‍රාදේශීය රෝහල් සංවර්ධනය කිරීමටත් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් මෙම ප්‍රදේශවල මාර්ග අබලන්වී ඇති පසුබිමක, හදිසි ප්‍රතිචාර සඳහා ඉහත සඳහන් රෝහල්වලට අමතර ගිලන් රථ ලබාදීමටත්;

(ii) ගලහ සහ දෙල්තොට ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍ය අයිතිවාසිකම් තහවුරු කිරීමට විශේෂ ශ්‍රම බලකායක් පත්කර විසඳුම් ලබාදීමටත්;

පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தின் தெல்தோட்டை பிரதேச செயலாளர் பிரிவிலும் அதை அண்டிய கிராமங்களிலும் வசிக்கும் மக்கள் எதிர்கொண்டுள்ள அடிப்படை மற்றும் அவசர சுகாதார பிரச்சினைகள் தொடர்பாக அறிவாரா என்பதையும்;

(ii) தெல்தோட்டை அநுர டேனியல் மாவட்ட வைத்தியசாலை, கலஹா மற்றும் பட்டியகம-பல்லேகம பிரதேச வைத்தியசாலைகளின் தற்போதைய தரவரிசைப்படுத்தல் யாது என்பதையும்;

(iii) மேற்படி வைத்தியசாலைகளின் அங்கீகரிக்கப்பட்ட மற்றும் தற்போதுள்ள பணியாட்டொகுதி யாது என்பதையும்;

(iv) மேற்படி வைத்தியசாலைகளில் அவசர விபத்துப் பிரிவு, சத்திரசிகிச்சைக் கூடம், அதிதீவிர சிகிச்சைப் பிரிவு மற்றும் மகப்பேறியல் மற்றும் பெண் நோயியல் விசேட நிபுணத்துவச் சேவைகள் காணப்படாத காரணத்தால் நோயாளர்கள் கண்டி மற்றும் பேராதனை வைத்தியசாலைகளுக்கு மாற்றப்படும்போது நோயாளர்கள் வழியிலேயே உயிரிழக்கின்றமையை அறிவாரா என்பதையும்;

(v) தெல்தோட்டை அநுர டேனியல் மாவட்ட வைத்தியசாலையை ஆதார வைத்தியசாலையாகத் தரமுயர்த்துவதற்கும்,

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

கலஹா மற்றும் பட்டியகம - பல்லேகம வைத்தியசாலைகளை அபிவிருத்தி செய்வதற்கும் நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 'தித்வா புயல்' காரணமாக இப்பிரதேசங்களின் வீதிகள் சேதமடைந்துள்ள நிலையில், அவசர தேவைகளின்போது துரிதமாகச் செயற்படும் வகையில் மேற்படி வைத்தியசாலைகளுக்கு மேலதிக நோயாளர் காவு வண்டிகளை வழங்குவதற்கும்;

(ii) கலஹா மற்றும் தெல்தோட்டை பிரதேச மக்களின் சுகாதார உரிமைகளை உறுதிப்படுத்துவதற்கு விசேட ஊழியர் படை ஒன்றை நியமித்துத் தீர்வு காண்பதற்கும்;

நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும், அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware of the basic and emergency health issues faced by the people in the Deltota Divisional Secretary's Division and in the surrounding villages in the Kandy District;

(ii) the present grading of the Anura Daniel District Hospital in Deltota and the Galaha and the Pattiyagama-Pallegama Divisional Hospitals;

(iii) the approved cadre and the present staff strength of the said hospitals;

(iv) whether he is aware that patients die while being transferred from the said hospitals to the Kandy and the Peradeniya Hospitals due to the lack of emergency treatment, surgery facilities, intensive care and obstetrics and gynaecology specialist services in those hospitals; and

(v) whether steps will be taken to upgrade the Anura Daniel District Hospital in Deltota as a base hospital and to develop the Galaha and the Pattiyagama-Pallegama Divisional Hospitals?

(b) Will he further inform this House whether steps will be taken to -

(i) provide additional ambulances to the above-mentioned hospitals for emergency response in the context that the roads in the said areas are in a dilapidated condition due to "Cyclone Ditwah"; and

(ii) appoint a special workforce to ensure the health rights of the people in the Galaha and Deltota areas and to provide solutions to them?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 1. පෝෂණ සම්බන්ධ ගැටලු

අවුරුදු 5ට අඩු දරුවන්ගේ මන්දපෝෂණය

ගර්භිණී මව්වරුන්ගේ රක්තහීනතාව හා පෝෂණ ගැටලු

2. දන්ත සෞඛ්‍ය ගැටලු

මලෙලමගල් දෙමළ විද්‍යාලය සඳහා දන්ත චිකිත්සක නිලධාරියෙකු නොමැතිවීම හේතුවෙන් ජංගම දන්ත සායන පැවැත්වීම අඩපණ වෙලා තිබෙනවා.

ගලහ රෝහල සඳහා දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු නොමැතිවීම.

3. ගලහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම.

4. දෙල්තොට ප්‍රාදේශීය රෝහල සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියකගේ හිඟය.

(ii) 1. දෙල්තොට ප්‍රාදේශීය රෝහල - A ශ්‍රේණිය

2. ගලහ ප්‍රාදේශීය රෝහල - B ශ්‍රේණිය

3. පට්ටියගම පල්ලේගම ප්‍රාදේශීය රෝහල - C ශ්‍රේණිය

(iii) ඇමුණුම 01 මගින් දක්වා ඇත.

ඇමුණුම 01

**දෙල්තොට ප්‍රාදේශීය රෝහල**

| අංකය | කාණ්ඩය | අනුමත ගණන | දැනට සිටින ගණන |
|---|---|---|---|
| 1 | Medical Officer | 03 | 02 |
| 2 | Dental Surgeon | 01 | 01 |
| 3 | RMO/AMO | 02 | 01 |
| 4 | Nursing Officer | 10 | 08 |
| 5 | PHNO | 00 | 01 |
| 6 | PHM | 03 | 02 |
| 7 | Ward Sister | 01 | 00 |
| 8 | Medical Laboratory Technician | 00 | 01 |
| 9 | Dispenser | 02 | 01 |
| 10 | Management Service Officer | 01 | 01 |
| 11 | Driver | 01 | 01 |
| 12 | Development Officer | 01 | 01 |
| 13 | Hospital Overseer | 01 | 01 |
| 14 | Attendant | 06 | 07 |
| 15 | Saukya Karya Sahayaka (Ordinary) | 04 | 04 |
| 16 | Saukya Karya Sahayaka (Junior) | 10 | 07 |
| 17 | Saukya Karya Sahayaka (Junior)* | 03 | 00 |
| 18 | Watcher | 02 | 00 |

ගලහ ප්‍රාදේශීය රෝහල

| අංකය | කාණ්ඩය | අනුමත ගණන | දැනට සිටින ගණන |
|---|---|---|---|
| 1 | Medical Officer | 03 | 02 |
| 2 | Dental Surgeon | 01 | 00 |
| 3 | RMO/AMO | 01 | 01 |
| 4 | Nursing Officer | 04 | 04 |
| 5 | PHNO | 00 | 00 |
| 6 | PHM | 02 | 01 |
| 7 | Ward Sister | 00 | 00 |
| 8 | Medical Laboratory Technician | 00 | 00 |
| 9 | Dispenser | 01 | 01 |
| 10 | Management Service Officer | 00 | 00 |
| 11 | Driver | 01 | 01 |
| 12 | Development Officer | 01 | 01 |
| 13 | Hospital Overseer | 00 | 00 |
| 14 | Attendant | 05 | 02 |
| 15 | Saukya Karya Sahayaka (Ordinary) | 02 | 05 |
| 16 | Saukya Karya Sahayaka (Junior) | 04 | 03 |
| 17 | Saukya Karya Sahayaka (Junior)* | 03 | 00 |
| 18 | Watcher | 02 | 01 |

පට්ටිය-පල්ලේගම ප්‍රාදේශීය රෝහල

| අංකය | කාණ්ඩය | අනුමත ගණන | දැනට සිටින ගණන |
|---|---|---|---|
| 1 | Medical Officer | 02 | 02 |
| 2 | Dental Surgeon | 00 | 00 |
| 3 | RMO/AMO | 01 | 01 |
| 4 | Nursing Officer | 04 | 04 |
| 5 | PHNO | 00 | 00 |
| 6 | PHM | 02 | 00 |
| 7 | Ward Sister | 00 | 00 |
| 8 | Medical Laboratory Technician | 00 | 00 |
| 9 | Dispenser | 01 | 01 |
| 10 | Management Service Officer | 00 | 00 |
| 11 | Driver | 01 | 01 |
| 12 | Development Officer | 01 | 01 |
| 13 | Hospital Overseer | 00 | 00 |
| 14 | Attendant | 04 | 03 |
| 15 | Saukya Karya Sahayaka (Ordinary) | 02 | 01 |
| 16 | Saukya Karya Sahayaka (Junior) | 04 | 03 |
| 17 | Saukya Karya Sahayaka (Junior)* | 03 | 00 |
| 18 | Watcher | 00 | 02 |

(iv) පහත ඇමුණුම 02හි සඳහන් දත්ත අනුව පෙනී යන්නේ පසුගිය වර්ෂ කිහිපයේදී ගලහ සහ දොළුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසවල රෝගීන් ප්‍රවාහනයේදී මාතෘ මරණ සිදු වී නොමැති බවයි.

ප්‍රාදේශීය රෝහල්වල දැඩි සත්කාර ඒකක ස්ථාපිත කිරීම සඳහා නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරයෙකු ඇතුළුව විශේෂඥ වෛද්‍ය නිලධාරි කණ්ඩායමක් සිටිය යුතුය. එවැනි කාර්ය මණ්ඩලයක් සිටිනුයේ ද්විතීයික හෝ ඉහළ මට්ටමේ රෝගී සත්කාර සේවා සපයනු ලබන රෝහල්වලය. නමුත් ප්‍රාදේශීය රෝහල් සඳහා එවැනි කාර්ය මණ්ඩලයක් අනුමත කර නොමැති බැවින් දැඩි සත්කාර ඒකක ස්ථාපිත කර නොමැත. කෙසේ වුවද, අවශ්‍යතාව මත අංග සම්පූර්ණ හදිසි ප්‍රතිකාර ඒකක මෙම රෝහල්වල ස්ථාපිත කර ඇත.

ඇමුණුම 02

**Maternal Deaths**

**MoH - Doluwa**

| | | |
|---|---|---|
| 1 | 2021 | 27 Y G4,C2 PHM Area - Hunugala, Place of Death - NH Kandy, Cause - Burn |
| 2 | 2023 | 35 Y G3, C3 PHM Area - Pupurassa, Place of Death - NH Kandy, Cause - Tumour of Brain |
| 3 | 2024 | 33Y G3, C2 PHM Area - Millagahamula, Place of Death - NH Kandy, Cause - Septic Abortion |
| 4 | 2024 | 35 Y G2, P2 PHM Area - Kahawatta, Place of Death - BH Gampola, Cause - Placental Abruption |

**Maternal Deaths**

**MoH - Galaha**

| | | |
|---|---|---|
| 1202134 Y G3,C1 PHM Area - Loolkandura, Place of Death - NH Kandy, Cause - COVID | | |
| 2 | 2024 | 25 Y G3, C2 PHM Area - Bopitiya, Place of Death - TH Peradeniya, Cause - Pulmonary Embolism |
| 3 | 2025 | 25Y G2, C0 PHM Area - Galaha, Place of Death - TH Peradeniya, Cause - TB, Pneumonia |

(v) දෙල්තොට අනුර ඩැනියෙල් දිස්ත්‍රික් රෝහල, මූලික රෝහලක් ලෙස ශ්‍රේණිගත කිරීමට මෙතෙක් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොමැත.

පසුගිය වසර කිහිපයක සහ 2026 වසරට අදාළව මෙම රෝහල්වල සිදු කරන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර ඇමුණුම 03 මඟින් දක්වා ඇත.

ඇමුණුම 03

දෙල්තොට ප්‍රාදේශීය රෝහල

| අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | වටිනාකම රු. | වර්ෂය | ප්‍රතිපාදන මූලාශ්‍රය |
|---|---|---|---|---|
| 1 | Renovation of old OPD Building at DH Deltota | 17,024,188.74 | 2019-2023 | HSEP |
| 2 | Construction of corridor between ETU and OPD building, Access road and gate -DH Deltota | 3,655,854.83 | 2023 | PSSP |

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

**ගලහ ප්‍රාදේශීය රෝහල**

| අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | වටිනාකම රු. | වර්ෂය | ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| 1 | Construction of new OPD building at DH Galaha | 19,649,377.72 | 2019-2023 | HSEP |
| 2 | Renovate/refurbish the clinic building at DH Galaha | 3,918,570.34 | 2024 | PSSP |

**පට්ටිය-පල්ලේගම ප්‍රාදේශීය රෝහල**

| අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | වටිනාකම රු. | වර්ෂය | ප්‍රතිපාදන මූලාශ්‍රය |
|---|---|---|---|---|
| 1 | Renovate/refurbish and expansion of OPD building at DH Pattiya Pallegama | 6,438,145.90 | 2023 | PSSP |
| 2 | Construction of ambulance garage, restroom & examination room at DH Pattiya Pallegama | 14,135,044.94 | 2024-2025 | PSDG |

**2026 සංවර්ධන සැලසුම්**

| අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | ආයතනය | වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන | ප්‍රතිපාදන මූලාශ්‍රය | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | Renovate/ refurbish male/ female wards | DH Deltota | 10.00 | PSDG | ඇස්තමේන්තු සකස් කරමින් පවතී. |
| 2 | Construction of a store room | DH Deltota | 10.00 | PSDG | ඇස්තමේන්තු සකස් කරමින් පවතී. |
| 3 | Construction of staff quarters complex (Stage 1) | DH Pattiya Pallegama | 20.00 | PSDG | ඇස්තමේන්තු සකස් කරමින් පවතී. |
| 4 | Renovate/ refurbish maternity ward | DH Deltota | 7.58 | PHSEP | ප්‍රසම්පාදන කටයුතු සඳහා යොමුකර ඇත. |

(ආ) (i) "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල පස් කඳු කඩා වැටීම, නායයෑම් ආදිය නිසා මාර්ග අබලන් වී ප්‍රවාහන දුෂ්කරතා ඇති විය.

එම තත්ත්වය තුළ අමතර ගිලන් රථ යෙදවීම ප්‍රතිඵල රහිත වේ. කෙසේ වුවද, එම රෝහල්වල හදිසි ප්‍රතිකාර සේවා ශක්තිමත් කිරීමට කටයුතු කළ අතර, කාර්ය මණ්ඩලය, අවශ්‍ය ඖෂධ සහ අනෙකුත් පහසුකම් ලබා දී අවස්ථානුකූලව තත්ත්වය කළමනාකරණය කර ගැනීමට කටයුතු කරන ලදී.

දැනට එම රෝහල් තුනෙහිම ගිලන් රථ තුනක් සේවයේ යොදවා ඇති අතර, හදිසි අවශ්‍යතාවකදී භාවිත කිරීම සඳහා 1990 ගිලන් රථ ද සූදානම් කර ඇත.

(ii) "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ ආපදාවට ලක් වූ අතර සියලුම සෞඛ්‍ය කාර්ය මණ්ඩලය පැය 24 පුරාම සූදානම් කර තැබීමට සිදු විය. ආපදා තත්ත්වය හමුවේ වෛද්‍ය කණ්ඩායම් අවශ්‍ය පරිදි අදාළ ප්‍රදේශවලට යොමු කර සෞඛ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

(ඇ) පැන නොනඟී.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி! கௌரவ பிரதி அமைச்சர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

தெல்தோட்டை அநுர டேனியல் மாவட்ட வைத்திய சாலையானது ஆரம்பிக்கப்படும்பொழுது, மாவட்ட வைத்திய சாலையாகவே ஆரம்பிக்கப்பட்டது. எனினும், அவ்வைத்திய சாலை தற்போது தரம் குறைக்கப்பட்டு ஒரு பிரதேச வைத்தியசாலையாக உள்ளது. இன்று அந்தப் பகுதியில் பாரிய வைத்தியத் தேவைகள் மற்றும் சுகாதாரத் தேவைப்பாடுகள் காணப்படுகின்றன. இந்த வைத்தியசாலையின் தரம் குறைக்கப்பட்டு இருப்பதன் நோக்கம் என்ன என்பதைக் குறிப்பிட முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ඇත්තටම එහි ශ්‍රේණිය අඩු කිරීමක් කර නැහැ. ප්‍රාදේශීය රෝහලක් විධියටම තමයි ඒක තිබුණේ. සාමාන්‍යයෙන් දිස්ත්‍රික් රෝහලක තිබෙන පහසුකම් ඒ රෝහලේත් තිබෙනවා. ශ්‍රේණිය පහත දැමීමක් කර නැහැ. ශ්‍රේණිය උසස් කරනවා මිස කිසිම රෝහලක ශ්‍රේණිය පහත් කිරීමට අපට බලාපොරොත්තුවකුත් නැහැ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

சில வருடங்களுக்கு முன்னர், கண்டி மாவட்டத்தில் வைத்தியசாலைகளுக்கு அனைத்து வசதிகளும் பெற்றுக் கொடுக்கப்பட்டு, தரமுயர்த்தி அபிவிருத்தி செய்யப் படுவதற்கான புதிய திட்டம் ஒன்று இருந்ததாகவும், அதில் இந்த தெல்தோட்டை அநுர டேனியல் மாவட்ட வைத்திய சாலையும் உள்வாங்கப்பட்டு இருக்கின்றது என்ற தகவலும் கிடைக்கப்பெற்றது. உண்மையிலே அவ்வாறானதோர் அபிவிருத்தித் திட்டம் காணப்படுகின்றதா? குறித்த திட்டத்தில் இந்த வைத்தியசாலை உள்வாங்கப்படுமாக இருந்தால், எவ்வாறான அபிவிருத்திப் பணிகள் இடம்பெறும், அவை எப்போது ஆரம்பிக்கப்படும் என்பதை இந்தச் சபையில் கூற முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

අපි ලංකාවේ සියලුම රෝහල් සංවර්ධනය කරන්නේ ජාතික සැලැස්මක් යටතේ; Master Plan එකක් යටතේ. ඒ Master Plan එක ඇතුළේ අපි හදලා තිබෙනවා, ගොඩනැඟිලි සංවර්ධනය

වෙන්නේ කොහොමද, අපේ මානව සම්පත කළමනාකරණය කරන්නේ කොහොමද සහ අපේ අවශ්‍ය පහසුකම් ප්‍රමාණය ප්‍රසාරණය කරන්නේ කොහොමද කියන එක. මහනුවර දිස්ත්‍රික්කයේ ඒ සම්බන්ධයෙන් වූ සැලැස්ම යටතේ මේ හැම රෝහලක්ම සංවර්ධනය කිරීම සඳහා අපේ සැලැස්මක් තිබෙනවා. මම පිළිගන්නවා, දැනට එම රෝහලට ලැබිය යුතු පහසුකම් ඔක්කෝම ලැබිලා නැහැ කියලා. විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ තිබෙන රෝහල් 3ම මීට වඩා සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. මේ වසරේදී ඒ සඳහා අපි අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -1831/2026- (1), ගරු කන්දසාමි ප්‍රභු මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## කිලි/මුලංගාවිල් මහා විද්‍යාලය: පුරප්පාඩු සහ සම්පත් හිඟය

கிளி/முழங்காவில் மகா வித்தியாலயம்:
வெற்றிடங்கள் மற்றும் வளப் பற்றாக்குறை
KILI/ MULANKAVIL MAHA VIDYALAYA: VACANCIES AND LACK OF RESOURCES

1185/2025

**1.ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சிவஞானம் சிறீதரன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Sivagnanam Shritharan)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනහරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිලි/ මුලංගාවිල් මහා විද්‍යාලය යනුවෙන් ජාතික පාසලක් තිබෙන බවත්;

(ii) එම පාසලේ ගුරු පුරප්පාඩු, සේවක පුරප්පාඩු, ගෘහ භාණ්ඩ හිඟයක් සහ සම්පත් හිඟයක් මේ වන විට පවතින අතර ඒ හේතුවෙන් එම පාසල අධ්‍යාපන කටයුතුවලදී යම් පසුබෑමකට ලක්වී ඇති බවත්;

(iii) එම පුරප්පාඩු/හිඟයන් සම්පූර්ණ නොකර එම පාසලේ සිසුන්ගේ අධ්‍යාපන කටයුතු ඉහළ නැංවිය නොහැකි බවත්;

එතුමිය පිළිගන්නේද?

(ආ) (i) ඉහත පාසලේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත පාසලේ කනිෂ්ඨ සේවක පුරප්පාඩු 17ක් පැවතියද, මේ වනතෙක් එම පුරප්පාඩු නොපිරවීමට හේතු කවරේද;

(iii) එම පාසලේ ගොඩනැඟිලි අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන දිනය කවරේද;

(iv) එම පාසලේ ගෘහ භාණ්ඩ හිඟයට විසඳුම් ලබා දෙන දිනය කවරේද;

(v) ඉහත පාසලේ කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සම්පූර්ණයෙන්ම පුරවනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி மாவட்டத்தின் பூநகரி பிரதேச செயலாளர் பிரிவில் கிளி/முழங்காவில் மகா வித்தியாலயம் எனும் தேசிய பாடசாலை யொன்று உள்ளது என்பதையும்;

(ii) அந்தப் பாடசாலையில் தற்போது ஆசிரியர் வெற்றிடங்கள், ஊழியர் வெற்றிடங்கள், தள பாடப் பற்றாக்குறை மற்றும் வளப் பற்றாக்குறை நிலவுவதோடு, இதன் காரணமாக அந்தப் பாடசாலை கல்வி நடவடிக்கைகளில் சற்று பின்னடைவைச் சந்தித்துள்ளது என்பதையும்;

(iii) அந்த வெற்றிடங்கள்/பற்றாக்குறைகளை நிவர்த்தி செய்யாமல் அந்தப் பாடசாலை மாணவர்களின் கல்வி நடவடிக்கைகளை மேம்படுத்த முடியாது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மேற்படி பாடசாலையிலுள்ள கல்வி மற்றும் கல்விசாரா ஊழியர்களின் எண்ணிக்கை வெவ் வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி பாடசாலையில் 17 கனிஷ்ட ஊழியர் வெற்றிடங்கள் காணப்பட்டபோதிலும், இது வரை அந்த வெற்றிடங்கள் நிரப்பப்படா மைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி பாடசாலையின் கட்டிடத் தேவைகள் பூர்த்திசெய்யப்படும் திகதி யாது என்பதையும்;

(iv) அந்தப் பாடசாலையின் தளபாடப் பற்றாக் குறைக்குத் தீர்வு வழங்கப்படும் திகதி யாது என்பதையும்;

(v) மேற்படி பாடசாலையின் பணியாட்டொகுதியில் நிலவும் வெற்றிடங்கள் முழுமையாக நிரப் பப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she admit that -

(i) there is a National School known as Kili/ Mulankavil Maha Vidyalaya in the Poonakari Divisional Secretary's Division of the Kilinochchi District;

(ii) the said school has experienced a setback in its academic activities due to the current shortage of teachers and other staff as well as lack of furniture and resources; and

(iii) improving the education of the students in this school is not feasible without addressing those vacancies/shortages?

(b) Will she inform this House of the -

(i) number of academic and non-academic staff members in the said school, separately;

(ii) reasons for not filling those vacancies, though 17 vacancies for junior staff remain at the said school;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) date on which the building requirements of the said school will be fulfilled;

(iv) date on which the furniture shortage of the above-mentioned school will be addressed; and

(v) date on which the staff vacancies of the said school will be completely filled?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) එම පාසලේ ගුරු පුරප්පාඩු හා සේවක පුරප්පාඩු පවතින බව වාර්තා වී ඇති අතර, පවතින සම්පත් හිඟය අතුරින් ඩෙස්ක් හා පුටු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරනු ඇත.

කෙසේ වෙතත්, පසුගිය වසර 4ක අපොස (සා/පෙළ) හා අපොස (උ/පෙළ) විභාග ප්‍රතිඵල විශ්ලේෂණ හා පසුගිය වසර 3ක අදාළ පාසල් ගුණාත්මක අධ්‍යාපනය පිළිබඳ තහවුරුව සඳහා බාහිර ඇගැයීමේදී ලබා ගත් පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශක - SEQI - අනුව මෙම විද්‍යාලය අධ්‍යාපන කටයුතුවලදී පසුබෑමකට ලක්වී ඇති බවක් නිරීක්ෂණය නොවන නමුත්, ගුරු පුරප්පාඩු හිඟය නිසා පාසල් අධ්‍යාපන කටයුතු සඳහා බලපෑමක් එල්ල වී ඇති බව නිරීක්ෂණය වේ.

(iii) දැනටමත් සමස්ත පාසල් පද්ධතිය තුළම ගුරු, ඒකාබද්ධ සේවය හා ඒකාබද්ධ සේවා නොවන තනතුරුවල පුරප්පාඩු විශාල ප්‍රමාණයක් පවතින අතර, එම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරමින් පවතී. එමෙන්ම පාසල් සඳහා අවශ්‍ය ඩෙස්ක් හා පුටු ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කරන අතර, එම අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව ඉහත අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පාසලේ අධ්‍යාපන කටයුතු තවදුරටත් ඉහළ නැංවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ආ) (i) අධ්‍යයන කාර්ය මණ්ඩලය

| අධ්‍යයන කාර්ය මණ්ඩලය | අනුමත | සිටින | ඌන |
|---|---|---|---|
| 6-11 ශ්‍රේණි සඳහා | 57 | 40 | 17 |
| උසස් පෙළ ශ්‍රේණි සඳහා | 08 | 03 | 05 |

අනධ්‍යයන කාර්ය මණ්ඩලය

- පාසල් ආරක්ෂක තනතුරෙහි එක් සේවකයෙක් හා සේවා සහායක - සනීපාරක්ෂක තනතුරෙහි එක් සේවකයෙක් දැනට සේවය කරන අතර, අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති බව කිලිනොච්චිය කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් දන්වා ඇත.

- කෙසේ නමුත්, මෙම පාසල ජාතික පාසලක් බවට පත් කර ඇති බැවින් ඒකාබද්ධ සේවා, ඒකාබද්ධ සේවා නොවන අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් නිර්ණායක මත පදනම්ව සකස් කර අනුමත කර ගැනීම සඳහා අංක ED/05/67/17/18 හා 2025.11.02 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති අතර එය පහත පරිදි වේ.

ඒකාබද්ධ සේවා

| තනතුර | අනුමත කිරීමට ඉල්ලුම් කර ඇති තනතුරු සංඛ්‍යාව |
|---|---|
| සංවර්ධන නිලධාරි / කළමනාකරණ සේවා නිලධාරි | 01 |

ඒකාබද්ධ සේවා නොවන

| තනතුර | අනුමත කිරීමට ඉල්ලුම් කර ඇති තනතුරු සංඛ්‍යාව |
|---|---|
| සේවා සහායක | 01 |
| රසායනාගාර සහායක | 01 |
| තාක්ෂණ පීඨ සහායක | 01 |
| තාක්ෂණ පීඨ සහකාර | 01 |
| පාසල් ආරක්ෂක | 03 |
| සේවා සහායක - සනීපාරක්ෂක | 02 |

(ii) පළාත් පාසල් සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති බව කිලිනොච්චිය කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් දන්වා ඇති අතර, ඉහත (ආ) (i)හි සඳහන් අනුමැතින් ලද පසුව කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

(iii) මෙම පාසලේ එක් ගොඩනැගිල්ලක් ඉදිකරමින් පවතින අතර, එම ගොඩනැගිල්ලේ වැඩ 2026 වර්ෂය තුළ නිම කර භාවිතයට ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(iv) මෙම පාසලට අවශ්‍ය ඩෙස්ක් හා පුටු ප්‍රමාණය 2026 වසරේදී ලබා දීමට කටයුතු කරමින් පවතී.

(v) අධ්‍යයන කාර්ය මණ්ඩලය

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් හා අනෙකුත් උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අංක 2474/18 හා අංක 2474/19 දරන 2026.02.02 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන හා 2476/18 දරන හා 2026.02.18 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් අයදුම්පත් කැඳවීම මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව 2026 වර්ෂය තුළ බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

එමෙන්ම, 2022-2024 කණ්ඩායමේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම මත ජාතික හා පළාත් පාසල්හි පවතින ගුරු පුරප්පාඩු සඳහා 2027 වර්ෂයේ මුල් කාර්තුව තුළ ගුරු සේවයට බඳවා ගැනීමට හැකියාව ඇත. ඒ අනුව, කිලි/මුලංගාවිල් මහා විද්‍යාලයට අදාළව හඳුනාගෙන ඇති ගුරු පුරප්පාඩු සඳහා එකී බඳවා ගැනීම් තුළින් ගුරුවරුන් ලබාදීමට හැකියාවක් ඇත.

අනධ්‍යයන කාර්ය මණ්ඩලය

ඉහත (ආ) (ii)හි අනුමැතින් ලද පසුව කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -1831/2026- (1), ගරු කන්දසාමි ප්‍රභු මහතා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු කථානායකතුමනි, ගරු කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
# தனி அறிவித்தல் மூல வினா
# QUESTION BY PRIVATE NOTICE

## උතුරු පළාතේ ගවයින් විශාල ලෙස මිය යාම
## வடக்கு மாகாணத்தில் கால்நடைகளின் பாரிய இறப்பு
## LARGE-SCALE CATTLE DEATHS IN NORTHERN PROVINCE

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ், வடக்கு மாகாணத்தில் கால்நடைகளின் பாரிய இறப்பு குறித்து அவசர நடவடிக்கை எடுத்தல் தொடர்பில் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி! அண்மைய காலநிலைப் பேரழிவைத் தொடர்ந்து வடக்கு மாகாணத்தில், குறிப்பாக மன்னார், முல்லைத்தீவு, வவுனியா, கிளிநொச்சி மற்றும் யாழ்ப்பாண மாவட்டங்களில் ஏற்பட்டுள்ள பாரதூரமான நெருக்கடி நிலையை கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

நாடு பயிர்ச் சேதங்கள் குறித்துக் கவனம் செலுத்திவரும் இவ்வேளையில், எமது கால்நடை சார் விவசாயிகள்மீது ஒரு "மௌனப் பேரழிவு" தாக்கியுள்ளது. திடீர் வெப்பநிலை குறைவு மற்றும் தொடர்ச்சியான மழை காரணமாக, 48 மணி நேரத்துக்குள் ஆயிரக்கணக்கான கால்நடைகள் உயிரிழந் துள்ளன. இது வெறுமனே விலங்குகளின் இழப்பு மட்டுமல்ல, ஆயிரக்கணக்கான குடும்பங்களின் கிராமியப் பொருளா தாரத்தின் முழுமையான வீழ்ச்சியுமாகும்.

புள்ளிவிபரங்கள் மற்றும் பாதிப்புகள்:

- உயிரிழப்புகள்: ஆரம்பகட்ட அறிக்கையின்படி, வடக்கு மாகாணத்தில் ஆயிரக்கணக்கான மாடுகள், எருமைகள் மற்றும் ஆடுகள் உயிரிழந்துள்ளன.
- இறப்புக்கான காரணம்: சராசரி வெப்பநிலையைவிட கணிசமாகக் குறைந்த கடும் குளிர் மற்றும் மேய்ச்சல் நிலங்களில் இருந்து கால்நடைகளுக்குப் போதிய தங்குமிட வசதி இல்லாமையுமே இதற்குக் காரணமென கால்நடை மருத்துவ அறிக்கைகள் உறுதிப்படுத்துகின்றன.
- பொருளாதார இழப்பு: நீண்ட கால பால் உற்பத்தி இழப்பைத் தவிர்த்து, நேரடியாக கால்நடைகளின் பெறுமதி மட்டும் சுமார் 150 மில்லியன் ரூபாவுக்கும் அதிகமென மதிப்பிடப்பட்டுள்ளது.

இவற்றின் அடிப்படையில் பின்வரும் கேள்விகளை கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

1. உயிரிழந்த கால்நடைகள் குறித்து அமைச்சு முறையான கணக்கெடுப்பை நடத்தி, தெளிவான தொரு தரவுத் தொகுப்பை உருவாக்கியுள்ளதா?
2. வடக்கு மாகாணத்தில் பாதிக்கப்பட்டுள்ள மாடு மற்றும் எருமை உரிமையாளர்களுக்கும், கோழிப் பண்ணை யாளர்களுக்கும், அதேபோல் இதனுடன் தொடர்பு டைய பண்ணை உரிமையாளர்கள் மற்றும் விவசாயிகளுக்கும் அமைச்சு எவ்வளவு இழப்பீடு வழங்கியுள்ளது? தயவுசெய்து, விரிவான தகவல்களை வழங்குமாறு கேட்டுக்கொள்கின்றேன்.
3. ஏற்கனவே பொருளாதார நெருக்கடியில் இருந்து மீண்டுவரும் விவசாயிகளுக்கு, உயிரிழந்த ஒவ்வொரு கால்நடைக்கும் உடனடியாக இழப்பீட்டுத் தொகையை வழங்க அரசாங்கம் முன்வருமா?
4. பலவீனமான நிலையில் இருக்கும் எஞ்சிய கால்நடைகளுக்கு அவசர விற்றமின்கள் மற்றும் மருத்துவ சிகிச்சைகளை வழங்க கால்நடை உற்பத்தி மற்றும் சுகாதாரத் திணைக்களம் எடுத்துள்ள நடவடிக்கை என்ன?
5. இதுபோன்ற அனர்த்தங்களுக்கு உள்ளாகும் வடக்கு மேய்ச்சல் நிலங்களில் வானிலையைத் தாங்கக்கூடிய கால்நடைத் தொழுவங்களை அமைப்பதற்கு மானியங்களை வழங்க அரசாங்கம் நீண்ட காலத் திட்டமொன்றைக் கொண்டுள்ளதா?

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த விவசாயிகளே எமது குழந்தைகளின் பசியைத் தீர்க்கும் பாலை வழங்கு கிறார்கள். அவர்கள் தம்மால் கையாள முடியாத ஒரு காலநிலைப் பேரழிவால் மேலும் கடனாளிகளாக மாற நாம் அனுமதிக்க முடியாது. மேற்படி கேள்விகளுக்கு விரிவான பதிலை நான் கௌரவ அமைச்சரிடம் எதிர்பார்க்கின்றேன். நன்றி!

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු කථානායකතුමනි, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට ගරු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුර ලබා දෙනවා.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

1. ඔව්.

උතුරු පළාතේ එළගවයින් සහ මීගවයින් 14,235ක් මිය ගිහින් තිබෙනවා.

2. ජාතික අයවැය චක්‍රලේඛ අංක 08/2025(i)හි විධිවිධාන ප්‍රකාරව ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ විපතට පත් ගොවීන් වෙත වන්දි ගෙවීම සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙත රුපියල් මිලියන 900.49ක ප්‍රතිපාදන ලබා දී ඇත.

මේ වන විට එයින් රුපියල් මිලියන 258.85ක වන්දි මුදල් ආපදාවට ලක් වූ ගොවීන් වෙත ලබා දී ඇත. ඉතිරි ගොවීන්ට ලබා දීම සඳහා මුදල් වෙන් කර තිබෙනවා.

3. ජාතික අයවැය චක්‍රලේඛ 08/2025(i) හි විධිවිධාන ප්‍රකාරව, ආපදාවෙන් බලපෑමට ලක් වූ සත්ව පාලන ගොවිපළවල මිය ගිය සතුන් ගණන පදනම් කරගෙන ලියාපදිංචි ගොවිපළ හිමියන් වෙත පමණක් පහත පරිදි දීමනා ගෙවනු ලැබේ.

- දෙමුහුන් ගවයින් සඳහා මිය ගිය එක් සතෙකු සඳහා රුපියල් 200,000ක් බැගින් උපරිමය සතුන් 10ක් දක්වා උපරිම ගෙවීම රුපියල් 2,000,000කි.
- දේශීය ගවයින් සඳහා මිය ගිය එක් සතෙකු සඳහා රුපියල් 50,000 බැගින් උපරිමය සතුන් 20ක් දක්වා උපරිම ගෙවීම රුපියල් 1,000,000කි. එම මුදල් සතුන් සඳහා ගෙවා තිබෙනවා වාගේම ගෙවමින් පවතිනවා.

4. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ගෙන ඇති පියවර පහත පරිදි වේ.

- උතුරු පළාතේ සියලුම දිස්ත්‍රික්කවල බලපෑමට ලක් වූ සතුන්ගේ ප්‍රතිකාර සඳහා රුපියල් මිලියන 25ක් වටිනා ඖෂධ නොමිලේ ලබා දී ඇත.
- ආපදා සිදු වූ ප්‍රදේශවල ජංගම සායන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- පසුගිය වසරේ ඇති වූ "දිට්වා" සුළි කුණාටුව සහ ගංවතුර තත්ත්වය හේතුවෙන් ස්වාභාවික තෘණ භූමි සහ වගා කළ තෘණ භූමි විශාල ප්‍රමාණයක් විනාශ වී යාම හේතුවෙන් පෝෂණ අවදානමකට ලක් වූ උතුරු පළාතේ ගව සහ එළු ගොවිපළ 4,749ක් සඳහා රුපියල් ලක්ෂ 280ක් වටිනා සාන්ද්‍ර ආහාර කිලෝග්‍රෑම් 266,650ක් නොමිලේ ලබා දීලා තිබෙනවා.

| දිස්ත්‍රික්කය | ගොවිපළ සංඛ්‍යාව | සාන්ද්‍ර ආහාර ප්‍රමාණය (කිලෝග්‍රෑම්) |
|---|---|---|
| යාපනය | 1,600 | 75,000 |
| කිලිනොච්චිය | 837 | 45,000 |
| මුලතිව් | 764 | 50,000 |
| මන්නාරම | 1,009 | 53,650 |
| වවුනියාව | 539 | 43,000 |
| එකතුව | 4,749 | 266,650 |

5. වර්තමාන පශු සම්පත් ප්‍රතිපත්තිය සහ "Dairy Hub" කිරි නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ කිරි ගොවීන් හා සැපයුම්දාමයේ භාණ්ඩ හා සේවා සපයන අනෙකුත් ව්‍යවසායකයින් පශු වෛද්‍ය කාර්යාල කේන්ද්‍ර කරගනිමින් සංවිධානගත කිරීම -"Dairy Hubs" පිහිටුවීම - හා කිරි ගොවි ව්‍යවසායකයින් සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. මෙම ජාතික වැඩසටහන හඳුන්වා දීම තුළින් ඉදිරියේදී ඇති විය හැකි මෙවැනි ස්වාභාවික ව්‍යසනයන්හිදී එම සංවිධාන තුළින්ම තම සාමාජික ගොවීන් සඳහා සහන සැලසීම ඉදිරියේදී සිදු කරනු ලබනවා.

තවද, 2026 සහ 2027 වර්ෂයන්හිදී පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිවලදී පසුගිය දා ආපදාවට ලක් වූ ගොවීන්ට ප්‍රමුඛතාව ලබා දීමට තීරණය කරලා තිබෙනවා.

`මෙයට අමතරව "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් දේශීය කිරි ගව කර්මාන්තයට සිදු වූ හානිය යථා තත්ත්වයට පත් කිරීම උදෙසා ඉදිරි මාස 18ක කාලයක් තුළ ලෝක බැංකු ආධාර මත පහත දක්වා ඇති සවිස්තරාත්මක සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙම සැලැස්ම සඳහා රුපියල් මිලියන 2,500ක් ආයෝජනය කෙරේ. මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම මඟින් සුළි කුණාටුවට පෙර පැවති නිෂ්පාදන මට්ටම් යථා තත්ත්වයට පත් කිරීම පමණක් නොව, සුළි කුණාටුව මඟින් බලපෑමට ලක් වූ පළාත්වල වඩාත් ඵලදායී දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන සහ තිරසාර කිරි කර්මාන්තයක් මූලික වශයෙන් නැවත ගොඩනැඟීම අපේක්ෂා කෙරේ.

මෙම උපාය මාර්ගය එකිනෙක මත රඳා පවතින පහත දක්වා ඇති කුලුනු 05 යටතේ සංවිධානය කර ඇත.

i. ආහාර සහ පෝෂණය සැපයීම
ii. සත්ව සුබසාධනය සහ යහපැවැත්ම
iii. සත්ව සෞඛ්‍ය වැඩිදියුණු කිරීම
iv. ගොවිපළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ
v. සත්ව අභිජනනය වැඩිදියුණු කිරීම

මෙම ඒකාබද්ධ ප්‍රවේශය ගොවිපළ සතුන් සහ ගොවීන් සඳහා කඩිනම් සහනයක් ලබා දීම සහතික කරන අතරම, එය දිගුකාලීන ආංශික වර්ධනයක් සහ ආපදා සූදානමක් සඳහා අඩිතාලම දමයි.

ලෝක බැංකු ණය ආධාර යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ඒකාබද්ධ ග්‍රාම නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ලෝක බැංකු ව්‍යාපෘතියේ - IRDCRP - ස්වාභාවික විපත්වලින් පසු වේගවත් පුනරුත්ථාපනය සඳහා නිශ්චිතවම ස්ථාපිත කර ඇති මූල්‍ය යාන්ත්‍රණයක් වන හදිසි අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිචාර දැක්වීමේ සංරචකය - CERC - යටතේ මෙම සවිස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම විශේෂයෙන් නිර්මාණය කර ඇත.

මෙවැනි ස්වාභාවික ව්‍යසනයකදී ඉදිරියේදී සිදුවිය හැකි හානි අවම කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදා ඇත.

i. සතුන් සඳහා තාවකාලික සත්ව නිවාස වෙනුවට ස්ථිර සත්ව නිවාස ඉදිකිරීම ප්‍රවර්ධනය කිරීම.

ii. පොදු තෘණ භූමි භාවිත කරන ගොවීන් වැඩිදියුණු කළ තෘණ වගාව සඳහා උනන්දු කරවීම සහ අවශ්‍ය යෙදවුම් සහ ආධාර ලබා දීම තුළින් තෘණ ව්‍යවසායකයින් බිහි කිරීම.

iii. තෘණ සංරක්ෂණය සහ සයිලේජ් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.

iv. කිරි නිෂ්පාදනය වැඩිකර ගැනීමේ අරමුණින් වැඩි විභවතාවක් සහිත කිරි ගවයින් නිදැලි කළමනාකරණ ක්‍රමයේ සිට අර්ධ සූක්ෂම හා සූක්ෂම කළමනාකරණ ක්‍රම වෙත පරිවර්තනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

v. සත්ව ගොවිපළ කළමනාකරණය නිදැලි ක්‍රමයේ සිට අර්ධ සූක්ෂ්ම හෝ සූක්ෂ්ම ක්‍රමයට ක්‍රමානුකූලව පරිවර්තනය කිරීම.

vi. සියලු සත්ව ගොවිපළ ලියාපදිංචි කිරීම සහ සුදුසු රක්ෂණ ක්‍රමයක් සඳහා ගොවීන් යොමු කිරීම.

vii. සුළි කුණාටුවෙන් ආපදාවට පත් වූ ගොවීන් සඳහා රජයේ අරමුදල් මත ක්‍රියාත්මක වන සහන ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම.

ඒ ආදී වශයෙන් ක්‍රියාමාර්ග ගණනාවක් මේ වනකොට අරගෙන තිබෙනවා, අරගනිමින් තිබෙනවා කියන එක පිළිතුරක් වශයෙන් මම කියන්න කැමැතියි.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, விரிவான பதில்களை வழங்கியமைக்கு நன்றி!

பதிவுசெய்யப்படாத பண்ணையாளர்களுடைய பிரச்சினை என்பது, அவர்களுடைய தவறால் ஏற்பட்டதா அல்லது அதிகாரிகளுடைய தவறால் ஏற்பட்டதா என்று தெரியவில்லை. பதிவுசெய்யப்படாத பண்ணையாளர்களும் இதனால் கூடுதலாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அவர்களுக்கும் இந்த உதவித் தொகையை வழங்குவதற்கு அரசாங்கத்திடம் ஏதாவது திட்டம் இருக்கின்றதா? என அறிய விரும்புகிறேன்.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, දැනට ලියාපදිංචි කරන ලද ගොවීන් තමයි මෙහි නිර්ණායක විධියට අරගෙන තිබෙන්නේ. ලියාපදිංචි නොවුණු ගොවීන්ගේ තොරතුරුත් අපි අරගෙන තිබෙනවා. ඒ තොරතුරුත් අප ළඟ තිබෙනවා. ඒ පිළිබඳවත් අපි සාකච්ඡා කරමින් ඉන්නවා. ඒ ගොවීන් මෙහිදී ලියාපදිංචි නොවුණත් ඒ අයත් ගොවීන්. ඒ අයටත් කිරිගවයින් හිටියා. ඒ අයත් කිරි කර්මාන්තයේ යෙදෙනවා. ඊට අදාළ සාධක තිබෙන තත්ත්වයන් ඇතුළේ අපි ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා කියන එකත් මම මේ වෙලාවේ මතක් කරනවා. නිශ්චිතව, එකළුල්ලේම ඒකට අදාළව උත්තරයක් දෙන්න මේ වෙලාවේ මට අපහසුයි. දැන් ඒ පිළිබඳව සාකච්ඡා කරමින් පවතිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

## II

## රාජ්‍යය සම්බන්ධිත උල්ලංඝනයන් සම්බන්ධයෙන් යුක්තිය සහ වගවීම

அரசு தொடர்புடையதாகக் கூறப்படும் மீறல்களுக்கான பொறுப்புக்கூறலும் நீதியும்

JUSTICE AND ACCOUNTABILITY FOR ALLEGED STATE-CONNECTED VIOLATIONS

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මේ ප්‍රශ්නය මම ඉදිරිපත් කරනවා. දැන් සුරේෂ් සලේව අත්අඩංගුවට ගෙන තිබෙන වෙලාවේ මෙම ප්‍රශ්නයට උත්තර සොයා බැලීම ඔබතුමන්ලාගේ පරීක්ෂණවලට උදවු වෙයි කියලා මම හිතනවා.

Sri Lanka's war and its aftermath left behind many unresolved questions surrounding the fate of individuals who were killed or detained. Activists, civilians and alleged combatants alike were affected, and in many cases, the circumstances surrounding those events remain unclear and uninvestigated. Serious allegations of this nature have also been documented internationally.

The "Channel 4" broadcasts between 2011 and 2019, including the documentaries "Sri Lanka's Killing Fields" and "No Fire Zone", presented evidence of alleged war crimes and raised specific concerns about the conduct of State security forces.

I believe the latest dispatched one is being investigated under the Easter Sunday Attack in 2019, but the other incidents, we want to know if you are investigating.

At the same time, I would like to draw your attention to one such incident occurred in April, 2014 in Nedunkerni area of Vavuniya, where three individuals named Selvanayagam Kajeeban, Gopi, Sundaralingam Kajeeban, Thevigan, and Navaratnam Navaneethan, Appan, were reportedly killed in a military intelligence operation. All three were suspected to have had links with military intelligence and investigations are reportedly ongoing, is what the Government had said at the time.

These killings do not stand alone. They are allegedly connected to a broader pattern involving State-linked organizations, especially in the Eastern Province known as the "Islamic Centre" and the "Tripoli Platoon", which were said to have been created and armed with the support of military intelligence between 2004 and 2014. These incidents share a single thread, the alleged involvement of the State security apparatus and the persistent absence of accountability.

Before I go to my first question, என்னுடைய முதலாவது கேள்வியைக் கேட்பதற்கு முன்னர், கௌரவ அமைச்சர் அவர்களின் கவனத்துக்கு ஒரு விடயத்தைக் கொண்டு வருகின்றேன். அதாவது, இந்த மூன்று பேரும் 2014ஆம் ஆண்டு வவுனியாவில் ஒரு தமிழ் அரசியல்வாதியின் பின்னணியில் காட்டிக்கொடுக்கப்பட்டு, இராணுவப் புலனாய்வுப் பிரிவினரால் கொல்லப்பட்டதாகச் சொல்கின்றார்கள். இந்தக் காட்டிக்கொடுப்பைச் செய்த இராணுவ அதிகாரியும்

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

கொல்லப்பட்டதாகச் சொல்கின்றார்கள். அதேபோல், ருகீ பர்னாந்து போன்ற சிவில் சமூகத்தைச் சேர்ந்தவர்களையும் கைதுசெய்து இருக்கின்றார்கள். அதுமாத்திரமன்றி, கிளிநொச்சியைச் சேர்ந்த ஒரு பெண்மணியையும் இது சம்பந்தமாகக் கைதுசெய்து இருக்கிறார்கள். கௌரவ அமைச்சர் அவர்களே, இதோ என்னுடைய கையில் இருப்பது தான் அவர்களுடைய புகைப்படம். இவற்றை உங்களின் கவனத்துக்குத் தருகின்றேன்.

1. What is the current status of the investigations into the deaths of these three individuals? Which authority is conducting the investigations and what findings have been reached so far?
2. Did the Government supply arms to the "Islamic Centre" and the "Tripoli Platoon"? Were such weapons recovered and do official records exist? If so, could those records be tabled in Parliament?

ගරු ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය අහන්නේ මේ නිසායි. දැන් සුරේෂ් සලේ අත්අඩංගුවේ පසු වනවා. සුරේෂ් සලේ නැඟෙනහිර පළාතේ සේවය කළ පුද්ගලයෙක්, රාජ්‍ය බුද්ධි අංශයේ. මා ළඟ ලැයිස්තුවක් තිබෙනවා. මම ඔබතුමාට පෞද්ගලිකව ඒ ලැයිස්තුව එවන්නම්. ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ලබා දුන් උත්තරයේ බලන්න, ලබා දුන් weapons ප්‍රමාණය සහ භාර දුන් weapons ප්‍රමාණය පිළිබඳව. ගරු ඇමතිතුමනි, ඊට අමතරව මම මේ photos ටික ඔබතුමාට දෙන්නම්. දැනට මඩකලපුව දිස්ත්‍රික්කයේ එහෙන් මෙහෙන් weapons හමු වෙනවා. ඔබතුමාත් ඒ බව දකින්න ඇති. එහිදී පිස්තෝලයක් හමු වුණා; මෝටාර් හමු වුණා; තවත් පිස්තෝලයක් හමු වුණා. මේ, පසුගිය අවුරුද්ද ඇතුළත හමු වුණු ඒවා. මේගොල්ලන්ම අරගෙන තියපු ඒවා මේගොල්ලන්ම අරගෙන දෙනවා, "අපට හමු වුණා" කියලා. මේ ඡායාරූපයේ ඉන්නේ මේක පිටුපස ඉන්න පුද්ගලයන්. මේ photos ටිකත් මම ඔබතුමාට එවන්නම්. මේ ප්‍රශ්න ටික තමයි මම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්නේ. මේ ප්‍රශ්නයට ඔබතුමන්ලා උත්තරය හොයා ගත්තොත් ඒක දැනට කරගෙන යන පරීක්ෂණවලට උදවු වෙයි. මොකද, මේවා 2004 අවුරුද්දේ ඉඳන් පැවත ආපු බුද්ධි අංශ ක්‍රියාකාරකම්.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයේ කොටසක් ආරක්ෂක අමාත්‍යාංශයටත් අදාළයි. ඒ නිසා මේ පිළිබඳව පිළිතුරක් හෙට දිනයේදී ලබා දීමට බලාපොරොත්තු වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන. 2025.11.18වන දින ගරු රවී කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම. ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය, ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

පිළිතුර සපයන්නද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා අද සභාවේ නැහැ නේ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

පිළිතුර සභාගත කරන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

එතුමා ඒ ප්‍රශ්නය දැනටමත් ඉදිරිපත් කර තිබෙන්නේ, අහලා තිබෙන්නේ. ඇත්තවශයෙන්ම මෙතුමා ඒ පිළිතුර කියවන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ඒකට ඒ ප්‍රශ්නය අහපු මන්ත්‍රීවරයා සභා ගර්භයේ ඉන්න අවශ්‍ය නැහැ.

## කොළඹ ආරක්ෂක සමුළුව මඟින් සපයන අවස්ථාවන් සැලසුම්සහගතව භාවිත කිරීම: ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## கொழும்பு பாதுகாப்பு மாநாடுமூலம் வழங்கப்பட்ட வாய்ப்புகளைத் திட்டமிட்டபடி பயன்படுத்தல்: பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று
## PROACTIVE UTILIZATION OF OPPORTUNITIES PROVIDED BY COLOMBO SECURITY CONCLAVE: STATEMENT BY DEPUTY MINISTER OF DEFENCE

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

Hon. Speaker, on behalf of the Minister of Defence, I answer the Question raised by the Hon. Ravi Karunanayake under Standing Order No. 27(2) on 18th November, 2025, which contains eight parts.

Sir, I wish to make a brief statement to this esteemed House on the engagement of Sri Lanka with the Colombo Security Conclave, outlining its background, evolution, current institutional arrangements, operational engagements and the present position of the Government with regard to the Secretariat and future cooperation.

Sir, the Colombo Security Conclave is a regional security cooperation framework among Indian Ocean littoral States originated in 2011 as a trilateral maritime security cooperation mechanism among Sri Lanka, India and the Maldives. The primary objective of this arrangement was to enhance maritime safety and security, information sharing and operational coordination in addressing common non-traditional security threats in the region.

In recognition of the evolving security environment and the increasing inter-linkages between maritime security, terrorism, cyber threats, transnational organized crime and disaster response, the mechanism was renamed and formalized as the Colombo Security Conclave in November, 2020. Over time, the scope of cooperation was expanded and structured around five agreed pillars, namely,

- Maritime Safety and Security
- Countering Terrorism and Radicalization
- Combating Trafficking and Transnational Organised Crime
- Cyber Security, Protection of Critical Infrastructure and Technology
- Humanitarian Assistance and Disaster Relief

Sir, the Colombo Security Conclave currently comprises India, Sri Lanka, the Maldives and Mauritius as members. Bangladesh participates as a member-designate, while the Seychelles was an observer. The 7th National Security Advisers' Meeting of Colombo Security Conclave held in New Delhi on 20th November, 2025 approved the Seychelles as a full member.

The Colombo Security Conclave is a non-military alliance which functions on the principles of sovereign equality, mutual respect, consensus and non-interference, with a clear focus on addressing shared regional security challenges.

Since its inception, the Colombo Security Conclave has convened six National Security Adviser-level meetings and eight Deputy National Security Adviser-level meetings, with hosting responsibilities rotating among member States. The decisions taken at the National Security Adviser-level are implemented through Joint Annual Action Plans prepared under each pillar and coordinated through the meetings of the National Lead Coordinators.

In institutional terms, it was decided that the Colombo Security Conclave Secretariat will be established in Colombo and accordingly, a Secretariat has been temporarily established at the Sri Lanka Navy Headquarters, and two officers of the Sri Lanka Navy are presently functioning at this Secretariat. Sri Lanka has also designated senior officers from relevant Ministries and agencies as pillar coordinators, who plan and conduct activities and awareness programmes with the participation of other member States.

In August, 2024, Sri Lanka signed both the Colombo Security Conclave Charter and the Memorandum of Understanding on the Establishment of the Colombo Security Conclave Secretariat, thereby formally endorsing the institutional framework of the Conclave. However, the Headquarters Agreement, which governs matters relating to premises, privileges and administrative arrangements, has not yet been signed. That Agreement is currently under review, and Sri Lanka proposed minor amendments during the 7th National Security Adviser-level meeting held in New Delhi in November, 2025.

With regard to the location of the permanent Secretariat, while the previous Government had identified the BMICH premises, the present Government has not endorsed that option due to the high recurrent rental costs involved. The current position of the Government is to identify either a Government-owned facility that can be provided free of charge or a more cost-effective alternative location, ensuring fiscal responsibility and sustainability.

In operational terms, Sri Lanka actively engages in Colombo Security Conclave-related cooperation and information sharing. By way of example, the Sri Lanka Navy maintains close coordination with the Indian Navy on issues such as narcotics trafficking, human smuggling, illegal fishing and other forms of transnational organized crimes. In November, 2024, information shared by Sri Lanka regarding a suspected drug-trafficking fishing vessel led to the interception of the vessel by the Indian Navy and its subsequent handover to Sri Lanka for legal action, demonstrating the practical value of such cooperation.

Sri Lanka has also participated in and contributed to a wide range of Colombo Security Conclave-related exercises, workshops, and training programmes. These activities are undertaken in accordance with the Joint Annual Action Plans agreed under the Colombo Security Conclave framework.

National Lead Coordinators' Meetings are conducted periodically by the Colombo Security Conclave Secretariat and Sri Lanka is represented at those meetings by the Additional Secretary, Defence of the Ministry of Defence. The Sri Lankan delegation for the 7th National Security Adviser-level meeting hosted by India in November, 2025 was led by the Secretary to the Ministry of Defence. The next Deputy National Security Adviser-level Meeting is scheduled to be held in virtual format in 2026, and the 8th National Security Adviser-level Meeting will be hosted by the Maldives in late 2026.

It is also pertinent to note that no separate national strategy has been formulated exclusively for the Colombo Security Conclave. Instead, Sri Lanka's engagement is guided by the jointly agreed Colombo Security Conclave

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

Action Plans, which cover counter-terrorism, cyber security, humanitarian assistance, disaster relief and other shared priorities.

With regard to governance arrangements, as agreed by member States, the first Secretary-General of the Colombo Security Conclave has been nominated by India. After that, the post of the Secretary-General will be rotated among member States in alphabetical order in accordance with the Memorandum of Understanding. There is no provision at present for a Deputy Secretary-General, though Sri Lanka has proposed the creation of such a post to be permanently held by a Sri Lankan during recent discussions in view of the Secretariat being established in Colombo. Each member State is, however, required to appoint a Director to assist the Secretary-General.

On matters relating to privileges, visas and facilities for foreign officials, no specific decisions have been taken pending the finalization of the Headquarters Agreement.

Sir, in conclusion, the engagement of Sri Lanka with the Colombo Security Conclave remains pragmatic, transparent and firmly aligned with national interests. The Government is committed to regional security cooperation while, at the same time, ensuring fiscal discipline, legal clarity and respect for national sovereignty as the Colombo Security Conclave continues to evolve.
Thank you, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා විශේෂ ප්‍රකාශයක් කරන්නට අවස්ථාව ලබා දීම ගැන.

ගාල්ල වරාය ආසන්න මුහුදු සීමාවේ ඉන්දියන් සාගරය තුළ, - අපි අනුමාන කර තිබෙනවා නාවික සැතපුම් 40ක්, 44ක් කියලා. එහි නිශ්චිතභාවය රජය තහවුරු කරන්නට ඕනෑ - ඉරාන නාවික හමුදාවට අයත් "IRIS Dena" නෞකාවට විදේශ රාජ්‍යයක මැදිහත්වීමක් හරහා ප්‍රහාරයක් එල්ල වී මුහුදුබත් වූ බව ජාත්‍යන්තර මාධ්‍ය හරහා අනාවරණය වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා නාවික හමුදාව ජීවිත බේරා ගැනීමේ මෙහෙයුමක් සිදු කර තිබෙනවා. ඒ පිළිබඳව අපේ ප්‍රශංසාව පුද කරනවා. මෙම ප්‍රහාරය සිදු වූ නිශ්චිත ස්ථානය හෝ එය අප මුහුදු සීමාවට හෝ අනන්‍ය ආර්ථික කලාපයට සම්බන්ධද යන්න පිළිබඳ සහ රජය ගත් රාජ්‍ය තාන්ත්‍රික ආරක්ෂක පියවර පිළිබඳව මෙතෙක් නිල ප්‍රකාශයක් ඉදිරිපත් කර නැහැ.

මම පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ විශේෂයෙන්ම මේ ජාත්‍යන්තර නීතිය ගැන. ඒක, United Nations Convention on the Law of the Sea - UNCLOS.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මට ලබා දී තිබෙන ලේඛනය කියවන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායතුමනි, මේක වැදගත් කාරණයක්, මට මේක පැහැදිලි කරන්න ඉඩ දෙන්න. මම කථා කරන්නේ ජාත්‍යන්තර නීතිය ගැන.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, මේ ලිපිය මට ලබා දුන්නාට පස්සේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මම දැනුම් දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි. මට අවස්ථාව ලබා දෙන්න, මේක බරපතළ ප්‍රශ්නයක්.

එක්සත් ජාතීන්ගේ United Nations Convention on the Law of the Sea - UNCLOS - කියන ඒ ජාත්‍යන්තර නීතියේ Article 56හි "Rights, jurisdiction and duties of the coastal State in the exclusive economic zone", Article 58හි "Rights and duties of other States in the exclusive economic zone" සහ Article 88හි "Reservation of the high seas for peaceful purposes", ඒ කියන්නේ සාමකාමී අරමුණු, පිළිබඳ සඳහන් වෙනවා. ඒ ජාත්‍යන්තර නීතිය තුළ due regard කියන principle එක ලෝකයම පිළිගත් ජාත්‍යන්තර සිද්ධාන්තයක්, ගරු කථානායකතුමනි. ඒ වාගේම 1994 San Remo Manual on International Law සහ ජාත්‍යන්තර මානව නීතිය කියන මේ සියල්ලත් මෙයට අදාළ වෙනවා. ජාත්‍යන්තර මානව නීතියේ 44වැනි රීතිය, ඒ වාගේම San Remo Manual on International Law එකේ 34වැනි ඡේදයට අනුව මේ due regard කියන principle එක අනුගමනය කරලා තමයි රටවල් ඒ ඒ මුහුදු සීමාවල කටයුතු කරන්නේ. එහිදී continental shelf එක වේවා, territorial sea වේවා, අනන්‍ය ආර්ථික කලාපය වේවා, රටක මුහුදු සීමාවන් තුළ කටයුතු කරන්න අවශ්‍ය ජාත්‍යන්තර නීතිය තමයි වඩාත් පැහැදිලි කිරීමක් හැටියට මම ඒ පැහැදිලි කළේ.

එතකොට, අපේ රටේ ස්වෛරීභාවය, ඒකීයභාවය සහ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීම රජයේ වාගේම පාර්ලිමේන්තුවේත් වගකීමක් සහ යුතුකමක්. එවන් සංවේදී ජාත්‍යන්තර යුද සිදුවීමක් අප රට ආසන්නයේ සිදුව තිබියදී මේ සභාව දැනුවත් නොකිරීම මන්ත්‍රීවරුන්ගේ ව්‍යවස්ථානුකූල වගකීම් ඉටු කිරීමට බාධාවක් හැටියට අපට සලකන්න සිද්ධ වෙනවා. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ - United Nations Charter එකේ - Article 2(1)වලට අනුව සියලුම රාජ්‍යයන්ගේ ස්වාධීනත්වය සහ සමානාත්මතාව සෑම රටක් විසින්ම පිළිගන්නට ඕනෑ. එසේම, මම පෙර සඳහන් කරපු ආකාරයට මෙවැනි අවස්ථාවලදී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතියේ 19 සහ 20වැනි වගන්ති යටතේ දක්වා ඇති අතර, ඒ අනුව යුද අභ්‍යාසවල නිරත වීම, දේශීය ජල තීරයේ සබ්මැරීන් ගමන් කිරීම සම්බන්ධයෙන් වන එකඟතාවන් දක්වලා තිබෙනවා. හැබැයි, මේ සම්මුතීන්ට අත්සන් තැබූ රටක් හැටියට අපේ රටේ රජයත් මේ සිද්ධිය පිළිබඳව රට වෙනුවෙන් විශේෂ ප්‍රකාශයක් කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම මේ කාරණය කියන්න කැමැතියි. CNN, BBC, Al Jazeera කියන ජාත්‍යන්තර මාධ්‍යවල ප්‍රකාශයක් කළා, අපේ රටේ ආරක්ෂක අමාත්‍යාංශය - ඒ sourcesවලින් - දැනුම් දුන්නාය කියලා, සබ්මැරීනයකින් torpedo attack එකක් වුණා කියලා. අපේ ආරක්ෂක අමාත්‍යාංශයේ තොරතුරු උපුටා දක්වමින් ජාත්‍යන්තර මාධ්‍ය එසේ කියනකොට, අපේ රටේ ආරක්ෂක අමාත්‍යාංශය කියනවා, "නැහැ, එහෙම torpedo attack එකක් වුණේ නැහැ" කියලා. ඊට පස්සේ ඇමෙරිකානු,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අවසන් කරන්න නොවෙයි, මේක වැදගත් කාරණාවක්, ගරු කථානායකතුමනි.

ඇමෙරිකාවේ ආරක්ෂක ලේකම්, පීට් හෙග්සෙත් මහත්මයා ප්‍රකාශ කරනවා, "ඔව්, අපේ සබ්මැරීනයකින් ටෝපිඩෝ ප්‍රහාරයක් එල්ල කළා" කියලා. එම නිසා මේ ප්‍රශ්නය පිළිබඳව රජය විශේෂිත වූ නිල ප්‍රකාශයක් කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, ඊට අමතරව මම කියන්න කැමැතියි, ගාල්ලට මෘත ශරීර විශාල ප්‍රමාණයක් ගෙනැත් තිබෙන බව. ඒ වෛද්‍ය අංශ ඉල්ලීමක් කරනවා, ඒ මෘත ශරීර තැන්පත් කරන්නට අඩි 40 container අවශ්‍යයි කියලා. ඒ මෘත ශරීර තැන්පත් කිරීම සඳහා අවශ්‍ය cooler containers ලබා දීම ක්‍රියාත්මක කරන්න කියලා මම රජයෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තවත් කාරණාවක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේකත් වැදගත්. අපේ රටේ මුහුදු සීමාවේ - territorial sea එකේ - කොළඹ වරායට තදාසන්නව තවත් ඉරාන නැවක් තිබෙනවා කියලා කාරණාවක් තිබෙනවා. ඒ පිළිබඳව අපට පැහැදිලි ප්‍රකාශයක් අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විශේෂයෙන්ම ටෝපිඩෝ ප්‍රහාරයට ලක් වුණු ඒ නැව පිළිබඳවත්, ඒක කොතැනද සිද්ධ වුණේ, අපේ රටේ මුහුදු සීමාවෙන් නාවික සැතපුම් කීයක් දුරින්ද යන කාරණා ගැන පැහැදිලි කිරීමක් අවශ්‍යයි. ඒ වාගේම, මෙහෙම දෙයක් වුණා කියලා ජාත්‍යන්තර මාධ්‍ය කියන කොට, අපේ රටේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් කියනවා එහෙම වුණේ නැහැ කියලා. ගරු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාත් මේ ගරු සභාවේ ඉන්න මොහොතේ මම මේ කාරණය අහන්න කැමැතියි. ඔබතුමා දන්නවා නේ, guided missile submarines තිබෙනවා; attack submarines තිබෙනවා; ඒ වාගේම Ballistic missile submarines තිබෙනවා. ඔබතුමාම කිව්වා, මේසයකුයි, බංකුවකුයි අරගෙන එන්න, ජාතික ආරක්ෂාව පිළිබඳ විග්‍රහයක් දෙන්නම් කියලා. හැබැයි, අපේ රටේ මුහුදු සීමාවේත්, අපේ රටේ අනන්‍ය ආර්ථික කලාපයේත් සිදු වන දේවල් වර්තමාන රජය දන්නේ නැහැ. ඒ වාගේම, මේ සභාවටත්, රටේ ජනතාවටත් දැන ගන්න කරුණාකරලා ප්‍රකාශයක් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධවම දෙයක් කියන්න මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්, ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක්. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණාව තමයි කථා කළේ.

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.*[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපිට මතු කරන්න දෙන්න. ඊට පස්සේ එතුමාට පුළුවන් ඒ ගැන කථා කරන්න. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, එතුමා උත්තරයක් දෙයි ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. *[බාධා කිරීමක්]* දැන් ගරු විපක්ෂ නායකතුමා කථා කළා නේ. ඒ හොඳටම ඇති.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපිට මන්ත්‍රීවරු විධියට අයිතියක් තිබෙනවා, මොකක්ද මේ කරන්නේ? *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාගේ අවස්ථාව.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපිට කථා කරන්න දෙන්න.*[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් පිළිතුරක් ඕනෑ නම් මම ඉදිරිපත් කරන්නම්.*[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට mike එක දෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඉස්සෙල්ලාම ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. ඔබතුමා අපට කථා කරන්න ඉඩක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එක කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Point of Order එකක් කියන්නේ? වැදගත් ප්‍රශ්නයක් ගැන කථා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වැදගත් ප්‍රශ්නයක් තමයි මේ,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 92(2) යටතේ කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද කියන්නේ?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක කියවලා එන්න ආපහු. මම ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම ගැන. වෙනත් කාරණයක් නිසා නොව, මේ සම්බන්ධව මුළු රටම කථා වන වෙලාවක් නිසයි මටත් මේ ගැන කථා කරන්න වුවමනා කළේ. දැනට ලැබිලා තිබෙන තොරතුරු එක්ක අපි සියලු දෙනාම දන්නවා, ඉන්දියාව සමඟ පැවැති යම් යුද අභ්‍යාසයක ප්‍රතිඵලයක් විධියට නැව් දෙකකට වැඩි ප්‍රමාණයක් ඇවිත් තිබෙනවා කියලා. හැබැයි, මම කියන්න කැමැතියි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේ සභාවේ ක්‍රමවේදය අනුගමනය කිරීම සම්බන්ධ ගැටලුවක් නොවෙයි-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කලබල කරන්නේ නැතිව පොඩ්ඩක් ඉන්නකෝ, ගරු කථානායකතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.*[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමා, කථා කරන්න දෙන්නකෝ. කථා කරන්න දෙන්න අපට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණයේ point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අහගෙන ඉන්නවා නම්, ඔබතුමා පොඩි වෙලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න ඉතින්. ඔබතුමාට අවස්ථාව දීලා තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක තමයි. කියන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Mike එක දීලා තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බාධා කරන්න එපා.

මේ තත්ත්වය තුළ රටක් විධියට අපි විශාල අර්බුද ගණනාවකට මුහුණ දී තිබෙනවා. 1971දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ United Nations Declaration එකට අනුව ඉන්දියානු සාගරය සාම කලාපයක් විධියට පිළිගන්නවා කියලා අපි එකඟතාවකට ආවා. හැබැයි, අද වන කොට අපි විශාල අර්බුදයකට ලක් වෙලා සිටිනවා. ඔබතුමන්ලා, අපි සියලු දෙනා දන්නවා, ලංකාවේ විශාල මුස්ලිම් ප්‍රජාවක් ඉන්න බව. අපට විශාල කලකිරීමක් තිබෙනවා, ඉරානයේ ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන. ඉරානයට පහර දීම සම්බන්ධව මේ ආණ්ඩුව අද වනතුරු කිසිම ප්‍රකාශයක්, හෙළා දැකීමක් සිද්ධ කරලා නැහැ. අපි අහන්න කැමැතියි, ඇමෙරිකා එක්සත් ජනපදය ගෙන යන මේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ කියලා. අපි තවත් අමාරුවක වට්ටන්නද මේ හදන්නේ? ඔබතුමන්ලා ඉන්දියාවත් සමඟ අත්සන් කරපු, ඇමෙරිකාවත් සමඟ අත්සන් කරපු ගිවිසුම් සම්බන්ධයෙන් ඇත්ත තත්ත්වය මොකක්ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි,-

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමා, එහෙම අවස්ථාව දෙනවා නම් අපිටත් ඕනෑ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අන්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇත්ත අයිතිකාරයෝ. *[බාධා කිරීමක්]* එතුමා ඇත්ත පක්ෂ නායකයෙක්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ; ජාතික සංවිධායක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට අවස්ථාව දීලා තිබෙන්නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මේක ලංකාවට දෙන්න ආපු පරිප්පුවක්; අපේ රටට දෙන්න ආපු පරිප්පුවක්. එතැනදී වුණේ මොකක්ද? ඒ නැව් ඉන්දියාවේ යුද අභ්‍යාසයකට 18වැනි දා තමයි ඉන්දියාවට ආවේ. විශාකාපට්නම්වල තමයි ඒ යුද අභ්‍යාසය තිබුණේ. ලෝකයේ රටවල් ඔක්කොම වාගේ ඒකට ආවා. හැබැයි, මේක අපව පටලන්න, අපේ රට පටලන්න කරපු කැත වැඩක්. යුද අභ්‍යාසයකට එන්න කියලා, ඒ මිනිස්සුන්ට තම රටට ආරාධනා කරලා ඒ මිනිස්සු ගෙන්නුවා. යුද අභ්‍යාසය ඉවර වෙලා අනෙක් රටවල මිනිස්සු එළියට යනකොට ඒ මිනිස්සු කොහේට යන්නද? තම රටට ආරාධනා කරලා ගෙන්වපු ඒ මිනිස්සු එළියට දැම්ම හින්දා තමයි ඒ නැව ඔය කියන පැත්තෙන් අපේ රට පැත්තට ඇදුණේ. මේක මහා කැත වැඩක්. අපි පොඩි රටක් වුණත් එහෙම කැත වැඩ කරන්න බැහැ. ඒ මිනිස්සු ගෙනැල්ලා මැරුවා වාගේ වැඩක් තමයි මේ කළේ. මේක හරිම අසාධාරණ වැඩක්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දැන් උත්තරයක් දෙන්න යන හින්දා මේ ගැන නිරවුල් කර ගන්නයි මම මේ කාරණය අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණය point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මීට පෙර කිව්වා වාගේම, ඉන්දියාවේ යුද අභ්‍යාසයක් තිබුණා. ඒකට රටවල් 74ක් සහභාගි වෙලා තිබෙනවා. අපේ ලංකාවේ තිබෙන "නන්දිමිත්‍ර" කියන නැවත් එම යුද අභ්‍යාසයට සහභාගි වුණා. නැව් 42ක් සහභාගි වෙලා තිබෙනවා, අහස්යානා 29ක් සහභාගි වෙලා තිබෙනවා, එම යුද අභ්‍යාසයට. එම යුද අභ්‍යාසය අවසන් වෙලා මේ කියන නැව ආපසු ඉරානයට පිටත් වෙන්න ආවා, ඉන්දියාවේ දැනුම් දීමත් එක්ක. නමුත් අපි දන්නවා, ඇමෙරිකානු යුද නැව් ගල්ෆ් කලාපයේ තිබෙන බව. ඒ නිසා ඉරානයේ නැවට ඉරානයට යන්න බැහැ. එසේ යන්න බැරි හින්දා තමයි ඒගොල්ලෝ ඒ නැව හරවාගෙන ඇවිත් ගාල්ල වරායට නාවික සැතපුම් 40ක වාගේ දුරකින් පැය 11ක් තිස්සේ තියාගෙන හිටියේ. ඒගොල්ලන් ලංකා ආණ්ඩුවෙන් අවසර ඉල්ලුවා, ඒ නැවට ගාලු වරායට එන්න දෙන්න කියලා. ගමන් කරමින් තිබියදී නොවෙයි එම නැවට පහර දුන්නේ. නැව තිබුණේ මුහුද මැද නවත්වාගෙන. මොකද, ඒගොල්ලන්ට යන්න බැහැ, ඉරානයට. ඒගොල්ලන්ට ඉරානයට යන්න බැරි, ඉරානය අවට මුහුදේ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි. ඒ නැවට ඉරානයට යන්න බැරි වුණේ මොකද? එම කලාපයේම යුද්ධය පවතින නිසා ඒ නැවට යන්න බැහැ. ඒ නිසා ඒගොල්ලෝ ගාලු වරායට එන්න අපේ ආණ්ඩුවෙන් අවසර ඉල්ලා පැය 11ක් නැව නවත්වාගෙන හිටියා. නමුත් ආණ්ඩුව පැය 11ක් තිස්සේ ඒකට උත්තරයක් දුන්නේ නැහැ. ඒ පැය 11ක කාලය ගත වුණාට පසුව මේ තොරතුර කොහොම හරි ඇමෙරිකානු හමුදාවට ගියා. මේ තොරතුර ලැබුණාට පසුව තමයි ඒගොල්ලෝ ක්‍රියාත්මක වුණේ. ඒගොල්ලන්ගේ සබ්මැරීන් එක මේ අවට තිබුණේ නැහැ. ඒ සබ්මැරීන් එක තිබුණේ ගල්ෆ් කලාපයේ. එය ගල්ෆ් කලාපයේ ඉඳලා මෙහේට ආවා, ඒ නැවට පහර දෙන්න.

ගරු ඇමතිතුමනි, පැය 11ක් තිස්සේ ඒ නැව එහෙම නවත්වාගෙන ඉන්න ඉඩ දුන්නේ ඇයි? ජාත්‍යන්තර නීතිය අනුව අපි ඉන්දියාවත් එක්ක -ඉන්දිරා ගාන්ධි මැතිනිය එක්ක- ඉන්දියානු සාගරය සාම කලාපයක් ලෙස සලකමින් අත්සන් කළ ගිවිසුම් තිබෙනවා. ගිවිසුම් රාශියක් තිබෙනවා. මෙතැනදී ගරු විපක්ෂ නායකතුමාත්, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් ඒ ගැන කිව්වා. අපි එහෙම ජාත්‍යන්තර ප්‍රඥප්තිවලට අත්සන් කර තිබියදීත්, ගාලු වරායට එන්න එම නැවට ඉඩ නොදුන්නේ ඇයි කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අපි කවුරුත් දන්නවා, මැදපෙරදිග කලාපයේ යම් ආකාරයක දරුණු යුද්මය තත්ත්වයක් වර්ධනය වෙමින් පවතින බව. ඒ නිසා මේ වෙලාව, රටක් හැටියට පාර්ලිමේන්තුව හෝ එළියේ මාධ්‍ය හෝ උපයෝගී කරගෙන විහිළු කරන්නවත්, ආණ්ඩුවත් එක්ක තිබෙන දේශපාලන කෝන්තර පිරිමහන්නවත්, එහෙම නැත්නම් තමන් මේ වෙනුවෙන් මොකක් හෝ ප්‍රකාශයක් කළා කියන්නවත්, එහෙමත් නැත්නම් තවත් ජන කොටසක් කුපිත කරවන, ප්‍රකෝප කරවන ප්‍රකාශ කරන්නවත්, අසත්‍ය තොරතුරු, අර්ධ සත්‍ය තොරතුරු, වැරදි තොරතුරු මත පදනම් වෙලා එක එක හිතලු කියන්නවත් වෙලාවක් නොවෙයි.

මම හිතනවා, හැම දේශපාලන පක්ෂ නායකයෙක්ම, හැම මන්ත්‍රීවරයෙක්ම, හැම මහජන නියෝජිතයෙක්ම මෙවැනි ලෝක පරිමාණයේ තත්ත්වයකදී; ඇත්තටම ගත්තොත්, අපේ පාලනයට ඔබ්බෙන් පවතින මෙවැනි වාතාවරණයකදී ඉතා වගකීම් සහගත ප්‍රකාශ සිදු කළ යුතුයි කියලා.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, අපට අපේ baseline එකේ ඉඳලා නාවික සැතපුම් 12ක ජාතික ජල තීරයක් තිබෙන බව. ඒක අපට අයිති, අපේ නීති ක්‍රියාත්මක වන, අපට අවශ්‍ය තීන්දු ගන්න පුළුවන් නාවික සැතපුම් 12කින් යුත් ජල තීරයක්. ඒ නාවික සැතපුම් 12 ඉඳලා 200 දක්වා ප්‍රමාණයේ තිබෙන්නේ අනන්‍ය ආර්ථික කලාපයයි. ඒ කියන්නේ, Exclusive Economic Zone එක. මේ කලාපය තුළ ජාත්‍යන්තර ප්‍රඥප්ති, නීති ක්‍රියාත්මක වෙනවා. අපට ඒ කලාපය තුළ ආර්ථික කටයුතුවලට තමයි බලය තිබෙන්නේ. එහෙම නැතුව යුද්මය කටයුතු ආදි දේවලට නොවෙයි. මොකද, freedom of navigation අනුව මේ අනන්‍ය ආර්ථික කලාපය තුළ - Exclusive Economic Zone එක ඇතුළේ - ඕනෑම රටකට ගමනාගමනයේ යෙදෙන්න පුළුවන්කමක්, කටයුතු කරන්න පුළුවන්කමක් තිබෙනවා.

මේ කියන සිදුවීම වුණේ ගාලු වරායේ ඉඳලා නාවික සැතපුම් 19ක දුර සීමාවේ. මේ සිදුවීම සම්බන්ධයෙන් ඊයේ උදෑසන 5.08ට නාවික හමුදාවට අයිති Maritime Rescue Coordinating Centre - MRCC - එකට තමයි ඉස්සෙල්ලාම පණිවුඩයක් ලැබෙන්නේ. ඒ පණිවුඩය ලැබෙන්නේ ප්‍රහාරයක් එල්ල කළාද, නැද්ද කියන එක ගැන නොවෙයි. ඒ මුහුදු කලාපය තුළ යම් මෘත ශරීර ප්‍රමාණයක් පාවෙමින් තිබෙනවා කියන පණිවුඩය තමයි ඉස්සෙල්ලාම ලැබෙන්නේ. ඒ අනුව පැයක් ගත වන්නට මත්තෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවත්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවත් අනතුරට පත් වූවන් බේරා ගැනීමේ මෙහෙයුම් දියත් කරනවා. ඒ වෙලාවේ නාවික හමුදාවට හෝ ගුවන් හමුදාවට හෝ ආරක්ෂක අමාත්‍යාංශයට තිබුණු කාර්යභාරය, එය ප්‍රහාරයක්ද, ඒ ප්‍රහාරය සිදු වුණේ කොහොමද, එය torpedo attack එකක්ද කියන ඒවා හොය හොයා ඉන්න එක නොවෙයි. ඒක අනතුරක් වෙන්න පුළුවන්, ප්‍රහාරයක් වෙන්නත් පුළුවන්, ඒ ඕනෑම දෙයක් වෙන්න පුළුවන්. මානුෂීය පදනමින් මැදිහත් වෙලා ජීවිත ගලවා ගැනීමයි එහිදී කළ යුතු වන්නේ. ඒ අනුව රජය පැත්තෙන් ආරක්ෂක අමාත්‍යාංශය, නාවික හමුදාව, ගුවන් හමුදාව මෙහෙයවා ඒ කටයුතු කළා. අපට පුළුවන්කම ලැබුණා, ඒ අනතුරට ලක් වෙච්ච 32ක් කරාපිටියේ තිබෙන ගාල්ල ජාතික රෝහලට ගෙන එන්න. දැනට ඒ අතරින් එක් අයෙක් දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබනවා. ඒ වාගේම, 87දෙනෙකුගේ මෘත ශරීර දැනට අරගෙන ඇවිල්ලා තිබෙනවා. අපේ ගාල්ල ජාතික රෝහලේ සහ අවට ජාතික රෝහල්වල තිබෙන freezer containers මේකට ප්‍රමාණවත් නැහැ. ඒක ඇත්ත. ඒ වාගේම, රජය සතුවත් freezer container එකක් නැහැ. ඒ නිසාම අපි මේ කටයුත්ත පෞද්ගලික අංශයෙන් සිදු කර ගත යුතුයි. ඒ සඳහා වන කටයුතු අපි දැන් කරමින් පවතිනවා. තව පැය කිහිපයක් යනකොට ඒ freezer container එක කොළඹ ප්‍රදේශයේ ඉඳලා ගාල්ලට ළඟා වෙනවා. ඇත්තටම අපට freezer container එකක් මදි. ඒවායෙන් 2ක් අවශ්‍යයි කියලායි අප කල්පනා කරන්නේ. ඒ කටයුතු දැන් සිදු වෙමින් පවතිනවා. ඒකට ආරක්ෂක අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු සියලු බලධාරින් සම්බන්ධ වෙලා ඉන්නවා.

අපි ඊයේ මාධ්‍ය සාකච්ඡාවේදී ඒ තොරතුරු වාර්තා කරන විට ඒ සම්බන්ධයෙන් විවිධ මත තිබුණා. එය ප්‍රහාරයක්ද, අනතුරක්ද කියන එක සම්බන්ධයෙන් විවිධ මත ප්‍රචාරය වෙමින් තිබුණා. ඇත්තටම ඊයේ හවස තමයි ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍යය විසින් ඒ ගැන නිල වශයෙන් ප්‍රකාශයක් කළේ. ඒ අනුව අපට ලැබුණු තොරතුරු අනුව තමයි අපි කටයුතු කළේ. පාර්ලිමේන්තුවේදී විශේෂයෙන් ගරු විජිත හේරත් ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් කරුණු වාර්තා කරන විට, රජයක් හැටියට අප මේ සම්බන්ධයෙන් කරමින් ඉන්නේ මොකක්ද කියන එක තමයි කිව්වේ. රටක් හැටියට අපි ජාත්‍යන්තර සාමය වෙනුවෙන් කටයුතු කරනවා. විශේෂයෙන්ම, ඉන්දියානු සාගරයේ සාමය අපේ අපේක්ෂාවයි. ඒ වෙනුවෙන් කළ හැකි මැදිහත්වීම අපි කරමින් ඉන්නවා. ඔබතුමන්ලා කියපු දේවලටත් වඩා වැඩි සිදුවීම් ප්‍රමාණයක් මේ වෙලාවේත් ඉන්දියානු සාගරයේ සිදු වෙමින් පවතිනවා. රජය හැටියට ජාත්‍යන්තර නීතියට අනුකූලව සහ මානුෂීය පදනමින් අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙමින් ඉන්නවා. ඒක තමයි අපට කරන්න පුළුවන් වැඩේ. ජීවිත ආරක්ෂා කර

ගැනීම සඳහා, ගැටුම් අවම කර ගැනීම සඳහා, ඒ වාගේම කලාපීය සාමය ආරක්ෂා කර ගැනීම සඳහා අපේ මැදිහත්වීම් සිදු වෙමින් පවතිනවා. ඒ නිසා මට කියන්න පුළුවන් වන්නේ අප තවම ඒ කටයුතු කරමින් ඉන්නවා කියන එකයි. එයට අප මැදිහත් වෙමින් ඉන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අපි ඔබතුමන්ලාට දැනුම් දෙන්නම්; පාර්ලිමේන්තුවට විස්තර ප්‍රකාශයක් කරන්නම්. කොහොමත් මතක තියාගන්න, රජය හැටියට අපි ඉතාම වගකීම්සහගතව මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා කියන එක. මේක වෙන වෙන කෝන්තර පිරිමහන වෙලාවක් නොවෙයි. ඒක මතක තියාගන්න. මේ වෙලාවේ ජාත්‍යන්තර ප්‍රඥප්තිවලට අනුකූල වෙමින්, ඒ වාගේම ජීවිත හානි අවම වශයෙන් සිදු වන ආකාරයට සහ නැවතත් අවධාරණයෙන් කිව යුතු ඉන්දියානු සාගරයේ සාමය ආරක්ෂා වන ආකාරයට අපි රජයක් හැටියට වගකීම් සහගතව කටයුතු කරනවා. අපේ රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අදාළ ආයතන ඒ වෙනුවෙන් ක්‍රියා කරමින් ඉන්න බව මට කියන්න පුළුවන්. මම බලාපොරොත්තු වෙනවා, අද හවස් වෙනකොට වැඩි විස්තර ප්‍රමාණයක් ඔබතුමාට කියන්න පුළුවන්කම ලැබෙයි කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා ලබා දුන් පිළිතුරට මම සවන් දුන්නා. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, මේ කාරණයත්. මේ සිද්ධිය වුණේ ඔබතුමා කියපු ආකාරයටම නාවික සැතපුම් 19ක් දුරින්. නාවික සැතපුම් 19ක් දුරින් කියන්නේ, අපේ අනන්‍ය ආර්ථික කලාපය, Exclusive Economic Zone එක. මම ඒකයි ගරු කථානායකතුමාගේත් අවසරය ඇතුව ඒ ගැන පොඩ්ඩක් විග්‍රහ කළේ. United Nations Convention on the Law of the Seaහි, එහෙම නැත්නම් එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ Article 56, Article 58 සහ Article 88 වල සඳහන් වෙලා තිබෙන්නේ, මේ අනන්‍ය ආර්ථික කලාපයේ කටයුතු කරන්නට ඕනෑ සාමකාමී අරමුණු උදෙසා, "for peaceful purposes" කියලායි. මෙන්න මේ "for peaceful purposes" සහ "due regard" කියන සංකල්ප තිබෙනවා. එතකොට ගරු කථානායකතුමනි, මේ සිදුවීම තුළ පරිසරයට සිදු වුණු හානිය, සමුද්‍ර සම්පත්වලට සිදු වුණු හානිය, සිදු වුණු මනුෂ්‍ය ඝාතන යන සියල්ලක්ම ඇත්ත වශයෙන්ම ජාත්‍යන්තර නීතියට පටහැනියි. දැන් මේ මොහොතේත් අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අපොහොසත් වෙලා තිබෙනවා, මම අහපු අර දෙවැනි නැව පිළිබඳ කාරණයට උත්තරයක් දෙන්න. දැන් තවත් නැවක් ඇවිල්ලා තිබෙනවා, Colombo Port එකට ආසන්නව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමා. මේක වැදගත් ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක විවාදයක් නොවෙයි නේ, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
වෙලාව තිබෙනවා නේ 5.30 වෙනකල්. පොඩ්ඩක් කථා කරන්න දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකද, මේක ජාතික ආරක්ෂාවට, රටේ ස්වෛරීත්වයට, භෞමික අඛණ්ඩතාවට බලපාන වැදගත් ප්‍රශ්නයක්. ඒ නිසා පොඩ්ඩක් අවස්ථාව දෙන්න.

ඉතින් මම ඔබතුමාට කියන්න කැමැතියි, ගරු ඇමතිතුමනි, due regard සහ peaceful purposes කියන මේ ජාත්‍යන්තර ප්‍රතිපත්ති අනුව සහ ආර්ථික කටයුතුවලට තමයි අනන්‍ය ආර්ථික කලාපය උපයෝගි කර ගන්න පුළුවන් කියන එක. එතැන military action කරන්න බැහැ. ඒක අපේ රටේ ස්වෛරීත්වයට මරු පහරක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ නිසා මම අහන්න කැමැතියි, විශේෂයෙන්ම ඔය ප්‍රතිපත්තිය සහ මේ කොළඹ වරායට ආසන්නව ඇවිල්ලා තිබෙන දෙවැනි නැවක් ගැන ඔබතුමා දන්නවාද කියලා. මොකක්ද, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය? ඇයි, ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් නොකරන්නේ? මේ ප්‍රශ්න අහන්නේ, ප්‍රශ්න ඇති කරන්න නොවෙයි. රට ඇතුළේ ප්‍රශ්න ඇති කරන්න නොවෙයි. මේක රටේ ස්වෛරීත්වයට, ජාතික ආරක්ෂාවට බලපාන ප්‍රශ්නයක් නිසායි අපි අහන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරන කරුණුවලට වඩා බොහෝ කරුණු අපි දන්නවා. රජය ඒ ගැන දැනගෙන තමයි කටයුතු කරන්නේ. ආරක්ෂක අමාත්‍යවරයා හැටියට ජනාධිපතිතුමා, ආරක්ෂක මණ්ඩලය සහ රජය ඒ සම්බන්ධ කරුණු දන්නවා. දැනගෙන, මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා, ජීවිත හානි අවම කර ගැනීම සඳහා, කලාපීය සාමය ආරක්ෂා කර ගැනීම සඳහා මැදිහත් වීම කරමින් ඉන්නවා. මේ කියන නැව තවමත් තිබෙන්නේ අපේ ජාතික ජල තීරය තුළ නොවෙයි. එය තිබෙන්නේ, ජාතික ජල තීරයට ආසන්න Exclusive Economic Zone එකේ. ඒත් අපි ඒ ජීවිත සම්බන්ධයෙන් උපරිම මැදිහත් වීම කරමින් ඉන්න බව පමණක් මට කියන්න පුළුවන්. ඒ කටයුතු අවසන් වුණාම සවිස්තර වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම්.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

## කාන්තා දායකත්වය අගයන ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් සකස් කිරීම
## பெண்களின் வகிபாகத்தை அங்கீகரிக்கும் தேசிய பராமரிப்புக் கொள்கையை வகுத்தல்
## FORMULATION OF NATIONAL CARE POLICY RECOGNIZING WOMEN'S ROLE

[පූ.භා. 11.12]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව තහවුරු කරමින්, දේශපාලනික, ආර්ථික සහ සමාජීය වශයෙන් කාන්තාවට සම අවස්ථා හිමි වන පරිසරයක් නිර්මාණය කිරීම අපගේ ප්‍රධාන අපේක්ෂාවකි. අද වන විට ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ කොඳුනාරටිය බවට පත්ව ඇත්තේ කාන්තාවයි. ඇඟලුම්, තේ මෙන්ම විදේශ ප්‍රේෂණ හරහා ද රටට ඩොලර් ගෙන ඒමේ ප්‍රධානතම කාර්යභාරය ඇය විසින් නොපිරිහෙලා ඉටු කරනු ලබන අතර, ආදායම් උත්පාදනය කරන ප්‍රධාන ප්‍රවාහයන් සියල්ල තුළම ඇයගේ ශ්‍රම දායකත්වය කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත.

මෙලෙස රටේ ආර්ථිකය ඔසවා තබන කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සහ ඔවුන්ට අවශ්‍ය පොදු පහසුකම් පුළුල් කිරීම වෙනුවෙන් නව නීතිරීති සහ ප්‍රතිපත්ති රාමුවක් කඩිනමින් සකස් කළ යුතුව ඇත. එසේම, දේශපාලනය සහ ආර්ථිකය තුළ කාන්තා සහභාගිත්වය තවදුරටත් වර්ධනය කිරීම සඳහා ඔවුන්ට බලපාන සමාජ ආරක්ෂණ ක්‍රමවේද ශක්තිමත් කරමින්, යල්පැන ගිය ආකල්ප වෙනස් කළ හැකි නව සමාජීය දැක්මක් රට තුළ ස්ථාපිත කළ යුතු වේ.

තවද, පුරවැසියෙකු, මවක, ගෘහිණියක මෙන්ම සමාජ අවශ්‍යතා වෙනුවෙන් නායකත්වය දෙන තැනැත්තියක ලෙස ද ඇය විවිධ භූමිකා ඔස්සේ පවුල සහ සමාජය වෙනුවෙන් ඉමහත් වගකීම් සමුදායක් ඉටු කරයි. එහෙත්, නිවස තුළ සහ ඉන් පිටත ඇය සිදු කරන මෙම දැවැන්ත "වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමය" ජාතික ආර්ථිකයට නිසි පරිදි ගණනය කිරීමේ හෝ ඇගයීමේ ක්‍රමවේදයක් මෙතෙක් අප රට තුළ සකස් වී නොමැත. ඇය සෘජුව මෙන්ම වක්‍රව ද ජාතික ආර්ථිකයට ලබා දෙන මෙම ශ්‍රම දායකත්වය තවදුරටත් නොසලකා හැරිය නොහැක.

වත්මන් ආණ්ඩුවේ ප්‍රධාන දැක්ම වන්නේ ද කාන්තාවගේ ශ්‍රමයට සමාජය තුළ නිසි ගෞරවය හිමි වන, ඇයගේ ශ්‍රමය නිවැරදිව ඇගයෙන සාධාරණ සමාජයක් ගොඩනැඟීමයි. එම දැක්මට අනුව යමින්, සුරැකුම් ආර්ථිකය සඳහා ඵලදායී වට පිටාවක් නිර්මාණය කිරීම උදෙසාත්, කාන්තාවගේ වැටුප් නොලබන ශ්‍රමය ජාතික ආර්ථිකයේ ප්‍රධාන කොටසක් ලෙස පිළිගැනීම උදෙසාත් කඩිනමින් "ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක්" - National Care Policy - සකස් කළ යුතු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු කථානායකතුමනි, මාර්තු 08වැනි දා ජාත්‍යන්තර කාන්තා දිනය. අපේ රටේ වාගේම ලෝකයේම කාන්තාවෝ මාර්තු 08වැනි දා කාන්තා දිනය සමරනවා. අපි මේ සමරන්නේ 104වන ජාත්‍යන්තර කාන්තා දිනය. 1910දී ඩෙන්මාර්ක්වල කෝපන්හේගන් නගරයේ පැවැති වැඩ කරන කාන්තාවන්ගේ ජාත්‍යන්තර සමුළුවකට ක්ලාරා සෙට්කින් මැතිනිය විසින් යෝජනාවක් ඉදිරිපත් කරනවා, "මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනය විය යුතුයි" කියලා. ඒ යෝජනාව ඉදිරිපත් කරන්න මූලික වන්නේ, 1908 වර්ෂයේ වාගේ කාන්තාවන් ඡන්ද අයිතිය හා කම්කරු අයිතීන් ඉල්ලලා මැන්හැට්න් නගරයේ, රට්ගර්ස් චතුරශ්‍රයේ දී කරන ලද දැවැන්ත උද්ඝෝෂණ සහ වැඩවර්ජනයි. කාන්තාවන් ඡන්ද අයිතිය හා කම්කරු අයිතීන් ඉල්ලා 1908 මාර්තු 08වැනි දා පටන් ගත් ඒ උද්ඝෝෂණ හා වැඩ වර්ජනයට එරෙහිව එදා හිටපු නායකයෝ දැවැන්ත මැදිහත් වීමක් සිදු කරනවා. අයිතිවාසිකම් ඉල්ලමින් ඒ කළ සටන සිහි කරමින් තමයි මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනය බවට පත් කිරීමේ යෝජනාව 1910 දී ඉදිරිපත් කර සම්මත කර ගන්නේ. ඒ අනුව, ලෝකයේ සිටින කාන්තාවන් 1911 සිට අද වන තුරු ජාත්‍යන්තර කාන්තා දිනය සමරනවා.

මේ මොහොතේ අපේ රටේ වාගේම, ලෝකයේම ජනතාව ලෝක සාමය ඉල්ලා සිටිනවා. කුමන රටක කුමන හෝ යුද්ධයකදී දරුවන්, කාන්තාවන් ඇතුළු ජනතාව පීඩාවට පත් වනවා. එම නිසා ලෝක සාමය ආරක්ෂා කර ගන්න ඕනෑ. අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑය කියන කාරණාව ජාත්‍යන්තර කාන්තා දිනය ගැන කථා කරන මේ වෙලාවේ මා සඳහන් කරනවා.

ගරු කථානායකතුමනි, සුරැකුම් ශ්‍රමය - care labour - ගැන කථා කළොත්, අපි හැමෝම මේ ගැන විවිධ අවස්ථාවලදී අදහස් ප්‍රකාශ කරලා තිබෙනවා. සුරැකුම් ශ්‍රමය ජාතික ආර්ථිකයට එක් කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් වෙන්න ඕනෑ බව කියනවා. සුරැකුම් ආර්ථිකයේ තිබෙන වටිනාකම සහ ඒ සඳහා ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව අද දැඩි විධියට තිබෙනවා.

මේ සුරැකුම් ආර්ථිකය සම්බන්ධව වාගේම 3R platform එක - 3R රාමුව - සම්බන්ධව විවිධ රටවල් අදහස් හා යෝජනා කිහිපයකුත්, සාර්ථක වැඩ පිළිවෙළකුත් මම හිතන විධියට ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ජාත්‍යන්තර කම්කරු සංවිධානයට ඇතුළත්ව සිටින සමහර රටවල් මේ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. ඔවුන් කියනවා, කාන්තාවන් ජාතික ආර්ථිකයට මොන තරම් දායකත්වයක් දෙනවාද කියලා හඳුනා ගැනීමක් කරන්න ඕනෑ කියලා. කාන්තාවන්ගේ සේවා සත්කාරය, නැත්නම් ජාතික ආර්ථිකයට දායක කරගෙන නැති, එහෙමත් නැත්නම් අපි හඳුන්වන සුරැකුම් ආර්ථිකයේ කොටස මොකක්ද කියන එක හඳුනා ගැනීම අවශ්‍යයි. ඒකෙදි 3R කියන සංකල්පයට අනුව "Recognize" කියන එක වැදගත් වෙනවා. ඒක නිසා මම හිතන විධියට අපිත් ඒ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි, අඩු කිරීම, එහෙම නැත්නම් "Reduce" කියන එක: කාන්තාවන්ට තිබෙන සුරැකුම් ශ්‍රමය පිළිබඳව කථා කරද්දී අපි මොනවාද අඩු කරන්න ඕනෑ? ගරු කථානායකතුමනි, ඒකෙදි තාක්ෂණය කියන කාරණය වැදගත් වෙනවා. යටිතල පහසුකම් හා තාක්ෂණය ලබා දීමෙන් සත්කාරක සේවාවලට වැය වන වෙලාව, එහෙම නැත්නම් වැය බර අඩු කර ගන්න පුළුවන්. අපේ ඩිජිටල් ආර්ථික විෂය භාර ඇමතිතුමා ඒ කෙරෙහි අවධානය යොමු කරමින් ඒ සම්බන්ධව විසඳුම් විශාල ප්‍රමාණයක් ගෙනැල්ලා තිබෙනවා. ආර්ථිකය ගැන, එහෙම නැත්නම් කාන්තාවන් ගැන කථා කරද්දී මට මේ වෙලාවේදී ඒක දැනෙන්නේ ඩිජිටල් ආර්ථිකය තුළ අපට සිදු කරන්න පුළුවන් මහා පිම්මක් විධියටයි. මොකද, මේ වෙලාවේදී ඩිජිටල් ආර්ථික විෂය භාර ඇමතිතුමා වාගේම ඒ අමාත්‍යාංශය විශාල වැඩ කොටසක් මේ වෙනුවෙන් කරනවා. ඒ අනුව ගෙවීම් ක්‍රම පහසු කරලා තිබෙනවා. අපි දන්නවා, දරුවන් ඉන්න මවකට, කිරි දෙන මවකට, එහෙම නැත්නම් ආබාධිත කාන්තාවකට නගරයට ගිහිල්ලා ඒ ගෙවීම් කරන්න විශාල කාලයක් වැය වන බව. ඒ වාගේම සමහර විට ඒ කාන්තාවන් ලිංගික හිංසනයට ලක් වෙනවා. එහෙම නැත්නම් ඔවුන් අනතුරුවලට ලක් වෙන්න පුළුවන් අවස්ථාත් තිබෙනවා. ඩිජිටල් තාක්ෂණය හරහා ඒ ගෙවීම් කටයුතු කිරීමේදී අපට කාලය අවම කර ගන්න පුළුවන් වනවා වාගේම පහසුකම් සැලසීමත් කරන්න පුළුවන්. ඒ සඳහා රජයක් විධියට අපි වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. පොදු ගෙවීම් ක්‍රම, විවිධ බැංකු හරහා කරන ණය ගැනීම් ක්‍රම වාගේම නිෂ්පාදන ක්‍රමයට දායක වෙන්න පුළුවන් පහසුකම් අපි වැඩි කරනවා. 4G, එහෙම නැත්නම් 5G ලබා දෙනවා කියන්නේ, ඒ පහසුකම් තවත් සාර්ථක වෙනවා කියන එකයි. ඩිජිටල් ක්‍රමය තුළින් මේ පහසුකම් ලැබෙනවා කියන්නේ, කාන්තාවන්ගෙන් විශාල දායකත්වයක් සංවර්ධනයට ලබා ගන්න පුළුවන් කියන එකයි.

ඒ වාගේම අපට ලැබී තිබෙන තවත් පහසුකමක් තමයි, ඩිජිටල් තාක්ෂණය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකි වීම. අපි දන්නවා, හිංසනයට පත් වුණු කාන්තාවක් පොලීසියට, එහෙම නැත්නම් වෙනත් ආයතනයකට ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරන්න කැමති නැති බව. හැබැයි, මේ ඇති කර තිබෙන online platform එක හරහා හිංසනයට ලක් වුණු කාන්තාවන්ට පැමිණිලි ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ වාගේම ඒ පිළිබඳව විමර්ශනයක් කරන්නත් පුළුවන්. එමෙන්ම ඒ සම්බන්ධ විසඳුම් හා අධීක්ෂණයමේ වනකොට කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයෙන් සිදු කරනවා.

අපේ සුරැකුම් ආර්ථිකයට තාක්ෂණික මෙවලම් ලබා දීම ඉතාම හොඳ ප්‍රවණතාවක් හැටියට අපි දකිනවා. ඒ වාගේම සයිබර් අවකාශය තුළ සිදු වන විවිධ හිංසන මේ වෙද්දී වැඩි වෙලා තිබෙනවා. ඒ හිංසන වැළැක්වීමටත් තාක්ෂණය තුළින් මේ වෙලාවේදී ලබා දෙන සේවාව හා නීතිරීති, අලුත් පද්ධතීන් ඉවහල් වෙනවා කියන එක තමයි අපට දැනෙන්නේ. ඊළඟ කාරණාව තමයි, ප්‍රතිව්‍යාප්තිකරණය. අපි එය හඳුනා ගත්තා. එමෙන්ම ඒ සඳහා වැය වන කාලය අඩු කළා. ඒ වාගේම තමයි, "Redistribute" කියන එක. ජාතික ඒකාබද්ධ සත්කාරක වැඩ පිළිවෙළක් හරහා අපේ සාමාජිකයන්ගෙන් පරිසරයේ දායකත්වය ලබා ගන්නේ කොහොමද කියලා අපට දැනගන්න පුළුවන්. උදාහරණයක් විධියට ගත්තාම, ඒ සේවාව ලබා දෙන එක කාන්තාවකට විතරක් අයිති දෙයක් නොවෙයි, ඒ සඳහා සමාජ සත්කාරක වැඩ පිළිවෙළක් සැකසිය යුතුයි කියලා අපි හිතනවා.

විශේෂයෙන් දරුවන් වෙනුවෙන්, වැඩිහිටියන් වෙනුවෙන්, වැඩිහිටියන් බලා ගැනීම වෙනුවෙන්, ආබාධිත දරුවන්ට පහසුකම් සැලසීම වෙනුවෙන් වාගේම කාන්තාවන්ගේ ශ්‍රමය ලබා ගැනීම වෙනුවෙන් රජයකට ජාතික ඒකාබද්ධ සත්කාරක ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. එවැනි සත්කාරක ක්‍රමවේදයක් ඇති කිරීම තුළින් ඇත්තටම අපි මේ කථා කරපු සුරැකුම් ආර්ථිකය ශක්තිමත් කිරීම හා ආර්ථිකයේ දායකත්වය ලබන කොටස වැඩි කර ගන්න පුළුවන් කියන කාරණාව මේ වෙලාවේදී මම ප්‍රකාශ කරන්න කැමැතියි. තාක්ෂණය ගෙන ඒම තුළින් අද වෙද්දී හිංසනය අවම වෙලා තිබෙනවා වාගේම රජය අරගෙන තිබෙන නව ක්‍රමවේද නිසාත් කාන්තාවන් වන අපට පොඩි අභිමානයකුත් ඇති වෙලා තිබෙනවා කියන කාරණය ජාත්‍යන්තර කාන්තා දිනය මූලික කරගෙන පවත්වන මේ විවාදයේදී මම කියන්න කැමතියි. සාමාන්‍යයෙන් අම්මා කෙනෙක් දරුවා තමන්ගේ කුස තුළ සිටින කාලයේ ඉඳලා තමයි දරුවා මොන පාසලටද ඇතුළත් කරන්න ඕනෑ, කොහොමද ඇතුළත් කරන්නේ, කාගෙන්ද මේ සම්බන්ධව උදව්වක් ගන්නේ, කාටද මේකට උදවු කරන්න පුළුවන් කියලා හිතන්නේ කියන එක අපි දන්නවා. හැබැයි, අද වෙද්දී තමන්ගේ දරුවා පාසලට ඇතුළත් කරන්න ඕනෑ නම් ඔවුන්ට දේශපාලනඥයන්ගේ පසුපස යන්න, ලිංගික අල්ලස් දෙන්න, මුදල් වියදම් කරන්න ඕනෑ නැහැ. රජය ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා, දරුවෙක් නියමිත පරිදි පාසලකට ඇතුළත් කරන්න කිසිම දේශපාලනඥයෙකුගෙන් ලියුමක් ඕනෑ නැහැ කියලා.

මට තවත් තත්පර කිහිපයක් ලබා දෙන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

ඒ වාගේම තමයි, රජයේ රැකියාවක් ලබා දීමේදීත්. අද වෙද්දී රජයේ රැකියා ලබා දෙන නිශ්චිත ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය තුළ රජයේ රැකියා ලබා ගන්න කාන්තාවන්ටත් අවස්ථාව ලබා දී තිබෙනවා. රැකියාවල උසස්වීම් ලබා ගන්න නිශ්චිත ක්‍රමවේදයක් තිබෙනවා. මම හිතන විධියට, මේ ක්‍රමවේද සකස් කිරීම තමයි අපේ සුරැකුම් ආර්ථිකයට දක්වන ප්‍රධාන දායකත්වය. ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක අවශ්‍යතාව මේ වෙද්දී වැඩි වෙලා තිබෙනවා. මේ අය වැය තුළින් වාගේම අපේ රජය මඟිනුත් මේ දක්වන දායකත්වය ඒකට විශාල පිටුවහලක් වෙලා තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Hon. (Mrs.) Rohini Kumari Wijerathna to second the Motion. You have 12 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.25]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් පළමුව ඔබතුමාට ස්තුතිවන්ත වන අතර, මූලාසනය මාරු වීමට වැය වෙච්ච කාලය මට ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් ජාත්‍යන්තර කාන්තා දිනය මූලික කරගෙන ගෙන එන යෝජනාවේදී, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සිටින ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරිය හැටියට එය ස්ථිර කරන්නට ලැබීම සතුටට කාරණාවක් ලෙස මම හිතනවා. ඒ අනුව, අද දින ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය විසින් සභාව කල් තබන අවස්ථාවේ ගෙනාපු යෝජනාව මම ස්ථිර කරනවා.

මෙවර ජාත්‍යන්තර කාන්තා දිනයේ තේමාව වන්නේ, "Rights. Justice. Action. For ALL Women and Girls". සියලු කාන්තාවන් සහ ගැහැනු ළමුන් සඳහා අයිතිවාසිකම්, යුක්තිය සහ ක්‍රියාමාර්ග සලසන්න කියන එක එහි අදහසයි. ඉතිහාසය පුරාවටම විවිධ යුගවල අපි අයිතිවාසිකම් ගැන කථා කර තිබෙනවා; ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා; තව ක්‍රියාමාර්ග ගන්න තිබෙනවා. අද අපි කථා කරන්නේ තව ක්‍රියාමාර්ග ගත යුතු එක් ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන්. හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා, යුක්තිය ඉටු වුණාද කියන එක පිළිබඳව.

මම දැක්කා, අද මාධ්‍ය යම් සිද්ධියක් වාර්තා කරනවා. මම නම, ගම සහ ප්‍රදේශය කියන්නේ නැහැ. නමුත්, තරුණ දියණියකගේ මෘත ශරීරය රෝහලක මෘත ශරීරාගාරය තුළදී දූෂණයට ලක් වෙනවා. රටක් හැටියට අපි මේක හෙළා දකින්න ඕනෑ. ඒ වාගේම ඒ කටයුත්ත කරපු සියලුදෙනා නීතිය හමුවට ගෙනැල්ලා අදාළ පාර්ශ්වයන්ට යුක්තිය ඉටු කරන්න ඕනෑය කියන එකත් මම මේ සභාවේදී මුලින්ම මතක් කරන්න කැමැතියි.

අද අපි මේ කථා කරන මාතෘකාව මොකක්ද? මේ රටේ නොපෙනෙන එන්ජිම ගැනයි මම මේ කථා කරන්නේ. වැඩ කරන කාන්තාව කිව්වාම අපි බොහෝදෙනෙක් දකින්නේ ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවය කරන කාන්තාව, නැත්නම් තේ වත්තේ දලු නෙළන කාන්තාව, එහෙමත් නැත්නම් වැඩට යන කාන්තාව විතරයි. හැබැයි, අපි නොදකින තවත් දැවැන්ත ශ්‍රම බලකායක් මේ රටේ ඉන්නවා. ඒ තමයි කිසිදු වැටුපක් ලබන්නේ නැතිව, කිසිදු නිවාඩුවක් ගන්නේ නැතිව, දවසේ පැය 24න් පැය 18කටත් වඩා වැඩි කාලයක් නිවස තුළ වැඩ කරමින් වෙසෙන මව, බිරිඳ සහ දියණිය කියන මේ තුන්දෙනා. මේ අය සම්බන්ධයෙනුත් අපි අද අවධානය යොමු කරන්න බලාපොරොත්තු වනවා. ඇය කරන මේ නිහඬ මෙහෙවර නොවන්නට මේ රටේ කිසිදු පිරිමියෙකුට රැකියාවකට යෑමට පවා නොහැකි වනවා කියන එක ගැන තර්කයක් නැහැ.

දරුවන් පෝෂණය කරලා, ගිලන් වූ තමන්ගේ දෙමව්පියන්, නෑදෑයින් ඇතුළු සියලුදෙනා රැකබලා ගනිමින්, පවුල නැමැති ඒකකය ශක්තිමත්ව තබා ගන්නට ඇය කරන මෙහෙය අතිවිශාලයි. සමබර සමාජයක නොසැලෙන කුලුන කියන්නේ වැඩ අවසන් වෙලා ගෙදර ගිහින් නැවත වැඩ කරන කාන්තාව සහ ගෙදර සිට වැඩ කරන කාන්තාව කියන එක මම මේ වෙලාවේ කියන්න ඕනෑ. හැබැයි, රටේ අවාසනාවකට මේ ශ්‍රමය සැලකෙන්නේ නොමිලේ ලැබෙන සේවාවක් හැටියටයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය වසර තුළත් අපි දැක්කා, රජය විසින් ඉටු කළ යුතු සුබසාධනත්, මේ වගකීම් සියල්ලත් සමහර වෙලාවට මේ කාන්තාවන්ගේ ගොඩට වැටිච්ච අවස්ථා. කාලයක සිට අපේ රටේ පෝෂණ අර්බුදයක් තිබෙනවා. කිරිපිටි මිල සියයට 300කින් විතර ඉහළ යනකොට, බිත්තරයක මිල රුපියල් 60ක සීමාවකට වාගේ එනකොට, අපේ දරුවන්ට ලැබිය යුතු ප්‍රෝටීන අවශ්‍යතාව අහිමි වනකොට ඒ වේදනාව දරා ගත්තේත් මේ රටේ කාන්තාවයි. ඒ වාගේම ඇය තමන්ගේ ආහාර වේල, තමන්ට ලැබිය යුතු පෝෂණය කප්පාදු කරලා තමයි ඒ සඳහා කැප කිරීම් කළේ. එතකොට රැකියාවට යන කාන්තාවටත් ඒකට මුහුණ දෙන්න වනකොට, වැටුපක් නොලබා ඒ කටයුත්ත කරන කාන්තාව මේක දරාගන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අවධානය යොමු වෙන්න ඕනෑ. ඒ වාගේම සෞඛ්‍ය අර්බුදය ගත්තාම එයිනුත් වැඩිපුරම පීඩාවට පත් වන්නේ කාන්තාව. විශේෂයෙන්ම රජයේ රෝහල්වල ඖෂධ හිඟ වනකොට කාන්තාව දැඩි සේ අපහසුතාවට පත්වනවා. පසුගිය කාලයේ ඖෂධ 150ක විතර හිඟයක් තිබුණු බව අපි දන්නවා. රෝහලේ බෙහෙත් නැති වනකොට, නිවසේ රෝගීව සිටින වැඩිහිටියා, දරුවා බලාගන්න කාන්තාවගේ මානසික පීඩනය, ඒ සඳහා ගත කරපු අමතර කාලය සම්බන්ධයෙන් අපි කථා කරනකොට ඇයගේ ඒ මෙහෙයටවත් මිලක් ලැබුණේ නැහැ.

ඒ වාගේම ජීවන වියදම ගැන බලන්න. අපි ඊයේ පෙරේදාත් ගෑස් මිල ගැන කථා කළා. ගෑස් මිල ඉහළ යනකොට නැවත වතාවක් දර ළිප පාවිච්චි කරන්න කාන්තාව පෙලඹෙනවා. එතකොට කාන්තාවගේ පෙණහලු දුමෙන් පිරුණත්, ඇයගේ ශ්‍රමය GDP එකට ඇතුළත් වන්නේ නැහැ. හැබැයි, මේ ලෝකයේ දියුණු රටවල් රැකවරණ ආර්ථිකය, එහෙම නැත්නම් care economy කියන එක තේරුම් අරගෙන තිබෙනවා. උදාහරණයක් හැටියට අයිස්ලන්තය ගත්තාම, ස්ත්‍රී-පුරුෂ වැටුප් පරතරය නීතියෙන් අවසන් කළා පමණක් නොවෙයි, දරුවන් රැකබලා ගැනීම රජයේ සහ පෞද්ගලික අංශයේ හවුල් වගකීමක් බවටත් පත් කළා. උරුගුවේ ජාතික රැකවරණ පද්ධතියක් - National Care System එකක් - හදලා තිබෙනවා. ඒක හරහා සෑම පුරවැසියෙකුටම රැකවරණය ලැබීමේ අයිතිය සහ රැකවරණ සපයන්නන්ගේ අයිතිය තහවුරු කර තිබෙනවා. මෙන්න මෙවැනි ක්‍රම අපි රටක් විධියට මේ පද්ධතියට අලුතින් එකතු කරන්න ඕනෑය කියන එක මම මේ වෙලාවේ මතක් කරනවා.

දේශපාලනයේදී අපි සියයට 25ක quota එකක් ගෙනැල්ලා පළාත් පාලන ආයතනවලට කාන්තාව ගෙනැත් තිබුණත්, ශ්‍රී ලාංකීය ජනතාව තුළ තවමත් තිබෙන ආකල්පය තමයි, ගැහැනුන්ට මොන දේශපාලනය ද, වැඩ ටික කරගෙන ගෙදර ඉන්න කියන එක. හැබැයි, මෙවැනි මානසිකත්වයකින් ගොඩ එන්නට ප්‍රතිපත්ති හැදීම මේ 2026 වසරේදීවත් ඉටු කරලා මේ පසුගාමීත්වයෙන් අපි මිදෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හිතන්නේ වැටුප් නොලබන අය විධියට ඉන්නේ ගෙදර වැඩ කරන අය විතරයි කියලා. හැබැයි, ගෘහිණියන්, කම්කරු රැකියා කරන කාන්තාවන් පමණක් නොවෙයි, නීතිඥ වෘත්තිකයිනුත්, නීතිඥ සේවයේ ඉන්න වෘත්තිකයින්ගේ නවකයිනුත් අතින් කාලා හරක් බලනවා වාගේ වැඩක් තමයි කරන්නේ. අපි දකිනවා, නීතිපති දෙපාර්තමේන්තුවේ හැර වෙනත් කිසිම ආයතනික ව්‍යුහයක් මේ නවකයින්ට නැහැ කියලා. ඒ නිසා මම යෝජනා කරනවා, මේ නවක නීතිඥයින් වෙනුවෙන් ද ආයතනික ව්‍යුහයක් සකස් කරන්න ඕනෑ කියලා. එවැනි ආයතනික ව්‍යුහයක් සකස් කරලා, නීති සහන පතාගෙන එන අඩු ආදායම්ලාභීන්ට, එහෙම නැත්නම් වැටුප් නොලබන අය සඳහා නීති සහාය ලබා දෙන්නට, ඒ අයට අවශ්‍ය system එක සකස් කර දෙන්න කියලාත්මම මේ වෙලාවේ යෝජනා කරන්න කැමැතියි.

මේ තත්ත්වය වෙනස් කරන්නට අපි අර කථා කරපු කාරණාවලට අදාළව මම යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. එකක් තමයි, මේ නොපෙනෙන ශ්‍රමය GDP එකට එකතු කිරීම. කාන්තාවන් නිවසේදී කරන වැඩකටයුතු සඳහා වෙළෙඳ පොළ වටිනාකමක් නියම කර එය ජාතික ආදායමට ඇතුළත් කළ යුතුයි. එවිට ඇය රැකියා විරහිත වූ අයෙකු ලෙස නොව රටේ නිෂ්පාදකයෙකු ලෙස පිළිගැනීමකට ලක්වනවා.

ඊළඟට, සහනාධාර සහ ගෙවීම්. පූර්ණ කාලීනව වැඩිහිටියන් හෝ ආබාධිතයින් රැක බලාගන්නා කාන්තාවන් සඳහා රජය විසින් යම්කිසි වටිනාකමක් ලබා දිය යුතුයි කියා මම යෝජනා කරනවා.

ඊළඟ එක තමයි, විශ්වීය ළමා සුරැකුම් මධ්‍යස්ථාන සහ වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම. සෑම රැකියා ස්ථානයකම සහ සෑම ග්‍රාම සේවා වසමකම රජයේ ප්‍රමිතියට අනුව ක්‍රියාත්මක වන ළමා සුරැකුම් මධ්‍යස්ථාන සහ වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන සකස් කරන්නට ඕනෑය කියා මම යෝජනා කරනවා. මොකද අපි දන්නවා, බොහෝ කාන්තාවන් වැඩට නොයන්නේ තමන්ගේ දරුවා තියලා යන්න තැනක් නැති නිසා, තමන්ගේ වයස්ගත දෙමව්පියන් තියලා යන්න තැනක් නැති නිසා කියලා. එහෙම නම්, අපි කාන්තාවට අවශ්‍ය ඒ රැකවරණය සහ සහයෝගය ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි, පීතෘ නිවාඩු සම්බන්ධ කාරණය. දරුවන් හෝ වැඩිහිටියන් රැක ගැනීමේ වගකීම කාන්තාවන්ට පමණක් පවරන්නේ නැතුව පිරිමින්ට ද නිවසේ වගකීම් ඉටු කිරීමට හැකි වීම සඳහා අනිවාර්යයෙන් පීතෘ නිවාඩු ලබා දෙන නීතියක් ගෙන එන්න කියලා මම යෝජනා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවන්ගේ ශ්‍රමය සූරාකමින් ගොඩනැඟෙන ආර්ථිකයකින් කිසිම දවසක තිරසාර ආර්ථික සංවර්ධනයක් වෙන්නේ නැහැ. අපේ රටේ සියයට 52ක් ඉන්නේ කාන්තාවන්. මේ සියයට 52 ආර්ථිකයට දායක කර ගන්නේ නැතුව මේ ආර්ථිකය ගොඩ ගන්න පුළුවන් කියලා මම විශ්වාස කරන්නේ නැහැ. පසුගිය කාලය තුළ ඇය විඳි පීඩාව අපට ආපසු හරවන්න බැරි වුණත්, ඇයගේ අනාගතය සුරක්ෂිත කරන්නට මේ පාර්ලිමේන්තුවට යෝජනා ගේන්න සහ ඒවා සඳහා නීති ක්‍රියාත්මක කරන්න අපට පුළුවන් වනවා. ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමිය සභාව කල් තබන අවස්ථාවේ ගෙනා යෝජනාව ස්ථිර කරමින් මේ රටේ කාන්තාවගේ නිහඬ මෙහෙවර අගය කරන සැබෑ ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් මේ වසරේ ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන ලෙසත්, ඇය නිදහස් වූ දවසට මේ රට සැබෑ ලෙසම දියුණු වනු ඇති බවත් පවසන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පසුගිය මාසයේ දුම්බර බන්ධනාගාරයට, එහෙම නැත්නම් පුනරුත්ථාපන මධ්‍යස්ථානයට ගියා. ඇත්තටම කිව්වොත්, ඒක හරි ලස්සනයි; පිළිවෙළයි; හැබැයි, දුකයි. මොකද සැමියාගේ වරදට, පුතාගේ වරදට, ලිංගික අල්ලස් නොදුන් වරදට, එහෙම නැත්නම් ඇප දෙන්න කෙනෙක් නැතුව කාන්තාවන් විශාල පිරිසක් ඒක ඇතුළේ සිරගත වෙලා ඉන්නවා. මේ අයගෙන් බොහෝදෙනා ඉන්නේ රස පරීක්ෂක වාර්තාව තවම ආපු නැති නිසා. සමහර වෙලාවට ඇප දී ගන්න බැරිවත් කණ්ඩායම් ඉන්නවා. රුපියල් 5,000යි ගෙවන්න තිබෙන්නේ. හැබැයි, වසර ගණනාවක් රජයන් විසින් සිරගෙවල් ඇතුළේ ඉන්න මේ අයව නඩත්තු කරනවා. මේ අයට ආහාර ලබා දෙනවා, සෞඛ්‍ය පහසුකම් ලබා දෙනවා. ඒ නිසා මම කියනවා, මේවාට ක්‍රමවේද සකස් කෙරෙන්න ඕනෑ බව. මේ රස පරීක්ෂක වාර්තාව ගන්නට බැරි වෙලා තිබෙන්නේ නිලධාරින්ගේ හිඟකම නිසා නම්, ඒ සඳහා අවශ්‍ය බඳවා ගැනීම් කරන්න කියලා අපි මේ පාර්ලිමේන්තුවට යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ කාන්තාවන් එක්ක කථා කළාම දැනගත්තා, එතැන සිටින බොහෝදෙනෙක් 54 වගන්තිය යටතේ ඇතුළට දාපු අය කියලා. සමහර වෙලාවට ඒ අය ඒ වරද කරන්න හිතලාවත් නැති අය. එක් කාන්තාවක් මාත් එක්ක කිව්වා, ඇයගෙන් ලිංගික අල්ලසක් ඉල්លුවා, ඒක නොදුන් නිසා තමයි ඇය 54 වගන්තිය ගහලා ඇතුළට දැම්මේ කියලා. මම කියනවා, මෙවැනි දේවල් මේ රටේ සිද්ධ විය යුතු නැහැ කියලා. මේ කාන්තාවන් සියලුදෙනාම ඉල්ලන්නේ යුක්තිය. මේ යුක්තිය ඔවුන්ට ලබා දෙන්න කටයුතු කරන්න කියා මම ඉල්ලා සිටිනවා. මොකද, ලිංගික අල්ලස් නොදුන් නිසා නම් ඇතුළට දැම්මේ, වරදක් නොකර 54 වගන්තිය ගහලා නම් ඒ අයව ඇතුළට දාලා තිබෙන්නේ, දෙවියන්ගේ නාමයෙන් මම ඉල්ලා සිටිනවා, ඒ කටයුත්ත මින් ඉදිරියට කරන්න එපා කියලා. මේ ඉන්නේ මේ රටේ දරුවෙකුගේ අම්මෙක්, කාගේ හරි සහෝදරියක්, එහෙම නැත්නම් කාගේ හරි දියණියක්. ඉතින් කාන්තාව දිහා ඒ විධියට බලන්න කියන ඉල්ලීමත් මම මේ වෙලාවේ කරනවා. මොකද, මේ සියලුදෙනාම මේ රටේ ආර්ථිකයට උර දිය යුතු අය කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කරනවා. මේ රටේ කාන්තාවන් සියලුදෙනාගේ අයිතිවාසිකම් සුරැකෙන, ඒ අයට යුක්තිය ඉටු වන, ඒ වාගේම අයිතිවාසිකම් සහ යුක්තිය ක්‍රියාත්මක කරන රටක් හදන්නට අපේ පාර්ලිමේන්තුවට හැකි වේවායි කියන ප්‍රාර්ථනාව කරමින්, සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරපු යෝජනාව මම නැවතත් ස්ථිර කරනවා. ඒ වාගේම ශ්‍රමය සඳහා මිලක් නියම කරන, ඇයට වටිනාකමක් ලබා දෙන ක්‍රමවේදයක් සකස් වේවා කියාත් මම ප්‍රාර්ථනා කරනවා.

ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Prime Minister. You have 15 minutes to speak on today's Adjournment Motion.

[පූ.භා. 11.38]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් අද දින පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය ලෙස "ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක්" පිළිබඳව ඉදිරිපත් කර ඇති මේ සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මට හැකි වීම පිළිබඳව ඇත්තටම මම සතුටු වෙනවා. විශේෂයෙන්ම ඒක මට සතුටට කාරණයක් වෙන්නේ මේ නිසායි. අවුරුදු 6කට ප්‍රථමයෙන් පාර්ලිමේන්තුවේදී මගේ මංගල කථාව කරන අවස්ථාවේදී "සුරැකුම් ආර්ථිකය" ගැන මම කථා කළා. ඒ අවස්ථාවේදී මේ පාර්ලිමේන්තුව තුළ හිටියේ අපේ කීප දෙනායි. ඇත්තවශයෙන්ම ඒ අවස්ථාවේදී මේ මාතෘකාව යටතේ කථා කිරීමත් අලුත් දෙයක් වුණා. නමුත්, අවුරුදු 6කට පසුව මේ මාතෘකාව පිළිබඳව අද දවසේ කථා කරන්න අපට ශක්තිමත් කණ්ඩායමක් පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් ඉන්න එක ඇත්තටම සතුටට කාරණයක්. ඒ සංවාදය කොච්චර දියුණු වෙලාද කිව්වොත්, අද වනකොට ඒ සංවාදය ජාතික ප්‍රතිපත්තියක් දක්වා ගෙනයන්න පුළුවන් වන විධියට අදහස් ඉදිරිපත් වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවෙන් පිටතදීත්, පාර්ලිමේන්තුව තුළදීත් ඒක මාතෘකාවක් හැටියට මේ විධියට ශක්තිමත්ව ඉදිරිපත් වීම ඇත්තටම සතුටු වෙන්න පුළුවන් කාරණයක්. විශේෂයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් සභාව කල් තබන අවස්ථාවේ ගෙනෙන ලද ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් රටට අවශ්‍යයි කියන ඉතාම වටිනා යෝජනාව අපට මේ අවුරුද්ද තුළ හෝ යථාර්ථයක් කර ගන්න පුළුවන් වුණොත් එය අපි ලබන විශාල ජයග්‍රහණයක් ලෙස මම දකිනවා.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව, විශේෂයෙන්ම දේශපාලනය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය පිළිබඳව විශාල අවධානයක් යොමු වී තිබෙන මොහොතක්. ඒකට හේතුවක් බවට පත් වෙලා තිබෙන්නේත් මේ වෙනකොට දේශපාලනය තුළ කාන්තා නියෝජනය වැඩි වීමයි. පාර්ලිමේන්තුව තුළ විතරක් නොවෙයි, පළාත් පාලන ආයතනවල, ප්‍රජා මට්ටමේ නියෝජිත දේශපාලනය තුළ, ප්‍රජා සංවිධානවල, රාජ්‍ය සේවයේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ කියන මේ සියලු ක්ෂේත්‍රවල කාන්තා නියෝජනය ඉහළ යෑම නිසා මේ සම්බන්ධයෙන් වැඩියෙන් අවධානය යොමු වී තිබෙනවාය කියන එක අපි හැමෝටම පෙනෙන දෙයක්. ඒ නිසා අපට මේක තවත් හොඳ අවස්ථාවක්. මෙවැනි තීරණාත්මක විෂයයක්, අතිශයින්ම වැදගත් මාතෘකාවක් පිළිබඳව මේ විධියට සංවාදයක් ගෙනෙන එකත්, ඒ වෙනුවෙන් තව තවත් අවධානය ලබා ගනිමින්, කාන්තාවන්ට තමන්ගේ ජීවිතවලට අතිශයින්ම බලපාන මේ සුරැකුම් ආර්ථිකය කියන මාතෘකාව පිළිබඳව තවදුරටත් තහවුරු කරමින් එය ජාතික ප්‍රතිපත්තියක් දක්වා අපට ගෙන යන්න පුළුවන් වුණොත් ඒක ඉතාම හොඳයි.

කාන්තාව දේශපාලනය තුළ නිරත වීමේ ප්‍රධාන අරමුණක් වන්නේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම සඳහා මැදිහත් වීමයි. විශේෂයෙන්ම ඓතිහාසිකව කාන්තාවන්ට සාමාන්‍ය පුරවැසියන්ට ලැබී තිබුණු අයිතිවාසිකම් නොලැබුණා වාගේම යම් යම් ක්ෂේත්‍රවලට සහභාගි වීමේදී දුෂ්කරතාවලටත් මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒක, ආර්ථිකය වෙනුවෙන් වෙන්න පුළුවන්; සංස්කෘතික ජීවිතයක් වෙනුවෙන් වෙන්න පුළුවන්; අධ්‍යාපනය වෙනුවෙන් වෙන්න පුළුවන්. අපි ඉතිහාසය පුරාවට බැලුවත්, ගෝලීය වශයෙන් බැලුවත් සම්ප්‍රදායිකව කාන්තා නියෝජනය ඒ තැන්වලදී සාපේක්ෂව අඩුයි. දැන් අපි එහි යම් පරිවර්තනයක් දැක්කත් ඒවා තවම අවශ්‍ය මට්ටමට නැහැ කියන කාරණයත් අපට පිළිගන්න වෙනවා. දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික ක්ෂේත්‍රය ඇතුළු සෑම ක්ෂේත්‍රයක් දිහාම බැලුවාම පෙනෙනවා, කාන්තා සහභාගිත්වය සාපේක්ෂව අඩුයි කියන එක. එහෙම නැත්නම් වටිනාකම අඩු තැන්වල තමයි කාන්තා සහභාගිත්වය අපට බොහෝ විට පෙනෙන්න තිබෙන්නේ. සමානාත්මතාව, යුක්තිය සහ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින ඕනෑම කෙනෙක් මෙය ගැටලුවක් හැටියට දකින නිසා තමයි කාන්තා දේශපාලන කෝණයක් තුළින් මේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳව මැදිහත් විය යුත්තේ.

මේ පිළිබඳව විග්‍රහ කරන අවස්ථාවලදී පිළිගත් කාරණයක් තමයි, කාන්තාවන්ට සියලුම ක්ෂේත්‍රවල සම සහභාගිත්වය ලැබීමට හෝ ඔවුන්ට අවශ්‍ය විධියට ඒ සඳහා සහභාගි වීමට ප්‍රධාන බාධකයක් වෙලා තිබෙන්නේ, විශේෂයෙන්ම වැටුප් රහිතව කරන ශ්‍රමය - unpaid care work - බව. එයට වැටුප් නොලබා කරන සුරැකුම් වැඩ විශාල බාධාවක් - barrier එකක් - කියන එක පිළිගත් කාරණයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් කාන්තා සහභාගිත්වය පොදුවේ මේ ක්ෂේත්‍ර තුළ වැඩි කරන්න නම්, එය තවත් ශක්තිමත් කරන්න නම්, එය අපි පිළිගන්නවා නම්, ඇයටත් පුරවැසියෙක් හැටියට මේ සියලුම ක්ෂේත්‍ර තුළ සමානව සහ ගෞරවනීය ලෙස ඇයගේ අභිමතය අනුව සහභාගි වීමට අයිතියක් තිබෙනවා කියන එක අපි පිළිගන්නවා නම්, ඇයට එසේ සහභාගි වීමට තිබෙන ප්‍රධාන බාධක හඳුනා ගෙන ඒවා නැති කරන්නත් අපි මැදිහත් විය යුතුයි. එතැනදී තමයි, මේ සුරැකුම් ආර්ථිකය කියන සංකල්පයත්, විශේෂයෙන්ම වැටුප් නොලබා කරන සුරැකුම් වැඩවලට අගයක් දීම, එය ප්‍රතිසංවිධානය කිරීම, ඒකට අවශ්‍ය පොදු පහසුකම්, යටිතල පහසුකම් ගැන අවධානය යොමු කිරීමත් අතිශයින්ම වැදගත් වෙන්නේ. සුරැකුම් ආර්ථිකයක් පිළිබඳ ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් අපට වැදගත් වෙන්නේත් අන්න ඒ කාරණය නිසායි. වඩාත් සුරක්ෂිත ආර්ථිකයක් වෙනුවෙන් කාන්තාවන්ගේ සහභාගිත්වය, පුරවැසියෙක් හැටියට ඇයට සියලුම ක්ෂේත්‍රවලට සහභාගි වීමට තිබෙන අයිතිය තහවුරු කිරීමේ ඒ ක්‍රියාවලිය තුළ මෙය වැදගත් සන්ධිස්ථානයක් වන බවට කිසිම තර්කයක් නැහැ. අපි ඒක තේරුම් ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ප්‍රතිපත්තියකට එහා යන, නීතියක් සම්මත කිරීමටත් එහා යන ව්‍යුහාත්මක වෙනසක් හැටියට අපි මෙය දකින්න ඕනෑ. ඒ කියන්නේ, මේක එක ක්ෂේත්‍රයකට, එක අමාත්‍යාංශයකට, එක දෙපාර්තමේන්තුවකට සීමා වුණු කාරණයක් නොවෙයි. සමස්ත සමාජ ව්‍යුහය තුළම ඇති විය යුතු පරිවර්තනයක් නිසා මේක ටිකක් සංකීර්ණ වැඩක්. ක්‍රමානුකූලව ප්‍රතිපත්ති සකස් කරමින්, අවශ්‍ය නීති සම්පාදනය කරමින්, ඒකට අවශ්‍ය මුදල් ආයෝජනය කරමින්, සමාජ ආකල්ප වෙනස් කරමින් යන්න ඕනෑ ගමනක් නිසා මෙවැනි ප්‍රතිපත්තියක් තුළ එවැනි දීර්ඝ කාලීන දැක්මක් තිබීම අතිශයින්ම අවශ්‍යයි. මේ care work කියන එක, එහෙම නැත්නම් සුරැකුම් වැඩ හරහා ආර්ථිකය පවත්වාගෙන යෑම, සුරැකුම් වැඩවලට සහාය ලබා දීම, එය නියාමනය කිරීමට මැදිහත් වීම, ප්‍රතිසංවිධානය කිරීම සහ සුරැකුම් වැඩ බෙදා ගැනීම හෝ එය තනි පුද්ගලයෙකුගේ හෝ තනි පාර්ශ්වයකගේ පමණක් වගකීමක් නොවන විධියට සකස් කිරීම කියන සියල්ලම මෙයට අඩංගු විය යුතු කාරණා වෙනවා. ඒ වාගේම වැටුප් ලබමින් කරන සුරැකුම් වැඩ, වැටුප් නොලබා කරන සුරැකුම් වැඩ පිළිබඳ වටිනාකමක් දීම, ඒකට අගයක් දීම, විශේෂයෙන් වැටුප් නොලබා කරන සුරැකුම් වැඩ තුළින් සමාජය කොච්චර දුරට යැපෙනවාද කියන එකත්, ඒ නිසාම ඒකට වටිනාකමක් සහ ඇගයීමක් දෙන එකත් අතිශයින්ම වැදගත්.

ප්‍රායෝගිකව අපි මොනවාද මෙතැනින් බලාපොරොත්තු වෙන්නේ? එකක් තමයි, සුරැකුම් වැඩ කියන එක පුද්ගල වගකීමක් පමණක් නොවෙයි, ඊට එහා යන සමාජ වගකීමක් කියන එක හඳුනා ගැනීම සහ එය එසේ දකින එක අතිශයින්ම වැදගත්. එහෙම නැත්නම් දරුවන් බලා ගැනීම, පවුලක් රැකීම, වැඩිහිටියන් රැකීම, ආබාධ සහිත පුද්ගලයන් රැකීම, අසනීපයට පත්වෙච්ච අය රැකීම යන මේ සියල්ලම පෞද්ගලික වගකීම්වලට එහා ගිය සමාජ වගකීමක් හැටියට අර්ථකථනය කිරීම අතිශයින්ම වැදගත්. සුරැකුම් වැඩවල තිබෙන ඒ සමාජයීය බලපෑම දැක්කාම තමයි අපට මේකට පොදු මැදිහත් වීමක් කරන්න පුළුවන් වෙන්නේ සහ පොදු යටිතල පහසුකම් - public infrastructure - කියන දේවල් මේකට කොච්චර බලපානවාද කියන කාරණය තේරුම් ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යටිතල පහසුකම්වලදී විශේෂයෙන් ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ සුරැකුම් ආර්ථිකය අපි හඳුනා ගන්නේ කොහොමද, ප්‍රවාහන ක්ෂේත්‍රය තව ආරක්ෂිත කර ගන්නේ කොහොමද, ප්‍රවාහන ක්ෂේත්‍රය තව කාර්යක්ෂම කරගන්නේ කොහොමද යන කාරණා සියල්ලමත් සුරැකුම් ආර්ථිකයත් එක්ක බද්ධ වෙලා තිබෙනවා. සුරැකුම් වැඩවලට දෙන අගයත් එක්ක ඒක අපට තවත් තහවුරු වෙනවා.

ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තාම, දරුවෙක් පාසලට ඇතුළු කිරීමේ ක්‍රියාවලිය තුළ, අධ්‍යාපනය ලබාදීම තුළ ගෙදරට තිබෙන බර ඒ කියන්නේ, දරුවාගේ homework කරවන එක, අමතර පන්ති යවන එක ඇතුළු සියල්ල තුළින්ම සුරැකුම් වැඩ තවත් සංකීර්ණ වීම, සුරැකුම් වැඩවල බර තව වැඩි වීම තේරුම් අරගනිමින් අධ්‍යාපනය ගෙදරට බරක් නොවන විධියට, දෙමව්පියන්ට බරක් නොවන විධියට වෙනස් වීමත්, සුරැකුම් ආර්ථිකයක්, එහෙම නැත්නම් සුරැකුම් වැඩවල වටිනාකම තේරුම් ගත්ත ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලිය සිද්ධ වෙන්න ඕනෑ. ඒ නිසාම තමයි අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා

කරනකොට, අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් ගැන කථා කරනකොට අන්න ඒක ගැනත් අවධානය දීලා තිබෙන්නේ. දරුවෙකුගේ අධ්‍යාපනයේ, තරුණයෙකුගේ අධ්‍යාපනයේ වගකීම රජයක් හැටියට අපි භාර ගන්නෙත්, රජයක් හැටියට ඒකට මැදිහත් වෙන්නෙත් අන්න ඒ කාරණාව නිසායි. ඒ වාගේම තමයි අධ්‍යාපනය ලබනකොට ඒ අධ්‍යාපනයට තිබෙන ප්‍රවේශය තවත් තහවුරු කිරීමට, නැවත වතාවක් පවුලට හෝ පුද්ගලයෙකුට ඒ බර නොයන විධියට සුරැකුම් මධ්‍යස්ථානද, අවශ්‍ය ආරක්ෂාවද, අවශ්‍ය අනෙක් පහසුකම්ද - ඒ කියන්නේ stationeryවලට දෙන පහසුකම්ද, පොත්පත් ගන්න දෙන උපකාරද, එහෙම නැත්නම් සපත්තු කුට්ටමක්ද, uniformsද - යන සියල්ලම ඒ අර්ථයෙන් තේරුම් අරගෙන, ඒකේ වටිනාකම තේරුම් අරගෙන අපි මේ වෙලාවේ අධ්‍යාපනය තුළ ඒවා පොදු අවශ්‍යතා සහ පොදු යටිතල පහසුකම් හැටියට දකිමින් ඒවාට මැදිහත් වීම සඳහා මේ අවස්ථාවේ ක්‍රියාත්මක වෙනවා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, විශේෂයෙන් ආබාධ සහිත අයගේ අයිතිවාසිකම් තහවුරු කිරීම, ඔවුන්ට ස්වාධීනව ජීවත්වීමට තිබෙන අයිතිය පිළිගැනීම යන මේ සියල්ලම සුරැකුම් ප්‍රතිපත්තියක් තුළ සහ සුරැකුම් ආර්ථිකයක් තේරුම් ගැනීම, එහි වටිනාකම තේරුම් ගැනීම තුළ අපට කරන්න හැකිවීම ගැන මම සතුටු වෙනවා. අපට යන්න තව බොහෝදුරක් තිබුණත් ඒ දිශාව හරියට තේරුම් අරගෙන ඒ දිශාවත් එක්ක ගමන් කිරීමට හැකි වීම පිළිබඳව අපට සතුටු වෙන්න පුළුවන්.

ඒ වාගේම විශේෂයෙන් කාන්තා දේශපාලනයට අවධානය වැඩි වෙන අවස්ථාවලදී මාධ්‍ය හැසිරීම, සමාජ මාධ්‍යවල හැසිරීම යන මේ සියල්ලම තුළත් කාන්තා නායකත්වයට ගෞරවනීය ලෙස සැලකීම, පිළිගැනීම කියන කාරණාවලට අපි අවධානය දිය යුතුයි කියන එක මේ පාර්ලිමේන්තුව තුළ අපි අවස්ථා ගණනාවකදී මතු කර තිබෙනවා. කාන්තාවන්ට පුරවැසියන් හැටියට සමාජය තුළ, දේශපාලනය තුළ, සංස්කෘතිය තුළ බයක් නැතුව, ගෞරවනීය ලෙස මැදිහත් වීමට නම්, ඒ මාධ්‍ය තුළත්, සමාජ මාධ්‍ය තුළත් ඒ ගෞරවනීය බව රැකෙන විධියට, ආරක්ෂාව තහවුරු වෙන විධියට ඒ අවකාශ සංවිධානය වීම පිළිබඳවත් අපේ අවධානය දිය යුතුයි. මේවා නීතියෙන් පමණක් කරන්න පුළුවන් දේවල් නොවෙයි, වෙනස් සමාජ පරිවර්තනයක් තුළ සිද්ධ විය යුතු දේවල්. අපි සියලුදෙනාම දන්නවා, සමාජ පරිවර්තනයක් ඉබේ සිද්ධ වෙන්නේ නැහැ, ඒවාට මැදිහත් විය යුතුය කියලා. ඒ මැදිහත්වීමේ දිශානතිය කෙසේ සිද්ධ විය යුතුද කියන එක තමයි දේශපාලනිකව අපේ අවධානයට ගත යුත්තේ. කාන්තාවන්ට වාගේම යුක්තිය, සාධාරණත්වය ලැබිය යුතු සියලුදෙනාටම ගෞරවනීය ලෙස, සුරක්ෂිත ලෙස ජීවත් වෙන්නත්, පුරවැසියන් හැටියට සමානව සම්බන්ධ වීමටත්, ඒ අයිතිය තහවුරු වෙන විධියේ සමාජ පරිවර්තනයක් ඇති කිරීමටත් තමයි අපි බලාපොරොත්තු වන්නේ. ඒ වෙනුවෙන් තමයි අපි වැඩ කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්න ඒ දිශානතියට මේ සමාජය ගෙන යෑමේදී ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් ඉතාම වැදගත් කාරණයක් වන බව නොඅනුමානයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයටත්, අද දින මෙම වැදගත් යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමියටත්, එය ස්ථිර කළ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියටත් මම ස්තුතිවන්ත වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. K. Kader Masthan. You have six minutes.

[மு.ப. 11.55]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற சர்வதேச மகளிர் தினம் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்து கொண்டு உரையாற்றுவதற்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு நன்றியைக் கூறிக்கொள்கின்றேன். இம்மாதம் 8ஆம் திகதியே சர்வதேச மகளிர் தினமாகும். எனினும், முன்கூட்டியே சர்வதேச மகளிர் தின வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இலங்கையின் சனத்தொகையில் கிட்டத்தட்ட 52 சதவீதமானவர்கள் பெண்களாக இருக்கின்றார்கள். எனினும், ஒவ்வொரு செயற்பாட்டிலும் - activitiesஇலும் - அவர்களுக்குரிய பங்கு உரிய முறையில் சென்றடையவில்லை என்றுதான் கூற வேண்டும். இந்த அரசாங்கத்தில் பிரதம மந்திரியாக ஒரு பெண்மணி இருப்பதால், இதனை நிவர்த்தி செய்து, எதிர்காலத்தில் அரசியல் செயற்பாடு, பொருளாதார செயற்பாடு உட்பட எல்லாச் செயற்பாடுகளிலும் பெண்கள் உரிய பங்கை வகிக்கக்கூடிய விதத்தில் இந்த அரசாங்கத்தின் செயற்பாடுகள் அமைய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மூன்றாம் உலக யுத்தம் ஏற்பட்டுவிடுமோ என்றளவுக்கு இன்று உலகில் பயங்கரமான நிலைமை இருக்கின்றது. இதற்குக் காரணம் ஏகாதிபத்தியமும் யுத்த வெறியும்தான். இதன் பின்னணியிலேதான் ஈரானின் உச்ச ஆன்மீகத் தலைவர் ஆயதுல்லா அலி கமேனி அவர்கள் கொலை செய்யப்பட்டுள்ளார். அவர் ஈரானிய மக்களுக்குச் செய்துள்ள பணிகளை நான் நினைவுகூர்கின்றேன். அவர் ஓர் உன்னதத் தலைவராக இருந்து, அந்நாட்டு மக்களை பாரம்பரியம், நாகரிகம், பண்பாடு கொண்ட சமூகமாக ஒழுங்கமைப்பதற்கு வழிகாட்டினார். அவருடைய இழப்பு ஈடுசெய்ய முடியாததாகும். எனவே, இந்தச் சந்தர்ப்பத்தில் ஈரான் அரசாங்கத்துக்கும் அந்நாட்டு மக்களுக்கும் எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

ஏகாதிபத்தியத்தின் அடிப்படையில் ஈரான்மீது மிருகத்தனமான தாக்குதல்களை மேற்கொள்கின்றார்கள். அமெரிக்காவும் இஸ்ரேலும் போர் வெறி பிடித்து அலைகின்றன. உலக சமாதானத்துக்காக உருவாக்கப்பட்ட ஐ.நா. சபை இவர்களைக் கட்டுப்படுத்தாமல் என்ன செய்துகொண்டு இருக்கின்றது? என்ற கேள்வி எழுகின்றது. இவர்கள் சொல்கின்றார்கள், “நாங்கள் சரியாக aim பண்ணித்தான் அடித்தோம்” என்று. ஈரானில் 167 பாடசாலைச் சிறுமிகள் இறந்திருக்கிறார்கள். அப்படியென்றால், அவர்களுக்கும் aim பண்ணித்தான் அடித்திருக்கிறார்கள். Aim பண்ணி எல்லாவற்றையும் செய்வதாகச் சொல்கின்ற இவர்கள், வெனிசுலா நாட்டிலிருந்து சனாதிபதியைக் கடத்திக்கொண்டு போயிருக்கிறார்கள்; ஈரானின் உச்ச ஆன்மீகத் தலைவரைக் கொலைசெய்து இருக்கிறார்கள்; அங்குள்ள 167 பாடசாலை மாணவர்களைக் கொலைசெய்து இருக்கிறார்கள். இவ்வாறான செயற்பாடுகளை உடனடியாக நிறுத்த வேண்டும். அதேபோல், அமெரிக்காவுக்கு military bases அமைப்பதற்கு அனுமதி வழங்கியுள்ள சவூதி அரேபியா, UAE, கட்டார், குவைத் போன்ற நாடுகள்மீது ஈரான் தாக்குதல் நடத்துவதையும் உடனடியாக நிறுத்த வேண்டும். நாங்கள் கூறுவது என்னவென்றால், இந்தப் போர் நிறுத்தப்பட வேண்டுமென்றுதான். சமாதானத்தை

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

ஏற்படுத்துவதற்குரிய ஏற்பாடுகளை எமது அரசாங்கம் செய்ய வேண்டும். அது இன்று பாரிய கேள்விக்குறியாக இருக்கின்றது.

கிட்டத்தட்ட 100 ஈரானிய கடற்படையினர் இறந்ததற்குக் காரணமாக எமது அரசாங்கம் இருந்திருக்கின்றது என்பதை நினைக்கும்போது வேதனையாக இருக்கின்றது. அவர்கள் 11-12 மணித்தியாலங்களாக உதவி கோரியும் அவர்களுக்கு எமது அரசாங்கம் உதவி வழங்கவில்லை. "உதவி வழங்காவிட்டாலும் பரவாயில்லை, காட்டிக் கொடுக்காமல் இருந்திருக்கலாம்" என்று வெளியில் பேசிக்கொள்கிறார்கள். உண்மையிலேயே இது வேதனைக்குரிய விடயமாகும். மாண்புமிகு சனாதிபதி அவர்கள் சமாதானத்தை ஏற்படுத்துவதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டும். ஒரு சிறிய நாடும் சமாதானத்தை ஏற்படுத்துவதில் பாரிய பங்கு வகிக்கலாம். அந்த அடிப்படையில், இது உலகப் போராக மாறாமல், யுத்தத்தில் ஈடுபட்டிருக்கின்ற அமெரிக்கா, இஸ்ரேல், ஈரான் நாடுகளோடு பேச்சுவார்த்தை நடாத்தி, சமாதானத்தை ஏற்படுத்துவதற்குரிய ஏற்பாடுகளை விரைவாகச் செய்ய வேண்டுமென நாங்கள் இந்த இடத்தில் அரசாங்கத்திடம் கேட்டுக் கொள்கின்றோம். இந்த யுத்த சூழ்நிலையால் பாதிக்கப்பட்டிருக்கின்ற ஈரான், சவூதி அரேபியா, குவைத், பஹ்ரைன், கட்டார் போன்ற நாடுகளில் ஏற்பட்டிருக்கின்ற உயிரிழப்புகளுக்கு எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த யுத்தத்தை விரைவாக முடிவுக்குக் கொண்டுவர வேண்டுமெனவும், அதற்குரிய ஏற்பாடுகளை அரசாங்கம் செய்ய வேண்டுமெனவும் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. (Mrs.) Hemali Weerasekara. You have nine minutes.

[අ.භා. 12.01]

**ගරු හේමාලි වීරසේකර මහත්මිය (නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. (Mrs.) Hemali Weerasekara - Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාර්තු 08වැනි දිනට යෙදී තිබෙන ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ඉල්ලීම මත අද පවත්වන කල් තැබීමේ විවාදයේදී අදහස් දක්වන්න ලැබීම මට සතුටට කරුණක්. මා මෙය අවස්ථාවක් කර ගන්නවා, රටේ ජනගහනයෙන් සියයට 52ක් වන කාන්තාව වෙනුවෙන් හඬ අවදි කරන්න වාගේම, ඇය තුළ ඇති ශක්තිය හා හැකියාව ගැන පොදු සමාජයට වාගේම අපේ රටේ කාන්තාවටත් උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

අපේ රජයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව කාන්තාව කියන්නේ, තවදුරටත් හුදෙක් සුබසාධනය මත ජීවත් වන අයෙකු නොවන බවත්, මේ රටේ නිෂ්පාදන හා සේවා ආර්ථිකයේ ප්‍රධාන කොටස්කරුවෙකු වන බවත් මම මුලින්ම අවධාරණය කරන්න කැමැතියි. මේ ගරු සභාවේ අවධානය යොමු කරවමින් කථා කරන්න මා කැමැතියි, අපේ රටේ මෑත කාලයේ -විශේෂයෙන්ම වර්තමානයේ- විවිධ ක්ෂේත්‍රවල ඉතා කැපවීමෙන් තම කාර්යභාරය ඉෂ්ට කරන ශ්‍රී ලංකාවේ කාන්තා නියෝජනය ගැන.

විශේෂයෙන්ම ලංකාවට ඡන්ද අයිතිය ලැබිලා අවුරුදු 90කට වැඩි වුණත්, පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය සියයට 6 ඉක්මවන්න බැරි වුණා. පාර්ලිමේන්තු ඉතිහාසය සැබෑ පරිවර්තනයකට ලක් කරමින් එම ප්‍රතිශතය 9.8 දක්වා වර්ධනය වුණේ 2024දී පැවැති මැතිවරණයත් සමඟයි. ඇත්තටම ආණ්ඩුවක් ලෙසත්, දේශපාලන පක්ෂයක් ලෙසත් පොහොසත් රටක් ගොඩ නඟන්න නම් අපි හිතනවා, මේ රටේ දේශපාලන යන්ත්‍රණය තුළ වාගේම රට වෙනුවෙන් තීන්දු තීරණ ගන්නා සෑම තැනකම කාන්තාව ප්‍රබල සාධකයක් වෙන්න ඕනෑ කියලා. අද වන විට දසවැනි පාර්ලිමේන්තුවේ - ව්‍යවස්ථාදායකය තුළ - ඒ වෙනස, ඒ පරිවර්තනය ඉතා හොඳින් පෙනෙන්නට තිබෙනවා.

අපේ ගරු අගමැතිතුමිය, හරිනි අමරසූරිය සහෝදරිය අගමැති ධුරයේ වගකීම් මැනවින් ඉෂ්ට කරන ගමන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන ඇමතිවරිය ලෙස ද කැබිනට් ඇමති ධුරයක් දරමින් ඇගේ කාර්යභාරය ඉතා ප්‍රශස්ත අයුරින් ඉෂ්ට කරමින් සිටිනවා. ඒ වාගේම තමයි කැබිනට් ඇමති ධුරයක් දරමින් කාන්තා සහ ළමා කටයුතු ඇමතිවරිය ලෙස සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය, ඒ වාගේම ජනමාධ්‍ය නියෝජ්‍ය ඇමතිවරිය ලෙස කෞෂල්‍යා ආරියරත්න සහෝදරිය දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවට අභීත නායකත්වයක් දෙමින් ආණ්ඩුකරණ ක්‍රියාවලියේද ඉතාම දක්ෂ ලෙස නියැළෙනවා. මේ දසවැනි පාර්ලිමේන්තුව තුළ අනෙකුත් මන්ත්‍රීවරියන් ද පක්ෂ, විපක්ෂ භේදයක් නැතිව විවිධ සංසද, ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා ආදියෙහි සභාපතිත්වය දරමින් නායකත්වය ගෙන කටයුතු කරනවා. ඒ වාගේම, මෙතෙක් මන්ත්‍රීවරයෙකු විසින් පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කාරක සභා සභාපති ධුරය දැරුවත් මෙවර පළමුවරට මන්ත්‍රීවරියකට එම තනතුර ලැබීමත් විශේෂත්වයක් කොට සලකනවා. එපමණක් නොවෙයි, ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුළ ක්‍රියාකාරී මන්ත්‍රීවරියන් 2,300කට වැඩි පිරිසක් ජනතා නියෝජිතයන් ලෙස ජනතා සේවයේ යෙදී සිටිනවා. ඒ අතරින් පිරිසක් නගරාධිපති, උප නගරාධිපති, සභාපති සහ උප සභාපති ලෙස වැඩ කටයුතු කරමින් සිටිනවා.

ඒ වාගේම, මේ රටේ අධිකරණ ක්ෂේත්‍රය දෙසට හැරුණොත්, අගවිනිසුරු ධුරයට පත් දෙවැනි කාන්තාව වන්නේ 48වැනි අගවිනිසුරු මුර්දු නිරූපා ප්‍රනාන්දු මහත්මියයි. එම නිලය තුළ විශාල කාර්යභාරයක් කරමින් සිටි ඇය 2025 ජූනි මස සේවයෙන් විශ්‍රාම ගියා. ඊට අමතරව අද වෙනකොට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරියන් හා මහාධිකරණ විනිසුරුවරියන් ලෙස තවත් කාන්තාවන් 5දෙනෙක් කටයුතු කරනවා. තවද, අධිකරණ විනිසුරුවරියන් ලෙස සියයට 31.3ක කාන්තා නියෝජනයක් තිබෙනවා. සමස්ත නීතිඥවරියන්ගේ ප්‍රතිශතය 70.8ක් වෙනවා. අමාත්‍යාංශ ලේකම්වරියන් ලෙස, විදේශ තානාපතිවරියන් ලෙස කාන්තාවන් 5දෙනා බැගින් ගෞරවනීය සේවයක් ඉටු කරමින් සිටිනවා. ඒ වාගේම පළාත් ලේකම්වරියන් ලෙස තවත් කාන්තාවන් දෙදෙනෙක් ද, රාජ්‍ය පරිපාලන, මුදල් හා ආදායම්, තාක්ෂණික යන ක්ෂේත්‍රවල කාන්තාවන් 22ක් අධ්‍යක්ෂක ජනරාල් ධුර, කොමසාරිස් ජනරාල් ධුර හොබවමින් සිටිනවා. එමෙන්ම, කුෂානි රෝහණදීර මහත්මිය 10වැනි පාර්ලිමේන්තුවේ වර්තමාන මහ ලේකම්වරිය ලෙස කටයුතු කරනවා. එතුමිය තමයි එම ධුරයට පත් වූ දෙවැනි කාන්තාව. එතුමිය ලේකම් මණ්ඩලයේ ප්‍රධානියා ලෙස ඉතා ශක්තිමත් නායකත්වයක් ලබා දෙමින් සිටිනවා.

ඉතින්, මේ සියල්ල අතර මම දැන් අවධානයට යොමු කරන්නේ මෙරට පළමු කාන්තා නියෝජ්‍ය පොලිස්පතිනියන් සිව්දෙනා පිළිබඳවයි. ඒ සිව්දෙනා නම් වශයෙන් කිව්වොත්, දර්ශිකා කුමාරි මහත්මිය කාන්තා කාර්යාංශය භාර නියෝජ්‍ය

පොලිස්පති ලෙසත්, පද්මිණී වීරසූරිය මහත්මිය කළුතර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ලෙසත්, රේණුකා ජයසුන්දර මහත්මිය රත්නපුර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ලෙසත්, නිශානි සෙනෙවිරත්න මහත්මිය පර්යේෂණ හා තොරතුරු කොට්ඨාසයේ නියෝජ්‍ය පොලිස්පති ලෙසත් කටයුතු කරනවා. ඊට අමතරව වර්තමානයේ කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරියන් 4දෙනෙක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරනවා.

ඒ වාගේම අපට අමතක කරන්න බැහැ, අපේ රටේ වර්තමාන විගණකාධිපති සමුදිකා ජයරත්න මහත්මිය. එතුමිය තමයි විගණකාධිපති ධුරය හොබවන පළමු කාන්තාව. මේ අවස්ථාවේ මම සඳහන් කරන්න කැමැතියි, ඇයත්, මමත් එක විදු මෑණියකගේ දියණියන් බව. මම මුලින් අධ්‍යාපනය ලද කොළඹ යශෝදරා බාලිකාව ඇයගේද පාසලයි. රටේ ආරක්ෂක ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය යම් අඩු මට්ටමක තිබුණත්, අනෙක් සෑම ක්ෂේත්‍රයක් තුළම, විශේෂයෙන් වෛද්‍ය, ගුරු, විදුහල්පති, පරිපාලන, ගණකාධිකාරි, ක්‍රම සම්පාදන සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සියයට 50 ඉක්මවන කාන්තා නියෝජනයක් දකින්නට පුළුවන්. ඒ වාගේම, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළු වන කාන්තා ශිෂ්‍ය නියෝජනය අඛණ්ඩව සියයට 63 ඉක්මවනවා.

මහා පරිමාණ ව්‍යාපාරික ක්ෂේත්‍රය, ඒ වාගේම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ක්ෂේත්‍රය අතික්‍රමණය කළ කාන්තා චරිත විශාල ප්‍රමාණයක් අපට තිබෙනවා. මේ අවස්ථාවේ මට ඒ සියලුදෙනාගේ නම් සඳහන් කරන්නට නොහැකි වීම පිළිබඳව සමාව ඉල්ලා සිටිනවා. හැබැයි, සමස්ත කාන්තාවන්ගෙන් සියයට 30ක් පමණයි මේ සියලු නියෝජනය තුළ තිබෙන්නේ. මීට ඉස්සෙල්ලා කථා කරපු අපේ මන්ත්‍රීවරියන් තිදෙනාම කිව්වා වාගේ සුරැකුම් ආර්ථිකය තුළ සිටින පිරිසගෙන් සියයට 70ක්ම කාන්තාවන්. ඒ ශ්‍රමය ජාතික ආර්ථිකයට එක් කර ගැනීමට අවශ්‍ය ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් අවශ්‍යයි කිව්වොත් එහි විවාදයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාව තවදුරටත් දුර්වල, හීන පෞරුෂයක් සහිත නිවට නියාලු අයෙක් නොවෙයි. මම කියන්න කැමැතියි, මම ඉහත සඳහන් කළ කිසිදු කාන්තාවක් එම ධුර සඳහා ඉබේ පහළ වුණු අය නොවෙයි කියන එක. ඒ වාගේම, එම ධුර ඔවුන්ට බන්දේසියක තබා පිළිගැන්වූ ඒවාත් නොවෙයි. ඒවා තමන් ඉදිරියේ වූ අභියෝග ජය ගනිමින්, සමහර විට නින්දා අපහාසවලට එරෙහිව නැඟී සිටිමින්, ඇය තුළ වූ ශක්තිමත්, අභිමානවත් ගැහැනියට පණ පොවමින්, තමන් සතු හැකියාව තුළින් අධිෂ්ඨානයෙන් සහ ධෛර්යයෙන් දිනාගත් තනතුරු. මගේ රටේ ආදරණීය සහෝදරියනි, මේ රට දිනූ සියලු කාන්තාවන් වාගේම ඔබත් ශක්තිමත්. අරමුණ වෙනුවෙන් කැප වීම, දරා ගැනීම වාගේම, අභියෝග හමුවේ ඉන්ද්‍රඛීලයක් සේ නැඟී සිටිමින්, වැටුණත් නැවත නැඟිටිමින් සියල්ල ජයගත හැකි ගැහැනිය ඔබයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවට තවදුරටත් අවශ්‍ය වන්නේ අනුකම්පාව නොවෙයි, අවස්ථාවයි. ඇයට නිවස තුළ මෙන්ම රටේ ආර්ථිකය තුළත් ගෞරවනීය තැනක් හිමි විය යුතුයි. ඇයට ඕනෑම තැනක අදහස් දැක්වීමේ අයිතිය සහ පරිසරය තහවුරු කළ යුතුයි. ඇයට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම්ව, ලිංගිකත්වය මත පදනම්ව අපහාස උපහාස සිදු නොවිය යුතුයි. අවට නිවසේදී, මහ මගදී, රැකියා ස්ථානයේදී බියෙන් තොරව ජීවත් වීමට ඇති අයිතිය සුරැකිය යුතුයි. අනුකම්පාව වෙනුවට ඇයගේ ගමනට බාධා නොවන සමාජයක් සෑදීම මුළුමහත් සමාජයම සතු වගකීමක් ලෙස මම දකිනවා.

අයර්ලන්තයේ ප්‍රථම ජනාධිපතිනිය මේරි රොබින්සන් මහත්මියගේ ප්‍රකාශයකින් මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඇය මෙහෙම කියනවා:

"දේශපාලනයට එක් කාන්තාවක් පැමිණි විට ඇය වෙනස් වේ. නමුත් දේශපාලනයට බොහෝ කාන්තාවන් පැමිණි විට දේශපාලනය වෙනස් වේ.''

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වැඩ පිළිවෙළ තුළ දේශපාලන පක්ෂයක් ලෙසත්, ආණ්ඩුවක් ලෙසත් ඒ වෙනස අපි සිදු කරමින් සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Hemali Weerasekara, your time is up.

**ගරු හේමාලි වීරසේකර මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர)
(The Hon. (Mrs.) Hemali Weerasekara)
*ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තත්පර 30ක් දෙන්න.*

අපේ රටේ කාන්තාව දේශපාලනිකව සවිඥාණ කරමින්, ඇයගේ අයිතිය සුරකිමින්, ජාතික ආර්ථිකයට ඇයගේ දායකත්වය ලබා ගනිමින් තවදුරටත් ඇය මේ සමාජයේ වින්දිතයෙක් නොකර විජයග්‍රාහිකාවක් ලෙස ඔසවා තැබීමේ ක්‍රියාවලිය අපි සිදු කරමින් සිටිනවා යැයි පවසමින් මම සමු ගන්නවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Jeevan Thondaman. You have eight minutes.

[පි.ව. 12.11]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
*கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வணக்கம்!*

Hon. Prime Minister, I would appreciate it, if you could hear me out on this. Is it all right, if I address you in Tamil? கௌரவ பிரதமர் அவர்கள் இங்கு வீற்றிருப்பதற்கு என்னுடைய மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். கௌரவ பிரதமர் அவர்களே, இன்றைக்கு நான் இந்தச் சபையில் முக்கியமானதொரு விடயம் பற்றி பேசவேண்டி இருக்கின்றது. அதுவும் வேதனைக்குரிய ஒரு விஷயம் பற்றி பேசவேண்டிய இருக்கின்றது. நான் இந்த இடத்தில் பெயர்களைக் குறிப்பிட விரும்பவில்லை. சமீபத்தில் நுவரெலியா மாவட்டத்திலுள்ள முக்கியமான ஓர் அரச வைத்தியசாலையில் ஓர் இளம் பெண் இறந்திருக்கிறார். அவரது உடல் பிரேதப் பரிசோதனை செய்யப்பட்ட பிற்பாடு, குற்றச்சாட்டு ஒன்று முன்வைக்கப்பட்டு இருக்கின்றது. அதாவது, அந்தப் பெண்ணின் உடல் பிரேதப் பரிசோதனை செய்யப்பட்ட பிற்பாடு, அன்று இரவு அதே வைத்தியசாலையில் வேலை செய்கின்ற மூன்று ஊழியர்கள் - minor staff - பிரேத அறையின் பூட்டை உடைத்துக்கொண்டு உள்ளே போயிருக்கிறார்கள். இது சம்பந்தமாக என்னுடைய அபிப்பிராயத்தை நான் சொல்ல விரும்பவில்லை. ஆனால், இதன்போது நடந்த விடயம் என்ன? இதன் உண்மைத் தன்மை

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

என்ன? என்பதை அறியும் விடயத்தை அரசாங்கம் கட்டாயம் பொறுப்பெடுத்தாக வேண்டும். ஏனென்றால், இன்றைக்கு மலையகத்தில் பதற்றமான நிலைமை ஏற்பட்டிருக்கிறது. இப்பொழுதுகூட, அங்கு பல்வேறு பகுதிகளில் ஆர்ப்பாட்டங்கள் நடந்துகொண்டு இருக்கின்றன.

இறந்த பெண்ணின் குடும்பத்தினரைப் பொறுத்த வரைக்கும், அவர்களுக்கு இது சம்பந்தமாகப் பேசவோ, இது சம்பந்தமான விடயத்தை வெளியே கொண்டுவரவோ விருப்பமில்லை. இது ஒரு குடும்பத்தின் தனிப்பட்ட பிரச்சினை கிடையாது. சமூகத்துக்கு மிகவும் ஆபத்தான ஒரு விஷயம்! பல்வேறு தரப்பினர் இச்சம்பவம் பற்றி தங்களுடைய அபிப்பிராயங்களையும் குற்றச்சாட்டையும் முன்வைக்கின் றார்கள். ஆனால், உண்மை என்ன என்பதை அரசாங்கம் கட்டாயம் கண்டறிய வேண்டும். அதே வைத்தியசாலையில் வேலைசெய்யும் ஒரு மூத்த மருத்துவர் ஊடகங்களுக்கு வழங்கிய statementஇல் வெளிப்படையாகவே சொல்லி யிருக்கிறார், “மூன்று நபர்கள் உள்ளே போய் வெளியே வந்திருக்கிறார்கள்; நாங்கள் வைத்த மாதிரி அந்தச் சடலம் இப்போது இல்லை” என்று.

நிலைமை அப்படி இருக்கும்போது, இங்கு ஒரு சந்தேகம் எழுகின்றது. இதுதான் நடந்திருக்கின்றது, இது நடக்கவில்லை என்று சொல்லும் அதிகாரம் எனக்குக் கிடையாது. அரசாங்கம் இந்த விடயத்தைப் பொறுப்பேற்று, அதன் உண்மைத்தன்மை என்ன என்பதை மக்களுக்குத் தெளிவுபடுத்தியாக வேண்டும். ஏனெனில், இந்த மாதிரியான விடயங்கள் நிறைய இடங்களில் நடந்திருக்கின்றன. எனவே, நாம் இது சம்பந்தமாக நடவடிக்கை எடுத்து, இதற்கு முற்றுப்புள்ளி வைத்தாக வேண்டும். இப்போது வெளிவந்திருக்கின்ற இந்த விடயம் ஒருவேளை உண்மையாக இருந்தால், இதற்கு முன்னரும் இப்படியான பல சம்பவங்கள் நடந்திருக்குமோ? என்ற கேள்வி எழுகின்றது. இதற்குப் பிறகும் இப்படி நடக்குமோ? என்ற இன்னொரு கேள்வியும் எழுகின்றது. எனவே, இந்த விடயத்தை நேரடியாக கௌரவ பிரதமர் அவர்களின் கண்காணிப்பின்கீழ் கொண்டுவந்து, உரிய நடவடிக்கை எடுக்க வேண்டுமென அரசாங்கத்திடமும் அந்த மாவட்டத்தைப் பிரதிநிதித்துவப் படுத்தும் ஆளும் கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களிடமும் தாழ்மையாகக் கேட்டுக் கொள்கின்றேன். அத்துடன், அடுத்த பாராளுமன்ற அமர்வில் இது சம்பந்தமான உங்களின் கருத்தையும் நாங்கள் எதிர்பார்க்கின்றோம். மக்களும் அதனை ஆவலோடு எதிர்பார்த்துக்கொண்டு இருக்கின்றார்கள்.

அடுத்து, மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சின்கீழ் வருகின்ற சில விடயங்களைப் பேசியாக வேண்டும். இன்றைக்கு பெருந்தோட்டப் பகுதிகளில், குறிப்பாக கண்டி மாவட்டத்தில் இருக்கின்ற கலாபொக்க, பன்வில பகுதிகளாக இருக்கட்டும், நுவரெலியா மாவட்டத்தில் இருக்கின்ற பகுதிகளாக இருக்கட்டும்! இந்தப் பகுதிகள் தொடர்பில் நாம் ஒரு விடயத்தைத் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டும். அதாவது, இந்தப் பகுதிகளில் தோட்டத்தில் வேலை செய்கின்றவர்களும் இருக்கின்றார்கள்; தோட்டத்தில் வேலை செய்யாதவர்களும் இருக்கின்றார்கள். இந்த இரு தரப்பினரும் மலையகத்தில்தான் வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். தோட்டத்தில் வேலை செய்கின்றவர்களுடைய பிள்ளைகள் தோட்டத்தில் வேலை செய்யமாட்டார்கள். அப்படி இருக்கும்போது, இன்றைக்கு பெருந்தோட்ட நிறுவனத்தைப் பொறுத்தவரை, தோட்டத்தில் வேலை செய்தால்தான் அவர்களுக்கும் அவர்களுடைய பிள்ளைகளுக்கும் அங்கீகாரம் வழங்குகின்றது. நான் இதை கௌரவ பிரதமர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டுவருவதற்குக் காரணம் இருக்கிறது. இன்றைக்கு மலையகத்தின் பல்வேறு தோட்டப் பகுதிகளில் நடாத்தப்பட்டுக் கொண்டிருக்கின்ற preschoolsஇல் தோட்டத்தில் வேலை செய்யாதவர்களின் பிள்ளைகளும் கல்விகற்க முடியும். ஆனால், இன்றைக்கு மலையகத்தின் பல்வேறு பகுதிகளில் "நீங்கள் தோட்டத்தில் வேலை செய்யவில்லை என்றால், உங்களுடைய பிள்ளைகளை preschoolsக்கு எடுக்க முடியாது" என்று அங்கிருக்கின்ற முகாமையாளர்கள் ஒரு பிரச்சினையை உருவாக்கிக்கொண்டு இருக்கின்றார்கள்.

கௌரவ பிரதமர் அவர்களே, நீங்கள் சிறுவர் பாதுகாப்பு தொடர்பான அலுவலராக இருந்திருக்கிறீர்கள். இதன் முக்கியத்துவம் என்னவென்று உங்களுக்குக் கட்டாயம் தெரியுமென நான் நினைக்கின்றேன். கடந்த வாரம் PREDO என்ற நிறுவனம் ஹற்றனில் ஆர்ப்பாட்டம் செய்தது. ஏனென்றால், இவ்வளவு காலமும் NGOஆக, சிவில் அமைப்பாக இருந்து தோட்டப் பகுதிக்குள் அவர்கள் நடத்தி வந்த preschools இன்றைக்கு தோட்ட முகாமைத்துவம்மூலம் அவர்களிடமிருந்து வலுக்கட்டாயமாகப் பறிக்கப்படுகின்றன. ஆகவே, தயவுசெய்து இதில் உங்களுடைய interventionஐ மேற்கொள்ளுமாறு நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இன்னொரு விடயத்தைச் சொல்ல வேண்டும். நான் இந்த விடயத்தைப் பல தடவை அரசாங்கத்திடம் சொல்லி இருக்கிறேன். தயவுசெய்து, நீங்கள் இதைக் கருத்திலெடுங்கள்! இன்றைக்கு மலையக மக்களின் எண்ணிக்கை கிட்டத்தட்ட பத்து இலட்சம். Censusஐப் பொறுத்தவரை, அதில் வேறு பிரச்சினை நடந்தது. ஆனால், கிட்டத்தட்ட பத்து இலட்சம் பேர் இருக்கிறார்கள். அவர்களில் ஓர் இலட்சத்துக்கும் குறைவானவர்கள்தான் தோட்டத் தொழிலில் ஈடுபடுகின்றார்கள். இந்தச் சமூகத்திலுள்ள பெரும்பாலான மக்கள் தோட்டத்தொழில் அல்லாத வேறு தொழில்களிலே ஈடுபடுகின்றார்கள். அதாவது, informal sectorஇல் இருக்கின்றார்கள். இன்றைக்கு பெருந்தோட்ட நிறுவனங்களிடம் அவர்களுக்கு முக்கியத்துவமோ, அடையாளமோ, எந்தவித உதவியோ கிடையாது. இதுதான் உண்மையான பிரச்சினை! நாம் ஒவ்வோர் இடத்துக்கும் போய், “இந்த அரசியல்வாதி தவறு; இந்த தொழிற்சங்கம் தவறு” என்று சொல்வதில் பிரயோசனமில்லை. பிரச்சினை systemக்குள்தான் இருக்கிறது.

பெருந்தோட்ட நிறுவனங்களிடம் ஒப்பந்தத்தின் ஊடாக ஒப்படைக்கப்பட்ட இந்தப் பகுதிகளிலுள்ள மக்களும் அந்த ஒப்பந்தத்தின் அடிப்படையில்தான் இயங்கிக்கொண்டு இருக்கிறார்கள். அவர்கள் இலங்கை நாட்டின் பிரஜைகளாக அல்லாது, பெருந்தோட்ட நிறுவனங்களின் பிரஜைகள் போல்தான் இருக்கிறார்கள். அதை மாற்றியமைப்பதற்காக நாங்கள் அமைச்சரவைப் பத்திரமொன்றை - Cabinet Paper - சமர்ப்பித்து, அதற்கான அனுமதியையும் எடுத்திருக்கிறோம். தயவுசெய்து, கடந்த அரசாங்கத்தால் சமர்ப்பிக்கப்பட்ட அந்த அமைச்சரவைப் பத்திரத்தை எடுத்துப் பாருங்கள்! அதை உங்களால் கட்டாயம் பாவிக்க முடியும். அந்த அமைச்சரவைப் பத்திரத்தின் ஊடாக நாங்கள் எடுத்த அனுமதி என்ன வென்றால், பெருந்தோட்டப் பகுதிகளில் மனிதர்கள் வாழும்

இடங்களை அராசங்கம் பொறுப்பேற்க வேண்டும் என்பதுதான். இன்றைக்கு அந்த இடங்கள் அரசாங்கத்தின் கட்டுப்பாட்டுக்குள் கிடையாது. அவை பெருந்தோட்ட நிறுவனங்களின் கட்டுப்பாட்டுக்குள்தான் இருக்கின்றன. தோட்டத்தில் வேலை செய்தால் மட்டும்தான் அங்கே இருக்க முடியும். தயவுசெய்து, இந்த விடயத்தைக் கருத்திலெடுங்கள்!

கௌரவ பிரதமர் அவர்களே, நீங்கள் இங்கு இருப்பதனால் இன்னுமொரு விடயத்தை முன்வைக்க விரும்புகின்றேன். நான் இந்த விடயத்தை ஒரு மாதமாகச் சொல்லி வருகின்றேன். தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பளத்தை அதிகரித்துக் கொடுப்பதில் எனக்கு எந்த ஆட்சேபனையும் இல்லை. நான் உங்களுடைய வரவு செலவுத்திட்டத்துக்கு ஆதரவாக வாக்களித்திருக்கிறேன். நான் அப்பொழுதிருந்து உங்களிடம் ஒரேயொரு கோரிக்கையைத்தான் முன்வைத்து வருகின்றேன். தயவுசெய்து, தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு தொடர்பான வர்த்தமானியை வெளியிடுங்கள்! அந்த வர்த்தமானியை வெளியிட்டால் மட்டும்தான் அந்தச் சம்பளம் நியாயமான முறையில் மக்களுக்குக் கிடைக்கும். இன்றைக்கு பதிவுசெய்யப்பட்ட 78,000 தொழிலாளர்களுக்கு அந்தச் சம்பளம் கிடைக்கிறதா, இல்லையா? என்பது வேறு விடயம். ஆனால், இன்றைக்கு கைக்காசு தொழிலாளர்களுக்கு கிடைப்ப தில்லை. தனியார் துறையிலுள்ள தொழிலாளர்களுக்கும் அது கிடைப்பதில்லை. பல்வேறு இடங்களில் நிபந்தனைகளை விதித்து, பறிக்கும் கொழுந்தின் அளவை அதிகரித்து இருக்கிறார்கள். தயவுசெய்து, வர்த்தமானியை வெளியிடுங்கள்! அத்துடன், நீங்கள் கையெழுத்திட்ட அந்த ஒப்பந்தத்தையும் வெளியிட்டாக வேண்டும். அதனை Right to Information Actமூலம் பார்க்கலாம் என்று பார்த்தால், அது rejectஆகி இருக்கிறது. நாங்கள் appeal பண்ணியிருக்கிறோம். தயவுசெய்து, இதைக் கருத்திலெடுங்கள்!

Sir, I would like to bring up just one last matter. Hon. Prime Minister, I am aware of the Hon. Foreign Minister's statement yesterday on the Iranian crisis. I would like to make my submission in this House that it is not for any particular country, especially the United States, to decide who should be executed, imprisoned or removed. In a situation where Sri Lanka has benefited through Iran - again, many people may differ in their opinion about the actions of that Government - be it through the Uma Oya Project, be it through the barter of tea for oil or be it through even cultural exchanges and scholarships, silence cannot be a long-term foreign policy, as we will lose our credibility.

Yesterday, in our waters, within our territory, an Iranian vessel, which was returning from its naval exercise in India, was sunk. Yes, we have gone and saved the survivors, but that really brings up a question, Hon. Prime Minister. Again, this is not a criticism on the Government, but we, as the Opposition. are looking for clarification or would like to know, was Sri Lanka aware of these operations that were taking place within our waters or were we also part of this?

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Mrs.) Geetha Herath. You have nine minutes.

[අ.භා.12.20]

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදයට ගනු ලබන්නේ, සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද යෝජනාවයි. ඒක අපට වැදගත් යෝජනාවක්. මොකද, මාර්තු 08වැනි දාට ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී තිබෙන නිසා. ඒ සඳහා තවත් දින කිහිපයයි තිබෙන්නේ. එවැනි පරිසරයක් තුළ කාන්තාවගේ සුරක්ෂාව වෙනුවෙන් කථා කරන්න අවස්ථාව ලැබීම ඇත්තටම අගය කරනවා. මට කලින් කථා කරපු අපේ මන්ත්‍රීවරියන් මේ පිළිබඳව අදහස් දැක්වූවා; එහි තිබෙන වටිනාකම පැහැදිලි කළා.

නමුත් මම කාරණයක් කියන්න ඕනෑ. මීට පෙර මේ උත්තරීතර සභාව ආමන්ත්‍රණය කරපු විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මෙච්චර වැදගත් කාරණයක් විවාදයට ගන්නා මේ අවස්ථාවේදී, එතුමාගේ සම්පූර්ණ කථාව පුරාම පැහැදිලි කළේ ඊශ්‍රායල-ඉරාන යුද්ධය ගැනයි. අපි මේ සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කර ඒ සඳහා වේලාව වෙන් කර තිබියදීත් යුද්ධය ගැන තමයි එතුමා කරුණු මතු කළේ. මේ ගත වුණු වසර ගණනාව තුළ කාන්තාවට නිසි සුරක්ෂාවක් නොලැබුණේ එවැනි කරුණු නිසාමද කියන ප්‍රශ්නයත් මට නැඟෙනවා.

ඇත්තටම කාන්තාව ගැන කථා කරද්දී ශ්‍රමිකයන් ගැන කථා කළ යුතුයි. මොකද, අපේ රටේ ආර්ථිකය ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්න අවශ්‍ය වෙලා තිබෙනවා. අවුරුදු දෙක තුනක් ආපස්සට ගිහින් බැලුවොත්, කඩා වැටුණු ආර්ථිකයක් එක්ක තමයි අපි දැන් නැඟිටිමින් ඉන්නේ. එවැනි අවස්ථාවක ශ්‍රමිකයා බිහි කිරීමේ ඉඳලා, ඔහු නිර්මාණය කිරීම, ඒ ශ්‍රමිකයා වෙනුවෙන් හොඳ පරිසරයක් සකස් කිරීම, ඔහුට ශක්තිය ලබා දීම ආදී ඒ සියල්ල කරන්නේ කාන්තාව. හැබැයි, නිවස තුළ වෙන්න පුළුවන්, ඉන් පිටත වෙන්න පුළුවන්, සමාජය තුළ විවිධ භූමිකා දරමින්, මවක විධියට, ගැහැනියක විධියට, සහෝදරියක විධියට, දියණියක විධියට, විවිධ වෘත්තීන්වල නියැළෙමින් ඉහළ පුටුවල ඉඳගෙන, ඒ සෑම අවස්ථාවකම ඇය සපයන නිහඬ සේවයක් තිබෙනවා. නිහඬව ඇය ශ්‍රමය සපයනවා. ඒකට නිසි ඇගැයීමක් මෙතෙක් සිද්ධ වෙලා නැහැ කියන කාරණය අපි ආණ්ඩුවක් විධියට අවබෝධ කරගෙන තිබෙනවා. ඒ නිසා තමයි, අද මේ විවාදයට ගනු ලබන කාරණය තුළින්, ජාතික ආර්ථිකයට ලැබෙන කාන්තා ශ්‍රම දායකත්වය අගයමින්, වැටුප් රහිත සුරැකුම් ශ්‍රමය ජාතික ආර්ථිකයට එක් කිරීම සඳහා ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් සකස් කිරීමට යෝජනා කරලා තිබෙන්නේ. ඒ වෙනුවෙන් තමයි මේ විවාදය, මේ කරුණු දැක්වීම සිද්ධ කරන්නේ.

විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපේ රටේ ජනගහනයෙන් සියයට 52ක් ඉක්මවා කාන්තාවන් ඉන්නවා. අධ්‍යාපනයේ යෙදෙන පිරිස ගත්තාම, විශ්වවිද්‍යාල අධ්‍යාපනය හමාර කරන පිරිසෙන් සියයට 70ක් විතර කාන්තාවන් ඉන්නවා. එතැනදී ඉහළ ප්‍රතිශතයක් ගත්තත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පස්සේ කාන්තාවන් රැකියාවල යෙදෙන ප්‍රතිශතය අඩු වෙලා තිබෙනවා. ඒක සියයට 35ක් විතර වෙනවා. ලංකාවේ තිබෙන සුවිශේෂීතාවක් තමයි, උපාධිධාරිනියන් ගෘහිණියන් බවට පත් වෙලා ඉන්න එක. මොකද, විවාහයෙන් පස්සේ ඇය දරුවෝ රැක බලා ගන්න, මම මුලින් කිව්වා වාගේ ශ්‍රමිකයෙක් බිහි කරන්න, ඔහුට හොඳ පරිසරයක් හදන්න වෙහෙසෙනවා. ඒ නිසා ඇය රැකියාවක නිරත වන ප්‍රතිශතය අඩු වෙලා තිබෙනවා. අපේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න නම් ඒකර උර දිය හැකි කාන්තාවන් විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් ආර්ථිකයට සක්‍රියව දායක කර ගන්න ඕනෑ. එක් පැත්තකින් අධ්‍යාපනයට විශාල වැය බරක් දරද්දී, ඇය විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පස්සේ වයස අවුරුදු 25-30 වාගේ කාලය වෙනකොට රැකියාවක නිරත නොවෙනවාය කියන එක බරපතළ ප්‍රශ්නයක්.

[ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය]

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙනුත් අපි කියලා තිබෙන්නේ, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා. ඒ තුළ මහා අරුතක් තිබෙනවා. එය වචන හතරක් වුණාට එහි ලොකු අර්ථයක් තිබෙනවා. පොහොසත් කියන්නේ ආර්ථිකමය වශයෙන්, එහෙම නැත්නම් මුදලින් පොහොසත් කියන එකම නොවෙයි. එතැනින් එහාට ගිහිල්ලා, ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීම, සතුටින් ජීවත් වන පවුලක් නිර්මාණ කිරීම ඒ තුළ තිබෙනවා. එතැනදී අපට කාන්තාව වෙනම සවිබලගන්වන්නට බැහැ. කාන්තාව සවිබලගැන්විය යුතුයි. හැබැයි, හුදෙකලාව ඒ දේ කරන්න බැහැ. නමුත් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට විතරක් ඒ කාරණය ඉෂ්ට කරන්නත් බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අනෙක් අතට ගත්තාම ආණ්ඩුවක් විධියට අපේ වැඩ පිළිවෙළ සකස් වෙලා තිබෙන්නේ පවුල් ඒකකය තුළ පිරිමියා, කාන්තාව - පියා, මව- සහ දරුවා කියන සියලුදෙනා එකට තියලා සවිබලගැන්වීමටයි.

සවිබලගැන්වීම කියන එක තුළ ආර්ථිකය සවිබලගැන්වීම කියන දේත් එන්න පුළුවන්. හැබැයි ඒක විතරක් නොවෙයි. එතැනින් එහාට ගිහින් දේශපාලනික වශයෙන් සහ සමාජයීය වශයෙනුත් කාන්තාව සවිබලගන්වන්න අවශ්‍යයි. ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග රැසක්, ප්‍රතිපත්තිමය තීන්දු රැසක් අපි මේ වනකොට ආණ්ඩුවක් විධියට අරගෙන තිබෙනවා වාගේම, ඒ දේවල් ක්‍රියාත්මක වනවා.

විශේෂයෙන් කියන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුව 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත සම්මත කරගෙන තිබෙන බව. එතැනදී ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරන්නේ කාන්තා කොමිෂන් සභාවක් පිහිටුවීමයි. සමාජය තුළ කටයුතු කරද්දී අපි ප්‍රායෝගිකව අවබෝධ කර ගත් දෙයක් තමයි, පිරිමින් සහ කාන්තාවන් ගත්තාම සාපේක්ෂව කාන්තාවක් වීම තුළ ඇය මුහුණ දෙන සමාජයීය ප්‍රශ්න රැසක් තිබෙනවා කියන එක. ඇත්තටම ඒ කොමිෂන් සභාව හරහා ඒ ගැටලුවලට විසඳුම් සෙවීම වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීරණ ගන්න අවස්ථාවක් එනවා. ඉතින් ඒක හොඳ අවස්ථාවක්.

ඒත් එක්කම මම මතක් කරන්නට ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත 2005දී සම්මත වුණු එකක්. ඒකට දැන් වසර 20කට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. හැබැයි නවීන තාක්ෂණය, පරිගණක වාගේ දේවල් එක්ක සමාජයේ නිර්මාණය වන ගැටලු ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඒවාට අනුගතව, ඒවාට අනුරූපීව අපි ඒ වෙනුවෙන් විසඳුම් සොයන්නට ඕනෑ. එහෙම නැත්නම් ඒ නීති රීති වෙනස් කරන්න ඕනෑ. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනතේ අඩු පාඩු සහ එයට එකතු විය යුතු කාරණා කිහිපයක් තිබෙනවා. අපි දැන් ඒ දේවල් හඳුනාගෙන තිබෙන්නේ. ඉදිරියේදී ඒ සංශෝධන ගෙන ඒමටත් අපි කටයුතු කරමින් ඉන්නවා.

විශේෂයෙන්ම කියන්න ඕනෑ, කාන්තාව සවිබලගැන්වීමේදී ඊට බාධා වෙලා තිබෙන ගැටලු අපි හඳුනාගෙන තිබෙන බව. එක් උදාහරණයක් තමයි, ඊයේ පාර්ලිමේන්තුව තුළ විවාදයට ගනු ලැබූ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත. ඊයේ මතුවෙච්ච කාරණයක් තමයි, ආර්ථිකමය වශයෙන් පහළ මට්ටමේ ඉන්න අපේ කාන්තාවන් ක්ෂුද්‍රමූල්‍ය ණය ක්‍රම නිසා සූරාකෑමට ලක් වනවාය කියන එක. ඒක සමාජ ඛේදවාචකයක්; ඉන්න තැනින් තවත් පහළට ඇද දැමීමක්. ඒකට පිළියමක් විධියට ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පිහිටුවීමත්, ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමත් අරමුණු කරගෙන තමයි ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර විවාදයට ගනු ලැබුවේ. ඒකත් හොඳ අවස්ථාවක්. ඒ දේවල් පාලනය වෙද්දී අපි ආණ්ඩුවක් විධියට මේ වනකොට මුදල් අමාත්‍යාංශයෙන් රුපියල් බිලියන 96කට ආසන්න මුදලක් වෙන් කරලා තිබෙනවා, ණය යෝජනා ක්‍රම විධියට. විශේෂයෙන් කාන්තාවන් සවිබල ගැන්වීමටත් ඒක උපකාරයක් වනවා.

පොලී රහිත වෙන්න පුළුවන්, සුරැකුම් රහිත වෙන්න පුළුවන්, පහසුවෙන් ගෙවිය හැකි වෙන්න පුළුවන් මේ ණය යෝජනා ක්‍රම කාන්තා ව්‍යවසායකයන්ට හොඳ අවස්ථාවක් වනවා. ඒ දේවල් අපි ක්‍රියාත්මක කරනවා. මෙවැනි තත්ත්ව තුළ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, පොලීසිය යන සියලු ආයතන එක්ක -අපට තනිවම කාන්තාව සවිබල ගැන්වීම කරන්න බැහැ- අපි ආණ්ඩුවක් විධියට ලොකු වැඩ කොටසක් කරමින් ඉන්නවා.

අවසාන වශයෙන් මම මේ කාරණය කියනවා. කාන්තාවට අභියෝග ගොඩක් තිබෙනවා. මම අද ඔබට කියන්නේ ඒ අභියෝගවලදී වැටෙන්න එපා, සැලෙන්න එපා, ආණ්ඩුවක් විධියට අපි ඔබට ශක්තියක් වෙන්න, ඔබ නඟාසිටුවන්න අපි ඔබ වෙනුවෙන් සිටිනවා කියන එකයි. ඒකට හොඳම අවස්ථාව තමයි, මේ දසවැනි පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය වැඩිම අවස්ථාව. ඒකට රුකුලක් වෙන්න, හයියක් වෙන්න අපි ඉන්නවාය කියන එක මතක් කරමින්, මගේ කථාව අවසාන කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the Adjournment Debate shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය]සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ඔබතුමිය මූලාසනයේ සිටින මොහොතේදී මට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම ගැන ඇත්තටම සතුටු වෙනවා. කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, සමන්මලී ගුණසිංහ සහෝදරිය

විසින් අද දින සභාව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාව අතිශයින්ම වැදගත් වාගේම කාලීන එකක් කියා අපි හිතනවා.

ඒත් එක්කම මම මතක් කරන්න කැමැතියි, තව දින 3කට පසුව එළඹෙන 08වැනි දා සුවිශේෂී දවසක් බව. විශේෂයෙන්ම කාන්තාවන් ගැන කථා කරන මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න කැමැතියි, ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී තිබෙන්නේ මාර්තු 08වැනි දාට බව. කාන්තා දිනයට අදාළව ලොකු ඉතිහාසයක් තිබෙනවා. අවුරුදු සියයකට වඩා එහාට ගිය ඉතිහාසයක් කාන්තා දිනය සම්බන්ධව පවතිනවා. 1908 මාර්තු 08වැනි දා තමයි ඇත්තටම කාන්තා දිනයට අදාළ වස්තු බීජය ජනිත වන්නේ. කාන්තාවන් 15,000ක් වාගේ විශාල ප්‍රමාණයක් නිව්යෝර්ක් නගරයට එකතු වෙලා ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් විශාල අරගළයක් සිදු කර තිබෙනවා. ඒ අය එක පැත්තකින් ඡන්ද අයිතිය ලබා ගැනීම, වැටුප් වැඩි කර ගැනීම සඳහා වාගේම වැඩ කරන පැය ප්‍රමාණය සීමා කර ගැනීම සඳහා විශාල අරගළයක් කර තිබෙනවා. ඒ ඉතිහාසය තුළ තමයි මේ කාන්තා දිනයට අදාළ වස්තු බීජය සැපයෙන්නේ.

ඊට පසුව 1910දී පමණ ක්ලාරා සෙට්කින් කියන නීතිඥවරිය තමයි කාන්තා දිනය සම්බන්ධ අදහස යෝජනා කර තිබෙන්නේ. ඇය කොමියුනිස්ට් ව්‍යාපාරයට සම්බන්ධ කාන්තාවක්. ඒ අනුව 1911 වසරේ සිට කාන්තා දිනය සමරන්න පටන් ගෙන තිබෙනවා. ලෝක ඉතිහාසය තුළ විවිධ දිනවලදී එම දිනය සමරා තිබෙනවා. හැබැයි, වර්තමානයේදී මාර්තු 08වැනි දා අපි කාන්තා දිනය සමරනවා. අපි මෙවරත් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විධියට මාතරදී කාන්තා දිනය සමරන්න අවශ්‍ය කටයුතු සංවිධානය කර තිබෙනවා. "පොහොසත් රටක අභිමන ඇයවෙයි දැයක පෙරමග" කියන තේමා පාඨය යටතේ තමයි අපි මෙවර කාන්තා දිනය සමරන්නට කටයුතු සූදානම් කර තිබෙන්නේ. ඊට සමගාමීව 07වැනි දා අපේ රටේ විවිධ තැන්වලදී කාන්තා කාර්ය සංවිධාන හරහා ගොඩනැඟුණු කාන්තා ව්‍යවසායකත්වයට සම්බන්ධ අපේ කාන්තාවන් ඇගැයීමට ලක් කරන්නත් අපි කටයුතු යොදා ගෙන තිබෙනවා. ඒ අයගේ නිර්මාණාත්මක හැකියාවන් සම්බන්ධයෙන්, ව්‍යවසායකත්වයට මැදිහත් වීම සම්බන්ධයෙන් ඇගැයීම් කරන්නත්, දිස්ත්‍රික්ක වශයෙන් හොඳම ව්‍යවසායකයන් තෝරා ඒ අයට සම්මාන ප්‍රදානය කරන උත්සව සංවිධානය කරන්නත්, ඒත් එක්කම ඔවුන්ගේ නිෂ්පාදනවලට අවස්ථාව ලබා දීමට වෙළෙඳ පොළක් නිර්මාණය කරන්නටත් අපි කටයුතු කර තිබෙනවා. ඒවා තමයි, කාන්තා දිනය වෙනුවෙන් අපේ මැදිහත් වීම.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කර තිබෙන යෝජනාව තුළ ජාතික සුරකුම් ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සම්බන්ධව අදහසක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ තුළ වැටුප් නොලබන සුරකුම් ශ්‍රමය - unpaid care work - කියන එක ආර්ථිකයට නිසි පරිදි ගණනය කිරීමටත් යෝජනාවක් ඇතුළත් වෙලා තිබෙනවා. ඒත් එක්කම සුරකුම් ආර්ථිකය - care economy එක - තුළ ඵලදායී වටපිටාවක් නිර්මාණය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සම්බන්ධවත් සඳහන් කර තිබෙනවා. ඇත්තටම ජාතික ජන බලවේගයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අන්තර්ගත දේවල් විශ්ලේෂණය කළාම, ජාතික සුරකුම් ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳව කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට යම් වගකීමක් පැවරී තිබෙන බව පෙනී යනවා. විශේෂයෙන්ම ස්ත්‍රීන්ගේ වැටුප් නොලබන සුරකුම් ශ්‍රමයේ බර අඩු කිරීම කියන රජයේ ප්‍රතිපත්තියට අදාළව 2024.11.25 දිනැති ගැසට් පත්‍රයට ඇතුළත් කර අප අමාත්‍යාංශයට එම වගකීම පවරා දී තිබෙනවා. ඒ අනුව අපි අමාත්‍යාංශය විධියට ඉදිරිපත් කළ වාර්තාවක් තිබෙනවා. එහි අන්තර්ගතය ගැන මම පොඩ්ඩක් ප්‍රකාශ කරන්නම්, අපි මේ වෙනකොට අමාත්‍යාංශය විධියට ගෙන තිබෙන තීරණ මොනවාද කියන එක සම්බන්ධයෙන් යම් අදහසක් ගන්නට. "කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විසින් මේ වනවිටත් සකස් කර ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබලගැන්වීමේ ජාතික ප්‍රතිපත්තියෙහි ස්ත්‍රීන්ගේ වැටුප් නොලබන ශ්‍රමයේ බර අඩු කිරීම පිළිබඳවද ඇතුළත් කර ඇති අතර, එය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර එය අවසන් අදියරෙහි පවතින අතර, එහි එක් ක්‍රියාමාර්ගයක් ලෙස මෙම සුරකුම් ප්‍රතිපත්තිය සකස් කිරීම ද ඇතුළත් කර ඇත" යනුවෙන් එහි සඳහන් වෙනවා.

අපේ මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලද කාරණය වෙනුවෙන් ප්‍රතිපත්තියක් සකස් කරන්නට දැනටමත් අමාත්‍යාංශය විධියට අපි මූලික පියවර ගනිමින් ඉන්නවා. අමාත්‍යාංශය විසින් ඒ පිළිබඳව සාකච්ඡා වට දෙකක් පවත්වා තිබෙනවා. දැනටමත් මේ පිළිබඳව කටයුතු කරන අන්තර්ජාතික හා රාජ්‍ය නොවන ආයතන සමඟ මෙම ප්‍රතිපත්තිය සකස් කිරීම පිළිබඳව අමාත්‍යාංශය විසින් සාකච්ඡා කර ඇති අතර, ඔවුන් මේ සඳහා සහයෝගය ලබා දීමටත් එකඟතාව පළ කර තිබෙනවා. අන්තර්ජාතික සහ ජාතික වශයෙන් ක්‍රියාකාරීව මැදිහත් වන ආයතන එක්කත් අපි මේ පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන එම ආයතන සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමෙන් පසුව මෙම ප්‍රතිපත්තිය සකස් කිරීම වෙනුවෙන් කටයුතු කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. එමෙන්ම මේ පිළිබඳව අධීක්ෂණය සඳහා නියමු කමිටුවක් ස්ථාපිත කිරීමටද යෝජනා වී ඇති බැවින්, සුදුසු සාමාජිකයන්ගෙන් සැදුම්ලත් නියමු කමිටුවක් ඉදිරියේදී ස්ථාපිත කිරීමටත් සැලසුම් කරනු ලබනවා. ඒ සම්බන්ධයෙන් මැදිහත් වීමට අදාළ කරන නියමු කමිටුවක් ඉදිරියේදී සකස් වෙනවා. ඊට අමතරව ඉදිරියේදී සකස් කරන ප්‍රතිපත්ති කෙටුම්පත පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය වෙත ඉදිරිපත් කර අදහස් ලබා ගැනීමටත් අපි බලාපොරොත්තු වනවා. මම හිතන විධියට, ඒක අතිශයින්ම වැදගත්. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේද අදහස් ලබා ගෙන ඒවාත් මේකට ඇතුළත් කර ගන්නවා. ඒ අනුව මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරන යෝජනාවට අදාළව ජාතික සුරකුම් ප්‍රතිපත්තියක් ගොඩනැඟීමට අවශ්‍ය මැදිහත් වීම සම්බන්ධයෙන් වන මූලික කටයුතු ටික මේ වෙනකොටත් අපි අමාත්‍යාංශය විධියට අවසන් කරලා තිබෙනවා. ඊට අමතරව කම්කරු අමාත්‍යාංශය විධියටත් මේ සම්බන්ධයෙන් යම් මැදිහත්වීමක් තිබෙනවාද කියලා අපි හොයා බැලුවා. ඒ පැත්තෙනුත් අපට ලබා දුන් අදහස් ප්‍රමාණයක් තිබෙනවා.

විශේෂයෙන්ම අපි දැනට සැලසුම් කරලා තිබෙනවා, ජාතික සමාජ ආරක්ෂණ උපාය මාර්ගික සැලසුමක් - National Social Protection Strategy එකක් - ගොඩනඟන්න. මේ වෙනකොටත් එවැනි plan එකක් හදන්නට සමාජ සත්කාරක සේවා - social care - කියන එක ප්‍රධාන කුලුනක් විධියට හඳුනා ගෙන තිබෙනවා. ඒ අනුව කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය ඉහළ යෑම සහ පවුල් ව්‍යුහවල සිදු වී ඇති වෙනස්වීම් හේතුවෙන් මතු වී ඇති සහ වර්ධනය වී ඇති අවශ්‍යතා හඳුනා ගනිමින් ළමා සුරකුම්, වැඩිහිටි සුරකුම් සහ අනෙකුත් අදාළ සත්කාරක සේවා ශක්තිමත් කිරීම සඳහා විධිමත් යන්ත්‍රණයක් හඳුන්වා දීම සඳහා රජය මැදිහත් වෙමින් ඉන්නවා. මේ සඳහා කම්කරු අමාත්‍යාංශය, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය ඒකාබද්ධව මූලික කටයුතු ආරම්භ කර තිබෙනවා. අනෙකුත් අමාත්‍යාංශවල සහාය ඇතුව සත්කාරක අංශ විධිමත් කිරීම සහ ශක්තිමත් කිරීම අරමුණු කර ගත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා කමිටුවක් පිහිටුවා තිබෙනවා. තවද, වැටුප් රහිත සත්කාරක සේවා - unpaid care work - කියන එකේ ආර්ථික වටිනාකම හඳුනා ගැනීමටත්, එවැනි

[ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා]

සේවාවල නියුතු වූවන් සඳහා සුදුසු සමාජ ආරක්ෂණ සහ ප්‍රතිපත්තිමය ප්‍රතිචාර ගවේෂණය කිරීමටත් මෙහිදී විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අන්තර්ගත කරපු කරුණුත් අදාළ කරගෙන මේ යෝජනාව සම්බන්ධයෙන් රජයක් විධියට යම් වැඩ පිළිවෙළක් මේ වෙනකොට සකස් කරමින් ඉන්නවා. විශේෂයෙන්ම කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය වාගේම, ග්‍රාමීය යටිතල පහසුකම් වර්ධනය කිරීමට අදාළ සහ සමාජ ආරක්ෂාව සඳහා මැදිහත් වන අමාත්‍යාංශ සියල්ල එකතු වෙලා මීට අදාළ ප්‍රතිපත්තිමය තීන්දු-තීරණ ගනිමින් ඉන්නවා. ඉදිරියේදී එම තීන්දු-තීරණ ක්‍රියාත්මක කරන්නට පුළුවන්. ඒ සඳහා සාකච්ඡාවක් ගොඩනහන්නට අද මේ ඉදිරිපත් කර තිබෙන සභාව කල් තැබීමේ යෝජනාව ප්‍රවේශයක් බවට පත් වේවි කියලා මම හිතනවා.

ඒත් එක්කම ලෝකයේ විවිධ රටවල් පිළිබඳව අපි මේ වෙනකොටත් අධ්‍යයනය කරලා තිබෙනවා. ඒ රටවල් මෙවැනි සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙන්නේ කොහොමද, ඒවා ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අපි යම් අදහසක් ලබා ගනිමින් ඒ පිළිබඳවත් විශ්ලේෂණයක් කර ගනිමින් ඉන්නවා. අපි අමාත්‍යාංශය විධියට පසුගිය වසරකුත් මාස කිහිපය ඇතුළත කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් අවශ්‍ය මැදිහත් වීම කරන්න විශාල කර්තව්‍යයක් සිදු කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன)
(The Hon. (Dr.) Namal Sudarshana)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මම මේ විනාඩි දෙක පාවිච්චි කරමින් තවත් කරුණු කිහිපයක් මතක් කරන්නම්. විශේෂයෙන්ම 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත ගැන සමාලෝචනයක් කරන්නත් අපි තීරණය කරලා තිබෙනවා. ඒක 2005දී ගෙනාපු පනතක්. ඒ පනත මේ වනකොට අවුරුදු 20කට වඩා පැරණියි. දැන් ඒවායේ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. මේ පනතේ ගැටලු තිබෙනවා. අපි උත්සාහ කරනවා, සංශෝධනය කළ යුතු තැන් හඳුනා ගනිමින් නූතනයට ගැළපෙන පරිදි මේ පනත සංශෝධනය කරන්නට. ඊට පසුව ළමා අයිතිවාසිකම් තවදුරටත් තහවුරු කිරීම සඳහා පනත් කෙටුම්පත් සකස් කරන්නටත් අපි අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

ඒත් එක්කම අපි කවුරුත් දන්නා පනතක් වන 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත සකස් කරලා මේ වනකොට අවුරුදු 30කට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. මේ පනතත් යාවත්කාලීන විය යුතුයි. මොකද, මේ වනවිට සමාජ තත්ත්ව වෙනස් වෙලා තිබෙනවා. තාක්ෂණය ඇවිල්ලා තිබෙනවා. විවිධ අපචාර සිදු වන විධික්‍රම වෙනස් වෙලා තිබෙනවා. දරුවන්ට සිදු වන බලපෑම් වෙනස් වෙලා තිබෙනවා. ඒක නිසා ඒ පනතත් සංශෝධනය කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අපි ගනිමින් තිබෙනවා. අපි මේ විධියට විශාල මැදිහත්වීමක් කරනවා, කාලාන්තරයක් තිස්සේ යාවත්කාලීන නොවූ පනත් ටික සංශෝධනය කරලා යාවත්කාලීන කරන්නට.

ඒත් එක්කම මම විශේෂයෙන් මතක් කරනවා, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත ගැන. මේ පනත සම්මත වෙලා තිබුණාට ඒකට අදාළව ක්‍රියාමාර්ග අරගෙන තිබුණේ නැහැ, කාන්තා කොමිසම ගොඩනහන්නට. ඒ සම්බන්ධයෙන් අපි මැදිහත්වීම කළා. ඒ කොමිසම ගොඩ නැඟීමට තව ක්‍රියාවලියක් තිබෙනවා. මේක අලුතින් ගොඩ නැඟෙන කොමිසමක්. කලින් තිබුණු කොමිසමක් නොවෙයි. ඒක නිසා ඒකට අවශ්‍ය පහසුකම් ටික අපි සපයන්න ඕනෑ. අපි ඒකට තැනක් සොයා ගන්නට ඕනෑ. ඒත් එක්කම මේකට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගන්නට ඕනෑ. මේකට අවශ්‍ය ප්‍රතිපාදන ටික අපි සලසා ගන්නට ඕනෑ. ඉතින්, ඒ සම්බන්ධ ක්‍රියාවලිය මේ වෙනකොටත් ක්‍රියාත්මක වෙනවා. මම හිතනවා, සුවිශේෂී කාර්යභාරයක් තිබෙනවා කියලා මේ කාන්තා කොමිසමට. ජාතික කාන්තා ප්‍රතිපත්තියක් ගොඩ නඟන කාර්යභාරයත් පනත හරහා ඔවුන්ට පැවරිලා තිබෙනවා. ඔවුන් ඉදිරියේදී ඒ සඳහාත් මැදිහත්වීම කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මේ ආදී වශයෙන් අමාත්‍යාංශය විධියට අපි සුවිශේෂී කාර්යභාරයක් කරමින් ඉන්නවා.

විශේෂයෙන්ම ඉදිරියේ එන කාන්තා දිනය වෙනුවෙන් සුබ පතන්නට මා මෙය අවස්ථාවක් කරගන්නවා, තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඉතිහාසය ඇතුළේ අරගළ කරපු අපේ සුවහසක් කාන්තාවන්ට. අපේ මන්ත්‍රීවරියන් 20 දෙනෙක් පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ඒත් එක්කම විපක්ෂයේ මන්ත්‍රීවරියන් දෙදෙනෙක් පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. අපි දන්නවා, අපේ අගමැතිතුමිය, අපේ ඇමතිතුමිය ඇතුළු 20දෙනාම කාන්තාවන් වෙනුවෙන් බිම් මට්ටමේ අරගළ කරපු, විශාල මැදිහත්වීමක් කරපු, කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් විශාල මැදිහත්වීමක් කරපු පිරිසක් බව. මම ඒ අයට සුබ පතනවා. ඒ වාගේම ඉදිරියටත් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට, ඔවුන්ගේ උන්නතිය වෙනුවෙන් වැඩ කිරීමට ඒ අයට ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මට මේ කාල වේලාව ලබා දීම වෙනුවෙන් මූලාසනයට ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.12]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, சர்வதேச மகளிர் தினத்தையொட்டி, மகளிருக்கு ஏற்படுகின்ற பிரச்சினைகள் மற்றும் அவர்களுக்கு ஏற்படுகின்ற நன்மைகள் போன்ற பல்வேறுபட்ட விடயங்கள் சம்பந்தமாக இன்றைய ஒத்திவைப்பு விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்திருக்கின்றது. விசேஷமாக, இலங்கையின் சனத்தொகையில் 52 சதவீதமானவர்களாகப் பெண்கள் வாழ்கின்றார்கள் என்று சொல்லப்படுகின்றது. இவ்வாறு பெண்கள் 52 சதவீதமாக வாழ்ந்தாலும் அவர்கள் அதிகமான பிரச்சினைகளை எதிர்நோக்குவதாகவும் சொல்லப்படுகின்றது. இலங்கையின் பொருளாதாரம் வளர்ந்து வருகின்ற இந்தக் காலகட்டத்திலே, அந்தப் பொருளாதார வளர்ச்சிக்குப் பெண்களின் பங்களிப்பு அதிகமாக இருக்கின்றது என்பதை நாங்கள் இந்த நேரத்திலே சுட்டிக்காட்ட வேண்டும். அதில் ஒன்று, இந்த நாட்டினுடைய பொருளாதார வளர்ச்சிக்கான

ஆடைக் கைத்தொழில்துறை. தைத்த ஆடைகள் வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யப்படுவதில் அநேகமான பங்களிப்பு பெண்களால்தான் செய்யப்படுகின்றது. இரண்டாவது, பெருந்தோட்டத்துறை. பெருந்தோட்டங்களில் தொழில் புரிகின்ற 52 சதவீதமான பெண்கள் இலங்கையினுடைய பொருளதார வளர்ச்சியிலே அதிகமாகப் பங்குபெறும் குடிமக்களாக இருந்து வருகின்றார்கள். அதேபோல, மத்திய கிழக்கு நாடுகளுக்குச் சென்று தொழில்புரிந்து, அதன்மூலமாக இலங்கைக்கு அந்நியச் செலாவணியை ஈட்டித் தருகின்றவர்களாகவும் பெண்கள் காணப்படுகின்றனர். இவ்வாறு மூன்று முக்கிய துறைகள்மூலம் பெண்கள் இலங்கையினுடைய பொருளாதார வளர்ச்சியில் பங்கு வகிப்பதை நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது.

அதேநேரத்திலே இன்று இலங்கையை எடுத்துக்கொண்டால், இங்கு மூன்றில் ஒரு பங்கு பெண்கள்தான் அரசாங்கத் தொழிலிலோ அல்லது ஏனைய தொழிலிலோ ஈடுபடுவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது; அது 30 சதவீதம் என்று சொல்லப்படுகின்றது. ஆனால், பெருந்தோட்டத் துறையில் கிட்டத்தட்ட 44 சதவீதமான பெண்கள் தொழிலில் ஈடுபட்டு வருவதையும், அவர்கள் இந்த நாட்டுக்கு உழைத்துக் கொடுப்பதையும் நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. ஆனால், அந்தப் பெண்களைப் பொறுத்தவரையில், அவர்கள் மிகவும் துன்பகரமான சூழலில் வாழ்ந்து வருவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. அதாவது, இன்னும் 'லயன் காம்பரா'க்களிலே இருந்துகொண்டு, காலையிலே 5.00 மணிக்கு எழுந்து காலை உணவைச் செய்து, பிள்ளைகளுக்குச் சாப்பாடு கொடுத்துவிட்டுத் தாங்களும் சாப்பாட்டை எடுத்துக்கொண்டு தேயிலை மலையிலே போய் வேலை செய்கின்ற சூழ்நிலையை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. இப்படி தேயிலை மலையிலே வேலை செய்கின்றவர்களுக்கு கழிப்பிட வசதியோ அல்லது ஓய்வெடுக்கின்ற வசதிகளோ அங்கு இல்லை என்பதையும் நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. இந்த நவீன காலத்திலே இவ்வாறான வசதிகளை அவர்களுக்கு ஏற்படுத்திக் கொடுப்பது மிகவும் அத்தியாவசியமான காரியம் என்பதை அமைச்சர் அவர்களும் இங்கே இருக்கின்ற சந்தர்ப்பத்திலே நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

கௌரவ மங்கள சமரவீர அவர்கள் நிதி அமைச்சராக இருந்த காலத்தில், நுவரெலியா மாவட்டத்தில் தேயிலை மலைகளிலே 10 ஓய்வறைகள், 10 கழிப்பிடங்களை அமைப்பதற்கான ஏற்பாடுகளைச் செய்து கொடுத்தார். அதற்குப் பிறகு வந்த அரசாங்கங்கள் அதைத் தொடர்ந்து செய்யாததன் காரணமாக அந்த வசதிகளைச் செய்து கொடுப்பது நிறுத்தப்பட்டது. ஆனால், உங்கள் அரசாங்கத்திலே இப்பொழுது ஒரு பெண்மணிக்கு இந்த மகளிர் விவகாரத்திற்குப் பொறுப்பான அமைச்சு கொடுக்கப்பட்டிருக்கின்ற காரணத்தினால் இந்த விடயம் சம்பந்தமாக கௌரவ அமைச்சர் அவர்கள் முயற்சியெடுக்க வேண்டுமென்று அன்பாகக் கேட்டுக் கொள்கின்றோம். ஏனென்றால், சற்று சிந்தித்துப் பாருங்கள்! அங்கே toilet வசதிகள், ஓய்வு எடுப்பதற்கான வசதிகள் இல்லாத நிலையில், காலையிலே புறப்பட்டுச் சென்று மாலை 5.00 மணி வரையும் தேயிலைத் தோட்டத்திலே இருக்கும்போது, பெண்கள் என்ற வகையிலே அவர்கள் எங்கே சிறுநீர் கழிக்கப் போவார்கள்? எங்கே ஓய்வெடுக்கப் போவார்கள்? ஆகவே, நீங்கள் இதைச் செய்துகொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றோம்.

அதேபோல, வீட்டு வசதிகள் இல்லாத காரணத்தால் அவர்கள் மிகவும் கஷ்டப்படுகின்ற சூழ்நிலையில் இருப்பதையும் நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. 'ஆணும் பெண்ணும் சமம்' என்று சொன்னாலும் பெண்களுக்குப் பொறுப்பு அதிகமாக இருக்கின்றது. குறிப்பாக, பிள்ளைகளை வளர்ப்பதானாலும் சரி, அவர்களைப் பாடசாலைக்கு அனுப்புவதென்றாலும் சரி, குடும்பத்தின் நன்மை, தீமைகளை அறிந்து செயற்படுவதானாலும் சரி, பெண்களுக்குத்தான் அதிகமான பங்கிருக்கின்றது. அதேவேளையில், பெண்களுக்குப் பல்வேறு இம்சைகள் நடப்பதையும் அறியக்கூடியதாக இருக்கின்றது. இந்த இம்சைகளை இல்லாமல் செய்வதற்கான பல்வேறு நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் செய்து வருகின்றார். அந்த வகையில், அவருக்கு நாங்கள் நன்றி சொல்ல வேண்டும். எதிர்காலத்திலே இம்மாதிரியான விஷயங்களை மேலும் அதிகரிப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். உதாரணமாக, தமிழ் நாட்டு முதலமைச்சர் ஸ்டாலின் அவர்கள் 'பெண்களுக்கு இலவச பஸ் சேவை' என்ற திட்டத்தை அமுல்படுத்தியிருக்கின்றார். ஏன் நீங்களும் இவ்வாறான திட்டங்களை அறிவிக்கக் கூடாது? அவ்வாறு இங்கும் செய்தால் நல்லது. ஆனால், இதை எமது நாட்டிலே செய்ய முடியுமா என்பது பிரச்சினைக்குரியது.

நான் கௌரவ சுகாதார அமைச்சருக்கு நேற்றும் இந்தப் பாராளுமன்றத்திலே ஒரு பிரச்சினையைச் சொன்னேன். அதாவது, டிக்கோயா - கிளங்கன் ஆஸ்பத்திரியிலே ஏற்பட்ட ஒரு பிரச்சினையின் காரணமாக பெருந்தோட்டப் பகுதி முழுவதும் எதிர்ப்பு ஊர்வலம், strikes நடந்து கொண்டிருக்கின்றது. நீங்கள் இதைக் கருத்திற்கொண்டு, இறந்துபோன அந்தப் பெண்ணுக்கு ஏற்பட்ட அவமானத்தைத் தீர்ப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். அதுபற்றி நாங்கள் இங்கு விவாதிப்பதைவிட, ஓர் உள்ளக விசாரணையை அன்றி, தங்களின் அமைச்சின் மூலமாக ஒரு விசாரணையை நடத்துவதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், இந்த விடயம் தொடர்பான உண்மை, பொய் பற்றிய விஷயங்கள் இன்னும் சரிவரத் தெரியவில்லை. ஆதலால், நீங்கள் அது தொடர்பான உண்மையை வெளிக்கொணர வேண்டும் என்று நான் இந்த நேரத்திலே கேட்டுக் கொள்கின்றேன்.

அண்மையிலே வோல்ட்ரீம் என்றவொரு தோட்டத்தில் ஒரு 'லயன்' குடியிருப்பில் நெருப்புப் பிடித்திருக்கின்றது. இந்தக் குடியிருப்பில் இருந்த 9 குடும்பங்களைச் சேர்ந்த 47 பேர் இன்று அநாதரவாக இருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. இப்போது தோட்டங்களில் ஏற்படும் அவசர அனர்த்தத்தில் இருந்து 'தீப்பற்றுதல்' என்பது நீக்கப்பட்டிருப்பதாக NBRO சொல்கின்றது. ஆனால், தீப்பற்றுவது என்பது ஓர் அவசர அனர்த்தம்தான்! இதனை ஓர் அவசர அனர்த்தம் இல்லை என்று எப்படி நீங்கள் சொல்ல முடியும்? இதன்மூலம் இந்த அனர்த்தத்திற்கு உள்ளானவர்களுக்கு AGA officeஆல் உணவு வழங்க முடியாது; காணி கொடுக்க முடியாது என்று சொல்லப்படுகின்றது. ஆனால், அவர்களும் இந்த நாட்டினுடைய பிரஜைகள்! ஆகவே, அவர்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கு ஏதுவான சட்டங்களை இவ்வாறு மாற்றுகின்ற நடவடிக்கையை நீங்கள் கைவிட வேண்டும். அவசர அனர்த்தம் என்ற வகையிலே தீப்பற்றுவதும் அவ்வாறான ஒரு disaster தான்! ஆகவே, disaster இல், தீப்பிடித்தல், மழை வெள்ளத்தால் ஏற்படும் அனர்த்தம் ஆகியவற்றை வேறாகப் பார்க்காமல், அவற்றையும் அனர்த்தங்களாகச் சேர்த்துக்கொள்ள வேண்டும் என்பதை நான் இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

இறுதியாக, பெண்கள் என்பவர்கள் இந்த நாட்டினுடைய கண்களாக இருக்கின்றார்கள். அந்தப் பெண்கள் இந்த நாட்டினுடைய சுபிட்சத்திலே முக்கிய பங்கு வகித்து வருகிறார்கள். கடந்த காலத்தைவிட இந்த அரசாங்கத்திலே பாராளுமன்றத்தில் பெண்கள் அதிகமாகப் பிரதிநிதித்துவம் செய்வதை நாங்கள் காண்கின்றோம். ஆகவே, உங்களுடைய சேவை இந்த நாட்டுப் பெண்களுக்கு முக்கியமாகத் தேவை என்பதை சொல்லி, எனது பேச்சை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.20]

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අප ජීවත් වන ප්‍රජාතන්ත්‍රවාදී රට ඇතුළේ, මේ ආණ්ඩුකරණ ක්‍රියාවලිය ඇතුළේ කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය මේ රටේ සංවර්ධන ක්‍රියාවලියට ප්‍රශස්ත ලෙස උකහා ගැනීම, උරා ගැනීම, උපයෝගී කර ගැනීම කියන මාතෘකාව, නැත්නම් ඒ විෂයය ගත්තොත්, එය කෙටි කාලීන සංකේතාත්මක වැඩ පිළිවෙළක් නොවෙයි කියන එක ආණ්ඩුව විධියට අපි ඉතාම පැහැදිලිව අවබෝධ කරගෙන ඉන්නවා. එය දිගු කාලීන වැඩක්; සංකීර්ණ වැඩක්; මහා පරිමාණ වැඩක්. එය රටේ ආර්ථික ස්ථායීකරණය ඇති කිරීම සඳහා ඉතාම වැදගත්. හැබැයි, එය ආර්ථික වැඩක් විතරක් නොවෙයි. කාන්තාවගේ ශ්‍රම දායකත්වය ලබා ගැනීම කියන එක රටේ සංවර්ධන ක්‍රියාවලියට ගැඹුරු දේශපාලන-සමාජ කියැවීමක් සහිත, හරයක් සහිත වැඩක්. රටේ ඵලදායිතාව ගත්තොත්, රටේ ඵලදායිතාවට ගැහැනුන්ගේ තීරණ ගැනීමේ හැකියාව, බුද්ධිමය හැකියාව, තාර්කික හැකියාව, නායකත්ව හැකියාව, වගකීම් දරා ගැනීමේ හැකියාව, කළමනාකරණ හැකියාව ඇතුළු සියල්ල ඉතාම ඵලදායීව උපයෝජනය කර ගන්න අපට පුළුවන්. ඒක ඉතාම වැදගත්.

මෑතකදී අපේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය ලංගම සඳහා කාන්තා කොන්දොස්තරවරියන් කණ්ඩායමක් බඳවා ගත්තා. කෙනෙකුට දකින්න පුළුවන් එය පරිපාලන තීරණයක්, ප්‍රදර්ශනාත්මක වැඩක් කියලා. හැබැයි ඒක අපි එතැනින් එහාට කියවා ගන්න ඕනෑ දෙයක්. මේක ඇතුළේ තිබෙනවා, ගැඹුරු සමාජ-දේශපාලන පරිවර්තනයක්. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල 2019දී කරපු සමීක්ෂණ වාර්තාව අනුව තොරතුරු හෙළිදරව් කර තිබෙනවා, මේ ලෝකයේ සියයට 90ක් කාන්තාවන් කුමන හෝ ප්‍රවාහන මාධ්‍යයක් ඇතුළේ ජීවිතයේ එක වරක් හෝ අපයෝජනයට ලක්ව තිබෙනවා කියලා. එතකොට ලංකාවේ තත්ත්වය ගැන මම අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ.

මේ ඉතිහාස කථාව ඇතුළේ එක්තරා කාල පරිච්ඡේදයක යුරෝපයේ එක්තරා රටකින් -මට ඒ රට නිශ්චිතව මතක නැහැ- ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ඇතුළේ කාන්තාවන්ට සිදු වන අකටයුතුකම් සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීම සඳහා කාන්තා පොලිස් නිලධාරිනියන් කණ්ඩායමක් පුහුණුව පිණිස ලංකාවට යොමු කරනවා. එවකට පැවැති දේශපාලන තීන්දු තීරණ සහ ඒ මඩ ගොහොරුවේ තිබුණු යම් යම් ක්‍රියාමාර්ග මත, අක්‍රමිකතා මත ඒ වැඩේ නවතිනවා. ඒ වාගේම, ඒකට බලපෑවා ඒ පොලිස් නිලධාරිනියන්ටත් අපේ ප්‍රවාහන සේවය ඇතුළේ අත් විඳින්න වෙච්ච දුෂ්කරතාව. තමන්ගේ ප්‍රශ්න කියන්න බස් රථය ඇතුළේ ගැහැනියක් ඉන්නවා නම් ඒ කාන්තාව කොච්චර සුරක්ෂිතද? ඒ නිසා කොන්දොස්තරවරියකගේ -ටිකට් පොත අතේ තියාගෙන ඉන්න කාන්තාවකගේ- ඉඳලා මේ රටේ නීති හදන, ප්‍රතිපත්ති සම්පාදනය කරන තැන දක්වා කාන්තාවන් ලංකාවේ ශ්‍රමය සඳහා දායක කර ගැනීම වෙනුවෙන් සවිබල ගැන්වීම කියන එක අපේ ආණ්ඩුවේ ලොකු වැඩක් විධියට, ලොකු project එකක් විධියට හඳුනාගෙන එය මේ වෙද්දී රට පුරා දියත් කරමින් තිබෙනවා. ඒ වාගේම, අපේ ආණ්ඩුව තුළ කාන්තාව තවදුරටත් ශ්‍රම වෙළෙඳ පොළ ඇතුළේ අළෙවි වන භාණ්ඩයක් නොවෙයි, ප්‍රදර්ශන භාණ්ඩයක් නොවෙයි, ශ්‍රමිකයන් අතර දෙවැනි පන්තියේ තැනැත්තියක් ද නොවෙයි කියන එක හඳුනාගෙන ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ යොදා තිබෙනවා. මොකද, ලෝකයක් විධියට සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ 17න් 5වැනි තැනට අපි හඳුනාගෙන තිබෙනවා, කාන්තාවන්ට සිදු වන සෑම ආකාරයකම වෙනස්කම් පිටුදැකීම වාගේම ගෝලීය වශයෙනුත් කාන්තාව සවිබලගැන්වීම ඉතාම වැදගත් කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම අද මේ කථාව ඔබතුමිය ඉදිරියේ කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මොකද, පාර්ලිමේන්තුව ගත්තොත්, ඔබතුමිය මෙතැන තුන්වැනියා. මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ නියෝජ්‍ය කාරක සභා සභාපති ධුරය සඳහා කාන්තාවක් පත් වෙච්ච පළමු අවස්ථාව මෙයයි. ඒ නිසා ඔබතුමිය ඉදිරියේ මේ කථාව කරන්නට ලැබීම මම හිතනවා, මේ දේශපාලන ජීවිතය ඇතුළේ, දේශපාලන ඉතිහාසය ඇතුළේ තීරණාත්මක සන්ධිස්ථානයක් කියලා.

ආණ්ඩුවක් විධියට අපි කාන්තාවන් වෙනුවෙන් මොනවාද කළේ කියලා විපක්ෂය අපෙන් අහන කොට, අපට කියන්න බොහෝ දේ තිබෙනවා. මම දැන් ඒ ලැයිස්තුව කියාගෙන යන්න කැමැතියි.

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සහ පෙර පාසල්වල දරුවන්ගේ උදෑසන ආහාර වේල සඳහා වෙන් කර තිබූ රුපියල් 60ක මුදල අපි රුපියල් 100වන කල් වැඩි කරලා තිබෙනවා. සුනාමිය එනකොට, "දිට්වා" සුළි කුණාටුව එනකොට, අද අප ඇස් දෙකින් දකින මැද පෙරදිග යුද්ධයේදී ප්‍රහාර එල්ල වනකොට ගෙදර තිබෙන රත්‍රන් බඩු ටික කර ගහගෙන ගියේ නැහැ, අම්මලා. අම්මලා මුලින්ම තුරුලු කර ගත්තේ තමන්ගේ දරුවන්. මොකද, අම්මලාට තම ජීවිතයේ වටිනාම සම්පත තමයි තමන්ගේ දරුවා. තමන්ගේ ලෝකයේ වටිනාම සම්පත වන දරුවාට පෝෂ්‍යදායී ආහාර වේලක් දෙන්න තමන්ගේ ගේ ඇතුළේ ආර්ථික ශක්තියක් නැත්නම් පෝෂ්‍යදායී ආහාර වේලක් දෙන්න ඕනෑ නිසාම ගැහැනිය තම දරුවා පෙර පාසලට යවනවා. ඒකත් අද අප ආණ්ඩුවක් විධියට ලබපු ලොකු ජයග්‍රහණයක් කියලා අපි හිතනවා. මොකද, අපි මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සහ පෙර පාසල් සඳහා අපේ අය වැය හරහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ ජාත්‍යන්තර ප්‍රමිතිගත පෙර පාසල් නවයක් පළාත් නවයේ ඉදි කිරීම සඳහා අපි පියවර ගෙන තිබෙනවා.

කාන්තාවන් වෙනුවෙන් අපි මොනවාද කරලා තිබෙන්නේ? කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සහ දේශීය ආර්ථිකය වෙනුවෙන් කාන්තාවන්ගේ සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා ආණ්ඩුව විධියට අපි ව්‍යාපෘති 500ක් වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන නිදහස් කරලා තිබෙනවා. එය ලංකාවේ හැම දිස්ත්‍රික්

ලේකම් කාර්යාල මට්ටමින්ම ක්‍රියාත්මක වෙනවා. එම ව්‍යාපෘති මේ වෙද්දී බිමේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙමින් තිබෙන බව අපි අත් දකිනවා. කාන්තා නිෂ්පාදන අලෙවිය සඳහා මාර්ගගත අලෙවි පොළක් හඳුන්වා දීලා තිබෙනවා. ඒ වාගේම all-in-one market concept එක, ඒ ජාලය අපි ලංකාවේ පළාත් පාලන ආයතන මට්ටමින් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරලා තිබෙනවා. රැකියා නියුක්තියේ සිටින කාන්තාවන්ට නිවසේදීම සුරැකුම් බර අඩු කර ගන්න, ගෘහිණියන්ට ආදායම් අවස්ථාවක් සකස් කරන්න, විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල community kitchens සහ laundry services අපි ආරම්භ කරලා තිබෙනවා. ආර්ථිකයේ කාන්තා සහභාගිත්වයට පවතින විශාලම අභියෝගයක් තමයි, දරුවන් සහ නිවසේ ඉන්න වැඩිහිටි ප්‍රජාව රැක බලා ගැනීම. අන්න ඒ වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින්, පළාත් පාලන ආයතන මට්ටමින්, රැකවරණය සලසන්නන්ගේ ජාලයක් - caregivers' network එකක් - සකස් කරන්න අපි කටයුතු ආරම්භ කර තිබෙනවා. මෙකේ වාසි දෙකක් තිබෙනවා. එකක් තමයි, විශේෂ පුහුණුවක් යටතේ විරැකියාවට උත්තරයක් දෙමින් ශ්‍රම දායකත්වය ලබා දෙන ශ්‍රම බලකායට එකතු වෙන්න කාන්තාවන්ට පුළුවන් වීම. කාන්තාවන්ට එතැන රැකියා ජාලයක් නිර්මාණය වෙනවා. ඒ වාගේම, මේ රටේ පොදු මහත් ජනතාවට විශ්වාසයෙන් යුතුව පහසු හා සාධාරණ මිලකට එම සේවාව ලබා ගැනීමේ අවස්ථාව උදා වෙලා තිබෙනවා.

කාන්තාවන් උදෙසා නිෂ්පාදන ක්ෂේත්‍රයේ වාගේම, සැපයුම් ක්ෂේත්‍රය තුළත් ස්ථාවර වීම සඳහා සැපයුම් ගම්මාන සංකල්පය අපි හඳුන්වා දීලා තිබෙනවා. විශේෂයෙන් කාන්තා ව්‍යවසායකයන්ට කේවල සහ කණ්ඩායම් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් "දිරිය මං පෙත" ජීවනෝපාය සංවර්ධන වැඩසටහනත්, ඒ වාගේම "ලිය ශක්ති" අලෙවි පොළත් දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වාගෙන යන්න අපි මේ වෙද්දී කටයුතු සකස් කර තිබෙනවා.

ඒ වාගේම අපි මෙතැනදී අමතක කරන්න හොඳ නැහැ, ආබාධ සහිත කාන්තාවන්ට ආණ්ඩුවක් විධියට අප මොනවාද දෙන්නේ කියලා. ආබාධ සහිත කාන්තාවන්ට රජයේ රැකවරණය විශේෂයෙන් අවශ්‍යයි. අන්න ඒ අය වෙනුවෙන් රජය කටයුතු කිහිපයක් කරනවා. ඉඩමක් තිබෙන නමුත් නිවසක් නැති ආබාධ සහිත කාන්තාවක් ඉන්නවා නම්, නිවසක් තනා ගන්න අපි රුපියල් ලක්ෂ 10ක ආධාරයක් දෙනවා. පවතින නිවසේ අඩු පාඩු තිබෙනවා නම්, නිවස ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා රුපියල් ලක්ෂ 5ක ආධාරයක් දෙනවා. ඒ අයට වැසිකිළි පහසුකම් විශේෂයි. ඒ නිසා රුපියල් 150,000ක උපරිමයකට යටත්ව ඒ පහසුකම් සලසා දීම සඳහා අපි මෙසේ මුදල් ප්‍රතිපාදන දීප ව්‍යාප්තව වෙන් කර තිබෙනවා. ශ්‍රවණෝපකරණ අමතර කොටස් මිල දී ගන්න අපි උපරිමය රුපියල් 35,000ක් දක්වා ආධාර ලබා දෙනවා. වායු මෙට්ට, ජල මෙට්ට හා කෘත්‍රිම පාද -විශේෂයෙන් පාද අහිමි කාන්තාවන්ට- ලබා ගන්න රුපියල් 50,000ක උපරිමයකට යටත්ව අපි ආධාර සලසා දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වේදනාව කියන්නේ ජීවිතයකට වළක්වන්න බැරි දෙයක්. හැබැයි, ඒ වේදනාවේම මිරිකිලා, දුක් විඳලා, මැරිලා යනවාද කියන එක අපි තීරණය කර ගන්න ඕනෑ දෙයක්. අපි ගැහැනු වෙලා ඉපදිච්ච එක අපේ තීරණයක් නොවෙයි. ඒක සොබා දහමේ තීරණයක්. හැබැයි, දුක් විඳලා විඳලා, ඉවසලා ඉවසලා, අභියෝග හමුවේ පරාජය වෙන ගැහැනුන් වෙනවාද කියන එක අපි තීරණය කරන්න ඕනෑ දෙයක්. අභියෝගවලට මුහුණ දෙන ශක්තිමත් ගැහැනුන් තැනීම අපේ ආණ්ඩුවේ ලොකු වැඩක්. ඒක ජාතික ජන බලවේගයේ "ගැහැනු අපි එක මිටට" සංකල්පයේ වැඩක් නොවෙයි. ඒක ශ්‍රී ලංකා ජන රජයේ ආණ්ඩුවේ වැඩක්. ඒ නිසා ගැහැනු ආර්ථික වශයෙන්, දේශපාලන වශයෙන්, සමාජයීය හා සංස්කෘතික වශයෙන් සවිබලගැන්වීම සඳහා අපි අපේ වැඩ පිළිවෙළේ ඉදිරියට යන බව මේ මොහොතේ ඔබ සියලුදෙනා ඉදිරියේ සහතික කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.29]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව දින තුනකින් එළඹෙන ජාත්‍යන්තර කාන්තා දිනය අභිමුඛව තියාගෙන කාන්තාවන් වෙනුවෙන්ම ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාවට සම්බන්ධ වෙමින් අදහස් ස්වල්පයක් ප්‍රකාශ කරන්න ලැබීම ගැන මම අතිශයින්ම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජාත්‍යන්තර කාන්තා දිනය මාර්තු 8වැනි දා ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නම් කළේ, 1977 අවුරුද්දේ. ඒ වාගේම මම මතක් කරන්න කැමැතියි, 1977දී පත් වුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවේ කාන්තාවන් වෙනුවෙන් වනිතා කටයුතු අමාත්‍යාංශයක් ඇති කරපු බවත්, එතැන් පටන් බලයට පත් සෑම රජයක්ම කාන්තා කටයුතු අමාත්‍යාංශයක් පිහිටුවනවා වාගේම, කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් විවිධ වැඩසටහන් අඩුවැඩි වශයෙන් ක්‍රියාත්මක කරපු බවත්. අපි නියෝජනය කරපු රජයන් විසින් කාන්තා සුබසාධනය වාගේම අයිතිවාසිකම් වෙනුවෙන් කාන්තා කාර්යාංශයක් පිහිටුවලා සිදු කරපු සේවාව පිළිබඳවත්, ඒ වාගේම සේවා වනිතා ඒකකය ඇති කරලා අමාත්‍යාංශවල, ආයතනවල, ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ විවිධ සේවා ඉටු කරපු හැටිත් අපට අද කාන්තාවන් ගැන කථා කරන කොට මට මතක් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ විතරක් නොවෙයි. අපේ යහ පාලන ආණ්ඩුව කාලයේ ගැබිනි මාතාවන් වෙනුවෙන් පෝෂණ මල්ලක් ලබා දීම වැනි බොහොම වැදගත් වැඩ කටයුතු රාශියක් ඉටු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාන්තාවන් ගැන කථා කරන කොට, අධ්‍යාපනය ගැන කථා කරන කොට ප්‍රකට කියමනක් තිබෙනවා, "පිරිමි දරුවෙකුට දෙන අධ්‍යාපනය එක පුද්ගලයෙකුට දෙන අධ්‍යාපනයක්. ගැහැනු දරුවෙකුට දෙන අධ්‍යාපනය මුළු පවුලටම දෙන අධ්‍යාපනයක්" කියලා. ඒක අද අපට හොඳට පෙනෙන්න තිබෙන දෙයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාන්තාවන් ශක්තිමත් කරනවා කියන්නේ, ඇය සමාජයේ ඉහළින් ඔසවා තබනවා කියන්නේ පවුලක් ශක්තිමත් කිරීමක් වාගේ දෙයක්. පවුලක් ශක්තිමත් වෙන කොට සමස්ත සමාජයම ඉහළට එන බව අපි දන්නවා. ඒ වාගේම කාන්තාවකගේ තත්ත්වය බිඳ වැටුණොත් ඒ පවුලත්, සමාජයත් බිඳ වැටෙනවා කියන එකත් අපි අවබෝධ කර ගත යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රටක් හැටියට ශ්‍රී ලංකාවේ අපට පුළුවන් වුණා, ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය බිහි කරන්න. පසුගිය දශක තුන, හතර ඇතුළත අපේ රටේ විධායක

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ජනාධිපතිවරියක් බිහි කරන්නත් අපි සමත් වුණා. වර්තමානයේත් අපේ රටේ අගමැති ධුරය හොබවන්නේත් කාන්තාවක් වීමත්, මේ සභාවේ සැලකිය යුතු කාන්තා මන්ත්‍රීවරියන් පිරිසක් -ඔබතුමිය ඇතුළු- නියෝජනය කිරීම ගැනත්, රට පුරාම පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරියන් විශාල සංඛ්‍යාවක් මේ වෙනකොට ඉන්නවා දකින්න ලැබීමත් මම හිතනවා, පක්ෂ, පාට භේදයෙන් තොරව අපි කාටත් සතුටු වෙන්න පුළුවන්කම තිබෙන කාරණයක් කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ පරිපාලන සේවය දිහා බැලුවත්, නීති වෘත්තිය දිහා බැලුවත් -මට පෙර කථා කරපු මන්ත්‍රීතුමියත් නීතිඥවරියක්- වෛද්‍ය වෘත්තිය දිහා බැලුවත්, ගුරු වෘත්තිය දිහා බැලුවත් ගොඩක් ඉන්නේ කාන්තාවන්. අද ඉස්කෝලයකට ගිහින් පාසලේ ගුරු මණ්ඩලය දිහා බැලුවොත් දෙන්නෙක්, තුන්දෙනෙක් පිරිමි අය ඉන්නවා, අනෙක් ඔක්කෝම කාන්තාවන්. හෙද සේවය දිහා බැලුවත් වැඩි ප්‍රතිශතයක් ඉන්නේ කාන්තාවන්. ඒ වාගේම උසස් අධ්‍යාපනය ලබන විශ්වවිද්‍යාලවලත් මම හිතන විධියට ඉංජිනේරු පීඨය හැරුණු කොට අනෙක් හැම විශ්වවිද්‍යාල පීඨයකම වැඩිපුරම දකින්න ඉන්නේ කාන්තාවන්. මෙවැනි විවිධ ක්ෂේත්‍රවලින් කාන්තාවන් ඉදිරියට පැමිණ තිබීම ගැන අපි බොහොම සතුටින් කථා කරනවා; සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම තවමත් අපට සතුටු වෙන්න බැරි ක්ෂේත්‍ර ගණනාවක් කාන්තාවන්ගේ පැත්තෙන් බලන කොට තිබෙනවා කියන එක ඔබතුමියත් පිළිගන්නවා ඇති.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටට ඩොලර්, පවුම්, යෙන් ගෙනෙන ප්‍රධාන විදේශ විනිමය උත්පාදන මාර්ග තුන තමයි විදේශ රැකියා අංශය, ඇඟලුම් කර්මාන්තය සහ තේ කර්මාන්තය ඇතුළු වැවිලි කර්මාන්තය. මේ අංශ තුනටම කර දෙන්නේ, උර දෙන්නේ අපේ රටේ කාන්තාවන් බව අපට කිසි ලෙසකින්වත් අමතක කරන්න බැරි කාරණයක්. මේ ක්ෂේත්‍ර හැම එකකම කාන්තාවන් මුහුණ දෙන දුක්බර කතන්දරයක් තිබෙනවා, තවමත් අපි කාටවත් උත්තරයක් සොයාගන්න බැරි වෙච්ච. මැද පෙරදිග ගෘහ සේවයට යන කාන්තාවන් විඳින දුක් ගැහැට ගැන, වෙළෙඳ කලාපවල ඇඟලුම් කම්හල්වල සේවය කරන කාන්තාවන් මුහුණ දෙන ගැටලු ගැන, වතු ක්ෂේත්‍රය තුළ කාන්තාවන් මුහුණ දෙන කටුක අත්දැකීම් වාගේම, මේ මොහොත වන විට ලෝකයේ මතුව තිබෙන යුද තත්ත්වයත් එක්ක මේ ක්ෂේත්‍ර හැම එකකම ඇති වන අවදානම ගැන රජය ප්‍රමුඛ අවධානය යොමු කළ යුතුව තිබෙන අවස්ථාවක්, මේ අවස්ථාව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කියන්න කැමැතියි, අතීතයේ පටන් අපේ සංස්කෘතිය තුළ කාන්තාවට අද්විතීය තැනක් හිමිව තිබුණු බව. අපි මේ පය ගහගෙන ඉන්න මහ පොළොවට අපි කිව්වේ, පොළොව මහී කාන්තාව කියලා. අපේ රටට අපි කියන්නේ මාතෘ භූමිය කියලා. සමහරු රට ගැන දැන් විවිධ කථා කියන හැටි අපි දැක්කා. අපේ සමාජයේ එදාත්, අදත්, දැනුමට, කලාවට අධිපතිනිය හැටියට සලකන්නේ සරස්වතී දෙවඟන. ධනයට, සෞභාග්‍යයට අධිපතිනිය ලෙස සලකන්නේ ලක්ෂ්මී දෙවඟන. මාතෘත්වයට අධිපති ලෙස සලකන්නේ පත්තිනි දේවිය. මෙතැන තිබෙන විශේෂත්වය තමයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සියලු චරිත දේවත්වයෙහිලා සලකන චරිත වීමත්, ඒ සියල්ලම කාන්තා චරිත වීමත්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩි කීයක් තිබෙනවාද දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩි තුනකට ආසන්න කාලයක් ඉතිරිව තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මම බලනවා විනාඩි කිහිපයක් ඉතිරි කර දෙන්න, තව මන්ත්‍රීවරයෙකුට.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, අපේ සංස්කෘතික ආභාසය ගැන කථා කරලාවත්, අද මේ පාර්ලිමේන්තුවේ අපි කථා කරන වචනවලින්වත් - ඒවායින් පමණක්- කාන්තාවන්ට ලබා දිය යුතු ගෞරවය ලබා දෙන්න බැරි බව. වසරකට වරක් ජාත්‍යන්තර කාන්තා දිනය ඉලක්ක කරගෙන උත්සව පවත්වා, කථා පවත්වා, විවිධ නිවේදන නිකුත් කරලා පමණක් ඒක කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරන්නේ නැහැ. ඒකට ක්‍රියාවෙන් කටයුතු කිරීමට දැන් කාලය එළඹ තිබෙනවා. මම හිතනවා, ඒකට හොඳම අවස්ථාවක් දැන් ඇවිත් තිබෙනවා කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ඉතිරිව තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
හොඳයි.

මොකද, මේ පාර්ලිමේන්තුවේ කවදාවත් නැති තරම් මන්ත්‍රීවරියන් සංඛ්‍යාවක් අද ඉන්නවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය කියලා එකක් ඔබතුමියලාට තිබෙනවා, කාන්තාවන් වෙනුවෙන්. ඒකට පක්ෂ භේදයක් ගාවාගන්නේ නැතිව, කවුරුත් එකතු වෙලා සාධනීය වැඩ පිළිවෙළ දියත් කරන්න දැන් අවස්ථාව තිබෙනවා. එවැනි අවස්ථාවලදී අපි විපක්ෂයක් හැටියට සහයෝගය ලබාදෙන්න සූදානම් බව මම කියන්න කැමැතියි. මම දන්නවා, ගරු විපක්ෂ නායකතුමාත් විශේෂයෙන්ම මේ අංශයට දෙන්න පුළුවන් ඕනෑම සහයෝගයක් දීලා කටයුතු කරන්න සූදානම් බව.

අවසාන වශයෙන් මම මේකත් කියන්න ඕනෑ. අපි කවුරුත් දන්නවා අපේ රටේ ජනගහනයෙන් හරි අඩකට වඩා - සියයට 52ක්ම - ඉන්නේ කාන්තාවන් බව. නමුත්, ශ්‍රම බලකායෙන් සියයට 32ක් වැනි අඩු ප්‍රතිශතයක් තමයි තවම කාන්තා දායකත්වය තුළ තිබෙන්නේ. බොහෝ කාන්තාවන් ස්ථිර ආදායමක් නොලැබෙන රැකියාවල නිරත වෙලා ඉන්න බව තමයි වාර්තා වෙන්නේ. දැන් ගෘහණියන් හැටියට ඉන්න කාන්තාවන් මොන තරම් සේවයක් ඉටු කරනවාද? වචනවලින් කියන්න බැරි, මුදල්වලින් මනින්න බැරි සේවයක් ඔවුන් කරනවා. දරුවන් වෙනුවෙන්, ගෙදර නායකත්වය අරගෙන, ඒ දුක්ගැහැට ඔක්කොම විඳගෙන කරන ඒ සේවාව මිල කරන්න බැහැ. මම අහලා තිබෙනවා කවියක්, "වැඩ ඇරී වැඩට යන ගැහැනු" කියලා. දැන් මේ පාර්ලිමේන්තුව දෙස බලන්නකෝ. සවස 5.00ට විතර පාර්ලිමේන්තුවේ කටයුතු ඉවර වුණු ගමන් ඔක්කෝමලා බස්වලට දුවගෙන යනවා. පිරිමි කට්ටිය හුඟක් වෙලාවට යන්නේ, මහන්සි වෙලා ගෙදර ගිහින් විවේකයක් ගන්න. කෑම ටික හදලා තිබුණාම

කාලා, ඕනෑ නම් TV එක බලන්න හිතාගෙන තමයි ඔවුන් ගෙදර යන්නේ. නමුත්, මේ කාන්තාවන් වැඩ ඇරිලා යන්නේ ආපසු ගෙදර වැඩ පටන්ගන්න. ඒවා අපි අමතක කරන්න නරකයි. ඒ නිසා කාන්තාවන් සම්බන්ධයෙන් අපට ලොකු කාර්යභාරයක් ඉටු කිරීමට තිබෙනවා.

2025 වසරේ මුල් කාර්තුව තුළ කාන්තාවන්ගේ විරැකියා අනුපාතය සියයට 6.3ක අගයක තිබුණා. අපි මේ ඔක්කෝම ගැන කල්පනා කළ යුතුව තිබෙනවා. රට පුරා වෙසෙන කාන්තාවන් දිහා බලන කොට පෙනෙන්නේ, කාන්තාවන් අද වන විට අධ්‍යාපන මට්ටමින් කොච්චර ඉහළට ගිහින් සිටියත් ඒ අයගේ ශ්‍රමය බොහෝ විට වැය කරන්නේ ගෘහිණියන් හැටියට වන බවයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතින් මේ වැදගත් අංශය පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න මට ඉඩ ලබා දීම ගැන ඔබතුමියට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.39]

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ජාතික ආර්ථිකයට සිදු කරන කාන්තා ශ්‍රම දායකත්වය අගයමින්, වැටුප් රහිත සුරැකුම් ශ්‍රමය ජාතික ආර්ථිකයට එක් කිරීම සඳහා ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බවට යෝජනා කරමින් තමයි අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. මෙම යෝජනාව විශේෂයෙන්ම දසවන පාර්ලිමේන්තුවේ කාන්තා සංසදය වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන මේ මොහොතේ, ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වන්නට ප්‍රථම, අද දවසේ මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ලක් කෙරුණු කිසියම් කරුණු කිහිපයක් ගැන නැවත විමසීමක් කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

අද මට පෙර කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කියපු කාරණාවක් ගැන මුලින්ම කිව යුතුයි. "අපේ රටේ ගාලු මුහුදු සීමාවට ඔබ්බෙන් ජාත්‍යන්තර මුහුදු සීමාවේ ඉරාන යුද නෞකාව පැය 11ක කාල සීමාවක් නවතාගෙන තිබෙන අතරතුරේ එම ඉරාන නෞකාව අපේ මුහුදු සීමාවට ඇතුළු වන්නට ආණ්ඩුවෙන් අවසර ඉල්ලා තිබෙනවා. ඒ අවසරය නොදුන්නු නිසා එම නෞකාව මේ ප්‍රහාරයට ලක් වුණා" කියලා එතුමා ප්‍රකාශ කළා. මම අහන්න කැමැතියි, ඒ ප්‍රකාශයෙන් ගම්‍ය කරවන්න හදන්නේ මොකක්ද කියලා. මෙතුමන්ලා මේ කියන්නේ ලෝක යුධමය තත්ත්වයක් පවතින වෙලාවක ඒ නෞකාව අපේ ගාලු වරායට ගෙන්වන්න කියලාද? මේ වාගේ ප්‍රකාශ ඇත්තටම ඉතාම මිලේච්ඡයි; අමානුෂිකයි. ඒ වාගේම, ඒවා විටෙක දේශපාලනිකව හාස්‍යජනක වෙන්නත් පුළුවන්. අප විශ්වාස කරන්නේ ලෝක සාමය පිළිබඳවයි. ඒ නිසා දේශපාලනිකව බංකොලොත් වෙලා සිටින විපක්ෂය මේ යුද්ධය සම්බන්ධයෙන් හෝ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරලා ගොඩ යන්න හිතනවා නම් ඒක ඉතාම හාස්‍යජනක සහ දේශපාලනික බංකොලොත්භාවය මනාව පෙන්නුම් කරන අවස්ථාවක් කියලා මම හිතනවා.

අද මේ කල්තැබීමේ යෝජනාව පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමේදී, විශේෂයෙන්ම කාන්තා සංසදය විධියට අපි ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් සකස් කිරීම හා සම්බන්ධ යෝජනා ගෙන එන්නේ ඇයි; මෙහි අවශ්‍යතාව කුමක්ද කියන එක මුලින්ම තේරුම් ගත යුතුයි. සංඛ්‍යා දත්ත නිරීක්ෂණය කිරීමේදී - විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්තා අනුව- අපි දකිනවා, මෙරට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කාන්තා විද්‍යාර්ථීන් සාමාන්‍යයෙන් සියයට 60ක, 65ක ප්‍රමාණයක් සිටින බව. හැබැයි, අපේ ශ්‍රම බලකාය - labour force - ගත්තොත්, ඒ ශ්‍රම බලකාය තුළ අපට කාන්තා ශ්‍රමිකයන් හැටියට, කාන්තා ශ්‍රම බලකාය හැටියට වසර ගණනාවක් තිස්සේම හඳුනා ගන්න පුළුවන් වන්නේ සියයට 30ත්, 35ත් අතර ප්‍රමාණයක්. එහෙම නම් සැලකිය යුතු gap එකක්, සැලකිය යුතු රික්තයක් මේ සංඛ්‍යා දත්ත දෙක අතර අපට දකින්නට පුළුවන්.

එයින් අපට විද්‍යමාන වන්නේ විශේෂයෙන් කාන්තාවන් economically inactive තත්ත්වයක් පෙන්නුම් කරන බවක්. අපි කියනවා, අපේ රටේ බහුතර කාන්තාවන් සිටින්නේ ආර්ථිකමය වශයෙන් නිෂ්ක්‍රියභාවයකයි කියලා. ඒකට විශේෂ හේතුවක් තිබෙනවා. ඒ තමයි, අපේ ආසියාතික කලාපය තුළ විශේෂයෙන්ම "කාන්තාව" කියන භූමිකාව තුළම ඇයට පැවරෙන යම් වගකීම් ප්‍රමාණයක් තිබීම. නිවස තුළදී දරුවන්, වැඩිහිටියන් රැක බලා ගැනීම, ඒ අයගේ ආරක්ෂිතභාවය තහවුරු කිරීම, ඒ අයගේ පෝෂණ කටයුතු සිදු කිරීම ආදිය ඒවායෙන් කිහිපයක්. මේ කියන දේවල් විශේෂයෙන්ම reproduction ක්‍රියාවලිය කියලා අපි හඳුන්වනවා. හැබැයි, මේ reproduction එක කවදාවත් අපේ දළ ජාතික නිෂ්පාදිතයට, production එකට ඇතුළත් වන්නේ නැහැ, ගණනය - calculate - වන්නේ නැහැ. එහෙම නම් ආණ්ඩුවක් විධියට, රටක් විධියට, රටේ පාලකයන් විධියට, මහජන නියෝජිතයන් විධියට අපේ කාර්යභාරය තමයි, මෙන්න මේ ජාතික ආර්ථිකයට දායක නොවන කාන්තා ශ්‍රම බලකායට සාධාරණය ඉටු කිරීම. ඊට අදාළ පසුබිම නිර්මාණය කිරීමේ, එහෙම නැත්නම් ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලසාලීමේ වගකීම බාර ගැනීම. ඒක තමයි අපේ වගකීම වෙලා තිබෙන්නේ. මේ ගැන දීර්ඝ ලෙස විවිධ කාලවලදී සාකච්ඡාවට ලක් වුණා. විශේෂයෙන්ම ගත්තොත්, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ මූලධර්මයක් ලෙසම "unpaid care work" කියන සංකල්පය හඳුන්වා දීලා තිබෙනවා. නමුත්, සංකල්පයකට එහා ගිහින් අද වන විට මේ පාර්ලිමේන්තුව තුළ අපට හැකියාව ලැබී තිබෙනවා ඒ සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දීම කෙරෙහි සමස්ත අවධානය යොමු කර ගනිමින් ඊට අදාළ වැඩ කටයුතු කරන්න.

විශේෂයෙන්ම ගත්තොත්, කාන්තාව මත පැටවී තිබෙන මේ බර ආණ්ඩුවේ වගකීමක් ලෙස භාරගෙන වැඩ කරන්නට අපි මේ වන විටත් බොහෝ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. මීන් පෙර කථා කළ අපේ මන්ත්‍රී සහෝදරියන් වාගේම මන්ත්‍රී සහෝදරයන් සියලුදෙනා මේ කාරණය සඳහන් කළා. රාජ්‍ය ආයතනවල, පෞද්ගලික ආයතනවල සේවකයන්ගේ, වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම, මුල් ළමා විය සංවර්ධනය, අඩු ආදායම්ලාභී දරුවන්ට පොත් පත් ලබා ගැනීම සඳහා දීමනාවක් ලබා දීම, ළමුන් 300ට අඩු පාසල්වල දරුවන්ට සපත්තු දීමනාව ලබා දීම ආදිය සිදු කරමින් ඒ වාගේ විවිධ අංශ ඔස්සේ කාන්තාවන් මත පැටවී තිබෙන බරින්, වගකීමෙන් ඒ අය ගලවා ගැනීමට විවිධ වැඩසටහන් විවිධ අමාත්‍යාංශ හරහා අපි ක්‍රියාත්මක කරමින් සිටිනවා. ඉතින් මේ තුළ අපට "gender-responsive budgeting"

[ගරු නිතිඥ හසාරා ලියනගේ මහත්මිය]

කියන සංකල්පයත් දකින්න පුළුවන්. මොකද, කාන්තා හා ළමා කටයුතු ගැන කථා කරන කොට අපි ඒ බර තැබීම කාන්තා කටයුතු අමාත්‍යාංශය මත විතරක්ම නොව, සමස්ත අය වැය පුරා සහ සමස්ත අමාත්‍යාංශ කෙරෙහි ද එලෙසින්ම පවත්වාගෙන යමින් තිබෙන බව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කැමැතියි විශේෂයෙන්ම කාන්තාවන්ගේ මානසික සෞඛ්‍ය - mental health - වෙනුවෙන් ආණ්ඩුව විධියට අප ගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳව අද මගේ අවධානය යොමු කරන්න. මොකද, අප විශ්වාස කරන පරිදි නිවසක කාන්තාව තෘප්තිමත් නම්, ඇය සතුටින් නම් තමයි ඇයගේ ආදරය කරුණාව ලබන දරුවන් සතුටින් තෘප්තිමත්ව සිටින්නේ. ඒ දරුවන් යම් දවසක සමාජයට ගියාට පසුව ආදරය පතුරන ආදරණීය දරුවන් වන්නේ ගෙදර කාන්තාව, එහෙම නැත්නම් මව සතුටින් ඉන්නවා නම් පමණයි. විශේෂයෙන්ම "මානසික සෞඛ්‍ය" කියන එක ගැන ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්වචනය වන්නේ, "මානසික සෞඛ්‍ය යනු, පුද්ගලයෙකුට ජීවිතයේ ඇති ආතති සහ අභියෝග සමඟ සාර්ථකව කටයුතු කිරීමට, තම හැකියාවන් අවබෝධ කර ගැනීමට, ඵලදායී ලෙස වැඩ කිරීමට හා තම සමාජයට දායක වීමට ඇති හැකියාව ලබා දෙන මානසික යහ පැවැත්ම" කියන එකයි. එහෙම නම්, යහපත් මානසිකත්වය කියන එක කාන්තාවකගේ කාර්යක්ෂමතාවට හා සඵලදායිත්වයට ඍජු බලපෑමක් කරන බව සඳහන් කරන්න අපට පුළුවන්.

අපේ රටේ කාන්තාවන්ගේ මානසික ගැටලු සම්බන්ධ දත්ත විශ්ලේෂණය කිරීමේදී - Groundviews ආයතනයේ දත්තවලට අනුව - පෙනෙනවා, ලංකාවේ වැඩිහිටි ප්‍රජාවගෙන් සියයට 30ක් මානසික ගැටලුවලින් පීඩා විඳින බව. කාන්තාවන් ගත්තොත්, විශේෂයෙන්ම කාන්තාවන් අවපීඩනයට මුහුණ දීලා සිටිනවා. අපි එය depression ලෙස හඳුන්වනවා. කාන්තාවන් ආතතිය, ගෘහස්ත හිංසනය, පසු ප්‍රසව විශාදිය ආදි විවිධ ගැටලු තත්ත්වයන්ට මුහුණ දී සිටිනවා. නමුත් මෙතැන ගැටලුව වී තිබෙන්නේ, මේ පිළිබඳ පුළුල් සාකච්ඡාවක් හෝ නිසි දැනුවත් කිරීමක් අපට නොමැති වීමයි. ඒ නිසා ආණ්ඩුව විධියට අපි මානසික සෞඛ්‍ය පිළිබඳ සාකච්ඡාවක් ඇති කිරීම සහ දැනුවත්භාවය ඇති කිරීම කෙරෙහි මේ මොහොතේ අවධානය යොමු කර තිබෙනවා.

විශේෂයෙන්ම හිංසනයේ වින්දිතයන් වන කාන්තාවන් වෙනුවෙන් අපි මුළු දිවයිනම ආවරණය වන පරිදි "shelter homes" නමින් හඳුන්වන කාන්තා රැකවරණ මධ්‍යස්ථාන ආරම්භ කර තිබෙනවා. එහි 11වන මධ්‍යස්ථානය අපි නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම, "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව පශ්චාත් කුණාටු තත්ත්වය තුළ ඒ ඇති වෙච්ච මානසික තත්ත්වයන්ට අදාළව "Healing Sri Lanka" වැඩසටහන කෙරෙහිත්, ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතන සමඟ එක්ව කාන්තාවන්ගේ පහසුව සඳහා ඒ අයගේ දරුවන් රැක බලා ගැනීමේ මධ්‍යස්ථාන නිර්මාණය කිරීම කෙරෙහිත් අපි අවධානය යොමු කර තිබෙනවා. තවත් එකක් තමයි, උපදේශන වැඩසටහන්. මේ උපදේශන වැඩසටහන් සාම්ප්‍රදායික දේශන කලාවෙන් ඔබ්බට ගෙනිහින්, කාන්තාවන් වාගේම සමස්ත සමාජය දැනුවත් කරන රටාවකට පවත්වා ගෙන යන්න ඕනෑ. ඒ නිසා තමයි විවාහ අපේක්ෂිතව ඉන්න යුවළ වෙනුවෙන් ද අප මේ කියන විශේෂ පුහුණු වැඩසටහන් නිර්මාණය කරලා තිබෙන්නේ.

ඒ වාගේම තමයි සෞන්දර්ය අංශය ගත්තත්. අපි දන්නවා, මනසට සෞන්දර්ය - කලාව - බෙහෙතක් බව. හැබැයි, අපේ රටේ මේ තිබෙන ආර්ථික තත්ත්වය තුළ අද වන විට පවුලකට එකට ඉඳගෙන කලා රසාස්වාදය ලබන්න හෝ තමන්ගේ ජීවිතය ගැන කථා කරන්න හෝ එහෙම නැත්නම් තමන්ගේ ජීවිතය ගැන ගැඹුරින් හිතන්න හෝ වෙලාවක් නැහැ. සැමියා බිරිඳගෙන්, මව දරුවන්ගෙන් ඈත් වෙලා සිටින තත්ත්වයක් හමුවේ දකුණු පළාතේ "දක්ෂිණ පුනරුදය" නමින් වැඩසටහනක් පවත්වමින් අප උත්සාහ කළේ කාන්තාවන්ට කලාව සමීප කරවන්නටයි. "රටම එකට" විෂ මත්ද්‍රව්‍ය මැඩලීමේ ව්‍යාපෘතිය සහ "ආරෝග්‍යා" ප්‍රාථමික සෞඛ්‍ය ඒකක තුළිනුත් අප බලාපොරොත්තු වන්නේ කාන්තාවන්ගේ මානසික සුව පැවැත්ම වෙනුවෙන් ඒ අයට අවශ්‍ය වන සහාය ලබා දීමයි. මොකද, අපි විශ්වාස කරනවා, කාන්තාවක් නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගන්න නම්, ඇගේ මනස සැහැල්ලු විය යුතුයි කියලා. ව්‍යවසායකත්වය ගැන අප කථා කරනවා නම්, අලුත් සංකල්ප මතු වීම සඳහා ඇයගේ මනස නිදහස් වෙන්න ඕනෑ. එම නිසා කාන්තාවන්ට විතරක් නොවෙයි, සමස්ත සමාජයටම පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් අපි නිර්මාණය කරනවා. ඒ සඳහා අපි මේ කථා කරන unpaid care work, හුදු ප්‍රතිපත්තිවලට එහා ගිහිල්ලා ක්‍රියාවලියකටම දායක කරගන්න පුළුවන් කියලා විශ්වාස කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

මට මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය මනුෂ්‍ය ජීවිත අවතක්සේරුවට ලක් කළා. අද ලෝකය පුරා ඇතිවෙලා තිබෙන මේ බරපතළ දේශපාලන අර්බුදය නිසා අම්මලා, සහෝදර සහෝදරියන් වාගේම සමස්ත සමාජයම කම්පනයට පත්වෙලා තිබෙන්නේ. නමුත්, ඊයේ අපට ඒ මානුෂීය ආධාර ලබා දෙන්න බැරි වුණා. අපේ මිත්‍ර රාජ්‍යයක් තවත් මිත්‍ර රාජ්‍යයක් සමඟ යුද තත්ත්වයකට පැටලිලා දුෂ්කර තත්ත්වයකට පත්වෙලා ඉන්න වෙලාවේ තමයි මේ දේ වුණේ. යුද්ධයට උපකාර කිරීම නොවෙයි, මනුෂ්‍ය ජීවිත බේරාගන්න එක අපේ වගකීමක්.

අද මේ මොහොතේ දරුවෝ 300ක් ඉන්න නෞකාවක් අපේ දේශ සීමාව ඇතුළේ අපට උදවු කරන්න පුළුවන් සීමාවේ තිබෙනවා. ඒ ජීවිත බේරාගන්න එක, ඒ ජීවිත බේරාගැනීම වෙනුවෙන් ක්‍රියා කරන එක, මනුෂ්‍යත්වය, ජාත්‍යන්තර මානුෂවාදී නීතිය වැදගත් එකක්. එම නිසා ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමියට කියන්න තිබෙන්නේ ඒ රට මොකක්ද, ජාතිය මොකක්ද, ආගම මොකක්ද, යුද්ධය මොකක්ද කියන එක නොවෙයි අපි බලන්න ඕනෑ, මේ වාගේ අතිශය දුෂ්කර තත්ත්වයක් යටතේ ඉරාන දෙවැනි නෞකාවේ සිටින අයගේ

ජීවිත බේරාගැනීම කළ යුතු බවයි. කාටවත් යුද්ධයට උපකාර කරන්න නොවෙයි, කවුරුවත් දිනවන්නවත්, කවුරුවත් පරාද කරන්නවත් නොවෙයි අපට අවශ්‍ය. අපට මේ යුද්ධය අදාළ නැහැ. නමුත් මනුෂ්‍ය ජීවිත බේරාගන්න අපි කටයුතු කරන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සමස්ත කාන්තාව සමාජය තුළ, රට තුළ, ලෝකය තුළ ඉදිරියට ගෙන එන්නට ඉතා වැදගත් වන ක්ෂේත්‍රයක් තමයි ක්‍රීඩාව. ක්‍රීඩාව තුළින් ගොඩනැගෙන පෞරුෂය, ක්‍රීඩාව තුළින් ඇති කරන ස්ත්‍රී-පුරුෂ සමානතාව, ක්‍රීඩාව තුළින් ඇති කරන්නා වූ නායකත්ව ගුණාංග, එක පැත්තකින් මහජන නියෝජිතයන් වෙන්න, යම් වෘත්තියක් කරන්න, සමාජය තුළ ඉදිරියෙන්, අසමානතාවකින් තොරව ක්‍රියා කරන්න හේතු වනවා. මම අපේ කාන්තා ක්‍රිකට් කණ්ඩායමට සුබ ප්‍රාර්ථනා කරනවා, බටහිර ඉන්දීය කොදෙව් දූපත්වලදී ඒ කණ්ඩායම පරාජයට පත් කරන්න අපේ කණ්ඩායමට ශක්තිය ලැබුණු නිසා. නමුත්, අද අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව සමස්තයක් වශයෙන් පිරිහිලා තිබෙනවා. අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව සමස්තයක් වශයෙන් පිරිහෙන්න හේතුවක් තිබෙනවා. ඒ, පරිපාලනයේ තිබෙන අඩුපාඩු, පරිපාලනය තුළ තිබෙන දූෂණය, පරිපාලනය තුළ තිබෙන අක්‍රමිකතාව නිසා. මේ රජය බලයට පත් වුණේ ඒ අක්‍රමිකතා ඉවත් කරනවා කියලා. ඒ සඳහා දිගු කාලීන පිළියමක් යෙදිය යුතුයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරමු.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මට තත්පර 30ක් දෙන්න.

ඒ අක්‍රමිකතා ඉවත් කිරීම සඳහා කේ.ටී. චිත්‍රසිරි යෝජනා මත පදනම් වූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් මීට කලින් කැබිනට් මණ්ඩලය අනුමත කරලා තිබෙනවා. සවිස්තරාත්මකව, දිගු කාලීනව මේ රටේ ව්‍යවස්ථාදායකය මැදිහත් වෙලා මේ සමස්ත ප්‍රශ්නය විසඳීමට, ක්‍රිකට් ක්‍රීඩාවේ කළමනාකරණය හා සම්බන්ධ ප්‍රශ්නය විසඳීමට යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. කෙටි කාලීන අතුරු යෝජනා මඟින්, අතුරු කමිටු මඟින් මේ ප්‍රශ්නය විසඳීමට ගියොත් අපි අර්බුදයකට ලක්වන්න පුළුවන් කියන අනතුර ගැනත් මම කියන්න කැමැතියි.

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
Madam Chair, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය ගැන පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍ය වනවා. මා කළේ මනුෂ්‍යත්වයට එරෙහි ප්‍රකාශයක් නොවෙයි. විශේෂයෙන් ගත්තොත්, රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් අපි මේ වාගේ කටයුතුවලදී ඉතාම සූක්ෂ්ම විය යුතුයි. එවන් අවස්ථාවකින් දේශපාලන වාසි ගන්නවා නම් අන්න ඒක තමයි අපි හෙළා දකින්නේ. එහෙම නැත්නම් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට අපි ලෝක සාමය වෙනුවෙන්, මනුෂ්‍යත්වය වෙනුවෙන් එකලෙසම පෙනී සිටිනවාය කියන වගකීම් සහගත ප්‍රකාශය මම මේ අවස්ථාවේදී කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.53]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ විවාදය අවස්ථාවේ ඔබතුමිය මුලසුන දැරීම පිළිබඳව මා සතුටු වනවා.

ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තකොටගෙන ආණ්ඩු පක්ෂය විසින් ඉල්ලුම් කරන ලද විවාදයට අදාළව අද දින ජාතික ආර්ථිකයට කාන්තා ශ්‍රම දායකත්වය අගයමින් වැටුප් රහිත සුරැකුම් ශ්‍රමය ජාතික ආර්ථිකයට එක් කිරීම සඳහා වන යෝජනාව යටතේ තමයි අද සාකච්ඡා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද උදෑසන සිට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියන් කිහිපදෙනෙක්ම විවිධ ක්ෂේත්‍ර සම්බන්ධ කරගනිමින් ජාතික ආර්ථිකයක් සඳහා කාන්තාවගේ ශ්‍රමයට ලබා දෙන්න පුළුවන් වටිනාකමට තහවුරුවක්, ස්ථාවරභාවයක් ඇති කර ගත යුත්තේ කෙසේද යන්න පිළිබඳව අදහස් දක්වනු ලැබුවා. ඒ කාරණාවේදී මාගේ විෂය පථය ලෙස තෝරාගෙන තිබෙන්නේ කාන්තාව හා දේශපාලන සහභාගිත්වයයි; දේශපාලනයේදී කාන්තාවගේ සහභාගිත්වය කියන එක තමයි අද මගේ මාතෘකාව බවට පත්වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි අපේ ජීවිතය තුළ විවිධ අවධි ගත කරනවා. කාන්තාවන් විධියට අපට කුඩා අවධියේ සිටම විවිධ භූමිකා තිබෙනවා. කුඩා දරුවාගේ අවධියේ සිට, පාසල් යන අවධියේ සිට, රැකියාවක් කරන අවධියේ සිට, විවාහ වුණු අවධියේ සිට විවිධ භූමිකා අපට තිබෙනවා. මෙන්න මේ භූමිකා ඇතුළේ අප වාගේ රටවල කාන්තාවට දේශපාලන භූමිකාව බොහොම අඩු තැනක තමයි තිබුණේ. තවමත් තිබෙන්නේ අඩු තැනක්. නමුත්, පසුගිය මහ මැතිවරණයේදී සහ පළාත් පාලන මැතිවරණයේදී ඒ අඩුවෙන් තිබුණු දේශපාලන භූමිකාව ජාතික ජන බලවේගයේ අපි යම්තාක් දුරකට -ඒක හොඳම එක නොවෙන්න පුළුවන්- වැඩි කර ගන්න සමත් වුණාය කියන විශ්වාසය අපට තිබෙනවා. ඒකට විශේෂ හේතුවක් තිබෙනවා.

Christine Pintat කියන සක්‍රිය දේශපාලන ක්‍රියාකාරිනිය විසින් ලියන ලද "Recent study on 179 Parliaments in all over the world and the number of women MPs" කියන කෘතිය අනුව, "බොහොමයක් කාන්තාවන් දේශපාලනය දෙස බලන්නේ පිරිමින් පමණක් නිරතවන පාපන්දු ක්‍රීඩාවක් ලෙසයි" කියලා දැක්වෙනවා. 2016 අවුරුද්දේ ලබා ගත් සංඛ්‍යාලේඛන අනුවත් එය පැහැදිලි වනවා. අපට පොඩි කාලයේ ඉඳලා ම උගන්වපු දෙයක් තමයි, දේශපාලනය අපට අවශ්‍ය නැහැ කියන එක.

මම ඒකට පුංචි උදාහරණයක් කියන්නම්. අපේ ගම්වල තිබෙනවා, ගොවි සමිතිය, සමෘද්ධි සමිතිය, වැඩිහිටි සමිතිය, මරණාධාර සමිතිය වශයෙන් විවිධාකාර සමිති. මේ හැම සමිතියකටම ගිහිල්ලා වාඩි කරවන්නේ අපේ වයසක අම්මා හරි අක්කා. ඒක අපට පුංචි කාලයේ ඉඳලා තිබෙන අත්දැකීමක්. අම්මා කීයක් හරි හොයාගෙන මරණාධාර සමිතියේ තිබෙන බංකුවේ කොනක වාඩිවෙලා ඉන්නවා. ඒකේත් කාන්තා නියෝජනය තිබෙනවා. මොන වැඩ තිබුණත් ඒ හැම සමිතියකටම ගෙදර

[ගරු නිතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

ඉන්න අම්මා හෝ සහෝදරිය යවනවා. හැබැයි, අපි බහුතරයකට ජීවිත අත්දැකීමක් නැහැ, දේශපාලන රැස්වීමකට, දේශපාලන ක්‍රියාකාරිත්වයට අම්මා හරි නෝනා හරි අක්කා -සහෝදරිය- හරි වාඩිකරවන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දේශපාලන සාක්ෂරතාව අහිමි කරපු රටක තමයි අපි ජීවත් වුණේ. කාන්තාවට දේශපාලනයට සම්බන්ධ වීමේ අවස්ථාව අඩු රටක තමයි අපි ජීවත් වුණේ. ඒ නිසාම තමයි දේශපාලන රැස්වීමට ගෙදර සිටින තාත්තා හෝ අයියා -සහෝදරයා- යද්දි, අනෙක් හැම රැස්වීමකටම අම්මා හෝ සහෝදරිය ගිහිල්ලා වාඩිවෙලා හිටියේ. මෙන්න මේක වෙනස් කරන්න අපි සමත් වුණා, පසුගිය අවුරුද්දේ. අර කෘතියේ සඳහන් වුණු දේශපාලන පාපන්දුව, පිරිමින් විතරක් අත්පත් කරගෙන හිටපු පාපන්දුව අත්පත් කර ගැනීමේ යම් නැඹුරුවකට, ජයග්‍රහණයකට එළඹීමට අපි සමත් වුණා. එහි එක් ප්‍රතිඵලයක් ලෙස පාර්ලිමේන්තු නියෝජනයෙන් සියයට10ක්, එනම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් විසිදෙදෙනෙකු මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඉන් විසිදෙනෙකු ආණ්ඩු පක්ෂය නියෝජනය කරනවා. ඒක අපි ලබපු ජයග්‍රහණයක්. ඒක අපි විතරක් ලබපු ජයග්‍රහණයක් නොවෙයි. ඒ සඳහා පිටුපස ඉඳලා අපට තල්ලුව දීපු, අපට ශක්තිය දීපු, අපට හයිය දීපු කාන්තාවන් දසදහස් ගණනක් ඉන්නවා. ඔවුන් සියලුදෙනාම මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ. ඒ අය සක්‍රිය දේශපාලනය වෙනුවෙන් ක්‍රියා කරපු සහෝදරියන්.

ඒ වාගේම මේ වන විට පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරියන් -කාන්තා සහෝදරියන්- 2,039කට ආසන්න පිරිසක් ඉන්නවා. එයින් ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රී සහෝදරියන් 679ක් ඉන්නවා. මම ආසන්න වශයෙන් පමණයි මේ සංඛ්‍යාලේඛන කියන්නේ. මොකද, සමහර දිස්ත්‍රික්කවලින් මට නිශ්චිත තොරතුරක් ලැබිලා නැති නිසා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මම නියෝජනය කරන මධ්‍යම පළාතේ ඉතාම දුෂ්කර දිස්ත්‍රික්කයක් වන නුවරඑළිය දිස්ත්‍රික්කයෙනුත් පළාත් පාලන ආයතන නියෝජනය කරන -ආණ්ඩු පක්ෂය- මන්ත්‍රීවරියන් දහඅටදෙනෙකු පත් කරන්න ජාතික ජන බලවේගයේ අපි සමත්වෙලා තිබෙන බව. ඒකෙන් බහුතරයක් කොට්ඨාසවලින් ඡන්දය ඉල්ලා තේරී පත්වෙච්ච සහෝදරියන්. ඒ වාගේම අතහැර දැමූ, කවදාවත් දේශපාලනයට කාන්තාවන් සම්බන්ධ නොවුණු යාපනය දිස්ත්‍රික්කයේත් ජාතික ජන බලවේගය නියෝජනය කරමින් මන්ත්‍රී සහෝදරියන් විසිහතරදෙනෙක් තේරී පත් වී ඉන්නවා. මේවා අපි ලබපු ලොකු ජයග්‍රහණ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලත් මන්ත්‍රී සහෝදරියන් හැටහයදෙනෙක් ඉන්නවා.

ඒ නිසා ගම වෙනුවෙන් තීන්දු තීරණ ගන්න ඒ බොහෝ තැන්වල මේ වනකොට කාන්තා සහෝදරියන් යම් ජයග්‍රහණයක් ලබා ගනිමින් ඉන්නවා. රටකට අවශ්‍ය වන නීතිරීති සම්පාදනයේදීත් යම් තීන්දු තීරණ ගන්නට ඔවුන්ට දැන් හැකියාවක් තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් මම ඔවුන් සියලුදෙනාටම සුබ පතනවා. මේක අපි ලබපු ජයග්‍රහණයක් ලෙස සටහන් කරගෙන, අපි රටේ ආර්ථිකය හැදීමේදී, අපි ගමේ ආර්ථිකය හැදීමේදී, අපි කාන්තාව සවිබලගැන්වීමට ගන්නා වූ තීන්දු තීරණවලදී ඔබගේ සක්‍රිය දායකත්වය උපරිමයෙන් ලබා දෙන්න කියලා ඒ සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම කාන්තාවගේ භූමිකාව නිරූපණය කිරීමේදී විවිධ ගැටලුවලට අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. දේශපාලන පක්ෂවල ක්‍රියාකාරිත්වය, මාධ්‍ය හැසිරීම, පුංචි කාලයේ ඉඳලා පැවරී තිබෙන වගකීම්, සාම්ප්‍රදායික මත සාම්ප්‍රදායික අදහස් සහ බලය හිමි පන්තියක් විසින් අපට කරන බලපෑම ආදී විවිධ බාධක මධ්‍යයේ තමයි අපට දේශපාලනය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. නමුත්, එවැනි අභියෝග මැද වුණත් පසුගිය අවුරුද්ද තුළ අගමැති ධුරය දරමින්, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය ධුරය දරමින් සහ සියලු අමාත්‍යාංශවලට අදාළ කාරක සභා නියෝජනය කරමින් මේ මන්ත්‍රීවරියන් තමන්ගේ භූමිකාව රඟ දක්වමින් කාන්තාවන් විධියට යම්කිසි ජයග්‍රහණ ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් වුණාය කියා මම හිතනවා.

ඒ අතරතුර මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හෝ පෙර පාසල්වල දරුවන්ගේ උදෑසන ආහාරය සඳහා ලබා දුන් රුපියල් 60ක දීමනාව අපි රුපියල් 100 දක්වා ඉහළ දමා තිබෙනවා. ඒ වාගේම අස්වැසුම ප්‍රතිලාභය ලබන පවුල්වල දරුවන්ට පාසල් ලිපි ද්‍රව්‍ය ලබා ගන්න රුපියල් 6,000ක දීමනාවකුත්, සිසුන් 300ට වඩා අඩු පාසල්වල දරුවන්ට ලිපි ද්‍රව්‍ය ලබා ගන්න රුපියල් 6,000ක දීමනාවකුත් ලබා දී තිබෙනවා. සුරක්ෂා රක්ෂණාවරණය වාගේම පරිවාසගත දරුවන්ට දීමනාවක් ලබා දී තිබෙනවා. මේවා සියල්ල එක පෙළට ගත්තාම, අපට කරන්න පුළුවන් දේවල් ටික වසරක කාලය තුළ අපි කර තිබෙනවා.

පසුගිය දවසක ජනාධිපතිතුමා කළ කථාවේ වැරදුණු එක වචනයක් අල්ලා ගෙන විපක්ෂය විසින් අපට ලොකු චෝදනාවක් නැඟුවා. අපට හිමි කර දී තිබෙන පුංචි ආර්ථිකය තුළ තමයි අපි මේ ටික කළමනාකරණය කරගෙන යන්නේ.

මගේ කථාව අවසන් කරන්න කලින් මම මේ කාරණයත් කියනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දේශපාලනය අපට වැඩක් නැහැ කියලා අපි කවුරු හරි හිතනවා නම් ඒක අපට වැරදුණු එක තැනක්. දේශපාලනය අපේ ජීවිතයේ සියලු තීන්දු තීරණවලට බලපානවා. අපි සතුටින් ඉන්නවාද, ඉස්කෝලේ යනවාද, අපේ දරුවන්ට හොඳම කෑම අරගෙන දෙනවාද, ඒ අය හොඳම සවාරියක් එක්කගෙන යනවාද, පිට රටකට යනවාද කියන මේ හැම එකක් තුළම දේශපාලනය තිබෙනවා.

මේ අවස්ථාවේදී පුංචි කවියක් මට මතක් වෙනවා. දේශපාලනයට තිබෙන අපේ කැමැත්ත ගැන නුවන් තොටවත්ත කියන වෛද්‍යවරයා ලියපු කවිය කියලා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඔහුගේ එක් කවියක මෙසේ කියනවා:

"ඉපදුණු දවසෙම තීරණය වෙලා තිබුණේ මාව දෙන කෙනා ගැන - ඒ තාත්තාගේ කැමැත්ත

කවමදාවත් ලැබුණේ නැහැ එළිය බලන්නවත් ජනේලයකින් මගේ කැමැත්තට - ඒ අම්මාගේ කැමැත්ත

තීරණය කළාම මාව කසාද බන්දලා දෙන්න, වචනයක්වත් ඇහුවේ නැහැ මිනිහයි තාත්තායි දෙන්නම - ඒත්, ඒ දෙන්නාගේ කැමැත්ත

ඒත් හැමෝම බණින්නේ මගේ කැමැත්තට කළ එකම දේට - කඩුව දෙන එක වැදි රජ්ජුරුවන්ට"

ඒ නිසා කාන්තාවන්ට තමන්ගේ කැමැත්ත සම්බන්ධයෙන්, දේශපාලනයට ඇති කැමැත්ත සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ ස්වාධීන අයිතිය පිළිබඳව ප්‍රශ්න කරන්න ඉඩ තියන්න එපා. ජීවිතයේ ඕනෑම තීන්දු තීරණයක් ගැනීමේදී කාන්තාවගේ

ස්වාධීනත්වය ආරක්ෂා කරමින්, ඇයගේ ගෞරවය ආරක්ෂා කරමින් කටයුතු කිරීම තමයි කාන්තා දිනයේ ලබා දෙන හොඳම පණිවුඩය. ඒ කාරණයත් මතක් කරමින්, මට කථා කරන්න වෙලාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.03]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාන්තා දිනය නිමිත්තෙන් පැවැත්වෙන මේ විවාදයේදී පළමුවෙන්ම ශ්‍රී ලංකාවේ කාන්තාවන් සියලුදෙනාටම - අම්මලාට, සහෝදරියන්ට - මම සුබ පතනවා. ඒ වාගේම ඒ සියලුදෙනාට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා, හොඳින් ජීවත් වෙන්න ලැබෙන්න කියලා. හැබැයි, ආණ්ඩුවෙන් මම ඉල්ලීමක් කරනවා, මේ ගෞරවනීය කාන්තාවන්ට මේ රටේ ජීවත් වෙන්න අයිතිය ලබා දීම සඳහා පරිසරය ආරක්ෂා කර දෙන්න කියලා. මම මේ අවස්ථාවේදී ඒ ඉල්ලීම කරන්නේ මේ නිසායි.

මගේ ළඟ ෆොටෝ එකක් තිබෙනවා. නමුත්, ඒක හරියට පෙනෙන්නේ නැහැ. වීඩියෝ එකකුත් තිබෙනවා, අවශ්‍ය නම්. මේ වනකොට නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ plant එකක චිමිනියෙන් සම්පූර්ණයෙන් කළු දුමක් පිට වෙනවා. ඒ කළු දුමාරයෙන් ඉතාම ප්‍රබල ලෙස ඒ ප්‍රදේශය වසාගෙන තිබෙනවා. ඒකට හේතුව මෙයයි. බාල ගල් අඟුරු දහනය කිරීම හේතුවෙන් ඊයේ මේ බලාගාරයේ එක plant එකක වැඩ කටයුතු නතර කරන්න සිද්ධ වුණා. දැන් මේ චිමිනියේ තිබෙන filtration system එක අයින් කරලා තිබෙනවා කියලා තමයි අපට දැන ගන්න ලැබිලා තිබෙන්නේ. මේ කාරණය නිසා මේ ප්‍රදේශයට බරපතළ පරිසර හානියක් සිද්ධ වනවා. කල්පිටිය බලප්‍රදේශයට සිදු වන පරිසර හානිය නිසා ඒ ප්‍රදේශයේ ජීවත් වන කාන්තාවන්ගේ අයිතිය තමුන්නාන්සේලා ආණ්ඩුවක් හැටියට අද වනකොට උදුරාගෙන තිබෙනවාය කියන එක විශේෂයෙන් මම මතක් කරනවා.

ඒ නිසා මේ හැම දෙයක්ම කරද්දී මතක තබා ගන්න, පරිසරය ආරක්ෂා කර ගත්තේ නැත්නම් මේ රටේ කාන්තාවන්ට විතරක් නොවෙයි, අපි කාටවත් හොඳින්, නීරෝගීව ජීවත් වෙන්න ලැබෙන්නේ නැහැ කියන එක. ඒ වාගේම අපේ දරුවන්ට ඉදිරි අනාගතයක් ගොඩනඟන්න, මේ රට හොඳට හදන්න අවශ්‍ය කරන වැඩසටහන් හදන්න බැහැ. මේ නිසා තමයි අපි පුනපුනා කිව්වේ, බාල ගල් අඟුරු ගෙනාවාට පසුව ඒවා දහනය කිරීමේදී මේ සිද්ධිය වනවා කියලා. මේ හානිය සිද්ධ වුණේ සමස්ත රටටම විදුලි ආලෝකය ලබා දෙන්න කැප කිරීමක් කළ කල්පිටිය බලප්‍රදේශයේ අහිංසක මිනිස්සුන්ට. එදා මේ බලාගාරය හදනකොට ඒ ප්‍රදේශයේ මිනිස්සු මැරුණා. ඒ නිසා මේ බලාගාරයෙන් නිකුත් වන දුමත් එක්ක පරිසර හානියට එකතු වන අළු සම්බන්ධව ගන්න තීන්දුව පිළිබඳව මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන්න කියලා ඉතා ගෞරවයෙන් මම අද ඉල්ලනවා. කාන්තාවන්ගේ නාමයෙන්වත් මේක නිවැරදි කරන්න කියලා විශේෂ ඉල්ලීමක් හැටියට මම මේක ඉදිරිපත් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.06]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය මූලාසනයේ ඉන්නකොට මට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව ඇත්තටම සතුටු වනවා. ඒ එක්කම අපි නිර්මාණය කරන්න සහසම්බන්ධ වුණු, දායක වුණු ගෞරවනීය මගේ අම්මා ඇතුළු සියලු කාන්තාවන්ට මගේ උත්තමාචාරය පළ කරන්න කැමැතියි. ඔව්, අපි ජීවත් වන මහ පොළොව "මිහිකත" කියලා අපි හඳුන්වනවා. හැබැයි, අපි මොකක්ද කරලා තිබෙන්නේ? අපි, අපේ ශක්ති ප්‍රමාණයෙන් උපරිම විධියට මිහිකත දූෂණය කර තිබෙනවා.

මොහෙන්දජාරෝහරප්පාවල ජගත් මාතා පිදීමෙන් තමයි ඉතා ඈත අතීතයේ දවසක කාන්තාවන්ට ගරු කළේ. හැබැයි, අද වනකොට මිහිකත වාගේම අපිත් එක්ක ජීවත් වන කාන්තාව අපි දූෂණය කරනවා. වචනයෙන් දූෂණය කරනවා; බැල්මෙන් දූෂණය කරනවා; ක්‍රියාවෙන් දූෂණය කරනවා. එහෙම කරලා අපි කියනවා, "තොටිල්ල පදවන අත ලෝකය පාලනය කරනවා" කියලා. මොන බොරුද? තොටිල්ල පදවන අත ලෝකය පාලනය කරනවා නම් ලංකාව උදාහරණයකට ගන්න. ලංකාවේ සියයට 52ක් ඉන්නේ කාන්තාවන්. හැබැයි, පාර්ලිමේන්තුව තුළ කාන්තාවන් ඉන්නේ 22යි. කෝ, මෙතැන ප්‍රජාතන්ත්‍රවාදයක්? මෙතැන ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. ප්‍රාදේශීය දේශපාලනයේදී කාන්තාවන් නියෝජනය වෙන්නේ සියයට 25යි. සියයට 27ක් අත්හැරලා. කෝ, මෙතැන ප්‍රජාතන්ත්‍රවාදයක්? මේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමය අපි වෙනස් කරන්න ඕනෑ. ඔවුන්ට සියයට 52ක නියෝජනයක් දෙන්න ඕනෑ. එතකොට තමයි මේ ප්‍රජාතන්ත්‍රවාදය සැබෑවක් වෙන්නේ; යථාර්ථයක් වෙන්නේ. අනෙක් පැත්තෙන් දේශපාලනයේ තිබෙන පුරුෂාධිපත්‍ය ගතිය වෙනස් කරන්න පුළුවන් වෙන්නේ. එතකොට කාන්තා ස්වභාවයේ දේශපාලනයක් ප්‍රතිනිර්මාණය වේවි. අපි බලාපොරොත්තු වෙන්නේ අන්න ඒක. ඒ සඳහා ශ්‍රී ලාංකීය සකල කාන්තා පරපුරට අපි ආරාධනා කරනවා. ඔබ සතු විය යුතු බලය, ඔබ සතු විය යුතු ශක්තිය ඔබම දෝතට ගන්න ඕනෑ.

තේ දල්ල නෙළන කාන්තාව තමයි, ආර්ථිකයේ විශාල පංගුවක් දරන්නේ. රෙදි මහන කාන්තාව තමයි ආර්ථිකයට විශාල ශක්තියක් දෙන්නේ. විදේශගතව ප්‍රේෂණ එවන කාන්තාව තමයි ආර්ථිකයට විශාල ශක්තියක් දෙන්නේ. හැබැයි, ඒ අය මේ ආර්ථිකය බුක්ති විඳීම තුළ ඒක තිබෙනවාද? ඒක මේ දේශපාලනය බුක්ති විඳීම තුළ තිබෙනවාද? ඒක මේ සංස්කෘතිය බුක්ති විඳීම තුළ තිබෙනවාද? උත්තරය, නැහැ. එහෙම නැත්නම් මොකක්ද මේකෙන් කියැවෙන්නේ? ඒකෙන් කියැවෙන්නේ අපි කාන්තාවට නියම ගරුත්වය, නියම අභිමානය දීලා නැහැ කියන එකයි.

සාමාන්‍ය ජන සංගණන වාර්තාව අනුව කාන්තාවන් ඉන්නේ සියයට 52යි. හැබැයි, ආබාධ සහිත ප්‍රජාව ලක්ෂ 16ක් ඉන්නවා. එයින් සියයට 57ක් කාන්තාවෝ. ඔවුන්ට නිසි නියෝජනය ලැබී නැහැ. අනෙක් පැත්තෙන්, ඔවුන් දිහා බලන ආකල්පයේ අතිශය ඍණාත්මක බවක් තිබෙනවා. ඇය කුටුම්බයකට ඇතුළත් වීම -

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

විවාහයකට ඇතුළත් වීම - කුටුම්බයක් ආරක්ෂා කිරීම පිළිබඳ කාරණයේදී සෘණාත්මක ආකල්පයකින් තමයි සමාජය බලන්නේ. ඇය මවක් වෙනකොට සෘණාත්මක ආකල්පයකින් තමයි බලන්නේ. ඇයි, ආබාධිත බවත් එක්ක අම්මා කෙනෙක් වෙන්න බැරිද? දරුවෝ හදන්න බැරිද? ඒ දරුවෝ යහපත් තැනකට ගේන්න බැරිද? මේ ප්‍රශ්න රෝහල්වලදීත් අපට ඇහෙනවා, මහ මඟදීත් ඇහෙනවා, බස් රථයේදීත් ඇහෙනවා. අවමන් සහගත වචන ඇහෙනවා; හිත් රිදෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් ඔවුන් නිහඬව ඉන්නවා. ආබාධ සහිත කාන්තාවන් දූෂණය වන ප්‍රමාණය, බලහත්කාරකම්වලට යට වන ප්‍රමාණය පවුල තුළ ඉඳලා සමාජය දක්වාම ගමන් කරනවා. මේක උහුලන්න පුළුවන්ද?

ආබාධ සහිත කාන්තාවන්ට රැකියා වෙළෙඳ පොළේ තිබෙන්නේ ඉතා පටු තැනක්; ඉතා චූටි තැනක්. අධ්‍යාපනය ලැබීමේදී ඔවුන්ට තිබෙන ගැටලු අප්‍රමාණයි. මොකද, ඇයට සුරක්ෂිතතාව ඇති කරන්න නම් ඇයත් එක්ක දෙමව්පියන්ගෙන් කවුරු හරි හෝ භාරකරුවෙක් අනිවාර්යයෙන්ම පාසලට යන්න ඕනෑ, ආපසු පාසලෙන් එක්කරගෙන එන්නත් ඕනෑ. ඇයට ලැබිය යුතු පහසුකම් සම්බන්ධයෙන් ගත්තොත් අසාධාරණකමක් අපට දකින්නට ලැබෙනවා. එවන් අවස්ථා අහිමි කිරීම අපි කොහොමද යුක්ති සහගත යැයි පිළිගන්නේ? අපට ඒක යුක්තියක් විධියට පිළිගන්න බැහැ. ඒ නිසා අපි කියනවා, ආබාධ සහිත කාන්තාවටත් සමාන අයිතිය සහ සාධාරණ අවස්ථා දෙන්න ඕනෑ කියලා.

මාක්ස්වාදයට අනුව කාන්තාව ද්විත්ව පීඩනයට ලක් වුණු කෙනෙකු විධියටයි සලකන්නේ. එක පීඩනයක් තමයි ආර්ථික පීඩනය. දෙවැනි පීඩනය තමයි පුරුෂාධිපත්‍යයේ පීඩනය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආබාධ සහිත කාන්තාව ද්විත්ව පීඩනයකට නොවෙයි, ත්‍රිත්ව පීඩනයකට -තුන් ආකාර පීඩනයකට- ලක්වෙලා තිබෙනවා. ඒ තමයි ආබාධිත බව නිසා ඇති වන පීඩනය. මේක සමාජයක් විධියට අපි දරා ගන්නේ කොහොමද? පොදුවේ කාන්තාවන්ට එල්ල වන පීඩනය අපි ප්‍රතික්ෂේප කරනවා වාගේම, ආබාධ සහිත කාන්තාවට එල්ල වන මේ පීඩනයත් අපි ප්‍රතික්ෂේප කරනවා.

මැක්සිම් ගෝර්කි කියන විධියට මේ ලෝකය නිර්මාණය වෙන්නේ, අපි ජීවත් වෙන්නේ මවගේ කිරෙනුයි, සූර්යයාගේ රශ්මියෙනුයි. එහෙම නම්, අපි සූර්ය වන්දනාව කරන විධියටම මාතෘ වන්දනාවත් කළ යුතුයි. හැබැයි, ඒක වචනයකට විතරක් නොවෙයි, ඒක හුදු වන්දනාවකට විතරක් නොවෙයි සීමා විය යුත්තේ. සම අයිතියක්, නැත්නම් අභිභවා ගිය අයිතියක් ඇයට උරුමයි. සමාජයීය වශයෙන්, ආර්ථිකමය වශයෙන් සහ අපේ අනුෂ්කා සහෝදරිය කිව්වා වාගේ දේශපාලන භූමිකාව තුළත් ඇයට විශාල පංගුවක් අයිතියි. මොකද, ජන නියෝජනය ඇයගේ බහුතරය වන නිසා. සංස්කෘතිකමය වශයෙන් ඇය හුදු අන්‍යයන් පිනවීම සඳහා පාවිච්චි කරන මෙවලමක් නොවිය යුතුයි. ඇයට සංස්කෘතිය බුක්ති විඳින්න, සංස්කෘතිය නිරූපණය කරන්න අවකාශ දිය යුතුයි. හුදු වචනවලින් මේ මහ පොළොව කාන්තාවට උපමා කළාට වැඩක් නැහැ, මේ ලෝකය පාලනය කරන්නේ ඇගේ දෝත කියලා කිව්වාට වැඩක් නැහැ, ඒක යථාර්ථයක් බවට පත් කරන්න බැරි නම්. අපි සමාජයක් විධියට, මනුෂ්‍යයෝ විධියට ශිෂ්ට සම්පන්න බවකට උරුමකම් කියනවාද කියන ප්‍රශ්නය අපේ හෘදය සාක්ෂියෙන් අහන්න ඕනෑ. ඇය ජාතික ආර්ථිකයට ලබා දෙන ශක්තිය ඇයට බුක්ති විඳින්න අවස්ථාව තිබෙනවාද කියන එක අපි අහන්න ඕනෑ. සමස්ත ශ්‍රී ලාංකීය කාන්තාව තමන්ගේ දේශපාලනය, ආර්ථිකය, සමාජයීය බලය විතරක් නොවෙයි සංස්කෘතියත් එක මිටට බුක්ති විඳින ප්‍රජා කණ්ඩායමක් බවට පත් කිරීම තමයි අපේ බලාපොරොත්තුව. ලෝකයේ ගාමක බලය නිර්මාණය කරන මේ උත්තම කාන්තාවන්ට වචනයෙන් නොවෙයි, සැබෑවටම මගේ උත්තමාචාරය පළ කරමින් මා නිහඬ වෙනවා.

මට ලබා දුන් මේ අවස්ථාව වෙනුවෙන් බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[පි.ව. 2.14]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எதிர்வருகின்ற 8ஆம் திகதி சர்வதேச மகளிர் தினத்தைக் கொண்டாடவுள்ள எனது தாயான எஸ்.டி. சபுரா உம்மா உட்பட அனைத்துப் பெண்களுக்கும் எனது வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். இவர்கள் அனைத்து உரிமைகளையும் பெற்று, சமூகத்துக்குப் பிரயோசனமான பிரஜைகளாகத் திகழ வேண்டுமென இன்றைய நாளில் பிரார்த்திக்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று யுத்த மேகம் குடிகொண்டுள்ளது. ஈரான் - அமெரிக்க யுத்தம் காரணமாக கொல்லப்பட்ட ஈரானிய ஆன்மீகத் தலைவர் அலி கமேனி அவர்களின் மறைவுக்கு ஆழ்ந்த இரங்கலைத் தெரிவித்து, அவருக்கு அல்லாஹ்வின் அருள்கிட்ட வேண்டுமெனப் பிரார்த்திக்கின்றேன். தற்போது ஏற்பட்டுள்ள இந்த யுத்தம் காரணமாக மத்திய கிழக்கில் தொழில் செய்துவரும் இலங்கையர்களைப் பாதுகாப்பதற்கு இலங்கை அரசு முன்வர வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். ஈரான், இலங்கையின் நட்பு நாடாகும். உமா ஓயாத் திட்டத்தை மாத்திரமன்றி, பல திட்டங்களை வெற்றிகரமாக இலங்கைக்கு வழங்கியுள்ளது. உலக சமாதான எதிரியும் நாசகாரனுமான 'ட்ரம்ப்' எனும் சைத்தான் திருந்துவதற்கு இறைவன் துணைபுரிய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இஸ்ரேல் மற்றும் அமெரிக்காவின் கூட்டுச் சதியால் இந்தப் போர் ஏற்பட்டுள்ளது. பலஸ்தீனில் பல்லாயிரக்கணக்கான அப்பாவி மக்களை நோன்புக் காலம் என்றும் பாராமல் கொன்றுகுவிக்கும் இஸ்ரேல், இன்று அமெரிக்காவைத் தூண்டி ஈரான் மீதான போரை நடாத்தியது. போர் ஏற்பட்டால் எல்லோருக்கும் அழிவு ஏற்படும்; பாதிப்பு ஏற்படும். அந்த வகையில், எமது நாட்டுக்கும் பாதிப்பு ஏற்படும். இந்தப் போரானது வளைகுடாவில் பரவ வாய்ப்பு இருக்கின்றது. எனவே, யுத்தம் செய்து இரத்தம் சிந்துவதை விடுத்து, சமாதான உடன்படிக்கைக்கு சம்பந்தப்பட்ட அனைத்து நாடுகளும் முன்வர வேண்டுமென இந்த உயரிய சபை மூலமாகக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று இலங்கையின் பல பாகங்களிலும் பெற்றோல் மற்றும் எரிவாயுவுக்கான வரிசை நீண்டு காணப்படுகின்றது.

அரசாங்கம் சரியான திட்டத்தை மேற்கொண்டு, QR Codeஐ அறிமுகம் செய்வதன்மூலம் இந்த வரிசையைக் குறைத்து, பதுக்கலையும் தடுக்க முடியும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பொத்துவில் பிரதேச செயலாளர் பிரிவிலுள்ள அறுகம்பை பிரதேசமானது சுற்றுலாத்துறைக்குப் பெயர்பெற்ற ஒரு பிரதேசமாகும். 1960ஆம் ஆண்டு முதல் இங்கு சுமார் 500 குடும்பங்கள் 150 ஏக்கர் அளவான நிலத்தில் குடியிருந்து வந்தவேளையிலே இப்பிரதேச செயலாளர் பிரிவில் சுற்றுலாத்துறை ஆரம்பமானது. இம்மக்களுக்கு LDO permitsஉம், 'ஜயபூமி' உறுதிகளும் வழங்கப்பட்டுள்ளன. இம்மக்களுக்கு குறைந்தபட்சமாக 6 பேர்ச்சஸ் நிலமும் கூடியபட்சமாக சுமார் 40 பேர்ச்சஸ் நிலமுமே வழங்கப்பட்டு இருக்கின்றது. அறுகம்பை, கொட்டுக்கல், lighthouse போன்ற இடங்களில் சுற்றுலாத்துறை நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. இப்பிரிவு மக்களுக்காக எல்லா அரசாங்கங்களும் deeds தருவதாகக் கூறி ஏமாற்றிவிட்டன. "AKD" அரசாங்கமாவது deeds வழங்குமென நம்பியிருக்கும் நிலையில், எல்லோரும் lease பெற வேண்டுமென அறிவித்திருப்பது சுற்றுலாத்துறையை மேற்கொள்பவர்களுக்கு துக்கத்தை ஏற்படுத்தியுள்ளது. மேலும், சுமார் 100 நாட்கள் மட்டுமே ஓராண்டில் தொழில்வாய்ப்பு உள்ளதையும் சுட்டிக்காட்ட விரும்புகின்றேன். சுமார் 6 பேர்ச்சஸ் முதல் 40 பேர்ச்சஸ் வரையுள்ள இந்த நிலங்களுக்கு lease பெற வேண்டுமென அரசு பணிப்பது எந்த வகையில் நியாயம்? இங்கு two-star homestays, guest houses என்பனவே இருக்கின்றன; பாரிய hotels இல்லை.

அரசுக்கு நிதி தேவையென்றால், இங்கு பாரியளவான hotelsஐ அமைத்து வருமானத்தைப் பெற்றுக்கொள்ள முடியும். எமது பிரிவுகளில் சுற்றுலாத்துறையை மேற்கொள்பவர்கள் மீனவர்களும் விவசாயிகளும் மட்டும்தான். Arugambay Bridge முதல் surf point வரைக்கும் geo bags இடப்படல் வேண்டும். Tourism செய்ய வேண்டுமெனில், அலை வேண்டும். அலை வர வேண்டும் என்றால், geo bags இடப்பட வேண்டும். நாட்டுக்கு டொலர் tourismமூலம் வர வேண்டும் என்றால், கரையோரத்தைப் பாதுகாக்க வேண்டும். கடற்கரையில் tourismக்காக beach-bed, umbrella போன்றவற்றை இட வேண்டாமென CCD தடுப்பது ஏன்?

Hotels நடாத்துபவர்கள் CCD, marine, பிரதேச சபை போன்றவற்றுக்குரிய எல்லா வகையான Government taxஐயும் செலுத்துகின்றார்கள். மேலும், முன்னைய சனாதிபதி அவர்களால் வழங்கப்பட்ட 'ஜயபூமி' உறுதிகளைத் தற்போதைய சனாதிபதி இரத்துச் செய்ய நடவடிக்கை எடுப்பது நியாயமா? எனக் கேட்கின்றேன். இந்தப் புதிய அரசானது deed வழங்கும் வேலைத்திட்டத்தில், பொத்துவில் பிரதேச செயலாளர் பிரிவு உட்பட சுற்றுலாத்துறை மேற்கொள்ளப்படும் எல்லாப் பிரதேசங்களையும் சேர்த்துக்கொள்ள நடவடிக்கை எடுக்க வேண்டும். "Arugambay Tourism Zone" என்ற name boardஆனது யாருடைய சிபாரிசில், எப்படி, யாரால், எந்த இடத்தில் அடையாளப்படுத்தப்பட்டது? என்பதை இந்தச் சபையில் கேட்க விரும்புகின்றேன். மிகவும் அவசரமாக அறுகம்பே பிரிவில் மீதமாகவுள்ள 1,800 மீற்றருக்கும் CCDஆனது Geo bagsஐ இட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். ஏற்கெனவே 200 மீற்றருக்கு Geo bags இடப்பட்டமைக்கு நன்றி கூறுகின்றேன். இந்தப் பிரிவில் சுற்றுலாத்துறை நடவடிக்கைகளை மேற்கொள்கின்ற M.H.A. Raheem, Dilzath, K. Bary, A. Mafeer ஆகியோருக்கு என்னுடைய நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அம்பாறை மாவட்டத்தின் அக்கரைப்பற்று பிராந்திய மத்திய அரசின் நீர்ப்பாசனப் பொறியியலாளரான S. Suhirthan அவர்களின் சேவைகளைப் பாராட்டவேண்டி இருக்கின்றது. இந்த உயரிய சபையில் அப்பிரிவு மக்கள் சார்பாக அவருக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். பொத்துவில் பிரதேச எல்லைக்குள் அபிவிருத்திப் பாதையில் தங்களை கடந்த காலங்களில் ஈடுபடுத்திய Meerasahibu Podiyar, Y. M. Musthafa, Azath Moulana, M.M. Hassan, M.S.M. Marzook, A.L. Rauff, M.H.A. Raheem, P. Partipen, M.S.M. Samzudeen, M.I. Cader Mohideen, A.B. Ismalebbai மற்றும் முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களான M.B.A. Azeez, M. Gunasegaram, M.C. Kanagaratnam, M. Jalaldeen, R. Pathmanathan, S.M.M. Muzaraff, M.I. Uthumalebbe, M. Abdul Majeed ( SSP) ஆகியோருக்கும் இந்தச் சபையில் நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அம்பாறை மாவட்டமானது விவசாயத்துறையில் நாட்டுக்கு அதிக பங்களிப்புச் செய்யும் ஒரு மாவட்டமாகும். குறிப்பாக, நெல் உற்பத்தியிலே பாரிய பங்களிப்பை வழங்கி வருகின்றது. இங்கு மழை காலங்களில் அறுவடை நடைபெறும்போது, விவசாயிகள் தமது ஈர நெல்லை விற்பனை செய்யும்போது பாரிய நட்டத்தை எதிர்நோக்குகின்றார்கள். இதனைத் தடுக்கும் முகமாக, அரசானது நெல்லை உலர்த்தக்கூடிய - dryers - இயந்திரங்களை பொத்துவில் உட்பட அதிகமாக விவசாயம் செய்கின்ற பிரதேச செயலகப் பிரிவுகளுக்கு வழங்குவதற்குரிய நடவடிக்கைகளை விரைவில் மேற்கொள்ள வேண்டும். இதனால் பூரணமான இலாபத்தை மாவட்ட விவசாயிகள் அடைவார்கள்.

மட்டக்களப்பு மாவட்ட அரசாங்க அதிபர் அவர்களால், 1956ஆம் ஆண்டு பொத்துவில் பிரதேச விவசாயிகளில் மத்திய தர வகுப்பு விவசாயிகள் 131 பேருக்கு தலா 5 ஏக்கர், 10 ஏக்கர், 20 ஏக்கர், 30 ஏக்கர் வீதம் 1,900 ஏக்கர் நிலமானது லகுகலை பிரதேச செயலகம் பிரிக்கப்படுவதற்கு முன்னர் அப்பிரிவில் வழங்கப்பட்டு விவசாயம் செய்யப்பட்டு வந்தது. 1990ஆம் ஆண்டு யுத்தம் காரணமாக அவற்றில் செய்கை பண்ணப்படவில்லை. எனினும், சமாதான காலங்களில் மீண்டும் செய்கை பண்ணப்பட்டு வந்தது. 2010ஆம் ஆண்டு இப்பகுதி வனசீவராசிகள் திணைக்களத்துக்குச் சொந்தமானதென வர்த்தமானி அறிவித்தல் களவாக வெளியிடப்பட்டது. பல போராட்டங்களின் பின்னர், கடந்த கால அரசானது இதில் 186.4 ஹெக்டெயாரை மட்டும் விடுவிக்க சிபாரிசு செய்தது. ஆனால், அது விடுவிக்கப்படுவதற்கு முன்னர் அரசாங்கம் மாறிவிட்டது. எனவே, இந்த அரசானது பொத்துவில் பிரதேச விவசாயிகளது லகுகலை பிரதேச செயலாளர் பிரிவிலுள்ள 1,900 ஏக்கர் உரிமை காணிகளில், விடுவிக்க இணக்கம் தெரிவிக்கப்பட்ட 186.4 ஹெக்டெயார் விவசாயம் செய்த காணிகளை வனசீவராசிகள் திணைக்களத்திடமிருந்து விரைவாக விடுவிக்க நடவடிக்கை எடுக்க வேண்டுமென இந்த உயரிய சபையில் கேட்டுக் கொள்கின்றேன்.

2009ஆம் ஆண்டு காலப்பகுதியில் பல்வேறு சிரமங்களுக்கு மத்தியில் தொண்டர் ஆசிரியர்களாகக் கடமைபுரிந்தும், ஆசிரியர் சேவைக்குள் உள்வாங்கப்படாதவர்கள் வடக்கில் 60 பேரும் கிழக்கில் 193 பேரும் இருக்கின்றார்கள். அரசானது இவர்களது விடயத்தை மீள்பரிசீலனை செய்து, ஆசிரியர் நியமனத்தை வழங்க ஆவன புரிய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

காரைதீவு, பதியத்தலாவ போன்ற அரச கால்நடை வைத்திய அலுவலகங்களுக்கு வாகனங்களை வழங்க அரசு நடவடிக்கை எடுக்க வேண்டும். இதன்மூலம் பூரணமான அரச சேவையை வழங்க முடியும். மேலும், பொத்துவில், சாய்ந்தமருது பிரதேச செயலாளர் பிரிவுகளில் மீனவர்களுக்காக Ice Factory அமைத்துக் கொடுப்பதற்கு அரசு நடவடிக்கை எடுக்க வேண்டும். இப்பகுதியில் 500 பெரிய படகுகள் உள்ள நிலையில், 9,000 - 11,000 மெற்றிக்தொன் மீன் உற்பத்தியும் செய்யப்படுகின்றது. மேலும், இம்மீனவர்களுக்காக எரிபொருள் நிரப்பு நிலையத்தையும் அமைத்துக் கொடுக்க அரசு நடவடிக்கை எடுக்க வேண்டும்.

நிந்தவூரில் மூடப்பட்டுள்ளதாகக் கூறப்படும் 'ஒசுசல' மீண்டும் திறக்கப்பட்டு, அப்பகுதி மக்களுக்குத் தொடர்ந்து சேவை வழங்கும் இடமாக அது மாற்றப்பட வேண்டுமென மிகவும் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன். மேலும், அரசானது pharmacistsஐ நியமனம் செய்யவும் அவர்களுக்கான பயிற்சிகளை வழங்கவும் நடவடிக்கை எடுக்க வேண்டும். இப்பகுதியிலுள்ள Addappallam Bridge உடைக்கப்பட்டு ஒன்றரை வருடங்களாகியும் இன்னும் மீள நிர்மாணிக்கப்படவில்லை. மிக விரைவாக இதனை நிர்மாணித்து, A4 வீதியை சிறப்பாக பாவிப்பதற்கு ஆவன புரிய வேண்டும். மேலும், நிந்தவூர் வைத்தியசாலையில் 2 VOG specialists இருக்கும் நிலையில், ஒரு Blood Bank இல்லாமல் இருப்பது விநோதமாக உள்ளது. எனவே, விரைவில் அங்கு Blood Bank ஏற்படுத்தப்பட வேண்டும். அங்கு தொடரான வைத்திய சேவைக்காக paediatricians, anesthetists போன்றோரையும் நியமனம் செய்ய அரசானது நடவடிக்கை எடுக்க வேண்டும்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට තව පොඩි වෙලාවක් දෙන්න.

அடுத்து, நிந்தவூர் paddy storeஐப் புனரமைப்புச் செய்வதன்மூலம் 1,200 மெற்றிக்தொன் நெல்லைக் கொள்வனவு செய்ய முடியும். இதனைத் திருத்தம் செய்ய 9 மில்லியன் ரூபாய் தேவையாகவுள்ளது. எனவே, அரசாங்கம் இந்த நிதியை ஒதுக்கி, இந்த paddy storeஐ மீள இயக்க வைத்து, விவசாயிகளது நெல்லைக் கொள்வனவு செய்ய ஆவன புரிய வேண்டும். மேலும், இங்குள்ள பிரதேச சபைக்கு dozer, gully bowser உட்பட SWM விடயங்களை மேற்கொள்ளும் இயந்திரங்களும் வழங்கப்பட வேண்டும். அத்துடன், நிரந்தரமாக ஒரு Zonal Education Officerஐ நியமிக்க மாகாணக் கல்வித் திணைக்களம் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිලූෂා ලක්මාලි ගමගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.23]

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මාර්තු 08වැනි දිනට යෙදී තිබෙන ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් පාර්ලිමේන්තු කාන්තා සංසදය මඟින් ඉදිරිපත් කරන ලද සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ලැබීම මම භාග්‍යයක් කොට සලකනවා.

ජාතික ආර්ථිකයට කාන්තා ශ්‍රම දායකත්වය අගයමින් වැටුප් රහිත සුරැකුම් ශ්‍රමය ජාතික ආර්ථිකයට එක් කිරීම සඳහා "ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක්" සකස් කිරීම කියන කාරණය තමයි මේ යෝජනාවෙන් ඉදිරිපත් කර තිබෙන්නේ. මෙය, කාන්තාවන් විධියට අප අගය කළ යුතු යෝජනාවක්.

කාන්තාවන් විධියට අපි අපේ ජීවිත කාලය තුළ එක එක භූමිකාවලට පණ පොවනවා. විශේෂයෙන්ම දියණියක් විධියට, බිරිඳක් විධියට, ලේලියක් විධියට, මවක් විධියට. මේ ආදි වශයෙන් අපට කාන්තාවන් විධියට ජීවිතයේ විවිධ භූමිකාවලට පණ පොවන්න සිද්ධ වෙනවා. මේ සියලු භූමිකාවලට පැවරෙන ඒ ඒ කාර්යයන් තිබෙනවා. ඒ සියලු කාර්යයන් අතරේ කාන්තාවන් විධියට අපි විවිධ ක්ෂේත්‍ර හරහා ජාතික ආර්ථිකයට අපේ ශ්‍රම දායකත්වය සපයනවා. අපි මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කඳුකරයේ සිටින තේ දලු නෙළන අපේ සහෝදරියන්, විදේශ ප්‍රේෂණ විධියට අපට ඩොලර් සපයන විදේශගත ශ්‍රමික සහෝදරියන් සහ ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවිකාවන් වන අපේ සහෝදරියන්. ඒ සියලුදෙනා අපි මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරනවා.

ජාතික ආර්ථිකයට ශ්‍රම දායකත්වය සපයන්නියන් අතර ඇඟලුම් සේවිකාවන් විශේෂ ප්‍රමුඛතාවක් ගන්නවා. බොහෝ විදේශ රටවල වාගේම අපේ රටේත් අප අඳින ඇඳුම් පැළඳුම්වල තිබෙන්නේ ඔවුන්ගේ වෙහෙස, මහන්සිය, ධෛර්යය සහ කැපවීමයි. අප අඳින ඇඳුම් තුළින් පිළිබිඹු වන්නේ ඔවුන්ගේ ඒ කැපවීමයි. ඒ කැප කිරීම කරන කාන්තාවට අපෙන් ලැබිය යුතු ගෞරවය සහ ආරක්ෂාව ඇත්තටම ලැබෙනවාද කියන එක ගැන නැවතත් හිතා බලන්න කාලය ඇවිල්ලා තිබෙනවා. වර්තමානයේ වෙළෙඳ කලාපවල බොහෝ විට සේවය කරන්නේ ගම්වලින් පැමිණි තරුණියන් සහ කාන්තාවන්. ඒ අයට කුඩා භූමියක, කුඩා කාමරයක තමයි නවාතැන් පහසුකම් ගන්න සිද්ධ වෙන්නේ. ඒ කුඩා කාමරය තුළත් බොහෝ පිරිසකට එකට එක්ව ජීවත් වෙන්න තමයි සිදු වෙලා තිබෙන්නේ. පානීය ජල පහසුකම් සම්බන්ධයෙන්, සනීපාරක්ෂාව සම්බන්ධයෙන් වාගේම පෞද්ගලිකත්වය අහිමි වීම සම්බන්ධයෙන් වන ප්‍රශ්නවලට ඒ කුඩා කාමරය තුළදී ඒ කාන්තාවන්ට මුහුණ පාන්න සිද්ධ වෙනවා. ඒ වාගේ ගැටලු තිබියදී තමයි කාන්තාවන් තම ශ්‍රමය සපයන්නේ.

ඒ වාගේම ලෝක වෙළෙඳ පොළේ ඇණවුම් අඩුවීම, කර්මාන්තශාලාවල නිෂ්පාදන කෝටාව අඩුවීම නිසාත් මෙම සේවිකාවන්ට විශාල ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒවා අතරින් වැඩ පැය කප්පාදු කිරීම, අතිකාල නවතා දැමීම, රැකියා අහිමි වීම වාගේ දේවලුත් සිද්ධ වෙන්න පුළුවන්. මෙන්න මේ හින්දා අපේ වෙළෙඳ කලාපවල සහෝදරියන්ට දැඩි මානසික ආතතිය, අනාගතය පිළිබඳ අස්ථාවරභාවය, පවුල පෝෂණය කිරීමට අපහසු වීම වාගේ විශාල ගැටලු ප්‍රමාණයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ඇත්තටම ඒ කාන්තාවන් මේ

සියල්ල දරාගෙන තමයි අපේ ජාතික ආර්ථිකයට ශ්‍රම දායකත්වය සපයන්නේ. ඒ නිසා ඔවුන්ට ලැබිය යුතු ගෞරවය, ආරක්ෂාව සහ සාධාරණය ඉෂ්ට කරන්න නම් සමාජයක් විධියට අපි අපේ ආකල්ප ද වෙනස් කර ගත යුතුයි. මොකද, බොහෝ වෙලාවට සමාජය ඔවුන් දිහා බලන්නේම, "කලාපයේ ළමයින්" කියන වෙනමම ආකල්පයකින්. ඇත්තටම අප බලන ඒ ආකල්පයත් වෙනස් කළ යුතුයි.

අප කියන්න ඕනෑ, ඒකාකාරී ජීවිතයක් ගෙවන ඔවුන්ට රජය විධියට අපි දැන් සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති සංස්කෘතික මධ්‍යස්ථාන හරහා විශාල මෙහෙවරක් කරමින් තිබෙන බව. ඒ හරහා අපේ පැරණි සංස්කෘතික අංග, ඒ වාගේම මනස පිනවන්න අවශ්‍ය දේවල් සියල්ල දැන් කරළියට ගෙන එමින් පවතිනවා. ඒක අපේ කාන්තාවන්ටත් විශාල සහයෝගයක් වනවා. ඒ වාගේම, පුස්තකාල සඳහා ලබා දෙන සේවා අතිවිශිෂ්ට අන්දමින් ඉහළ නංවා, ඔවුන්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමේ හැකියාව ද ලබා දීලා තිබෙනවා. එමඟිනුත් ඔවුන්ගේ ඒකාකාරී ජීවිතය වෙනස් කර ගැනීමට හැකියාව ලැබිලා තිබෙනවා.

අපි මේ වෙලාවේ කියන්න ඕනෑ, අපේ කාන්තාවන් විවිධ අංශ හරහා සේවය සපයන බව. එතැනදී රාජ්‍ය මට්ටමින්, දේශපාලන අංශයෙන්, පරිපාලන අංශයෙන් යනාදි වශයෙන් හැම අංශයකින්ම අපේ කාන්තාවෝ තමන්ගේ දක්ෂතා ඉදිරිපත් කරමින් නායකත්වය දරනවා. අපේ ගරු අග්‍රාමාත්‍යතුමිය ප්‍රමුඛ අපේ ගරු කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය, අපේ ගරු ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය, අපේ ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය වන ඔබතුමිය ඇතුළු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියන් විසිදෙනෙකු ද, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරියන් දෙදෙනෙකු ද ඇතුළුව කාන්තාවෝ විසිදෙදෙනෙක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් නිවැරදි ආකාරයෙන් කටයුතු කරමින් ඉන්නවා.

මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, විශේෂයෙන් අපේ සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමිය, ප්‍රධාන ලේකම්තුමිය සහ නියෝජ්‍ය පොලිස්පතිතුමිය ඇතුළු පිරිස අපේ කාන්තාවන් වෙනුවෙන් විශාල කාර්ය භාරයක් සිදු කරන බව. ඒ වාගේම මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, දිස්ත්‍රික්කයක් විධියට ගත්තාම රත්නපුර දිස්ත්‍රික්කයේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් රුපියල් ලක්ෂ 5ක මුදලක් කාන්තාවන් සවිබල ගැන්වීම පිණිස වෙන් කර තිබෙන බව. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ කාන්තාවන්ට දීර්ඝ කාලයක් තිස්සේ තමන්ගේ පවුලට ඉඩමක් නොමැති වීම පිළිබඳව තිබුණු වියවුල අවසන් කරන්න, තමන් පදිංචි බිම් ප්‍රමාණය සඳහා ඉඩම් ඔප්පු ලබා දීම වෙනුවෙන් ඔප්පු සකස් කරමින් පවතිනවා. මා හිතන්නේ, කාන්තාවන්ගේ ඉදිරි ජීවිතය සාර්ථක කර ගන්න ඒකත් විශාල පිටු බලයක් වනවා. ඒ කාන්තාවන්ට දීර්ඝ කාලයක් තිස්සේ පැවැති ගැටලුවලට ඒකත් විසඳුමක් වෙනවා. ඒ වාගේම තමයි, රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් රුපියල් මිලියන 519ක් වැය කරලා, නිවාස 519ක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒකත් කාන්තාවන්ට විශාල ශක්තියක් වෙනවා. මොකද, ඒ හැමදෙනාටම තමන්ගේම තැනක ලස්සන ජීවිතයක් ගත කරන්න අවස්ථාව තිබිය යුතුයි, ආරක්ෂාව සහ රැකවරණය තිබිය යුතුයි. ඒ සඳහා මේකත් ලොකු පිටු බලයක් වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ලබා දුන් කාලය අවසන්.

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)
මම තවත් විනාඩියක කාලයක් ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

පළමුවැනි වතාවට අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් කාන්තා අනුකම්පු සම්බන්ධීකරණ සභාපතිවරියන් විසින්, තමන්ගේ දිස්ත්‍රික්කයේ ඉන්න කාන්තාවන්ගේ ආරක්ෂාව, ජීවනෝපාය මාර්ග වෙනුවෙන් විධිමත්ව සංවිධානය කරන, විධිමත් වැඩ පිළිවෙළක් දැන් ක්‍රියාත්මක වනවා. ඒකත් අපේ ගම්වල ජීවත් වන කාන්තාවන්ට විශාල ශක්තියක් වෙනවා, තමන් සවිබල ගන්වා ගැනීමට වාගේම තමන්ගේ පවුලේ ආරක්ෂාව හා සංවර්ධනය සඳහා.

අවසාන වශයෙන් මම ප්‍රාර්ථනා කරනවා, කාන්තාවන් විධියට අපට ගහක එතෙන වැලක් විධියට නොව, හයිය අරටුව සහිත ගහක් විධියට නැඟී සිටින්න ශක්තිය හා ධෛර්යය ලැබේවා කියලා. එසේ ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂ නායක, ගරු ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON.CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 2.31]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාත්‍යන්තර කාන්තා දිනයත් සමඟ, කාන්තාව වෙනුවෙන් සුරැකුම් ආර්ථිකය, ජාතික සුරැකුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුයි කියන යෝජනාව වැදගත් යැයි අපිත් විශ්වාස කරනවා. ඒක වටිනා අදහසක්. අපි ඒ අදහස ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගන්නවා.

හැබැයි, ගැටලුවක් ලෙස තිබෙන කාරණාව තමයි රජය ප්‍රකාශ කරන දේ ක්‍රියාත්මක කරනවාද කියන කාරණාව. ජාතික කාන්තා කොමිසම ස්ථාපනය කරලා ඒකට ආචාර්ය රමණී ජයසුන්දර මැතිනිය සභාපති හැටියට පත් කිරීම මේ මොහොතේ බරපතළ අර්බුදයක් තිබෙනවා, ජාතික කාන්තා කොමිසම ස්ථාපනය කරන්නට බැරුව. කාන්තා කොමිසමක් ස්ථාපනය කරන්නේ කාන්තා අයිතිය සුරක්ෂිතව කරන්නට. කාන්තාවන්ට සිදුවෙන අඩන්තේට්ටම්, අභියෝග, ගැටලු ඒ සියල්ලට කාන්තා කොමිසම හරහා නිරවුල් විසඳුමක් ලබා දෙන්නටයි ඒ ආයතනය පිහිටුවලා තිබෙන්නේ. හැබැයි රජය උත්සාහ කළා, කාන්තා කොමිසම කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ රුකඩයක් බවට පත් කරන්නට. ඒ ආකාරයට නම් සුරක්ෂිත වූ කාන්තාවක් නිර්මාණය වෙන්නේ නැහැයි කියන එක අපි පිළිගන්නට ඕනෑ.

මොහොතකට හිතන්න. බඩු මිල වැඩි වෙනකොට කාන්තාව සුරක්ෂිත වෙනවාද, කාන්තාව සුරැකෙනවාද? තෙල් මිල, ගෑස් මිල වැඩි වෙනකොට, ඒවා ගන්න පෝලිම්වල ඉන්න වෙනකොට කාන්තාවගේ සුරක්ෂිතභාවය ශක්තිමත් වෙනවාද? කාන්තාව රකින්න ඕනෑය කිය කියා විදුලි බිල වැඩි කරන්න කියනකොට කාන්තාව රැකෙනවාද?

අද පොඩ්ඩක් මේ ගැනත් හිතලා බලන්න. ශ්‍රම බලකායේ සහභාගිත්වය ගත්තොත්, කාන්තා සහභාගිත්වය සියයට 32යි. පුරුෂ පාර්ශ්වයේ සහභාගිත්වය සියයට 70කට ආසන්න ප්‍රමාණයක් වෙනවා. අද එතැනින්ම කාන්තාව කොන් වෙලා තිබෙනවා. උසස් පෙළ සමත් කාන්තාවන්ගේ විරැකියා ප්‍රතිශතය 8.2යි. පුරුෂ පාර්ශ්වයේ සියයට 4.2යි. යෞවනියන්ගේ විරැකියා ප්‍රතිශතය 27.3යි. සුරැකුම් ආර්ථිකය ගැන කථා කරනවා වාගේම, ඒ ගැන ලස්සන කථා කියවනවා වාගේම, ඒ කථා ක්‍රියාවට නංවලා පැහැදිලි, ගුණාත්මක, හරාත්මක, ධනාත්මක වටිනාකමක් කාන්තාවට එකතු කරන්නට ප්‍රායෝගික වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියන එක මම කියන්න කැමතියි.

අද අපි කථා කරනවා, කාන්තාව සුරක්ෂා කිරීම ගැන. නමුත් ඊයේ මොකක්ද කළේ? ගම්වල, නගරවල, කුඩා ගම්වල, කුඩා නගරවල ප්‍රජා මූල සංවිධාන ගොඩ නඟලා, ස්වේච්ඡා සංවිධාන ගොඩ නඟලා, විවිධ සමිති ගොඩ නඟලා කාන්තාව මුල් වෙලා ඒ ගමේ පහේ කණ්ඩායම්, දහයේ කණ්ඩායම්, විස්සේ කණ්ඩායම් නිර්මාණය කරලා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා දෙනවා. ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩ පිළිවෙළ ගෙනාවේ දුප්පත්කම තුරන් කරන්න මිස, බිස්නස් එකක් විධියට ක්‍රියාත්මක කරන්න නොවෙයි. නමුත් ඊයේ මොකක්ද කළේ? ඊයේ සිට නියාමන ක්‍රමයක් නිර්මාණය කරලා අර කාන්තා මූලික, කාන්තා කේන්ද්‍රීය ගමේ නගරයේ ක්‍රියාත්මක වෙන ස්වේච්ඡා සංවිධාන නියාමනය කරන්න හදනවා, ක්ෂුද්‍ර මූල්‍ය ණය දීම බිස්නස් එකක් කරගත්ත මහා පරිමාණ ව්‍යාපාර, බැංකු, මූල්‍ය ආයතන ඒ නියාමනයෙන් ඉවත් කරලා. ඉතින්, අද කාන්තා අයිතිය ගැන කථා කරනවා, ඊයේ කාන්තාවට තිබුණු අයිතියක් ඉවත් කරලා.

ඒ වාගේම අද ගම් නගරවල කාන්තාවන් ගිනි පොලී ණය මුදලාලිලාගේ වින්දිතයන් බවට පත් වෙලා තිබෙනවා, විශේෂයෙන්ම උද්ගත වී තිබෙන ආර්ථික ප්‍රශ්නය තුළ. කොල්ලකාරී මූල්‍යමය සූරා කෑමට අද කාන්තාව ලක් වෙලා. ඒකට ඉංග්‍රීසියෙන් කියනවා, predatory financial exploitation කියලා. Online හරහා ණය ක්‍රම ආරම්භ කරලා online ණය මාෆියාව තුළ අද කාන්තාවන් වින්දිතයන් බවට පත් වෙලා තිබෙනවා.

කාන්තාවන් ගැන කථා කරනකොට, මවුවරුන් ගැන කථා කරනකොට, අද මාතෘ මන්දපෝෂණය ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මාතෘ මන්දපෝෂණය ගණනය කරන්නට ශරීර ස්කන්ධ දර්ශකය - Body Mass Index - උපයෝගී කර ගන්නවා. ශරීර ස්කන්ධ දර්ශකය නියමිත තත්ත්වයට නොමැති කාන්තාව, ඒ මව සුරක්ෂා කරන්නට ජාතික වැඩසටහනක අවශ්‍යතාව තිබෙනවා.

මව ගැන කථා කරනකොට, කාන්තාව ගැන කථා කරනකොට අපට ළමුන්, ළදරුවන්, -දරුවන්- අමතක කරන්නට බැහැ. අද කාන්තාව, මව, දරුවන් අපි හඳුන්වන්නේ සමාජයේ දැඩි අවදානමට ලක් වුණු කොට්ඨාස - highly vulnerable stakeholders in the society - හැටියට. බඩු මිල වැඩිවීම තුළ, දුප්පත්කම වැඩිවීම තුළ මේ අය දැඩි අවදානමකට ලක් වෙලා තිබෙනවා. වසර කිහිපයක් තුළ මේ සමාජය ඛේදවාචක 4කට මුහුණ දීලා තිබෙනවා. පාස්කු ඉරිදා ප්‍රහාරය, කොරෝනා - කොවිඩ්- වසංගතය, රට බංකොලොත් වීම, "දිට්වා" සුළි කුණාටුව වැනි තත්ත්ව මත බරපතළ දුප්පත්කමක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ දුප්පත්කම තුළ අද මන්දපෝෂණය බරපතළ තත්ත්වයක් බවට පත් වෙලා තිබෙනවා. නීරක්තිය -රක්ත හීනතාව- අඩු බර දරු උපත්, ක්ෂය වීම, කුරු වීම -මිටි වීම- කියන දේවල් මන්දපෝෂණය මනින දර්ශක. ළමා මන්දපෝෂණය - paediatric malnutrition, මාතෘ මන්දපෝෂණය - maternal malnutrition - අද බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

බලන්න, අද ඉදිරිපත් කර තිබෙන යෝජනාව තුළ සුරැකුම් ආර්ථිකය ගැන කථා කර තිබෙනවා. සුරැකුම් ආර්ථිකය ගැන කථා කරන ගමන්, මම විශේෂයෙන්ම මේ රාජ්‍ය පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරියන්ට සහ ඇමතිවරියන්ට පෙන්වා දෙන්න කැමැතියි, අද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියන්නේ මොකක්ද කියන කාරණය. ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා, එක පුද්ගලයෙකුට මාසයක් ජීවත් වෙන්න ආහාර සහ ආහාර නොවන වියදම් සඳහා රුපියල් 16,730ක් ඇතිලු. ඇත්තටම හිතලා බලන්න, එක පුද්ගලයෙකුට දින 30ක් තුළ රුපියල් 16,730කින් තමන්ගේ ආහාර සහ ආහාර නොවන වියදම් පිරිමහගන්න පුළුවන්ද කියලා. ඇත්තටම බැහැ. ජනාධිපතිවරයාත් මේ සභාවේ හිටපු අවස්ථාවකත් මම මේ කාරණාව කිව්වා. වැරදි දත්ත මත නිර්මාණය වන ප්‍රතිපත්ති අසාර්ථක ප්‍රතිපත්ති බවට පත් වෙනවා. කාන්තා මූලික ගෘහ ඒකක - women-headed households - අද විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ කාන්තාව සවිමත් කරන්නට, සවිබලගන්වන්නට පැහැදිලි වැඩ පිළිවෙළක් නැහැ.

ඒ වාගේම අපි හැමෝම පිළිගන්නවා, smart රටක් බිහි කරන්නට ඕනෑ බව. ඒ වාගේම smart අධ්‍යාපනය ක්‍රියාත්මක කරන්නට ඕනෑ. හැබැයි, online ක්‍රම, ඩිජිටල් ක්‍රම හරහා ඇත්ත වශයෙන්ම කාන්තාව ඇතුළු දරු පරපුර බරපතළ අවදානමකට ලක් වෙනවා. ඒ වෙනුවෙන් ගත යුතු පියවර අපි ගන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ළමයින් - minors - විවාහ කර දීමත් අද සමාජයේ ක්‍රියාත්මක වෙන වැඩක්. එය වළක්වා ගැනීම සඳහා ගෙනෙන්නට තිබෙන දැඩි නීති රීති අපි ගෙනෙන්නට ඕනෑ. කාන්තාව ගැන කථා කරනකොට සඳහන් කරන්න ඕනෑ, කාන්තාවට ගෘහයේත් හිංසනය, මහ පාරේත් හිංසනය, ප්‍රවාහනයේදීත් හිංසනය, වැඩ බිමේත් හිංසනය සිදු වන බව. මම කියන්නේ නැහැ, හැමෝටම කියලා. නමුත් කාන්තාවන් වැඩි ප්‍රමාණයක් මේ අඩන්තේට්ටම්වලට, මේ අභියෝගවලට, මේ ප්‍රශ්න වලට මුහුණ දෙනවා.

සුරැකුම් ආර්ථිකය අපි පිළිගන්නවා. ජාතික සුරැකුම් ප්‍රතිපත්තිය අපි පිළිගන්නවා. හැබැයි, අද අපේ රටේ නිර්මාණය වෙලා තිබෙන මේ අභියෝග තුළ, බරපතළ ආර්ථික හානිය තුළ කවදාවත් කාන්තාව වෙනුවෙන් සුරැකුම් ආර්ථිකයක්, ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් නිර්මාණය කරන්න බැහැ. අද විදුලි බිල වැඩි කරලා, ගෑස් මිල වැඩි කරලා, තෙල් මිල වැඩි කරලා. බාල ගල් අඟුරු ගෙනැල්ලා. ඒ නිසා විදුලි බිල වැඩි කරන්න සිදුවීම තුළ කාන්තාවත් අසහනයට පත් වෙනවා. දරු පරපුරත් - ළමා පරපුරත් - අසහනයට පත් වෙනවා. පුරුෂ පක්ෂය ඇතුළු මුළු ජන සමාජයම අසහනයට පත් වෙනවා.

ඒ නිසා අද විවාදය තුළ නිර්මාණය වෙන මේ ධනාත්මක, ප්‍රගතිශීලී අදහස් ක්‍රියාවට නංවන ජාතික වැඩ පිළිවෙළකට යොමුවන්න කියලා අවසාන වශයෙන් අපි ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කෞෂල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.42]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

2026 ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් ජාතික ආර්ථිකයට පිදෙන කාන්තා ශ්‍රම දායකත්වය අගයමින්, වැටුප් රහිත සුරැකුම් ශ්‍රමය ජාතික ආර්ථිකයට එක් කිරීම සඳහා, "ජාතික සුරැකුම් ප්‍රතිපත්තියක් සකස් කිරීම" කියන යෝජනාව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ලෙස අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ කියන්නේ, National Care Policy එකක් හඳුන්වා දීම සඳහා වන යෝජනාවක්. මේක වාමාංශික ව්‍යාපාරයක් ලෙස අපි ඉතා වැදගත් කොට සලකපු දෙයක් කියායි මා හිතන්නේ. අපේ මැතිවරණ ප්‍රතිපත්තියේදීත්, අපේ මැතිවරණ ව්‍යාපාරයේදීත්, අපේ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදීත් අපි මේ unpaid care work කියන එක national economy එකේ calculation එකට ගන්නේ කොහොමද කියන කාරණය සැහෙන්න කථා කරපු කාරණයක්. ඒ පොරොන්දුව ඉෂ්ට කරමින් ඒ සඳහා ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කරලා, ඒ හරහා වැඩ පිළිවෙළක් සකස් කිරීමේ දීර්ඝ කාලීන වැඩේ තමයි අපි මේ ආරම්භ කරන්නේ. නමුත් මේ වන විටත් අපේ සියලු ආර්ථික කටයුතුවලදී, අපේ රාජ්‍ය පාලනයේදී - governanceවලදී - අපි කාන්තාවගේ දායකත්වය සහ සුරැකුම් ශ්‍රමය කියන කාරණය අමතක කරලා නැහැ කියන එක ඒ අතරේම කියන්න ඕනෑ. අපි ඒක දැනටත් සැලකිල්ලට ගන්නවා. අපි බලයට ඇවිල්ලා කරපු මුල්ම අය වැය විවාදයේදී ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කරපු කථාවේ unpaid care work recognition කියන කාරණය සඳහන් කළා කියලා මට අද වාගේ මතකයි. කොහොම වුණත් unpaid care work කියන කාරණය ගත්තාම, ඒ සමඟ අපේ production සහ reproduction කියන දෙකම තිබෙනවා. Care work responsibility ගැන කථා කරද්දි අපේ නිෂ්පාදනය - production - සහ ඒ නිෂ්පාදනයට දායක වන සමාජ ප්‍රතිනිෂ්පාදනය - reproduction - කියන කාරණයත් අපි අමතක නොකළ යුතුයි.

අපේ ස්ත්‍රීවාදී දැක්ම ගත්තොත්, "අපට නිෂ්පාදනය පෙනෙන්නේ හරියට iceberg එකේ tip එක වාගේ. මේක තිබෙන්නේ උඩ. හැබැයි ඊට යටින් තිබෙන වැටුප් නොලබන අතිමහත්, දැවැන්ත සුරැකුම් ශ්‍රමයේ කොටස අපට පෙනෙන්නේ නැහැ" කියලා මාරියා මීස් කියනවා. ලෝක කම්කරු සංවිධානය 3R - recognize, reduce and redistribute - concept එක හඳුන්වා දී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒවා ගැන සඳහන් කළේ මේ ගැන කිසියම් ආකාරයක න්‍යායික පැහැදිලි කිරීමක් කරන්න. නමුත් විශේෂයෙන්ම ජනමාධ්‍ය නියෝජ්‍ය ඇමතිවරිය ලෙස මට වැදගත් වන මාතෘකාව වන "මාධ්‍ය සහ කාන්තාව" කියන එක ගැන කථා කරන්න මම අද බලාපොරොත්තු වෙනවා.
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍ය සහ කාන්තාව කියන කාරණය ගත්තාම, ඒ තුළ ප්‍රධාන අංශ දෙකක් තිබෙනවා. පළමුවැනිම අංශය තමයි, මාධ්‍ය ඇතුළේ කාන්තාව නියෝජනය වෙන්නේ කොහොමද, එහෙම නැත්නම් මාධ්‍ය කාන්තාව හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කියන කාරණය ආමන්ත්‍රණය කරන්නේ කොහොමද කියන එක. විශේෂයෙන් අපි දැකපු කාරණයක් තමයි, කාන්තාව කියන චරිතය එක්කෝ වෙළෙඳ භාණ්ඩයක් ලෙස නියෝජනය කිරීම, එහෙම නැත්නම් වින්දිත කාන්තාවක් ලෙස නියෝජනය කිරීම. මෙන්න මේකෙන් එළියට ඇවිල්ලා කාන්තාවගේ passive role එක නැතුව සක්‍රිය දායකත්වයක් - active role එකක් - දක්වා කාන්තාව කියන චරිතය මාධ්‍යවල නියෝජනය කරන්නේ කොහොමද කියන එක අභියෝගාත්මකයි කියා මා හිතනවා. ඒ වාගේම, ආචාර ධර්මවලට අනුව කාන්තාව ගැන වාර්තා කරන්නේ, කාන්තා භූමිකාව පෙන්වා දෙන්නේ කොහොමද කියන එකත්, ඒ වාගේම මාධ්‍යවල ඉන්න කාන්තාවන් සහ පොදුවේ අනෙකුත් කාන්තාවන් පිළිබඳව, විශේෂයෙන් සමාජ මාධ්‍ය ඇතුළු අනෙකුත් මාධ්‍යවල ක්‍රියාත්මක වෙන හිංසනය ගැනත් අමතක කරන්න බැහැ කියායි මා හිතන්නේ.

මේ අවස්ථාවේ මේ ගැන කියන්න මට කනගාටුයි. මම නම් වශයෙන් නොකිව්වත්, මාධ්‍යවල ඉන්න කැපී පෙනෙන දක්ෂතා පෙන්වන කාන්තාවන්ට සමාජ මාධ්‍යවලින් අතිශය අමානුෂික ලෙස හිංසාකාරී ලෙස අසභ්‍ය ප්‍රකාශ කරනවා. විශේෂයෙන් පසුගිය කාලයේ එවැනි දේවල් අපි දැකලා තිබෙනවා. මා හිතන හැටියට මේක මාධ්‍යවේදියෙකුට හෝ මාධ්‍යවේදිනියකට විතරක් සීමා වෙච්ච දෙයක් නොවෙයි. කාන්තාවන්ට ගෞරව කරන්න ඕනෑ කියලා අද උදේ ඉඳන් මේ පාර්ලිමේන්තු සභා ගර්භයේදී කිව්වා. නමුත් කනගාටුවට කාරණයක් තිබෙනවා. මෙතැනට ඇවිල්ලා උදේ ඉඳන් අසභ්‍ය වචන පාවිච්චි කරලා කාන්තාවගේ ගෞරවය සහ පාර්ලිමේන්තුවේ ගෞරවය කෙලෙසන මන්ත්‍රීවරු කිහිපදෙනෙක් විපක්ෂයේ ඉන්නවා. හැමෝම නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැනත් මේ වෙලාවේ මතක් නොකර බැහැ.

[ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය]

දෙවැනි කාරණය තමයි, මාධ්‍යවේදිනියන්ට මාධ්‍ය ක්ෂේත්‍රයේ - industry එකේ - කොයි තරම් දුරකට යන්න පුළුවන්ද කියන එක. ඒ කාරණය අපට මේ වෙලාවේ අමතක කරන්න බැහැ. අපි දකිනවා ක්ෂේත්‍රයේ - field එකේ - ජනමාධ්‍යවේදිනියෝ ඕනෑ තරම් ඉන්නවා; ලියනවා. නමුත් මාධ්‍ය ආයතන ගත්තොත්, ඒවායේ ප්‍රධාන මට්ටමේ කාන්තාවන් කොච්චර ඉන්නවාද කියන එක ප්‍රශ්නයක්. අපි දන්නවා, #MeToo Movement වැනි ව්‍යාපාරයක් ඇති වුණේම newsroom එක ඇතුළේ, මාධ්‍ය ආයතන ඇතුළේ සිදු වුණු යම් හිංසන ගැන කථා කරන්න පටන් ගත්ත නිසා කියලා. ඒවා ලංකාවේත් විවිධ තැන්වල විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක වනවා. ඉතින්, ඒ ගැන කනගාටුයි. නමුත්, ඒ වෙනුවෙන් ආණ්ඩුව හැටියට අපි මොකක්ද කරන්නේ කියලා ඇහුවොත්, මම ඒ සම්බන්ධ කාරණා දෙකක් සඳහන් කරන්න ඕනෑ.

එකක් තමයි, ස්වාධීන මාධ්‍ය කොමිසමක් ඇති කිරීම. අපි දැන් ඒ ගැන සාකච්ඡා පවත්වාගෙන යනවා. ඒක එක පැත්තකින් මම කලින් කියපු කාරණයට සම්බන්ධ වන ආයතනයක්. ඒ මොකක්ද? ඒක මාධ්‍ය ඇතුළේ වාර්තාකරණය ගැන, මාධ්‍ය දිහා බලාගෙන ඉන්න ස්වාධීන ආයතනයක්. නමුත් දෙවැනි කාරණය ගත්තොත්, ඒකට ගොඩක් අදාළ වෙන්නේ විද්වත් මාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීමයි. අපි ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය, ඒ කියන්නේ, Chartered Institute of Media Professionals පිහිටුවීමට මේ වනකොට කෙටුම්පත් සකස් කරලා අවසානයි. ඒකට අදාළ අමාත්‍ය මණ්ඩල සන්දේශය අනුමැතිය සඳහා අපි ඉතා ඉක්මණින් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා. ඒ සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය මේ දිනවල වැඩකටයුතු කරමින් සිටිනවා. එමගින් අපට මාධ්‍ය ක්ෂේත්‍රයේ පැහැදිලි වෙනසක් බලාපොරොත්තු වන්න පුළුවන්. ඒ තුළින් මාධ්‍යවේදීන්ගේ හා මාධ්‍යවේදිනියන්ගේ ආරක්ෂාව සඳහා වැඩ කරන්න පුළුවන්. මොකද, අපට ඊයේත් වාර්තා වුණා, "මව්බිම" පත්තරය වහන්න යනවා. එම නිසා 50දෙනෙකුගේ විතර රැකියා අහිමි වෙන්න යනවා කියලා. ඒ වාගේම ඔවුන්ට වැටුප් ගෙවලා නැහැ, සේවක අර්ථසාධක අරමුදල් ගෙවලා නැහැ කියලාත් වාර්තා වුණා. ඒ වෙනුවෙන් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්තුමාත් මැදිහත් වෙලා කම්කරු අමාත්‍යාංශයෙන් consultation එකකට වෙලාවක් ඉල්ලා තිබෙනවා. මොකද, රජයක් ලෙස අපි හිතනවා කර්මාන්තයක් ලෙස මාධ්‍ය නොපැවතීම කියන කාරණයේදී ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමත් අපේ යුතුකමක් කියලා. නිසි පරිදි වැටුප් ගෙවන්න ඕනෑ, සේවක අර්ථසාධක අරමුදල් ගෙවන්න ඕනෑ කියලා අපි දිගින් දිගටම කථා කළා. ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරිය ලෙස මම ඒ ඉල්ලීම පාර්ලිමේන්තුවේදීත් කරලා තිබෙනවා. යෝජිත ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය මාධ්‍යවේදීන් පුහුණු කිරීමට, මාධ්‍යවේදීන්ගේ ප්‍රමිතියක් ඇති කිරීමට හා මාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හොඳ උත්තරයක් සපයන්න පුළුවන් ආයතනයක් ලෙස අපි දකිනවා.

ඊළඟ කාරණය මෙයයි. ජනමාධ්‍යවේදිනියන් ගත්තාම කිසියම් විධියක capacity පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කියන්නේ, ශක්‍යතාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය මධ්‍යවේදීන් අතරත් තිබෙනවා. ජනමාධ්‍යවේදීන්ගේ ශක්‍යතා වර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශ විධියට අපි මේ අවුරුද්දේ රුපියල් මිලියන 104ක් වෙන් කරලා තිබෙනවා. රජයේ මාධ්‍ය ආයතනවල අයට විතරක් නොවෙයි, ජනමාධ්‍යවේදීන් ලෙස කටයුතු කරන ඕනෑම කෙනෙකුට සම්බන්ධ වෙන්න පුළුවන් විධියට අපි එම වැඩසටහන් හදන්න බලාපොරොත්තු වනවා. විශේෂයෙන් ඒකට ඇතුළත් වෙනවා ආචාර ධාර්මික මාධ්‍ය වාර්තාකරණය, ස්වාභාවික ආපදාවකින් අනතුරුව සිදු වන මාධ්‍ය වාර්තාකරණය, යුද්මය තත්ත්ව හෝ වෙනත් ආපදාවකින් පසුව සිදු වන වාර්තාකරණය හා තාක්ෂණික වාර්තාකරණය. Report කරද්දී තාක්ෂණික අංශයෙන් තිබිය යුතු කුසලතා - technical aspect එක - වර්ධනය කිරීම සඳහා අපි වැඩසටහනක් හදාගෙන යනවා. ඊළඟට, අපි බලාපොරොත්තු වනවා ජනමාධ්‍යවේදීන්ට හා ජනමාධ්‍යවේදිනියන්ට රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන්නත්. එහි මූලික සාකච්ඡා දැනට පවත්වමින් තිබෙනවා. අපි ඉදිරියේදී බලමු, ඒවායේ සාර්ථකත්වය කොහොමද කියලා. හොඳ ජනමාධ්‍යවේදියෙකු හෝ ජනමාධ්‍යවේදිනියක බිහි කිරීම සඳහා සහ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් සඳහන් ජනමාධ්‍යවේදය කර්මාන්තයක් ලෙස බිහි කිරීම සඳහා රජය පැත්තෙන් ගන්න පුළුවන් සියලු කටයුතු අපි කරගෙන යනවා. මම හිතන හැටියට එතැනදී National Care Policy එක අපේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමය හඳුනා ගැනීමේ මූලික පියවර වෙයි. ඒ සම්බන්ධයෙන් ලෝකයේ වෙනත් රටවලින් අපට ගත හැකි ආදර්ශ තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

**ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
මේ කාරණය කියලාත් මම අවසන් කරන්නම්.

විශේෂයෙන් උරුගුවේ ඉඳන් පටන් ගත්තාම කොලොම්බියාව, චිලී, පැනමාව, පිලිපීනය, ස්පාඤ්ඤය හා දකුණු කොරියාව වාගේ රටවල් රාශියක වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමය හඳුනා ගැනීම සඳහා විවිධ ආකාරයේ ප්‍රතිපත්ති සකස් කර, නීති කෙටුම්පත් කරලා තිබෙනවා. අපි ඒවාත් ආදර්ශයට ගනිමින් ඉන්නවා. ඒ වාගේම යම් සිවිල් සංවිධාන කිහිපයක් මේ වන විට මේ ක්ෂේත්‍රයේ වැඩ කරමින් ඉන්නවා. ඔවුන් සමඟත් සම්බන්ධ වෙමින් මේ care policy එක හඳුන්වා දීමේ වැඩ කටයුතු කරගෙන යන්න අපි බලාපොරොත්තු වනවා. ඒ සඳහා විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගේත්, මන්ත්‍රීතුමියන්ලාගේත් සහයෝගය ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.52]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ සංවාදයට ලක්වන කාන්තාව පිළිබඳව කථා කරද්දි කරුණු ගොඩක් සඳහන් වුණා. මම ඇත්තටම තේරුම් ගත්තා, ආණ්ඩු පක්ෂය කාන්තාව දෙස තවදුරටත් බලන්නේ කෙසේද කියන එක. මම ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් ඒක දැක්කා. ඔවුන්ගේ දේශපාලන ප්‍රචාරණ ව්‍යාපෘතියේදීත් ඒක දැක්කා. ඔවුන් දකින කාන්තාව අපි දකින කාන්තාව නොවෙයි. මට පෙර කථා කළ මන්ත්‍රීතුමියගේ කථාවෙනුත් පස්සේ මට පැහැදිලියි, මේ චින්තනය කොහෙන්ද එන්නේ කියලා. මේ චින්තනය එන්නේ පිට රටින්. මූලාසනාරූඪ

ගරු මන්ත්‍රීතුමනි, මේ චින්තනය ගොඩක් වෙලාවට ඇවිල්ලා තිබෙන්නේ බටහිරින්. මේ කථාවේදී මට තේරුණු දේ සහ තහවුරු වුණු දේ තවදුරටත් මේ ආණ්ඩුව විශ්වාස කරනවා. එනම්, බටහිරින් එන දේවල් ඒ විධියටම අපි පිළිගත යුතුයි කියන එක. අපේ කාන්තාව, බටහිර දෘෂ්ටි කෝණයෙන් දකින බටහිර කාන්තාව නොවෙයි. ඔවුන් සඳහන් කරන වෙනත් රටවල ඉන්න කාන්තාවනුත් නොවෙයි.

අපේ කාන්තාව වන්නේ අපේ මව. මෙය පීතෘ මූලික සමාජයක් කියලා අපි ඉගෙන ගත්තාට ප්‍රායෝගික ජීවිතයේදී අපි දකිනවා, මේක මාතෘ මූලික සමාජයක් කියන එක. මව කේන්ද්‍රීයව තමයි අපේ සමාජය සම්පූර්ණයෙන්ම ගොඩනැඟිලා තිබෙන්නේ. මම හිතන්නේ නැහැ, ඒකට අපේ සභ්‍යත්වය තුළ වෙනත් විග්‍රහයක් ලබා දෙන්න පුළුවන් කියලා. මම ඇයි එහෙම කියන්නේ? අපේ සමාජය මොන විධියකට හැසිරෙනවාද නැද්ද, කොයි දිශානතියක ගමන් කරනවාද නැද්ද කියන මේ සියල්ල තීරණය වන්නේ අපේ මව දෙස අපි බලන ආකාරය අනුවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ත්‍රීවාදී දෘෂ්ටි කෝණයෙන් බැලුවාම අපට මේක පෙනෙන්නේ රුයිතෙට; ඇදේට. එතැනදී අපේ අම්මා පෙනෙන්නේ නැහැ. සභ්‍යත්වයට ගරු නොකරන දේශපාලන චින්තනයකට කවදාවත් අපේ සමාජයේ ඒ කේන්ද්‍රීය චරිතය නොපෙනීම පුදුමයක් නොවෙයි.

"මව්බිම" පත්තරේ වහන්න ඔන්න මෙන්න තිබියදී අන්තිම පත්තරේ දාලා තිබෙනවා මම දැක්කා, "ගැහැනු අපි එක මිටට" කියන තේමාව ලබා දුන් ශ්‍යාමා බස්නායක මහත්මිය විශාල විරෝධයක් දක්වා තිබෙනවා කියලා "ගැහැනු අපි" කියන එක තවදුරටත් අපේ කාන්තාවට එරෙහිව මේ විධියට භාවිත කරන්න එපා කියලා. ඒකත් මම මතක් කරලා දෙන්න ඕනෑ. මේ ඔබතුමන්ලාගේම campaign එක. *[බාධා කිරීමක්]* කොහොම වුණත් ඔබතුමන්ලාට ඒ tagline එක දීපු එතුමිය පවා විරුද්ධ වනවා, බලයට ආ පසු ඔබ කරගෙන යන මේ වැඩේ වැරදියි කියලා. කොහොම වුණත්, ඒක පැත්තකින් තියමු.

ගෞරවයට පාත්‍ර වුණු අපේ අම්මා දැන් කොහොමද පවුලෙන් අයින් කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හෝඩියේ පන්තියේ ඉගෙන ගන්නා දරුවෙකුට පොත් ගෙදර ගෙනියන්න බැහැ නේ. අපි පොත් ගෙදර ගෙනිහිල්ලා අම්මාගෙන් තමයි ඉතිරි ටික ඉගෙන ගත්තේ. දැන් අම්මා දන්නේ නැහැ, දරුවා පොතේ ලිව්වාද නැද්ද කියලා. දරුවා අකුරු ලිව්වාද නැද්ද කියලා අම්මාට දැනගන්න බැහැ. දැන් අම්මාට බැහැ දරුවාට උදවු කරන්නත්. ඒක මේ ආණ්ඩුවෙන් තහනම් කරලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇයි මෙහෙම හිතන්නේ? මෙහෙම හිතන්නේම මෙන්න මේ චින්තනයේ තිබෙන ප්‍රශ්නයක් නිසායි. කවදාද අපි හිතුවේ මේ ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ වාමාංශික දේශපාලන බලවේගයකින් ආපු ආණ්ඩුවක් මේ විධියට පිට රටින් දේවල් ගෙනැල්ලා අපේ රටේ අත්හරීවි කියලා? වෙන රටවල එහෙම ඇති. එහෙම තිබෙනවා කියලාත් කිව්වා. හැබැයි, අපේ අම්මා තමයි මේ සමාජයේ රැජින. අපි-මේ රට යන්නේ කොතැනටද කියලා තීරණය කරන්නේ අපේ අම්මා. ඒකට බොරු ස්ත්‍රීවාදී සටන් පාඨ කියලා හරියන්නේ නැහැ.

අද පවතින යථාර්ථය මොකක්ද? දැඩි ලෙස ආර්ථික පීඩාවට පත්වෙලා තිබෙන ශ්‍රී ලාංකික කුටුම්භය තුළ දැඩි ලෙස තම මාතෘත්වය අභියෝගයට ලක් කරමින් ඇයට වන ඒ බලපෑම බලන්න. එදිනෙදා ජීවිතයේ ඇයට එන ප්‍රශ්න විසඳා ගැනීම සඳහා අද ඇය මොන තරම් සටනක් කරනවාද? අද ඔබට වගකීමක් තිබෙනවා, ඔබ පොරොන්දු වුණු දේ ඉෂ්ට කළත්, නැතත්. මම දන්නවා, ඔබ ගොඩක් දේවල් පොරොන්දු වෙලා තිබෙන බව. ඒවා පැත්තකින් තබන්න. හැබැයි, ප්‍රායෝගික ජන සමාජයේ කාන්තාව අද විඳින දුක, ඒ ආර්ථික දුෂ්කරතාවට සාපේක්ෂව ඒ තරමටම වැඩිවෙලා තිබෙනවා. අද ඇයට තවදුරටත් ඉතාම දුෂ්කර කාර්යභාරයක නිරත වෙමින් නායකත්වයට මඟ පෙන්වන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මගේ යෝජනාව මෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ආණ්ඩුව සලකා බලන්නට ඕනෑ, ඔබ බලයට ගෙනෙන්නට "ගැහැනු අපි" කියලා ඔබේ පස්සෙන් ආ ශ්‍රී ලාංකික කාන්තාවගේ ඒ බලාපොරොත්තුව පිළිබඳව. අවම වශයෙන් හෝ එය ඉෂ්ට කරන්නට නම් ඇය ආර්ථික වශයෙන් සන්නද්ධ කළ යුතුයි. ඒකට මේ බොරු තොරොම්බල් ගෙනැල්ලා හරියන්නේ නැහැ. ඒකට මේ ටොෆි, චොක්ලට් දීලා හරියන්නේ නැහැ. ඒකට මහ පොළොවේ දැනෙන වෙනසක් සිද්ධ වෙන්න ඕනෑ. ඇය ආර්ථික වශයෙන් බලගන්වනවා නම් ඇයට ඒ ආර්ථික හයිය එන්නේ කොහෙන්ද? ඇයට තමන්ගේම කියා ව්‍යවසායකත්වයක්, තමන්ගේම ස්වයං රැකියාවක්, තමන්ගේ හැකියාවෙන් යමක් උපයාගන්නට හැකි පරිසරයක්, ඊට අවශ්‍ය දැනුම, ඊට අවශ්‍ය නිර්මාණශීලීත්වය, ඊට අවශ්‍ය ප්‍රාග්ධනය ලැබෙන ආකාරය කියන්නට ඕනෑ. නිකම් පුහු ප්‍රකාශ කරලා අපේ අම්මා රවටන්න හදනවා නම් ඔබ කරන්නේ ඉතාම ද්‍රෝහී ක්‍රියාවක්; පවක්. ශ්‍රී ලාංකික කාන්තාවට ඇති ඒ ශුද්ධ වූ අයිතිය තහවුරු කර දීම සඳහා, අපේ සභ්‍යත්වය තුළින්ම මතු කර ඇති ඒ ඓතිහාසික අපේක්ෂාව ඉෂ්ට කරන්නට නම්, ඔය සාම්ප්‍රදායික ඔළමොට්ටළ ස්ත්‍රීවාදය බටහිරින් ගෙනැල්ලා මෙහේ ඔබන්න හදන එකෙන් ඔබ වහාම මිදිය යුතුයි.

මම නැවතත් යෝජනා කරනවා, කරුණාකර තමන්ගේ දෙමාපියන්ගේ නාමයෙන්, විශේෂයෙන්ම මවගේ නාමයෙන්, දිගටම කරගෙන යන්නට හදන මේ බොරු වැඩ ටික නවත්වා ඇත්ත වැඩක් කරන්නට මහ පොළොවට බහින්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ලද අවස්ථාවේදී මම මේ කාරණයත් කියන්න ඕනෑ. අද භූගෝලීය දේශපාලනය තුළත්, අපේ රාජ්‍ය තාන්ත්‍රිකභාවය පිළිබඳවත්, අපේ රටේ ආරක්ෂාව පිළිබඳවත් ගැටලු මතු වී තිබෙනවා. අපට නිශ්චිත විදේශ ප්‍රතිපත්තියක් සහ උපාය මාර්ගික දැක්මක් නොමැති වීම නිසා අද අපේ රටේ ජාතික ආරක්ෂාව ඉතාම දුර්වල තත්ත්වයකට පත් වෙමින් තිබෙනවාය කියන එක මේ ගරු පාර්ලිමේන්තුවේදී මම සඳහන් කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් මම කලිනුත් කිව්වා. මම නැවතත් කියනවා. අතීතයේදී වාගේ පොල් කොටන් කිහිපයක් උඩ වේදිකාවක් හදලා, ඒක උඩ නැඟලා කෑ ගහන දේශපාලනය නොවෙයි අද ඔබ කළ යුත්තේ. අපේ රටේ භූ දේශපාලනික උපාය මාර්ගය කුමක්දැයි පැහැදිලි වන වැඩ පිළිවෙළක් තුළ අනෙකුත් ජාතීන් හා අපේ කලාපයේ රටවලට අප පිළිබඳ විශ්වාසයක් ඇති වන ආකාරයෙන් වැඩ කරමින් මේ රට අනාරක්ෂිත නොකිරීමට වගබලා ගැනීමයි ඔබ කළ යුත්තේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

[ගරු දිලිත් ජයවීර මහතා]

මම නැවත මේ කාරණය කියන්නට ඕනෑ. අපටම ආවේණික වූ, අපේම සිතුම් පැතුම් සමුදායකින් එන අවිහිංසාව, සහෘත්වය සහ සංස්කෘතිය අනුගමනය කරමින් අපි කටයුතු කළ යුතුයි. මුළු ලෝකයටම ආගමික බලපෑමක් කළ ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේගේ දේශනාව වුණේ මොකක්ද? උන්වහන්සේ දේශනා කළ දෙයක් තමයි, "සබ්බේ සත්ථා භවන්තු සුඛිතත්තා" කියන්නේ. අපි සියලු සතුන්ට සැපත පතනවා නම්, මුළු ලෝකයටම සාමයේ පණිවුඩය ගෙනියන රටක් වෙන්න අපට පුළුවන්. අපි හුණ්ඩුවක් නොවෙයි. මේ යුද ගිනිදැල් නිවන්නට මැදිහත්කරුවෙක් වෙමින් අපේ රටේ තිබෙන ඒ දාර්ශනික චින්තනය තුළින් අපි ලෝකයට ආරාධනයක් කරන්නට ඕනෑ බව පවසමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.05]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද යෝජනාවට අදාළව කථා කරන්න කලින් පොඩි කාරණාවක් මට කියන්න තිබෙනවා, ධීවර අමාත්‍යාංශය හැටියට වාගේම ධීවර ඇමතිවරයා හැටියට. විශේෂයෙන්ම අපේ මුහුදු සීමාව තුළ එහෙම නැත්නම් ජාත්‍යන්තර මුහුදු සීමාව තුළ දැනට සිදු වෙමින් තිබෙන සිදුවීම් දැක්කාට පස්සේ කරුණු - කාරණා කිහිපයක්ම පැන නඟිනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම අපේ ධීවරයන් රැක ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. ඒක ආණ්ඩුවක් විධියට අපේ පැත්තෙන් කළ යුතු යුතුකමක්. එම නිසා අපි පළමුවෙන්ම අපේ සියලු ධීවර ජනතාවගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා, අපේ මුහුදු සීමාව උල්ලංඝනය කරමින් වෙනත් මුහුදු සීමාවලට යන්න එපා කියලා.

விசேஷமாக இன்று எங்கள் எல்லோருக்குமே தெரியும், எமது கடற்பரப்பில் அல்லது இந்து சமுத்திரத்தில் பெரும் பதற்றமான நிலைமை ஏற்பட்டிருக்கிறது; அந்தப் பதற்றமான நிலைமையின் காரணமாகப் பல்வேறு சம்பவங்கள் இடம்பெற்று வருகின்றன என்பது. உண்மையிலேயே அவ்வாறு இடம்பெறுகின்ற சம்பவங்களின் மூலமாகப் பாதிக்கப்படுவது எங்களுடைய மீனவர்களாக இருந்தால் அது எங்களுக்கு நல்லதல்ல, எங்களுடைய அமைச்சுக்கும் நல்லதல்ல! அதனால், நாங்கள் எங்களுடைய மீனவர்களிடம், இந்தப் பிரச்சினைகள் சற்றுத் தணியும் வரைக்கும் எங்களுடைய கடல் எல்லையைத் தாண்டிச் சென்று அத்துமீறி சட்டவிரோதமான ரீதியில் மீன்பிடி நடவடிக்கைகளில் ஈடுபட வேண்டாம் அல்லது அவ்வாறு செல்ல வேண்டாமென்று நாங்கள் மிக மிக அன்பாகக் கேட்டுக் கொள்கின்றோம்.

எங்களது புனித இஸ்லாம் மார்க்கம் 1447 ஆண்டுகளுக்கு முன்பே பெண்களுக்குரிய கௌரவத்தையும் உரிமைகளையும் வழங்கியுள்ளது. எங்களுடைய நபி (ஸல்) அவர்களிடம் ஒரு மனிதர் வந்து, "எனது நல்ல நட்புக்கும் சேவைக்கும் மிகவும் உரிமையுள்ளவர் யார்?" எனக் கேட்டார். அதற்கு நபி (ஸல்) அவர்கள் "உனது தாய்" என்று சொன்னார்கள். "இரண்டாவதாக யார்?" என்று அவர் கேட்டார். அதற்கும் "உனது தாய்" என்று சொன்னார்கள். "மூன்றாவதாக யார்?" என்று கேட்டார். அதற்கும் "உன்னுடைய தாய்" என்று சொன்னார்கள். "நான்காவதாக யார்?" என்று கேட்டபோதுதான் தந்தையைப் பற்றி குறிப்பிட்டார்கள். அந்தளவுக்கு இந்த உலகத்திலே பெண்களுக்குரிய உரிமைகளையும் அந்தஸ்தையும் எங்களுடைய புனித இஸ்லாம் மார்க்கம் வழங்கியுள்ளது. அது 'மாத்திரமல்லாமல், நபி (ஸல்) அவர்கள் கூறினார்கள், "எங்களுடைய தாய்மாருடைய பாதங்களின் கீழ் சுவர்க்கம் இருக்கின்றது" என்று. அந்தளவுக்குத் தாய்மாரைக் கண்ணியப்படுத்துகின்ற விடயத்தை நாங்கள் அதிலே பார்க்கின்றோம்.

அடுத்து, நான் இந்த விவாதத்திலே மிக முக்கியமாக இன்றைய காலகட்டத்திற்குத் தேவையான விடயமொன்றைப் பேச வேண்டும். அதாவது, கடந்த 40 வருட காலமாக ஈரானிலே ஆன்மீகத் தலைவராக இயங்கிவந்த ஆயதுல்லா அலி கமேனி அவர்களையும் அவரது குடும்பத்தினையும் ஈரான் நாட்டின் பாதுகாப்புத் துறைக்குரியவர்களையும் இந்தப் புனித ரமழான் மாதத்திலே அமெரிக்காவும் இஸ்ரேலும் சேர்ந்து 2026.02.28ஆம் திகதி காட்டுமிராண்டித்தனமான முறையிலே தாக்குதல் மேற்கொண்டு படுகொலை செய்திருக்கின்றனர். இந்தப் படுகொலை குறித்து, நாங்கள் இலங்கை மக்கள் சார்பில் கண்டனத்தைத் தெரிவிப்பதோடு எமது அனுதாபங்களையும் தெரிவித்துக் கொள்கின்றோம். அந்த நாட்டில் 132 இடங்களிலே பாரிய தாக்குதல்களை நடாத்தியிருக்கின்றார்கள். ஜனநாயக முறையிலே ஆட்சி நடத்திய ஓர் ஆன்மீகத் தலைவரை, ஒரு நாட்டின் மக்களை அழிக்கின்ற பணியை அமெரிக்கா இஸ்ரேலுடன் இணைந்து தொடர்ச்சியாக மேற்கொண்டு வருகின்றது.

இன்னுமொரு கவலையான சம்பவமும் ஈரானிலே நடைபெற்றிருக்கின்றது. அதாவது, 100க்கும் மேற்பட்ட பெண் பிள்ளைகள் பாடசாலையில் கல்வி கற்றுக் கொண்டிருந்தபோது குண்டுத் தாக்குதல்மூலம் அவர்களைப் படுகொலை செய்திருக்கின்றார்கள். அமெரிக்கா தன்னுடைய இலக்குகளை அடைவதற்காக, இவ்வாறு ஒவ்வொரு நாட்டின்மீதும் கைவைத்திருக்கிறது. சில காலத்திற்கு முன் ஈராக்கின் சதாம் உசேனை இல்லாமல் செய்தார்கள்; லிபியாவின் முஅம்மர் அல்-கடாபியை இல்லாமல் செய்தார்கள். வெனிசுவேலா நாட்டுக்குள் அத்துமீறி நுழைந்து, அந்த நாட்டினுடைய சனாதிபதியைக் கைதுசெய்து, அமெரிக்காவில் தடுத்து வைத்திருக்கின்றார்கள். இது எந்த வகையிலே நீதியாகும்? அந்த வகையில், இன்று எங்களுடைய

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

மார்க்கத்தின் முக்கிய தலைவரும் ஈரானின் உச்ச தலைவருமான ஆயதுல்லா அலி கமேனியைப் படுகொலை செய்திருக்கின்றார்கள். அமெரிக்காவினதும் இஸ்ரேலினதும் கொடுமையான செயற்பாடுகள் தொடர்ந்துகொண்டே செல்கின்றன. இவ்வாறான கொடுமைகளை ஐக்கிய நாடுகள் சபை சும்மா பார்த்துக்கொண்டிருக்கின்றது; கண்ணிருந்தும் குருடர்களாக இருக்கின்றார்கள்.

அமெரிக்க சனாதிபதி டொனால்ட் டிரம்ப் எண்ணெய் வளமுள்ள முஸ்லிம் நாடுகளின் ஆட்சி அதிகாரத்தை இல்லாமல் செய்யும் செயற்பாட்டில், இஸ்ரேலையும் இணைத்துக்கொண்டு செயற்பட்டு வருகின்றார். ஈரான் நாட்டுக்கு எதிராக அமெரிக்கா - இஸ்ரேல் இணைந்து மேற்கொண்ட பாரிய ஒருங்கிணைந்த இராணுவத் தாக்குதல் நடவடிக்கைகளினால் தற்போது மத்திய கிழக்கு மிகவும் மோசமாகப் பாதிக்கப்பட்ட நிலைமையில் உள்ளது. இக்கொடூரமான தாக்குதலினால் நமது நாட்டுக்கும் பாரிய பாதிப்புகள் ஏற்பட்டுள்ளன. மத்திய கிழக்கு நாடுகளில் வாழுகின்ற இலங்கையைச் சேர்ந்த பத்து இலட்சத்துக்கும் மேற்பட்டவர்களுடைய வாழ்க்கை கேள்விக்குறியாகி உள்ளது. அவர்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள்; நமது பொருளதாரம் பாதிக்கப்பட்டிருக்கின்றது. ஆனால், இந்த விடயங்களைப் பற்றி பேசுவதற்கு ஆளுங்கட்சியினர் கொஞ்சம் அச்சப்படுகின்றார்கள். அமெரிக்கா என்றதும், இஸ்ரேல் என்றதும் தொடை நடுங்குகின்ற ஒரு நிலைமையை நாங்கள் பார்த்துக்கொண்டு இருக்கின்றோம்.

எதிர்க்கட்சியில் இயங்கிய காலகட்டத்தில் பல போராட்டங்களை நடாத்தி, மனித உரிமைகளுக்காக நீண்டகாலமாகக் குரல் கொடுத்து ஆளுங்கட்சியாக மாறிய NPP அரசாங்கம், ஈரான் நாட்டின் ஆட்சி அதிகாரத்தை மாற்றுவதற்கு, எங்களின் புனித றமழான் மாதம் என்றும் பாராது அந்த நாட்டின்மீது அத்துமீறிப் படுகொலைகளைப் புரிந்த அமெரிக்காவுக்கும் இஸ்ரேலுக்கும் கண்டனம் தெரிவிக்காமல் இருக்கின்ற நிலைமை குறித்து இலங்கையில் வாழுகின்ற முஸ்லிம் சமூகம் மிகவும் கவலை அடைகின்றது. எனவே, நமது நாட்டில் வாழுகின்ற முஸ்லிம் மக்களின் உணர்வுகளைப் புரிந்து, ஈரான் நாட்டுப் படுகொலைகள் தொடர்பாக ஆளுங்கட்சியினர் பகிரங்கமாக கண்டனம் தெரிவிக்க வேண்டும். ஆளுங்கட்சியினர் அமெரிக்காவுக்கும் இஸ்ரேலுக்கும் ஏன் இவ்வளவு பயப்படுகின்றார்கள்? சனாதிபதித் தேர்தலில், பொதுத் தேர்தலில் பெரும்பான்மைப் பலத்தை இந்த நாட்டு மக்கள் உங்களுக்குத் தந்திருக்கின்றார்கள். எனவே, ஒரு நாட்டுக்குள் அத்துமீறி நடக்கின்ற படுகொலைகள் போன்ற சம்பவங்களுக்கு ஆளுங்கட்சியில் இருக்கின்ற நீங்கள் கண்டனம் தெரிவிக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் துபாய் நாட்டுத் தலைவர் ஷேக் முகமது பின் சயீத் அல் நஹ்யான் அவர்களுடன் தொடர்புகொண்டு, அங்கு ஏற்பட்ட பாதிப்புகளுக்குக் கவலை தெரிவித்ததோடு துபாய் நாட்டுக்குத் தேவையான உதவிகளையும் வழங்குவதாகத் தெரிவித்துள்ளார். ஆனால், அணிசேரா நாடு என்றால் சனாதிபதி அவர்கள் யுத்தத்தால் பாதிக்கப்பட்ட எல்லா நாட்டுத் தலைவர்களுடனும் தொடர்புகொண்டு அனுதாபம் தெரிவித்திருக்க வேண்டும். ஈரான் நாட்டில் நடந்த படுகொலைகள் சம்பந்தமாக - விசேஷமாக 100க்கும் மேற்பட்ட பெண் பிள்ளைகள் பாடசாலையில் படுகொலை செய்யப்பட்ட கொடூரமான செயலுக்கு - நமது சனாதிபதி அவர்களும் ஆளுங்கட்சியினரும் கண்டனத்தையும் அனுதாபத்தையும் தெரிவிக்காமல் இருப்பது சரியா? என்பதை உங்களுடைய மனச்சாட்சியை முன்னிறுத்திக் கேளுங்கள்! உங்கள் மனச்சாட்சி உங்களுக்குப் பதில் சொல்லும் என்பதைச் சொல்ல விரும்புகின்றேன்.

அதுபோல், ஈரானியக் கடற்படைக்குச் சொந்தமான கப்பலொன்று இந்தியாவினுடைய விசேட கடற்படைப் பயிற்சியின் பின் இலங்கைக் கடற்பரப்புக்குச் சற்று வெளியே தரித்திருந்தபோது அமெரிக்காவின் நீர்மூழ்கிக் கப்பல் ஒன்றினால் தாக்கி அழிக்கப்பட்டிருக்கின்றது; அதிலிருந்த நூற்றுக்கணக்கானவர்கள் காணாமற் போயிருக்கிறார்கள். இது தொடர்பான முழுமையான அறிக்கையை இந்த அரசாங்கம் பாராளுமன்றத்தில் சமர்ப்பிக்க வேண்டும் எனக் கேட்டுக் கொள்கிறேன். இதேவேளை இன்றும் இலங்கைக் கடற்பரப்பிற்குள் இன்னுமொரு ஈரானியக் கப்பல் வந்துள்ளதாகத் தெரிவிக்கப்படுகிறது. இச்செயற்பாடுகளால் அமெரிக்கா, இஸ்ரேல் யுத்த களத்துக்கு இலங்கையும் பயன்படுத்தப்படுகின்றதா? என்ற நியாயமான ஒரு கேள்வி எமது நாட்டு மக்கள் மத்தியில் எழுகின்றது. எனவே, இவை தொடர்பான அறிக்கைகளை பாதுகாப்புக்குப் பொறுப்பான கௌரவ அமைச்சர் அவர்கள் நாளை பாராளுமன்றத்தில் சமர்ப்பிக்க வேண்டுமென நான் மக்கள் சார்பிலே கேட்டுக் கொள்கிறேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

மனித உயிர்களைப் படுகொலை செய்து திருப்தியடையும் செயற்பாடுகளில் தொடர்ந்து ஈடுபட்டுவரும் டொனால்ட் டிரம்ப் மற்றும் இஸ்ரேலிய பிரதமர் பெஞ்சமின் நெத்தன்யாஹு ஆகிய இருவருக்கும் ஒரு விடயத்தைத் தெரிவிக்க விரும்புகின்றேன். "சதிகாரர்களுக்கெல்லாம் சதிகாரன் இறைவன்" என்பதனை நினைவுபடுத்துகின்றேன். எமது முன்னோர்கள் சொல்வார்கள், "சண்டியனின் சாவு சந்தியில்" என்று. அதுபோன்று இறைவனுடைய தீர்ப்பு உங்களுக்குக் கிடைக்கும் என்று நான் சொல்லிவைக்க விரும்புகின்றேன்.

அடுத்ததாக, ஆளும் கட்சியில் இருக்கும் முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களால் இது தொடர்பாகப் பேசுவதற்கு முடியாவிட்டால் ஆகக்குறைந்தது மற்றவர்கள் பேசும்போதாவது அவர்கள் அமைதியாக உட்கார்ந்திருக்க வேண்டும். நேற்று இந்தப் பாராளுமன்றத்திலே எதிர்க்கட்சியைச் சேர்ந்த ஓர் உறுப்பினர் முஸ்லிம்களைப் பற்றியும் ஈரானைப் பற்றியும் ரமலான் மாதத்தைப் பற்றியும் பேசினார். ஆனால், உங்களால் பேச முடியாது; உங்களுக்கு அதற்கு அனுமதி இல்லை. உங்களால் பேச முடியாதென்றால் மௌனமாக இருந்து கொள்ளுங்கள்! முஸ்லிம்களுக்காக, ஈரானுக்காக அல்லது ரமலான் சம்பந்தமாக இந்தப் பாராளுமன்றத்திலே மற்றவர்கள் பேசுகின்றபோது, நீங்கள் மௌனமாக இருக்க வேண்டுமென்று கேட்டு, விடைபெறுகிறேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.09]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්තු 08වැනි දාට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය හැටියට තමයි සුරැකුම් ශ්‍රමය සම්බන්ධ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ කියන්නේ, රටක් හැටියට ලංකාවට සුරැකුම් ශ්‍රමය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ කියන කාරණය තමයි අද අපි මන්ත්‍රීවරියන්ගේ සංසදය හැටියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ.

සුරැකුම් ශ්‍රමය ගැන ගොඩක් දෙනා කථා කරපු නිසාත්, අද විශේෂයෙන්ම කාන්තා කොමිසම ගැන විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තුවේ අවධානයට ලක් කරපු නිසාත් මම හිතුවා කාන්තාවන් හැටියට අපි මේ ඇවිල්ලා තිබෙන ගමන, කාන්තාවන් හැටියට දේශපාලනය තුළ අපි ඇවිල්ලා තිබෙන ගමන මොකක්ද කියන එක මතක් කර ගන්න අවශ්‍යයි කියලා. ඒ වාගේම අපි තේරුම් ගන්නට ඕනෑ, කාන්තා කොමිෂන් සභාව හා රජය අතර යම් ගැටුමක් තිබෙනවා වාගේ අදහසක් දිගින් දිගටම විපක්ෂය විසින් පෙන්වන්න හදනවාය කියන එක. ඒ අදහස ඇයි වැරදි වෙන්නේ කියන එක හා අපි වාගේ ආණ්ඩුවකට එවැනි අරමුණක් කිසිසේත්ම තිබෙන්නට බැහැ කියන එක මගේ කථාව තුළ විනාඩි කිහිපයක් අරගෙන පැහැදිලි කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඉතිහාසයේ දේශපාලනය තුළ කාන්තාවන්ට හිමි වෙලා තිබුණේ ඉතාම අඩු තැනක්. ලෝකයේ පළමුවැනි අගමැතිවරිය බිහි වුණේ ලංකාවෙන්. අපි තමයි ලෝකයේ පළමුවැනි අගමැතිවරිය බිහි කළේ. අද ගොඩක් කථා කළා ඉන්දියන් සාගරය සාම කලාපයක් කියන කථාවත්. මම හිතන විදියට, ඒ ගැන විපක්ෂයෙන් ගොඩක් කථා කළා. නමුත් ඉන්දියන් සාගරය සාම කලාපයක් කියන යෝජනාව එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කරන්නේ සිරිමාවෝ බණ්ඩාරනායක නම් වූ ලංකාවේ පළමු අගමැතිවරියයි. ඒ වාගේම ලෝකයේ පළමුවැනි ජනාධිපතිවරිය බිහි වුණේත් ලංකාවෙන්. ඒ, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමිය. එහෙම වුණත් අපට පෙනෙන්න තිබුණ දේ මොකක්ද? කාන්තාවන්ගෙන් එක්තරා පිරිසකට, එක්තරා ආකාරයක කාන්තාවන්ට දේශපාලනය කිරීමේ හැකියාවක් ලංකාවේ තිබුණත්, සාමාන්‍ය කාන්තාවන්ට දේශපාලනය කිරීමේ නිදහස රට තුළ තිබුණේ නැහැ. ඒක තමයි අපි පොදුවේ දැකපු දේ. මුදල් නැති නිසා, දේශපාලන පක්ෂවල තිබෙන ඉතා ප්‍රචණ්ඩ, හිංසන හැසිරීම් නිසා, වෙනත් විවිධ හේතු නිසා ලංකාවේ කාන්තාවන්ට දේශපාලනය කිරීමට නොහැකි වුණා. සාමාන්‍ය කාන්තාවන්ට, ඒ කියන්නේ පවුල් පසුබිමක් නැති, සමාජ පසුබිමක් නැති අපි වාගේ සාමාන්‍ය කාන්තාවන්ට දේශපාලනය කිරීමේ නිදහසක් තිබුණේ නැහැ. ඒක තමයි ලංකාවේ යථාර්ථය.

අපි දන්නවා මීට අවුරුදු 50කට විතර ඉස්සෙල්ලා ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ, ලංකා සම සමාජ ව්‍යාපාරය, කොමියුනිස්ට් ව්‍යාපාරය වාගේ පක්ෂවල විවියන් ගුණවර්ධන, ඩොරින් වික්‍රමසිංහ, කුසුමා ගුණවර්ධන වාගේ කාන්තාවන් සිටි බව. දේශපාලනය කරපු වාමාංශික ස්ත්‍රීන් හැටියට ඔවුන්ට තිබෙන ගරුත්වයත් සමඟම අපි මතක් කර ගන්න ඕනෑ කාරණාව තමයි, ඒ කාන්තාවන් වුණත් පවුල් පසුබිමක් රහිතව දේශපාලනය කරපු කාන්තාවන් නොවෙයි කියන එක. පළමු වතාවට අද අපේ පාර්ලිමේන්තුවේ - දසවන පාර්ලිමේන්තුවේ - මන්ත්‍රීවරියන් 20දෙනෙකු ඉන්නවා. කිසිදු පවුල් පසුබිමක්, කිසිදු දේශපාලන බලයක් නැතිව දේශපාලන නිදහස මතින්ම දේශපාලනය කරන කාන්තාවන් 20ක් අද අපේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මේ මොහොතේ තිබෙන වැදගත්කම, මේ මොහොතේ තිබෙන බරපතළකම සහ කාන්තා ව්‍යාපාරයට, කාන්තාවන්ට මෙහි තිබෙන වැදගත්කම ගැන අපේ රටේ කාන්තා ව්‍යාපාරය තුළත්, පොදුවේ මාධ්‍ය තුළත් ලබා දෙන සාකච්ඡා සහ ඒවායේ වැදගත්කම කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ කියලා මම පෞද්ගලිකව හිතනවා.

අපේ පාර්ලිමේන්තුවේ - දසවන පාර්ලිමේන්තුවේ - සාමාන්‍ය මලෙයහම් කාන්තාවන් දෙදෙනෙක් ඉන්නවා. මොකක්ද ඒකේ අදහස? අපේ රටේ පාර්ලිමේන්තුවේ කවදාවත් මලෙයහම් කාන්තා නියෝජනයක් තිබුණේ නැහැ. දසවැනි පාර්ලිමේන්තුවට පෙර, කිසිම මලෙයහම් කාන්තාවක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළේ නැහැ. නමුත් දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපට පුළුවන් වෙලා තිබෙනවා, මලෙයහම් කාන්තාවන් දෙදෙනෙක් මේ පාර්ලිමේන්තුවට අරගෙන එන්න. ඒ නිසා මේක නිශ්චිත දේශපාලන මොහොතක්. අපි ඒක පිළිගත යුතුයි. ඒ නිසා අපි ඇත්තටම ඉතාම ගෞරවයෙන් ලංකාවේ සමස්ත කාන්තාවන්ට සහ කාන්තා ව්‍යාපාරයට ආරාධනා කර සිටිනවා, මේ නිශ්චිත මොහොතට අවශ්‍ය ගෞරවය දීලා මේ සාකච්ඡාව කරමු කියලා. නමුත් අවාසනාවකට අපට පෙනෙනවා, යම්කිසි හේතුවකට සිවිල් සමාජය සහ දේශපාලනයේ සිටින කාන්තාවන් අතර යම් එකඟ නොවීම්, එහෙම නැත්නම් එකකට එකක් විරුද්ධ මත තිබෙනවා වාගේ අදහසක් හදන්න විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් උත්සාහ කරන බව. ඒ අය මන්ත්‍රීවරියන්ට challenge කරනවා. කාන්තාවන්ගේ අයිතිවාසිකම් ගැන මන්ත්‍රීවරියන්ට තමයි challenge කරන්නේ. නමුත් ඔවුන් හිතන්නේ නැහැ, තමන්ගේ දේශපාලන පක්ෂවල කොච්චර කාන්තාවන් ඉන්නවාද කියලා. අද පාර්ලිමේන්තුවට විපක්ෂයේ කාන්තාවන් කී දෙනෙක් අරගෙන ඇවිල්ලා තිබෙනවාද, පත් කරගෙන තිබෙනවාද, ඔවුන්ට ඒ බලය ලබා දීලා තිබෙනවාද? ඒ ගැන සාකච්ඡාවක් නැහැ. ඉතින් මම හිතන්නේ අපි මේ මොහොතට, මේ පාර්ලිමේන්තුවට ඒ අවශ්‍ය වැදගත්කම, ඒ අවශ්‍ය ගරුත්වය ලබා දිය යුතුයි කියලායි. ජාතික ජන බලවේගය හැටියට, දේශපාලන පක්ෂයක් හැටියට අපි ඉතාම ආඩම්බර විය යුතුයි, මෙවැනි වෙනසක්, තීරණාත්මක වෙනසක් ඉතිහාසයට එකතු කිරීමට සමත් වීම ගැන. නමුත් අපි මෙතැනින් නවතින්න අවශ්‍ය නැහැ. තව තවත් කාන්තාවන් මෙතැනට එන්න ඕනෑ. තව තවත් සාමාන්‍ය කාන්තාවන් එන්න ඕනෑ. මේ වෙනකොට අපේ ප්‍රාදේශීය දේශපාලනයේ - ප්‍රාදේශීය සභාවල, නගර සභාවල - ජාතික ජන බලවේගය නියෝජනය කරමින් මන්ත්‍රීවරියන් 683දෙනෙක් ඉන්නවා. ඒක සමස්ත කාන්තා නියෝජනයෙන් තුනෙන් එකක්. තුනෙන් එකක්ම ඉන්නේ, ජාතික ජන බලවේගයේ කාන්තාවන්. ඒ ගොඩක් අය ඡන්දය ඉල්ලලා, තමන්ගේ කොට්ඨාසය දිනලා ආපු මන්ත්‍රීවරියන්. ඒ අතර නගරාධිපතිවරියන් ඉන්නවා, සභාපතිවරියන් ඉන්නවා. ඒ නිසා අපි මතක තියා ගන්න ඕනෑ, මේ අපි ගත කරන කාලය කාන්තාවන්ගේ දේශපාලන නායකත්වය, බලය සම්බන්ධයෙන් වූ තීරණාත්මක කාලයක් බව. ඒ නිසා ඒ අවශ්‍ය ගෞරවය දීලා කථා කරන්න ඕනෑ.

විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා කාන්තා කොමිසම ගැන නිරන්තරයෙන් කථා කරනවා. නමුත් එතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරු කාන්තාවන්ට දෙන ගෞරවය මොකක්ද? එතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරු මේ මන්ත්‍රීවරියන්ට සලකන ආකාරය මොකක්ද? ඔවුන් ඒ සම්බන්ධයෙන් පෙන්වා තිබෙන වගවීම මොකක්ද? කිසිම වගවීමක් නැහැ. ඇත්ත, කාන්තා කොමිසම ස්වාධීන විය යුතුයි කියලා අපි හිතනවා. පාර්ලිමේන්තු

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

මන්ත්‍රීවරියන්ගේ සංසදය හැටියට අපි කාන්තා කොමිසම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වෙලා තිබෙනවා. අපට ඒ සම්බන්ධයෙන් ආපු පළමුවැනිම දැනුම් දීම මත අපි ක්‍රියාත්මක වෙලා තිබෙනවා. අපි කිසිම ආකාරයකින් කාන්තා කොමිසම ක්‍රියාත්මක නොවිය යුතු දෙයක් කියලා හිතන්නේ නැහැ. අපි ඒකට සහාය ලබා දෙනවා. මෙතැනදී තේරුම් ගන්න ඕනෑ, කාන්තාවන් සිවිල් සමාජයට සීමා කරලා තිබ්බ කාලය අපි අවසන් කරලායි තිබෙන්නේ, කාන්තාවන් දේශපාලන බලයෙන් ඉවත් කරලා තිබ්බ කාලය අපි අවසන් කරලායි තිබෙන්නේ කියලා. අපි අගමැතිවරියක් පත් කර ගත්ත රජයක්. අපි කැබිනට් ඇමතිවරියන් පත් කර ගත්ත රජයක්. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් 20ක් පත් කර ගත්ත රජයක්. අපි ප්‍රාදේශීය පාලනයට වැඩිම කාන්තා නියෝජනයක් ලබා දුන් රජයක්. ඉතින් අපි මොන හේතුවකටද කාන්තා කොමිසමට විරුද්ධ වෙන්නේ? අපි මොන හේතුවකටද කාන්තා කොමිසම අවතක්සේරු කරන්නේ? ඒ නිසා ඒ කථා කරන අය කොතැන හිටගෙනද කථා කරන්නේ කියලා බලන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ඇත්තටම හිතනවා, ඒ අය මේ කරන්න හදන්නේ කාන්තාවන්ගේ දේශපාලන බලය අවතක්සේරු කිරීමක් කියලා. ඒක කාන්තා කොමිසම ගැන කථා කරන එක තුළ විතරක් නොවෙයි තිබෙන්නේ. මන්ත්‍රීවරියන් හිංසනයට ලක් කිරීම තුළ තිබෙන්නේ කාන්තාවන්ගේ දේශපාලන බලය අවතක්සේරු කිරීමට ගන්නා උත්සාහයක්. අගමැතිවරියට දිගින් දිගටම පහර දීම තුළ තිබෙන්නේ මන්ත්‍රීවරියන්ගේ, කාන්තාවන්ගේ දේශපාලන බලය අවතක්සේරු කිරීමට ගන්නා උත්සාහයක්.

ඉතින් අපි හිතනවා අපි ඇති කර තිබෙන මෙන්න මේ වෙනස ව්‍යුහාත්මක වෙනසක් කියලා. ලංකාවේ දේශපාලනයේ ව්‍යුහාත්මක වෙනසක්, ඓතිහාසික වෙනසක් තමයි දේශපාලන බලය කාන්තාවන් සමඟ බෙදා ගැනීම; සාමාන්‍ය පවුල්වල කාන්තාවන් සමඟ බෙදා ගැනීම. ඒ වෙනස කරපු ව්‍යාපාරය "ගැහැනු අපි එක මිටට" කියලා ආවේ. ඒ ව්‍යාපාරයට අවශ්‍ය ගරුත්වය, recognition එක ලබා දීමට අවශ්‍යයි. ඒක දෙන්න ඕනෑ. ඒක අපි ඉල්ලන්න ඕනෑ දෙයක් නොවෙයි. ඒක මේ සමාජය දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
අඩු ගණනේ ඒක දෙන්න බැරි නම්, විපක්ෂයට මන්ත්‍රීවරියන් ගෙනෙන්නත් බැහැ. ඒ බැරිකම අතරේම, අපට අවශ්‍ය ගරුත්වය ලබා දී කටයුතු කරන්න බැරි බවත් ඔවුන් පෙන්වා දීලා තිබෙනවා. ඉතින් මම හිතන විධියට, මෙන්න මේ කාරණා තේරුම් අරගෙන අපි කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා ඉදිරියටත් කටයුතු කරන්න ඕනෑය කියන යෝජනාව කරමින් මගේ කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න වෙලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ක්‍රිෂ්ණන් කලෙයිචෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.18]

**ගරු ක්‍රිෂ්ණන් කලෙයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மார்ச் மாதம் 8ஆம் திகதி கொண்டாடப்படவுள்ள சர்வதேச மகளிர் தினத்தை முன்னிட்டு, தேசிய பொருளாதாரத்துக்கான பெண்களின் ஊழியப் பங்களிப்பை மதிப்பீடு செய்து, சம்பளமற்ற பராமரிப்பு ஊதியத்தை அதனுடன் இணைப்பதற்கான தேசிய பராமரிப்புக் கொள்கை ஒன்றைத் தயாரித்தல் தொடர்பாக மாண்புமிகு சமன்மலீ குணசிங்ஹ அவர்களால் கொண்டுவரப்பட்டுள்ள ஒத்திவைப்புப் பிரேரணையானது காலத்தின் கட்டாயத் தேவையாகும் என்பதே எங்களது கணிப்பீடாக இருக்கின்றது.

இந்தப் பிரேரணை தொடர்பில் கருத்துத் தெரிவிப்பதற்கு முன்னர், ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். சென்ற வாரம் டிக்கோயா ஆதார வைத்தியசாலையில் பாரிய அசம்பாவிதமொன்று நடந்துள்ளதாகக் கூறப்படுகின்றது. இன்றும் அது சம்பந்தமாகப் பேசப்படுகின்றது. அதாவது, அந்த வைத்தியசாலையில் வேலைசெய்யும் ஊழியர்கள் மலையக யுவதி ஒருவரின் சடலத்தைத் தவறாகப் பயன்படுத்தியதாகக் கூறப்படுகின்றது. இந்தச் சம்பவத்தைக் கேள்விப்பட்டது முதல் நான் உட்பட எங்களுடைய சுகாதார அமைச்சர், பிரதி அமைச்சர், மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவர் எனப் பலர் ஒன்றிணைந்து உரிய நடவடிக்கை எடுத்து வருகின்றோம். தற்போது இது தொடர்பில் உரிய தரப்பினருக்கு அறிவிக்கப்பட்டு, விசாரணைகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. எது எவ்வாறு இருப்பினும், மலையகத்தில் இவ்வாறான சம்பவங்கள் தொடர்ச்சியாக நடைபெறுவதையிட்டு என்னுடைய கண்டனத்தை இந்தச் சபையில் தெரிவித்துக் கொள்கின்றேன். விசாரணையின் முடிவில் சம்பந்தப்பட்ட நபர்கள் இந்தக் குற்றச்செயலில் ஈடுபட்டிருப்பது உண்மையெனத் தெரியவந்தால், அவர்களுக்கு எதிராக சுகாதார அமைச்சு பக்கச்சார்பு இன்றி உரிய நடவடிக்கை எடுக்கும் என்பதை நான் இவ்வேளையில் கூற விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் அரச துறையிலும் சரி, தனியார் துறையிலும் சரி, மலையகப் பிரதேசத்திலும் சரி, வெளிநாடுகளிலும் சரி, வேலைசெய்கின்றவர்களில் அரைவாசிப் பேர் பெண்களாகவே இருக்கின்றார்கள். இந்தப் பெண்கள் முகங்கொடுக்கும் பிரச்சினைகள் பல. விசேடமாக, மலையகத்தில் தோட்டப்புறங்களில் - தேயிலைத் தோட்டங்களில் - வேலைசெய்யும் பெண்கள் பாரிய பிரச்சினைகளுக்கு

முகங்கொடுக்கின்றார்கள். அவற்றை ஒவ்வொன்றாக எடுத்துக் கூறுவதற்கு நேரம் போதாது. அவர்கள் சமூக ரீதியாகவும், கலாசார ரீதியாகவும், தொழில் ரீதியாகவும் மிகவும் பின்தள்ளப்பட்ட நிலையிலே வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள்.

மலையக மக்களைப் பிரதிநிதித்துவப்படுத்தும் உறுப்பினர் என்ற வகையில், அங்கு வாழும் பெண்கள் முகங்கொடுக்கும் பிரச்சினைகளை இங்கு ஓரிரு வார்த்தைகளால் கூற முடியாது. சம்பளப் பிரச்சினையாக இருக்கலாம், கலாசாரம் சார்ந்த பிரச்சினையாக இருக்கலாம், தொழில் செய்யும் இடத்தில் எதிர்கொள்ளும் பாலியல் ரீதியான பிரச்சினையாக இருக்கலாம், வீட்டுப் பிரச்சினையாக இருக்கலாம், குழந்தைப் பராமரிப்பு சார்ந்த பிரச்சினையாக இருக்கலாம், இவ்வாறான பிரச்சினைகளால் அதிகமாகப் பாதிக்கப்படுவது மலையகப் பெண்களே!

இன்று மலையகத்தைச் சேர்ந்த அநேகமான பெண்கள் வெளிநாடுகளில் வீட்டுப் பணிப்பெண்களாக வேலை செய்துகொண்டு இருக்கின்றார்கள். அவர்கள் வெளிநாடுகளில் மாத்திரமல்ல, உள்நாட்டிலும் குறிப்பாக, நகர்புறப் பிரதேசங்களில் வீட்டுப் பணிப்பெண்களாக வேலை செய்துகொண்டு இருக்கின்றார்கள். இந்தப் பெண்களின் பிரச்சினைகள் சம்பந்தமாக நாங்கள் தொடர்ச்சியாக இந்தச் சபையிலும் வெளியிலும் பேசிக்கொண்டுதான் இருக்கின்றோம்.

எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் கூறுவதுபோல், தோட்டத் தொழிலாளர்கள் 200 வருட கால வரலாற்றைக் கொண்டிருந்தாலும், அவர்கள் தொழில் செய்யும் இடத்தில் அத்தியாவசியத் தேவைகளைப் பூர்த்திசெய்துகொள்வதற்கு ஒரு மலசலகூடம்கூட கிடையாது. அதுமாத்திரமல்ல, ஓய்வு எடுப்பதற்குரிய வசதியும் கிடையாது. இவ்வாறான நிலைமைதான் அங்கு காணப்படுகின்றது. "வளமான நாடு - அழகான வாழ்க்கை" என்ற எமது கொள்கைப் பிரகடனத்தின் அடிப்படையில், தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள் இந்த மக்களின் பிரச்சினைகள் அனைத்தையும் சரியான முறையில் கண்டறிந்துள்ளோம். அவற்றைத் தீர்க்கும் வகையில், முதற்கட்டமாக மாண்புமிகு சனாதிபதி அவர்களின் தலையீட்டின்மூலம் சென்ற பெப்ருவரி மாதம் 10ஆம் திகதி முதல் அவர்களுக்கு 400 ரூபாய் சம்பள அதிகரிப்பு பெற்றுக்கொடுக்கப்பட்டுள்ளது. அது மாத்திரமல்ல, இந்திய வீட்டுத்திட்டத்தின் மூலம் கிட்டத்தட்ட 10,000 வீடுகளை மலையகப் பிரதேசங்களில் அமைத்துக் கொடுப்பதற்கும் தீர்மானம் எடுக்கப்பட்டுள்ளது. இன்று காலையிலிருந்து இவ்வேளை வரை உரையாற்றிய எமது பெண் பாராளுமன்ற உறுப்பினர்களில் அநேகமானவர்கள், மலையகம் உட்பட நாடு முழுவதிலுமுள்ள பெண்களின் வாழ்க்கையை மேம்படுத்துவதற்கு எமது அரசாங்கம் எவ்வாறான தீர்மானங்களை எடுத்திருக்கின்றது என்பது தொடர்பில் தமது கருத்துகளை முன்வைத்தார்கள்.

அடுத்து, நுவரெலியா மாவட்டத்தில் தோட்டப்புறங்களில் வாழும் எமது மக்களின் பிள்ளைகள் வீதியோரங்களில் வியாபாரம் செய்வதை நாங்கள் பார்க்கின்றோம். இதனை நிறுத்தி, அவர்களும் வளமான வாழ்க்கை வாழ்வதற்கான வேலைத்திட்டங்களை ஏற்படுத்திக் கொடுப்பதே எமது அரசாங்கத்தின் நோக்கமாகும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසානයි.

**ගරු ක්‍රිෂ්ණන් කලෛසෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒரு நிமிடம் தாருங்கள்!

சென்ற அரசாங்கங்கள் நடைமுறைப்படுத்தாத விடயங்களைச் சுட்டிக்காட்டுவதோடு மாத்திரம் நின்றுவிடாமல், எமது மக்களின் குறிப்பாக, பெண்களின் தேவைகளைப் பூர்த்திசெய்வதற்கான சகல வேலைத்திட்டங்களையும் நடைமுறைப்படுத்துவதற்குரிய நடவடிக்கைகளை நாம் முன்னெடுத்துள்ளோம். பிரதானமாக அவர்களுடைய வருமானப் பிரச்சினையைத் தீர்ப்பதற்கான ஆரம்பக்கட்ட நடவடிக்கைகளை மேற்கொண்டுள்ளோம். இந்த நாட்டின் கௌரவ பிரதமர் அவர்கள் ஒரு பெண்மணி! அதேபோல், மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரும் ஒரு பெண்மணி! எனவே, நாங்கள் இந்த நாட்டில் பெண்கள் எதிர்கொள்ளும் பிரச்சினைகளுக்குச் சரியான தீர்வைப் பெற்றுக்கொடுப்பதற்கு முன்வருவோம் எனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.27]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சர்வதேச மகளிர் தின நிகழ்வையொட்டி இன்று கொண்டுவரப்பட்டிருக்கின்ற பெண்கள் சம்பந்தமான இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையின்மீது பேசுவதையிட்டு மகிழ்வுறுகின்றேன். காரணம், எங்களை ஈன்றெடுத்தவர் ஒரு தாய். இந்த நாட்டையும் நாங்கள் 'தாய் நாடு' என்றே வர்ணிக்கின்ற அளவுக்குப் பெண்களை நாங்கள் உயர்ந்த ஓர் அந்தஸ்தில் வைத்துப் பார்க்கின்றோம். அதேபோன்று, எங்களுடைய மார்க்கமும்கூட, "தாயின் பாதத்தின் கீழேதான் சொர்க்கம் இருக்கின்றது" என்று கூறுகின்ற அளவுக்குப் பெண்களுக்குக் கண்ணியத்தை வழங்கியிருக்கின்றது. ஏனைய மதங்களிலும் அவ்வாறே பல விடயங்கள் இருக்கின்றன. மாதா, பிதா, குரு, தெய்வம் என்பதை நாங்கள் பாடசாலைகளிலே கற்றோம். எனவே, எங்கும் தாய்க்கு முன்னுரிமை வழங்குகின்ற விடயங்களே காணப்படுகின்றன. தாயை, பெண்களை, சகோதரிகளை அல்லது எங்களுடைய பெண் பிள்ளைகளை மதிக்க வேண்டும், மரியாதை செய்ய வேண்டும் என்ற விடயத்திலே நாங்கள் யாரும் இங்கே அதனை எதிர்க்கவுமில்லை, அதற்கு விரோதமாகச் செயற்படவுமில்லை.

அவ்வாறான ஒரு சூழ்நிலையிலே, இன்று மத்திய கிழக்கு நாடுகள் யுத்த களமாக்கப்பட்டு உள்ளதுடன், ஈரானில் பெண்கள் கல்வி கற்கின்ற ஒரு பாடசாலையை மையமாக வைத்து ஒரு தாக்குதல் நடாத்தப்பட்டிருக்கின்றது. இதற்கு முன்பு இஸ்ரேல் பாலஸ்தீனத்தில் நடத்திய யுத்தத்திலும் குறிப்பாகக் குழந்தைகளை மையமாக வைத்துத்தான் தாக்குதல்களை மேற்கொண்டது. இவ்வாறான தாக்குதலின்

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

பின்பு, "தவறுதலாக இலக்குத் தெரியாமல் நடந்து விட்டது" என்று கூறி அவர்கள் தப்பித்துக் கொள்கின்ற ஒரு விடயத்தை நாங்கள் பார்க்கின்றோம். ஆனால், இன்று சர்வதேசச் சட்டங்களை மீறி, ஒரு நாட்டினுடைய தலைவரை மிகத் துல்லியமாக இலக்குவைத்துப் படுகொலை செய்திருக்கின்றார்கள். அவ்வாறு துல்லியமாக இலக்கு வைத்துத் தாக்குதலை நடத்துகின்ற இந்த வல்லரசுகள், அது குழந்தைகள் கல்வி கற்கின்ற இடம் என்று தெரியாமலா அக்குழந்தைகளைக் கொன்றிருக்கிறார்கள் என்பதைக் குறிப்பாக இங்கே ஆளும் தரப்பிலுள்ள பெண்கள் கவனத்தில் எடுக்க வேண்டும். இன்று நீங்கள் கொண்டுவந்திருக்கின்ற ஒத்திவைப்புவேளைப் பிரேரணையின் மிக முக்கியமான பாத்திரம் பெண்கள்! அது தொடர்பாகப் பலர் பேசினீர்கள். தற்போதைய யுத்தத்தில் பெண் குழந்தைகள் படுகொலை செய்யப்பட்டு இருக்கின்றார்கள்; அவர்களுடைய பெற்றோர் பரிதவிக்கின்றார்கள்; அவர்கள் அழுது கண்ணீர் வடிக்கின்றார்கள். எனவே, இந்த விடயத்தையும் கவனத்திற்கொண்டு, இதற்கு எதிரான ஒரு கண்டனத்தை இந்த அவையிலே நீங்கள் தெரிவிக்க வேண்டும் என்று இச்சந்தர்ப்பத்திலே நான் கேட்டுக் கொள்கின்றேன்.

ஈரான் நாடு எமது நாட்டின் கடந்த அரசாங்கங்களோடு மிக நெருக்கமான உறவைக் கொண்டிருந்ததுடன், இந்த நாட்டினுடைய பல தேவைகளுக்குத் தம்மால் முடியுமான பல உதவிகளையும் செய்திருக்கின்ற வரலாற்றுத் தடயங்கள் இருக்கின்றன. மிக அண்மையிலேதான் இலங்கைக்கு உமா ஓயா பல்நோக்கு அபிவிருத்தித் திட்டத்தின் மூலமாக விவசாயிகளுக்கான பாரிய நீர்ப்பாசன வசதி மற்றும் மின்சார உற்பத்தி ஆகியவற்றுக்கான நிதியையும் அந்த நாடு வழங்கியிருந்ததை நாங்கள் எல்லோரும் அறிவோம். அவ்வாறு அளவிட முடியாத பல உதவிகளைச் செய்த அந்த நாடு கடந்த அரசாங்கங்களோடு இணைந்து இந்த நாட்டினுடைய இறைமையைப் பாதுகாப்பதற்கு உதவியிருக்கின்றது; அதை யாரும் மறுத்துவிட முடியாது. அவ்வாறான உதவிகளைப் பெற்றுக்கொண்ட எமது நாட்டின் சார்பில் இன்று அந்நாட்டவர்களுக்கு ஓர் ஆறுதல் வார்த்தையைக்கூட கூற முடியாத அளவிலே சர்வதேச நாடுகளுடைய பிடியின் இறுக்கம் உங்களை அடிமைப்படுத்தி இருக்கின்றது.

"இந்த நாட்டிலே சமத்துவம், சோசலிசத்தைப் பின்பற்றி, நாட்டிலே இருக்கின்ற ஏனைய இன மக்களிடத்திலே இனப் பாகுபாடு இல்லாமல் நடந்துகொள்வோம்" என்று நீங்கள் கூறியதன் அடிப்படையிலே, இன்று ஈரானின் உச்ச தலைவர் ஆயதுல்லா அலி கமேனியை அந்த நாட்டவர்கள் எவ்வாறு தலைவர் என்று ஏற்றுக் கொள்கிறார்களோ, அவருக்கு உரிய அந்தஸ்தை - மரியாதையை - வழங்குகின்றார்களோ அதுபோன்று இந்த நாட்டினுடைய மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்கவை அவ்வாறு பார்க்கின்ற பல இலட்சக்கணக்கான முஸ்லிம் மக்களுக்கு, அவரை ஏற்றுக்கொண்டால், இந்த நாட்டுக்கு அவர் தலைவராக வந்தால் எல்லோரையும் சமமாக நடத்துவார் என்று எண்ணி வாக்களித்த மக்களுக்கு நீங்கள் எதைச் சொல்லப் போகின்றீர்கள்? இன்று எமது கடற்பரப்பிலே பல அநியாயங்கள் நடந்திருக்கின்றன. அதைத் தட்டிக் கேட்பதற்கு உங்களால் முடியாமல் இருக்கின்றது.

இவ்வாறான ஒரு சூழ்நிலையிலே கிழக்கிலே வாழ்கின்ற பெரும்பாலான மக்கள் மாத்திரம் அல்ல, இந்த நாட்டிலே இருக்கின்ற அதிகூடிய மக்களும் உங்களுடைய வாக்குறுதிகளை நம்பி இந்த NPP அரசாங்கத்துக்கு வாக்களித்திருக்கின்றார்கள். ஆனால், அதற்கு மாற்றமான முறையிலே நீங்கள் நடந்து கொள்கின்றீர்கள் என்பதற்கு, இந்த வாரம் நடந்து கொண்டிருக்கின்ற யுத்தத்தின்போதான, இன்று கொண்டுவந்திருக்கின்ற இந்த மகளிர் சம்பந்தமான விவாதத்தின்போதான உங்கள் நடவடிக்கைகள் சான்றுகளாக இருக்கின்றன. ஆளுந்தரப்பில் இருக்கின்ற யாரேனும் அதற்கு எதிரான கண்டனத்தைத் தெரிவிக்கவில்லை. ஏனைய சர்வதேச நாடுகளுக்குப் பயந்துகொண்டு அந்த நாடுகளின் பிரச்சினைகள் தொடர்பாக அணுகுவதை நாங்கள் பார்க்கின்றோம். ஆனால், ஐக்கிய அரபு நாடுகளின் மீதான தாக்குதல்களுக்கு எதிராக நீங்கள் அனுதாபங்களைக் கூறுகின்றீர்கள்; அவையும் முஸ்லிம் நாடுகள்தான் என்ற அடிப்படையில் நாங்கள் அதற்காக நன்றி கூறுகின்றோம்.

பெண்கள் சம்பந்தமாக இன்று பல விடயங்களை நீங்கள் பேசினீர்கள். உங்களுடைய அரச தரப்பிலே பிரதம அமைச்சர் மற்றும் மகளிர், சிறுவர் அலுவல்கள் அமைச்சுப் பதவிகளைப் பெண்களுக்குக் கொடுத்திருக்கின்றீர்கள்; பெண்கள் தொடர்பாகப் பல அமைப்புகளை ஏற்பாடு செய்திருக்கின்றீர்கள்; நாங்கள் அதை ஏற்றுக் கொள்கின்றோம்; அதை வரவேற்கின்றோம். அதேபோன்று, பிரதேச சபைகள் மூலமாகப் பல பெண்கள் இன்று மக்களுடைய பணிக்காக வந்திருக்கின்றார்கள். அவர்களில் நேரடியாக வெற்றி பெற்றவர்களும் இருக்கின்றார்கள்; வட்டார ரீதியாக bonus ஆசனங்கள் மூலமாக வந்தவர்களும் இருக்கின்றார்கள். முஸ்லிம்கள் சார்ந்த பிரதேசங்களிலே முஸ்லிம் பெண்களினுடைய பிரதிநிதித்துவம் என்பது மிகக் கடினமான ஒரு விடயம். அதாவது, முஸ்லிம் பெண்களை அரசியலுக்குள் கொண்டுவருவதென்பது கடினமான ஒரு விடயம். அவ்வாறிருக்கையில், இதை எல்லாம் தாண்டி வந்திருக்கின்ற அந்தப் பெண்கள் சம்பந்தமான நிதி ஒதுக்கீடுகள் மற்றும் ஏனைய விடயங்கள் கடந்த கால அரசாங்கங்களிலே மாகாண சபை மூலமாக ஏற்பாடு செய்யப்பட்டிருந்தது. பெண்களுக்கு நடந்தேறுகின்ற பாலியல் சம்பந்தமான பிரச்சினைகள் மற்றும் பாடசாலைகளில் நடைபெறுகின்ற பிரச்சினைகள் போன்ற பெண்கள் சம்பந்தமான பிரச்சினைகளைத் தீர்ப்பது சம்பந்தமாக இந்த அரசாங்கம் அவர்களுடைய குடும்பங்களை நாடிச் சென்று எதனையும் செய்வதாக இன்று வரைக்கும் நான் அறியவில்லை. அண்மையிலே, 'பிரஜா சக்தி'" திட்டத்திற்காக எங்களுடைய பிரதேசத்தைச் சார்ந்து தெரிவுசெய்யப்பட்ட அத்தனைபேரும் ஆண்களாக இருக்கின்றார்கள்; அந்தத் திட்டத்திற்குள் பெண்கள் எவரும் உள்வாங்கப்படவில்லை. ஏன் நீங்கள் அந்த விடயத்திலே கவனம் செலுத்தவில்லை? என்று கேட்கின்றோம். குறிப்பாக, பெண்களை மையமாக வைத்து, வீடுகளுக்குச் சென்று அவர்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கான சந்தர்ப்பங்களை இனிவரும் காலங்களிலே ஏற்பாடு செய்யவேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

மத்திய கிழக்கு நாடுகளிலே நடைபெறுகின்ற பிரச்சினை இந்த நாட்டுக்கும் ஏனைய சமூகம் சார்ந்த எல்லோருக்குமானதாக இருக்கின்றது. இதிலே நீங்கள் நீதியாக, நிதானமாக நடந்துகொள்ள வேண்டும் என்று இந்தச் சந்தர்ப்பத்திலே கேட்டு, இன, மத ரீதியான பாகுபாடுகளுக்கு அப்பால் சர்வதேச ரீதியாக எல்லா நாட்டு மக்களும் ஓரினம் என்ற அடிப்படையிலும் அந்த நாடுகள் கடந்த காலத்திலே செய்த பல உதவிகளையும் கவனத்திற்கொண்டு நடந்துகொள்ளுமாறு கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.36]

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ, ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය විසින් කාන්තාවන් වෙනුවෙන් "ජාතික සුරකුම් ප්‍රතිපත්තියක්" සකස් කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මම හිතන විදියට ඉතිහාසයේ පළමුවැනි වතාවට අද වෙන්න ඇති, මෙච්චර මන්ත්‍රීවරියන් ප්‍රමාණයක් කාන්තාවන් වෙනුවෙන් කථා කළේ. අද පාර්ලිමේන්තුවේ සිටින සියලු මන්ත්‍රීවරියන්ට කථා කරන්න අවස්ථාව ලැබුණා.

එදා අපේ දේශපාලන ව්‍යාපාරය වෙනුවෙන් තනිව හඬ නඟපු ඒ ගැහැනිය අද මේ රටේ දෙවැනි පුරවැසියා ලෙස, අග්‍රාමාත්‍යතුමිය ලෙස කටයුතු කරනවා. අද ඇයත් සමඟ තව කාන්තාවන් 19 දෙනෙක් මෙතැන සිටිනවා. අපි ඔක්කොම 20දෙනෙක් ඉන්නවා. මේ කාන්තාවන් ටික මේ පාර්ලිමේන්තුවට පත් කරලා එවලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය සභා නියෝජනය කරමින් මන්ත්‍රීවරියන් 683ක් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. ප්‍රජා ශක්ති කමිටුවල කාන්තාවන් ඉන්නවා. කාන්තා සභාවල කාන්තාවන් ඉන්නවා. කාන්තාවන් විශාල ප්‍රමාණයක් මේ දැවැන්ත දේශපාලන පරිවර්තනය උදෙසා එක මිටට එකතු වුණා විතරක් නොවෙයි, ඒ සියලුදෙනා දැන් මේ රටේ සක්‍රිය දේශපාලනයේ සවිඥානක ලෙස වැඩ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රටක් විදියට, මානව සමාජයක් විදියට ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් සංස්කෘතික වශයෙන් බිඳ වැටුණු රටක්. විපක්ෂ නායකතුමාගේ කථාව ඇතුළේ එතුමා අපේ බිඳ වැටීම ගැන කිව්වා. එතුමා කියපු ඒ බිඳ වැටීම අපි බලයට පත් වෙන්න ඉස්සෙල්ලා තිබුණු තත්ත්වය. ඇත්තටම එතුමාගේ කථාව නිසා මට නැවත වතාවක් අතීතයට යන්න සිද්ධ වුණා. ආර්ථිකය කඩා වැටෙනකොට, සමාජ සංස්කෘතිය බිඳ වැටෙනකොට, විෂ මත්ද්‍රව්‍ය පවුල් වෙළා ගන්නකොට ඒ බෙදවාචකය අත්වින්දේ ගෙවල්වල හිටපු ගැහැනු. දරුවන්ට තුන් වේල කන්න දෙන්න විදියක් නැතිව ඒ අම්මලා වේලක් දෙකක් බඩගින්නේ ඉඳලා දරුවන්ට කන්න දුන්නා අපට මතකයි. දරුවන් මන්දපෝෂණයෙන් පෙළෙනකොට පෝෂ්‍යදායි ආහාර වේලක් දෙන්න විදියක් නැතිව අම්මලා කොච්චර කඳුළු හෙළන්න ඇතිද? 2024 මාර්තු මාසයේ 27වැනි දා "මව්බිම" පුවත් පත වාර්තා කර තිබෙනවා, මේ රට දරුවෝ 30,000ක් හිඟමන් යදින රටක් කියලා. පාසල්වල assembliesවලදී දරුවන් ක්ලාන්ත වෙලා වැටුණා. දෙමවුපියන්, ගුරුවරුන් බත් බැංකු පටන් ගත්තා. එතුමා කියපු කාරණාව හරි, ඒ මොහොතේ. නමුත් අද පාසල් දරුවන්ට අවශ්‍ය පෝෂ්‍යදායි ආහාර වේලක් ලබා දෙන්න අපි සමත් වෙලා තිබෙනවා. ඔවුන්ට අවශ්‍ය පාසල් උපකරණ, සපත්තු ඇතුළු ඒ පහසුකම් ලබා දීම තුළින් දෙමවුපියන් ඒ වෙනුවෙන් දැරිය යුතු වැය බර අඩු කරන්න අපි ආණ්ඩුවක් විදියට සමත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. එතුමා කිව්වා, පෙර පාසල් දරුවන් මන්දපෝෂණයෙන් පෙළෙන ප්‍රමාණය ගැන. දරුවන්ගෙන් පහෙන් එකක් මන්දපෝෂණයෙන් පෙළුණු රටක් මේක. අපි පෙර පාසල් දරුවන්ට අවශ්‍ය පෝෂ්‍යදායි ආහාර වේලක් ලබා දීලා අද වනවිට මන්දපෝෂණය වර්ධනය නොකර මර්දනය කරන්න හැකියාව ලැබිලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ප්‍රථම වරට පාසල් යන ගැහැනු දරුවන්ට ප්‍රමිතියෙන් යුතු සනීපාරක්ෂක තුවා ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. ලැලි ගෙවල්වල, මැටි ගෙවල්වල, ඉටි කොළ ගෙවල්වල ජීවත් වෙන දරුවන්ට, දෙමවුපියන්ට නිවසක් ලබා දෙන්න අපි කටයුතු කරනවා. හිසට සෙවණක් නැහැ කියන්නේ මිනිහෙකුට තිබෙන ලොකුම ගැටලුවක්. මට මේ වෙලාවේදී මතක් වෙනවා, මම මිල්ලනිය ප්‍රදේශයේ නයනා කුමාරි කියන කාන්තාවගේ ගෙදරට මුල්ගල තියන්න ගිය අවස්ථාව. ඇය අවුරුදු 9ක් කූඩාරමක ජීවත් වෙලා තිබුණා. වැඩිවියට පැමිනුණු ගැහැනු දරුවන් තුන් දෙනෙක් එක්ක තමයි ඇය ඒ නිවසේ ජීවත් වුණේ. අපට හිතා ගන්නත් බැහැ, ඇය අවුරුදු 9ක් ඒ කූඩාරම ඇතුළේ ජීවත් වුණේ කොහොමද කියලා. ඒ නිවස තනලා ඔවුන්ට නිවසේ යතුර භාර දෙනකොට ඇස් දිලිසි දිලිසි තමයි ඒක භාර ගත්තේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි ආර්ථික අපහසුතාවලින් පෙළෙන, හිසට නිවසක් නැතුව විවිධාකාරයේ ගැටලුවලින් පීඩා විඳින ගැහැනු ජීවත් වුණු රටක් මේක. එතුමා කියපු කාරණාව හරි. එතුමන්ලා බලයේ හිටපු කාලයේ -මේ විපක්ෂය බලයේ හිටපු කාලයේ- ගොඩනඟපු රට ගැන තමයි එතුමා ඒ ප්‍රකාශ කළේ. අද අපි මේ ජනතාවට අවශ්‍ය සියලු ආකාරයේ පහසුකම් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. මෙවර නිවාස 51,000ක් ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඔවුන්ගේ හිසට තිබෙන ලොකුම බර තමයි අපි මේ නිදහස් කරන්නේ.

ඒ විතරක් නොවෙයි, රෑ නිදා ගෙන උදේ නැඟිටිනකොට බඩු මිල කොච්චර වැඩි වෙලා තිබේවිද කියන භයෙන් තමයි එදා මිනිස්සු නිදා ගත්තේ. නමුත්, අද එවැනි තත්ත්වයක් දකින්නට නැහැ. රාජ්‍ය අංශයේ වැටුප විතරක් නොවෙයි, පෞද්ගලික අංශයේ අවම වැටුප පවා වර්ධනය කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. ETF, EPF, gratuity, over-time මේ ආදී සියලු දීමනාවල rates ඒකත් එක්ක වැඩි වෙනවා. ණයක් නැතුව තුන් වේල කාලා ඇඳලා ඉන්න පුළුවන් ආර්ථිකයක් නිර්මාණය කරන්න වසරක් ගත වුණු තැන අපට හැකියාව ලැබී තිබෙනවා. මහා භාණ්ඩාගාරය පුරවන්නේ ඇයි කියලා විපක්ෂය ප්‍රශ්න කරන තරමට අපි ඉතා හොඳ මූල්‍ය විනයක් සහිතව මේ වනවිට ආර්ථිකය වර්ධනය කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, 2025 වසර තුළදී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ සුවිශේෂී ජයග්‍රහණ අපි අත්පත් කරගෙන තිබෙනවා. ඉතිහාසයේ ඉහළම අපනයන අගය ලෙස ඇමෙරිකානු ඩොලර් බිලියන 17.3ක සමස්ත අපනයන ආදායමක් අපි ලබා ගෙන තිබෙනවා. ඒක 2030 අවුරුද්ද වනකොට ඩොලර් බිලියන 36ක් දක්වා වර්ධනය කරන්න නිශ්චිතයි. පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ සියයට 42ක වර්ධනයක් තිබෙනවා. අපනයන කර්මාන්ත ක්ෂේත්‍රයේ සියයට 24ක කැපී පෙනෙන වර්ධනයකුත්, ඇඟලුම් අපනයන ක්ෂේත්‍රයේ සියයට 5ක වර්ධනයකුත් ලබා තිබෙනවා. මේ සියල්ලේම නිරත වන කාන්තාවන් බොහොමයක් ඉන්නවා.

අපි මේ අවුරුද්දේ ජූනි මාසයේ වසර 14කට පසු Sri Lanka Expo 2026, International Trade Exhibition පවත්වන්න නියමිතයි. එම වෙළෙඳ ප්‍රදර්ශනයට ජාත්‍යන්තර ගැනුම්කරුවන් සහ ආයෝජකයන් 1,500ක පමණ ප්‍රමාණයක් සහභාගි වෙන්න නියමිතයි. වෙළෙඳ පොළ අවකාශය මේ තුළින් නිර්මාණය වෙනවා. ඒ වාගේම ව්‍යවසායකත්ව උන්මාදයක් අපි මේ වනවිට රට තුළ ඇති කරලා තිබෙනවා.

[ගරු ඔෂානි උමංගා මහත්මිය]

අපි පසුගිය කාලයේ ගම්වලට ගිහිල්ලා ඒ කාන්තාවන් සමඟ සාකච්ඡා පැවැත්වූවා. ඒ හැම මොහොතකදීම ඔවුන් ව්‍යාපෘතියක් අරගෙන ඇවිල්ලා තමයි අපිත් එක්ක කථා කළේ. තමන්ගේ ගමේ තිබෙන සම්පත් මොනවාද කියලා හඳුනා ගෙන ඒකට අදාළව ව්‍යාපෘති සකස් කරලා, ඔවුන් මේ ආර්ථිකයට දායක වෙන්න කටයුතු කරමින් සිටිනවා. අද වනකොට ගැහැනුන්ට හයියක් ඇවිල්ලා තිබෙනවා, තමන්ගේ ගෙදර තිබෙන වැඩකටයුතුවලට එහා ගිහිල්ලා මේ රටේ ආර්ථිකයට දායකත්වය සපයන්න ඕනෑ කියලා.

මැක්සිම් ගෝර්කිගේ "අම්මා" නම් කෘතියේ තිබෙනවා, "ලොව සියලු දෑ නිර්මාණය වී තිබෙන්නේ මවගේ කිරි හා හිරුගේ රශ්මියෙනි" කියලා. ඇය සඵලත්වයේ සංකේතයයි. ඇය නිෂ්පාදනයේ සංකේතයයි. ඇය ශක්තිමත් ගැහැනියක්. ඇයට අවශ්‍ය වෙලා තිබුණේ රට තුළ වැඩ කරන්න අවස්ථා. හැබැයි, මුල් අවස්ථාවේදී විපක්ෂය කිව්වා වාගේ කාන්තාවන්ට එළියට එන්න තිබුණු අවස්ථාව ඉතිහාසය පුරාම මැඩ පවත්වා තිබෙනවා. නමුත්, අද ඉතාම ගෞරවනීය ලෙස කාන්තාවන් වේගයෙන් ඉදිරියට ඇවිල්ලා ආර්ථික වශයෙන් පමණක් නොවෙයි, සමාජ සංවර්ධනය උදෙසා සහ දේශපාලන සංවර්ධනය උදෙසාත් වැඩකටයුතු කරමින් සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.45]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය විසින් ජාත්‍යන්තර කාන්තා දිනය නිමිති කරගෙන අද ඉදිරිපත් කර තිබෙන සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවට අදාළව ලංකාවේ කාන්තාවන් පිළිබඳව කරුණු රාශියක් සාකච්ඡා කළා. මේ අවස්ථාවේදී මමත් ඒ සම්බන්ධ කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාන්තාවන් සහ පිරිමින් ලෙස ගත්තාම, ජීව විද්‍යාත්මකව තිබෙන වෙනසකම් හැරුණාම මේ දෙපිරිසම අනෙක් සෑම දෙයකින්ම වාගේ ලෝකය තුළ විශාල වගකීමක් පැවරී තිබෙන, විශාල කාර්යභාරයක් ඉෂ්ට කරන්න පුළුවන් කණ්ඩායමක් බව අපි කවුරුත් දන්නවා. නමුත් සමාජය සහ ආර්ථිකය සකස් කරලා තිබෙන විධියත් එක්ක ගත්තාම, අපි දන්නවා, පොදුවේ වැඩිපුරම සාමාන්‍ය කාන්තාවන්ට -හරියටම කිව්වොත් වැඩ කරන පන්තියේ සමාජ කණ්ඩායම නියෝජනය කරන කාන්තාවන්ට- ඒගොල්ලන්ගේ ඇත්ත හැකියාව තුළින් ආර්ථිකයට, දේශපාලනයට මෙන්ම සමාජයට අදාළ දේවල් සිදු කරලා, සමාජය සහ ලෝකය මීට වඩා මිනිසුන්ට, සොබාදහමට ගැළපෙන හොඳ තැනක් කිරීම වෙනුවෙන් ලබා දෙන්න තිබෙන දායකත්වය දෙන්න බැරි වන විධියට අපේ සමාජය, ආර්ථිකය, ආයතන, ආකල්ප විශාල වශයෙන් සකස් වෙලා තිබෙනවාය කියන එක. ලංකාවේ විතරක් නොවෙයි, ලෝකයේ තත්ත්වයත් එහෙමයි. ලංකාව පැත්තෙන් ගත්තාම, මේ යෝජනාවේ සඳහන්ව තිබෙන ආර්ථික දායකත්වය එසේ තිබියදීම පවා මේ රට මීට වඩා ශක්තිමත්ව ගොඩනඟන්න කාන්තාවන්ගේ දායකත්වය ගන්න බැරි වන විධියේ සමාජ, දේශපාලන සහ ආර්ථික ව්‍යුහයක් තමයි තිබෙන්නේ. එසේ තිබියදීත් තමයි කාන්තාවන් දැන් ආර්ථිකයට සුවිශාල දායකත්වයක් දක්වන්නේ.

විදේශ විනිමය වැඩියෙන්ම ලැබෙන්නේ කාන්තාවන්ගෙන් කියන එක අපි අවුරුදු 25ක්, 30ක් තිස්සේ කියන, දකින දෙයක්. නමුත්, සමාජය සකස් වෙලා තිබෙන විධියත් එක්ක, ආර්ථික කොන්දේසි සකස් වෙලා තිබෙන විධියත් එක්ක සාමාන්‍යයෙන් වරප්‍රසාදිත පවුල්වලින් එන සුළු පිරිසකට හැරුණාම අනෙක් අතිබහුතරයක් වන සාමාන්‍ය පන්තියේ කාන්තාවන්ට සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? ඔවුන් කොතරම් ඉගෙන ගත්තත්, දක්ෂ වුණත්, කැපවීමක් කරන්න පුළුවන්, දරා ගැනීමක් සහිත අය වුණත්, තමන්ගේ මට්ටමේ සිටින වෙනත් පිරිමියෙකුට වඩා කරුණු කාරණා කොතරම් තේරුම් ගත්තත්, නරක දේ හොඳ දෙයක් කරන්න, වෙනස් කරන්න යනකොට ඒකට බාධා වන විධියේ තත්ත්වයක් තමයි අපේ රටේත්, ලෝකය පුරාමත් තිබෙන්නේ. එයින් එකක් ගැන තමයි වැඩිපුර මේ යෝජනාවේ සඳහන් කර තිබෙන්නේ. හැම වෙලාවේදීම ගෙදර වැඩ කියන බර බද්ද, කාන්තාවගේ කකුලේ ගැට ගහලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ වැඩ කරන නිලධාරිනියලා වුණත් එහෙමයි. එතුමියන්ලා මේ සභාවේ කථා කරන මන්ත්‍රීවරුන්ගේ කථා ලියනවා, record කරනවා, වාර්තා හදනවා; රෑ 7.00ට, 8.00ට ගෙදර යනවා. ගෙදර ගියාට පසුව ඔවුන්ට වැඩ ගොඩක් කරන්න තිබෙනවා. ඒ වාගේ ගැහැනියකගේ අධ්‍යාපනය, විවේකය, විනෝදය සහ වෘත්තීය අනාගතය කියන ඔක්කෝම ගෙදර තිබෙන වැඩ කන්දරාවට යට වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මහාචාර්යවරයෙක්. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ සියයට 75ක්ම ගැහැනු ළමයි තමයි ඉගෙන ගන්නේ. ඒක, නිදහස් අධ්‍යාපනයෙන් අපේ රටට ලැබුණු ලොකු ජයග්‍රහණයක්. ඊට පසුව ආචාර්යවරු විධියට පත් වනකොටත් මම හිතන විධියට සාමාන්‍යයෙන් 40: 40 වාගේ gender balance එකක් තිබෙනවා. නමුත් අපි දන්නවා, Deansලා වනකොට, Department Headsලා වනකොට ඒ තත්ත්වය පැහැදිලිවම වෙනස් වන බව. *[බාධා කිරීමක්]* උපකුලපතිවරුත් අඩුයි කියලා අගමැතිතුමිය කියනවා. විධායක තනතුරුවලට යනකොට කාන්තා නියෝජනය අඩුයි. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තොත් දොස්තරවරියන් වැඩියි. නමුත්, රෝහල් අධ්‍යක්ෂ තනතුර බැලුවාම ගැහැනු අය අඩුයි. ඒක මේ පාර්ලිමේන්තුවේ වුණත් එහෙම තමයි. හැම තැනම එහෙම තමයි. ඒකට හේතුව ගැහැනියගේ අදක්ෂතාව නොවෙයි. ගැහැනියට සමාජය විසින් විශාල ගලක් පටවා තිබෙනවා. ඒ ගලත් කකුලේ ගැටගහගෙන තමයි ඇය අතිවිශාල දුරක් යන්නේ. අසාධාරණ ක්‍රමවලින් නොවෙයි, ඇත්තටම යම්කිසි සාධාරණ ක්‍රමවලින් ඉදිරියට ආවාට පස්සේ ඒක ගැහැනු ද, පිරිමි ද, වෙනත් ද කියලා අදාළ නැහැ. නමුත්, සාධාරණ සාමාන්‍ය ක්‍රමවලින් යම්කිසි කාන්තාවක් ව්‍යාපාරික ක්ෂේත්‍රයෙන් හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් හෝ නීති ක්ෂේත්‍රයෙන් හෝ ග්‍රාමීය මට්ටමින් හෝ දේශපාලනයෙන් හෝ ඉස්සරහට ආවාම අපි දැනගන්න ඕනෑකම තිබෙනවා, ඒ ජයග්‍රහණය පිටුපස නොකියපු, නොදැකපු දහසක් දේවල් කරලා, පිරිමියෙකුට කිසිජේත්ම කවදාවත්ම අදාළ නොවන මහා පරිමාණ කඩුලු සියයක් විතර පැනලා තමයි එතැන ඉන්නේ කියලා. මම හිතන විධියට ඒක තමයි වැදගත්ම දේ.

ඇත්තටම මම ආර්ථිකය ගැන ගොඩක් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ, මේ මාතෘකාව තුළ ගොඩක් අය ඒ ගැන කථා කරලා තිබෙන නිසා.

ගැහැනියක් යම්කිසි ක්ෂේත්‍රයක සාමාන්‍ය සාධාරණ ක්‍රමවලින් ඉදිරියට ආවාය කියන එකේ නොකියූ කථා ටොන් ගණනක් තිබෙනවා. අපි මීටර් 100 රේස් එකක් ගැන බැලුවොත්, පිරිමියා තරගය ආරම්භ කරන්නේ ගැහැනිය තරගය ආරම්භ කරන තැනට මීටර් 50ක් විතර ඉස්සරහින් වාගේයි. පිරිමියා ඓතිහාසික වශයෙන්, සමාජයීය වශයෙන්, දේශපාලන වශයෙන්, ආර්ථික වශයෙන් ඒ විධියට උස්සලා තිබෙන්නේ. ඒ නිසා තමයි මම මේ පාර්ලිමේන්තුවේ ගිය සැරේ කාන්තා දිනය ආසන්නයේ කරපු කථාවකදී මේ මන්ත්‍රිවරියන් 22 ගැනම කථා කළේ. මම කිව්වා, මේගොල්ලන් ඔක්කෝම "හයිපතියෝ" කියලා. මම ඒ කථාව කිව්වේ හයිපතියා කියන ග්‍රීක විද්‍යාඥවරිය, ගණිතඥවරිය සම්බන්ධ කරලා. එතුමිය ඝාතනය කරනවා, එතුමියගේ නිර්මාණ නිසා. මම කිව්වා, මේ ඉන්නේ හයිපතියා වාගේ වැදගත් වටිනා අය, එම නිසා මේ අය පරිස්සම් කරන්න ඕනෑ, ආරක්ෂා කරන්න ඕනෑ කියලා. මේගොල්ලන් අපට වඩා අතිදක්ෂයි. මන්ත්‍රීවරුන් වශයෙන් අපිත් අවංකව තේරුම් ගන්න ඕනෑ, මේගොල්ලන් අතිදක්ෂ බව. නායකත්වය ඇතුළු හැම දෙයටම අපට වඩා මේ අය අතිදක්ෂයි. එහෙම නොවුණා නම් මේ අයට මෙතැනට එන්න බැහැ. මම ඉල්ලපු දේ තමයි, හයිපතියාට කරපු දේ මේ අයට කරන්න එපා කියන එක. මොකද, මේ මන්ත්‍රීවරියන් 22 දිහා බලාගෙන තව දහස් ගණනක් ඉන්නවා.

අපි පළාත් පාලන මැතිවරණය ගත්තොත්, අපේ ජාතික ජන බලවේගයෙන් විතරක් මට මතක හැටියට මන්ත්‍රීතුමියලා හයසියඅසූ ගණනක් පත් වෙලා ඉන්නවා. මට මතක විධියට, එතැන හාරසිය ගණනක් කොට්ඨාස - wards - දිනලා ආපු අය ඉන්නේ. පාර්ලිමේන්තුව ගත්තොත්, මේ ඉන්න විසිදෙදෙනාගෙන් විවිධ ක්ෂේත්‍රවල දේශපාලන වගකීම් දරපු අය ඉන්නවා. ඡන්දය ඉල්ලා දිනපු අය තමයි මෙතැන ගොඩක් ඉන්නේ. මම හිතන විධියට, ජාතික ලැයිස්තුවෙන් පත් වෙලා ඉන්නේ එක්කෙනෙක් හෝ දෙදෙනෙක්. ඒ අය ජාතික ලැයිස්තුවෙන් ඇවිල්ලා ඉන්නේත් දක්ෂතා මත. එහෙම නැතිව නිකම් ආපු අය නොවෙයි. ඒ නිසා අපට කරන්න තිබෙන දේ මේකයි. කාන්තාවන්ට පොදුවේ ඉදිරියට එන්න තිබෙන බාධා මොනවාද කියන එක පරිපාලන වශයෙන්, ආයතනික වශයෙන්, ආකල්පමය වශයෙන් හඳුනා ගැනීම තමයි මම හිතන විධියට රටකට වැදගත් වන්නේ. ඒ කියන්නේ, කාන්තාවන්ට ආර්ථික වශයෙන් නැඟී සිටීම සඳහා අඩු පොලී ණය දෙන එක, කාන්තා ව්‍යවසායකත්වය ගොඩ නඟන්න මහන්සි වෙන එක.

අද එක්සත් ජනපදයේ ප්‍රහාර නිසා, මැද පෙරදිග ඇති වෙලා තිබෙන යුද්ධය නිසා අසරණ වෙලා ඉන්න කාන්තාවන්ගේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒ, ලංකාවේ අයට පමණක් නොවෙයි, ලෝකයේම අයට. ඒවා ගැන අපි විශේෂයෙන්ම මැදිහත් වෙන්න ඕනෑ. මොකද, කාන්තාව අසරණ වෙන්නේ කාන්තාවගේ මොකක් හෝ විශේෂ දුර්වලතාවක් නිසා නොවෙයි. ලෝකය ඇතුළේ පවතින පීඩාකාරී තත්ත්වයක් නිසා තමයි කාන්තාව අසරණ වෙන්නේ. එහෙම නැතිව කාන්තාවකට තිබෙන මොකක් හරි අමුතු දුර්වලතාවක්, දුර්වල ශරීරයක් නිසා නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
විනාඩි 13ක් තිබෙනවා කියලා හිතාගෙනයි මම කථාව පටන් ගත්තේ. දැන් කාලය අඩු වෙලා නේ තිබෙන්නේ. හොඳයි, මම ඉක්මනින්ම මගේ කථාව වෙනස් කරන්නම්.

මම කියන්න හදන්නේ මේකයි. ගැහැනිය අසරණ වන නිසා අපි උදව් කරනවා නොවෙයි. ලෝක සමාජය හදලා තිබෙන විධිය නිසා සහ අපේ රටේ සමාජය හැදිලා තිබෙන විධිය නිසා තමයි එහෙම වෙන්නේ. මට විනාඩි 13ක කාලයක් තිබෙනවා කියලායි මම හිතාගෙන සිටියේ. නමුත් කාලය ප්‍රමාණවත් නැති නිසා මගේ කථාව වෙනස් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම මතු කරපු කාරණය මෙයයි. අපි යම් යම් ප්‍රතිසංස්කරණ කළාට, යම් යම් උදවු පදවු කළාට ප්‍රධානම දේ තමයි, ඉදිරියට ඇවිල්ලා ඉන්න අය රැකබලා ගන්නේ කොහොමද කියන එක. විශේෂයෙන්ම ඉදිරියට ඇවිල්ලා ඉන්න අය තවත් ශක්තිමත් කරන්නේ, ධෛර්යවත් කරන්නේ කොහොමද කියන එක තමයි ප්‍රධාන වන්නේ. ආසියා පැසිෆික් කලාපයේ රටවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගෙන් සියයට 85ක්ම යම් ආකාරයකට තමන්ගේ ගැහැනුකම නිසා එක්කෝ සමාජ මාධ්‍යවල, නැත්නම් ජනමාධ්‍යවල අපහාසයට ලක් වනවා, විශේෂයෙන්ම ලිංගිකත්වය, හැඩරුව සහ ගැහැනුකම නිසා. ඒකට එරෙහිව සටන් කරන ප්‍රධානම වේදිකාව වෙන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුවයි. එක කාරණයක් තමයි, මෙවර අපේ මන්ත්‍රීවරියන් ප්‍රමාණය දෙගුණ වෙලා තිබෙනවා. එසේ දෙගුණ වෙලා තිබෙන්නේ නිකම් අම්මලා තාත්තලාගේ පිහිටෙන්ම ආපු අය නිසා නොවෙයි නේ. ගරු අගමැතිතුමියගේ ඉඳලා තමන්ගේ ශක්තියෙන් දේශපාලනය කරලා ආපු අය තමයි මේ ඉන්නේ. තම පරම්පරාවේ කෙනෙක් මන්ත්‍රීකමක සිටියත්, නැතත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා සිටින පිරිසක් අද ඉන්නවා. ඒක වටිනාකමක් ලෙස සලකන සමාජයක් එළියේ තිබෙනවා. අපි විදේශගත වුණාමත් අපට තේරෙනවා, අපේ මන්ත්‍රීවරියන් ගැන විශාල අදහසක්, විශාල ඇගැයීමක් පිට රට ජනතාව තුළ තිබෙනවා කියලා. නමුත් මට හිතෙනවා, ඒ ඇගැයීම නැතිම තැන මෙතැනද කියලා. ඇත්තටම ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාට සහ එතුමාගේ කාර්යාලයටත් මම කිව්වා, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ට කොපමණ අපහාස කෙරෙනවාද කියලා වාර්තාවක් හදන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි වැඩිපුර ඉඳලා තිබෙන්නේ විපක්ෂයේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට තව විනාඩි දෙකක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

අද ගත්තොත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගණනාවක් මන්ත්‍රීතුමියලාට අපහාස කිරීම නිසා ඒවා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට පවා යොමු කර තිබෙන බව අපි දකිනවා. අපි අවුරුදු 10, 15, 20 පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. අපි පමණක් නොවෙයි, විපක්ෂය තුළ වෙනත් අය සිටියදීත් මන්ත්‍රීතුමියලාට වර්තමානයේදී කරන තරම් අපහාස එදා

[ගරු බිමල් රත්නායක මහතා]

කරලා නැහැ. පසුගිය අවුරුදු දෙක තුනකට කලින් සිදු වුණු, මට මතක එක සිද්ධියක් දෙකක් තිබෙනවා. නමුත් ඊට පෙර ගත්තොත්, ඉතාම නරක පාර්ලිමේන්තු පවා අපි දැකලා තිබෙනවා. කරු ජයසූරිය හිටපු කථානායකතුමාට පුටුවෙන් ගහපු පාර්ලිමේන්තුවකුත් අපි දැකලා තිබෙනවා. හැබැයි, ඒ කාලයේ හිටපු මන්ත්‍රීවරියන් තුන් හතරදෙනාට - ඒ අය කොහොම දේශපාලනයට ආවත් - මේ වාගේ නරක ආකාරයට කථා කරනවා මම නම් කවදාවත් දැකලා නැහැ. මේ පාර්ලිමේන්තුවට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා පාර්ලිමේන්තුවේ ඉහළ නිලධාරින් සොයා බලන්න ඕනෑය කියලා මම හිතනවා.

මන්ත්‍රීතුමියලාට අපහාස කිරීම් සම්බන්ධයෙන් එදා මෙදා තුර වරප්‍රසාද ප්‍රශ්න කොච්චර ඇවිල්ලා තිබෙනවා ද, මේ පාර්ලිමේන්තුවේත් එවැනි අවස්ථා කොච්චර තිබෙනවා ද කියලා සොයා බලන්න ඕනෑ. ඇත්තටම පාර්ලිමේන්තුව විධියට අපි මේ පිළිබඳව කම්පා වෙන්න ඕනෑ. මේ මරන්නේ "හයිපතියා" වැනි අයයි. මොකද, මේ අයට ගහන, ගහන හැම ගැහිල්ලක් තුළින්ම එක පුංචි දැරියක්, පාසලක ශිෂ්‍යා නායිකාවක් දේශපාලනයට එන එක නතර කරනවා. තමන්ගේ අම්මාට මෙහෙම ගහනවා නම්, මටත් එහෙම වෙයි කියලා දරුවෝ බය වෙනවා. ඒ නිසා අපි දකින දෙයක් තිබෙනවා. මේවායෙන් සියයට 85ක් cyberbullying බව ඇත්ත. අපි දැක්කා, අගමැතිතුමියගේ ඉඳලා අනෙක් සියලු මන්ත්‍රීවරියන්ට මේ දේ සිදුවනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මන්ත්‍රීතුමියලා බය නැහැ. නමුත්, ඒගොල්ලන්ට එහෙම කිව්වාට පස්සේ සමාජයට සහ දරුවන්ට මුහුණ දෙන්න අමාරු වනවා.

මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 77 ඉඳලා තිබෙන්නේ පාර්ලිමේන්තුවේ විනය පිළිබඳවයි. ස්ථාවර නියෝග 81හි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "පාර්ලිමේන්තුව තුළ පැන නගින බරපතල විනය විරෝධී තත්ත්වයක දී කථානායකවරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන්නේ නම්, ප්‍රශ්නය නොවිමසා සභාව කල් තබනු ලැබීමට හෝ කථානායකවරයා විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවකට රැස්වීම අත්හිටුවනු ලැබීමට හැකි ය."

ඒ වාගේම ස්ථාවර නියෝග 82(1)හි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "විවාදයක දී අයුතු හෝ නොසැබි වූ නොනිසි වචන පාවිච්චි කරන හෝ 83 ස්ථාවර නියෝගය හෝ 91 ස්ථාවර නියෝගයේ (ඊ) හෝ (ඌ) ඡේදවල විධිවිධානවලට පටහැනිව කිසිවක් ප්‍රකාශ කරන සහ එසේ ප්‍රකාශ කළ දෙය පිළිබඳ පැහැදිලි කිරීමක් හෝ එම වචන ඉවත් කර ගැනීමක් සිදු නොකරන හෝ එවැනි අනුචිත වචන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සැහීමකට පත් වන ලෙස තම කනගාටුව ප්‍රකාශ කර නොමැති යම් මන්ත්‍රීවරයකු හෝ මෙම ස්ථාවර නියෝගවල නිශ්චිතව දක්වා නොමැති යම් රීතියක් කඩ කරන ලද යම් මන්ත්‍රීවරයකුට එරෙහිව පාර්ලිමේන්තුව විසින් සුදුසු යැයි සලකනු ලබන කවර හෝ ආකාරයකින් කටයුතු කරනු ලැබිය හැකි අතර මෙම ස්ථාවර නියෝග කිසිවකට, මෙම නියෝගවල නිශ්චය වශයෙන් දක්වා ඇති ආකාරයට හැර ..."

ආදී වශයෙන් මෙහි හරි පැහැදිලිව තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, අද මේ පාර්ලිමේන්තුව මන්ත්‍රීතුමියලාට අපහාස කරන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දෙතුන්දෙනෙකුගේ බලයට යටත් වෙමින් තිබෙනවා. මම මේ විවාදයේදී මේ කාරණය කියන්න හිතුවේම ඒකයි. අපට මේ මන්ත්‍රීවරියන් විසිදෙදෙනා පරිස්සම් කරන්න බැරි නම්, අපට මේ විසිදෙදෙනාගේ ආත්ම ගරුත්වය රකින්න බැරි නම් ලංකාවේ දුප්පත් අම්මලා, ඒ වාගේම බස් එකේ තැළි-තැළී වැඩට යන කාන්තාවන් ආරක්ෂා කරන්නේ කොහොමද? ඇඟලුම් කර්මාන්තශාලාවක වැඩ කරලා හවස 7.00ට ගෙදර එන නංගි කෙනෙකුගේ ආරක්ෂාව ගැන අපි බලන්නේ කොහොමද? ඒ ගැන මේ සභාවෙන් දෙන මතයේ තමයි ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ.

අනෙක් කාරණය මේකයි. පාර්ලිමේන්තුවේ දෙයක් කිව්වාට පස්සේ ඒකට විශේෂ බලයක් ආරෝපණය වෙනවා. ඊට පසුව ඒකම වවාගෙන කන social media platforms තිබෙනවා. ඒකට පොහොර දමමින් ඊට පසුව ඒක වවනවා. අපි කාන්තා දිනය වෙනුවෙන් උත්සව පවත්වයි, රැස්වීම් පවත්වයි. ඒවාත් කරන එක වැදගත්. කාන්තාවන්ගේ බලය පාර්ලිමේන්තුවක් අස්සේ කොටු කරන්න ඕනෑ නැහැ. ජාතික ජන බලවේගය, ජවිපෙ, සමාජවාදී කාන්තා සංගමය කියන ඒ ඔක්කොම අපි හදලා තිබෙන්නේ ගැහැනුන්ගේ බලය පාර්ලිමේන්තුවකට කොටු කරන්න නොවෙයි. මේ විසිදෙදෙනාට එහා ගිය දසලක්ෂ සංඛ්‍යාත කාන්තා බලයක් තිබෙනවා. ඒ කාන්තා බලය කොහොමද කියන එක 08වැනි දාට මිනිස්සු දකීවි. එළියේ බලය හදන්න ඕනෑ කියන්නේ පාර්ලිමේන්තුව තුළින් ඒක කරන්න බැරි නිසායි. මොකද, මේ වාගේ වනචරකම් කරන, වනචර කථා කියන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් අපහාසයට ලක් කරන අය හෙළා දකින සමාජයක් තිබෙන්න ඕනෑ. මේ සභාවේ ඉන්න මන්ත්‍රීතුමියලාට කැත වචන කියලා තමන්ගේ ප්‍රදේශයට යන විපක්ෂයේ හෝ ඕනෑම පක්ෂයක මන්ත්‍රීවරයෙකුට එරෙහිව සමාජයෙන් විරෝධයක් එන්න ඕනෑ. අගමැතිතුමියට කැත කථා කියන මන්ත්‍රීවරුන්ට තමන්ගේ ආසනයට යන්න බැරි වන විධියට ඒ ආසනයේ, ඒ මන්ත්‍රීවරයාගේ පක්ෂයේම කාන්තාවන්ගෙන් විවේචනයක් එන්න ඕනෑ. එහෙම සමාජයක් හැදෙන්න ඕනෑ. සරෝජා පෝල්රාජ් ඇමතිතුමියට මීට කලින් කොච්චර පහර ගැහුවාද, දරුවෙකුගේ මරණයක් සම්බන්ධව කියමින්? මම ඒ ගැන කනගාටු වෙනවා. ලංකාවේ කාන්තා සංවිධාන කියන සමහර මානව හිමිකම් සංවිධානවලටත් මම කථා කරලා ඇහුවා, ඇයි ඔයගොල්ලන් ඒ වෙනුවෙන් කථා කරන්නේ නැත්තේ කියලා. සමහරු මහ හැරියා. නමුත් අපි, අපේ මන්ත්‍රීවරියන් ආරක්ෂා කරනවා. දෙයක් වුණාට පස්සේ අවසානයට තමන්ගේ මහත්තයායි, දරුවෝ දෙදෙනායි, අම්මයි, තාත්තායි විතරයි ඉතුරු කියන තැනට පත් වෙන්න අපේ මන්ත්‍රීවරියන්ට අපි ඉඩ තියන්නේ නැහැ. පක්ෂයක් විධියට වාගේම කණ්ඩායමක් විධියට අපි ලක්ෂ සංඛ්‍යාත කාන්තාවන් රකිනවා. අපට ඒ solidarity එක තිබෙනවා. ඒ solidarity එක හැම ගැහැනියකටම අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධයෙන් නියෝගයක් දෙන්න කියලා.

අවුරුදු 50කට කලින් පැවති පාර්ලිමේන්තුවලවත් මේ පාර්ලිමේන්තුවේ තරම් මන්ත්‍රීවරියන්ට අපහාස කරලා තිබෙනවාද? ප්‍රසිද්ධ කැත කථා එකක් දෙකක් කර තිබුණු බව අපි දන්නවා, අගමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට එහෙම කියපු ඒවා වාගේ. නමුත් එවැනි අවස්ථා ඉතාම අඩුයි. තාත්තාගේ බූදලයක් විධියට, අම්මාගේ බූදලයක් විධියට ආපු අය නොවෙයි මේ සභාවේ ඉන්නේ. මේ ඉන්නේ උගත්, තනි මහන්සියෙන් වැඩ කරලා, ස්වේච්ඡාවෙන් දේශපාලනයට ආපු ඇත්තවශයෙන්ම දක්ෂ ගැහැනු. අපේ පක්ෂයේත් දසලක්ෂ සංඛ්‍යාත කාන්තාවන් පිරිසක් ඉන්නවා. ඒගොල්ලන් අතුරින් මෙතුමියලා ඉස්සරහට ඇවිල්ලා තිබෙන්නේ කොහොමද? විශේෂ කැප කිරීමක් කළ නිසා. මම කලිනුත් කිව්වා වාගේ, කකුලේ මහ ගලකුත් ගැට ගහලා තිබියදී. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා,

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ට මෙතරම් අපහාස කළ පාර්ලිමේන්තුවක් මීට පෙර කවදාවත් තිබිලා තිබෙනවාද කියලා පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය හරහා හොයා බලන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වැඩිපුරත් කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි පක්ෂයක් ලෙසත්, ජන වරමක් තිබෙන ආණ්ඩුවක් ලෙසත් අධිෂ්ඨාන කර ගත යුතු වෙන්නේ මන්ත්‍රීවරියන්ට විතරක් නොවෙයි පොදුවේ ගැහැනුන් කාටත් සිද්ධ වන අපහාස කිරීම්, ඒගොල්ලන්ව යට කරන්න දරන උත්සාහය පරාජයට පත් කරන නොනවතින දේශපාලන අරගළයක් පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් ඇති කර ගැනීමටයි. ඒ වෙනුවෙන් පෙළ ගැසීම අත්‍යවශ්‍යයි කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[5.03 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Presiding Member, I am thankful that I have been given this opportunity to speak on the Adjournment Motion brought in to mark the International Women’s Day. I wish to place on record my views, adding something to what the Hon. Bimal Rathnayake stated.

Sir, unless we respect the women in this House, we would not be able to get women to join politics in this country; අපේ කාන්තාවන්ගේ ගරුත්වය මේ සභාවේදී ආරක්ෂා කළේ නැත්නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වශයෙන් අපි කටයුතු කරන එක ගැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේක දේශපාලන කථාවක් නොවෙයි. අපි සියලුදෙනාට ඒ සම්බන්ධ වගකීමක් පැවරී තිබෙනවා. මේ සභාවට, මේ පාර්ලිමේන්තුවට කාන්තාවක් එන්නේ හුඟක් අමාරුවෙන්.

ඒගොල්ලන්ගේ පෞරුෂත්වයට නොයෙක් අවස්ථාවල මඩ ගහනවා. හැබැයි, ඒවාත් විඳගෙන ඒ අය පාර්ලිමේන්තුවට එනවා. පාර්ලිමේන්තුවේදී ඕනෑම දෙයක් කථා කරන්න පුළුවන්, අපහාස කිරීමේ නඩුවකට ලක් වෙන්නේ නැති නිසා. හැබැයි, ඒ නිදහස පාවිච්චි කරලා කාන්තාවන්ට අපහාස කරනවා නම් ඒක ප්‍රශ්නයක්. ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාව විශේෂ ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. ඒකට හේතුව මේකයි. අපට මේ සභාවේදී කාන්තාවන් ආරක්ෂා කරන්න බැරි නම්, කිසි විටෙකත් අපට දක්ෂ කාන්තාවන් අපේ දේශපාලන ක්ෂේත්‍රයට ඇතුළත් කර ගන්න බැහැ. අපේ රට තමයි ප්‍රථම ලෝක අගමැතිනිය බිහි කළේ. ඒ ගැන අපි ආඩම්බර විය යුතුයි. ඒ වාගේම අපේ රටේ වර්තමාන අගමැතිතුමියත් කාන්තාවක්. ඒකත් අපේ රටට ආඩම්බරයක් හැටියට මා දකිනවා.

Also, Sir, at this time when we celebrate the International Women’s Day, I am disheartened by the world situation today. There are women who have become widows due to this conflict in Iran; there are civilians killed all over. Every moment, a woman becomes a widow. That is a great concern because a widow is a burden to the society. Also, that grief of a widow, one has to realize, is not due to her fault, but due to this conflict which has created so much unrest around the world.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ රටේ විශ්වවිද්‍යාල දිහා බලනකොට සියයට 60ක් ඉන්නේ කාන්තාවන්. හැබැයි, අපේ ශ්‍රම බලකාය දිහා බලනකොට සියයට 70ක් ඉන්නේ පිරිමි පක්ෂය. කාන්තාවන් ඉන්නේ සියයට 30යි. ඇයි කාන්තාවන් අපේ ශ්‍රම බලකායට ඇතුළත් නොවන්නේ? ඒකට බලපාන නොයෙක් ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, පවුලක බර බොහෝ අවස්ථාවල දරන්නේ කාන්තාවන් බව. ඒ නිසා, we need to create more crèches. We also need to increase maternity leave. Currently, we give them 12 weeks' maternity leave. Hon. Prime Minister, the world norm is 14 weeks. Therefore, we should increase the maternity leave granted in this country, if we are to attract more women to join the workforce, .

We know that during the COVID-19 pandemic, work from home was promoted and gradually, people had been asked to come back to work. If we could create a situation where we could get people to work at least two days a week from home, we can encourage more women to join the workforce. So, we need to create a framework that permits women to work from home, encouraging more of them to join the workforce.

ඒ වාගේම අපි ආඩම්බර විය යුතුයි, අද වනකොට පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය ප්‍රතිශතයක් හැටියට ගත් විට 9.8ක් වීම ගැන. මම පළාත් සභා සහ පළාත් පාලන ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ නීතියක් ගෙනාවා, පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය සියයට 25ක් විය යුතුයි කියලා. පළාත් සභාවලටත් අපි ඒ නීතිය ගෙනාවාත් තවමත් ඒ මැතිවරණය පැවැත්වුයේ නැහැ. පළාත් සභාවලත් කාන්තා නියෝජනය සියයට 25ක් විය යුතුයි කියා අපි හිතනවා. මම හිතන විධියට, මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයට අපට කාන්තාවන් ඇද ගන්න පුළුවන් වුණා නම් ඒක ලොකු ජයග්‍රහණයක් වනවා. මේ රටේ ජනගහනයෙන් සියයට 52ක් කාන්තාවන් ඉන්නවා. හැබැයි, අවාසනාවකට වාගේ, බොහෝ අවස්ථාවල කාන්තාවන් තමයි, තවත් කාන්තාවකට ඡන්දය නොදෙන්නේ. ඒකත් ලොකු සමාජ ප්‍රශ්නයක්. ඒ කියන්නේ, ජනගහනයෙන් සියයට 52ක් කාන්තාවන් ඉන්න රටක, අපේ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය සියයට 9.8යි. මීට කලින් සියයට 5කට වඩා අඩු ප්‍රතිශතයක් තමයි කාන්තා නියෝජනය හැටියට තිබුණේ. ඒ නිසා මේක සමාජ ප්‍රශ්නයක්. සියයට 52ක් කාන්තාවන් ඉන්න රටක දේශපාලන ක්ෂේත්‍රය දිහා බැලුවාම අපට පෙනෙනවා, පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය හුඟක් අඩුයි කියන එක. හැබැයි, අපි පුළුවන් තරම් කාන්තාවන් අපේ දේශපාලන ක්ෂේත්‍රයට ඇතුළත් කර ගත්තා නම් ඒක ලොකු ජයග්‍රහණයක් වනවා. කාන්තාවන් දේශපාලන ක්ෂේත්‍රයට ඇතුළත් වුණා නම් දූෂණය හුඟක් අඩු වෙනවා කියන එක පර්යේෂණවලින් සොයා ගෙන තිබෙනවා. ඒ කියන්නේ, පිරිමි පක්ෂයට වඩා කාන්තාවන්ට ලජ්ජා භය නහරය තිබෙනවා. ඒ නිසා මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයෙන් දූෂණය ඈත් කරන්න ඕනෑ නම්, අපි පුළුවන් තරම් කාන්තාවන් දේශපාලන ක්ෂේත්‍රයට ඇද ගන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා.

ගරු අගමැතිතුමියනි, 2009 වර්ෂයේ යුද්ධය අවසන් වුණාට පස්සේ, after the eradication of the LTTE, 90,000 women have become widows and those 90,000 widows are living under very difficult circumstances. So, I think this Government should take note of that and try to give them

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

a better life through an accelerated social welfare programme. After the conflict, 90,000 have become war-widows in this country. They are a silent lot and nobody seems to talk about them, but there is a lot to be done with regard to them.

ඒ වාගේම, take sexual harassment at the workplace. It is another grave situation, which, as a nation, we have to address. If you take statistics, 2024 වසරේදී කාන්තාවන්ට පොදු ස්ථානවලදී සිදු වුණු ලිංගික හිරිහැර සම්බන්ධයෙන් පැමිණිලි 2,785ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම කාර්යාල පරිශ්‍රවලදී සිදු වුණු හිංසන 70කුත්, පොදු ප්‍රවාහනයේදී සිදු වුණු හිංසන 289කුත් වාර්තා වෙලා තිබෙනවා. Therefore, with regard to sexual harassment at workplace, we need to encourage offices to have a special officer to look into that. In most instances, when there is sexual harassment, victims are scared to go and report. And, if you take rape, unfortunately, the victim faces social stigma. So, if a woman had been raped, all women should get together and give her moral support to go to the police, make a complaint and bring the wrongdoer to book. Unfortunately, due to social stigma, victims are scared to go to the police and make a complaint. Also, rape cases, sometimes, take about 10 to 15 years to be over. As a result, by the time the case is taken up, there would be various other issues. But, in other countries, in western countries, the society give strength to the victim saying, "Go and make a complaint. We will stand by you and bring the person who is culpable to book"

Sir, I would like to say that when it comes to a woman, she is the most important fabric in the family. The contribution of a woman to the society and to her family cannot be compared with what a man does. A man only earns. But, today, in most instances, in a family, both the husband and wife earn.

Another matter is this. අපි දැකපු දෙයක් තමයි අතීතයේදී විවාහය තුළ කාන්තාව කොච්චර බැට කෑවත් විවාහය රැක ගෙන සිටීම. අද වනවිට සමාජය වෙනස් වෙලා තිබෙන්නේ. සමාජය වෙනස්වීමත් සමඟ කාන්තාවන්ගේ ආර්ථික ශක්තිය වැඩි කිරීම සඳහා කාන්තාවට ආර්ථික ස්වාධීනත්වය ලබා දීම ඉතා වැදගත්. අපි දැක තිබෙනවා, හුඟක් අවස්ථාවලදී කාන්තාවන් විශාල අභියෝගවලට මුහුණ පාන්නේ ආර්ථිකය ශක්තිමත් නැති නිසාය කියලා. නමුත් අපට කාන්තාවන් දිරිගන්වන්න පුළුවන් නම් ආර්ථික හා සමාජයීය වෙනසක් ඇති කරන්නත් පුළුවන් කියා මා විශ්වාස කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.12]

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාන්තා දිනයට අදාළව අද උදේ සිට මේ කල් තැබීමේ විවාදය පැවැත්වෙන අවස්ථාවේ, මන්ත්‍රීවරයකු හැටියට මටත් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙන ගමන්, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම වෙනුවෙන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සියලු මන්ත්‍රීතුමියන්ලාටත් මා ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, ලාංකීය සමාජය තුළ අතීතයේදී කාන්තාව සම්බන්ධයෙන් තිබුණු තත්ත්වය. සංස්කෘතික වශයෙන් විශාල පීඩනයකට ලක් වෙච්ච, අපවාදයට ලක් වෙච්ච, හිංසනයට ලක් වෙච්ච පිරිසක් තමයි අපේ රටේ කාන්තාව කියන්නේ. ඒකට මුල් කාලීන පසුබිමක් තිබුණා. ඒ පසුබිම තමයි, අපේ ලාංකීය සමාජය ගොඩ නැඟී තිබුණේ පුරුෂාධිපත්‍ය සමාජ ක්‍රමයක් ඇතුළේ වීම. ඒ පුරුෂාධිපත්‍ය සමාජ ක්‍රමය ඇතුළේ කාන්තාව හැම වෙලාවේම පිරිමි පාර්ශ්වයට යටත්වයි පැවතියේ. වැඩවසම්, පරාධීන සමාජ ක්‍රමයක් ඇතුළේ, පුරුෂාධිපත්‍ය සමාජය ඇතුළේ කාන්තාවට හිස ඔසවන්න නොදී හිර කරලයි තිබුණේ. හැබැයි, වර්තමානය වෙනකොට සමාජය තුළ සංස්කෘතිකමය වශයෙන් ඇති වුණු වෙනසත් එක්ක, මානව සමාජයේ සංවර්ධනයත් එක්ක, කාන්තාව විසින් ඇති කළ අරගළ මත ඒ අයට අහිමි වෙලා තිබුණු බොහෝ වරප්‍රසාද දිනා ගනිමින් සිටින මොහොතකයි අද ඉන්නේ.

වර්තමාන පාර්ලිමේන්තුවේ අපේ මන්ත්‍රී සහෝදරියන් විසිදෙදෙනෙක් ඉන්නවා. පිරිමි උදවිය හැටියට අපි ඇත්තෙන්ම සතුටු වෙනවා, එතුමියලාට එවැනි අවස්ථාවක් ලැබීම ගැන. මොකද, අපේ සමාජය තුළ තිබුණු අසාධාරණය ඇතුළේ කාන්තාවගේ ශ්‍රමය සූරා ගෙන කෑවා, ලිංගිකව සූරා ගෙන කෑවා. ඒ වාගේම ඔවුන් සතුව තිබුණු නිර්මාණශීලීත්වය, ඔවුන් සතුව තිබුණු හැකියාව සමාජයේ තිබුණු යම් යම් සංස්කෘතික පීඩන එක්ක යටපත් කරලා ඒ අයට නැඟිටින්න නොදී මේ සමාජය තුළ ඔවුන්ව පීඩනයට ලක් කර තිබුණා.

නමුත් අපි ස්ත්‍රී-පුරුෂ සමාජභාවී සමානාත්මතාව උදෙසා ආර්ථික සාධාරණය, වැටුප් නොලබන ස්ත්‍රී ශ්‍රමය ආර්ථිකයට සිදු කරන දායකත්වය අගයන රාජ්‍ය ප්‍රතිපත්ති, ආන්තික සමාජ කණ්ඩායම්වලට සාධාරණ සහ සමාන ලෙස සලකන නීති, ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය, සහභාගිත්වය හා භූමිකාව පුළුල් කිරීම, ආයතනගත හිංසන ව්‍යූහ ඇතුළුව සෑම ස්ථානයකම සියලු ආකාරයේ හිංසනයන්ට එරෙහි වීම, ස්ත්‍රීන් මුහුණ දෙන පීඩනය අවම කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී විශ්වීය පොදු සේවාවලට ප්‍රමුඛත්වය ලබා දීම, තිරසර පරිසර සංරක්ෂණ ප්‍රතිපත්ති සංවර්ධනයේදී ස්ත්‍රී සහභාගිත්වය, සමාජ ආයතන සහ ක්‍රියාවලි විසින් ප්‍රතිනිෂ්පාදනය කොට පවත්වාගෙන යනු ලබන අගතිගාමී ඒකාකෘතීන්ගෙන් තොර සමාජයක් ගොඩනැඟීම, ස්ත්‍රීන් ඇතුළු සියලු අනන්‍යතා කණ්ඩායම්වලට රාජ්‍ය සේවා, අයිතිවාසිකම් සහ යුක්තිය සඳහා ප්‍රවේශ වීමේ සමාන හිමිකම් ලබා දීම, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම වැනි මූලධර්මමය කරුණු ගොඩක් මූලික කරගෙන තමයි පසුගිය කාලයේ අපි රාජ්‍ය බලය, ආණ්ඩු බලය ලබා ගැනීමේ සටන ආරම්භ කළේ.

ඒ වෙලාවේ අපි මේ රටේ පිහිටෙව්වා නැත්නම් ආරම්භ කළා, සංවිධානය කළා, "ගැහැනු අපි එක මිටට" ව්‍යාපාරය. ඒ සංකල්පය මත ඉඳගෙන අපි අපේ රටේ කාන්තාව එක තැනකට ගත්තා. මට මතකයි, ඒ වෙලාවේ අපේ අගමැතිතුමිය, අපේ කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමිය ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ ඉන්න අනෙකුත් ක්‍රියාකාරින්, එළියේ හිටපු අපේ සහෝදරියන් මේ සමාජය පෙළගැස්වීම සඳහා, තමන්ට වෙච්ච අසාධාරණයට විරුද්ධව කාන්තාව ගොඩනැඟීම සඳහා ශක්තිමත් ව්‍යාපාරයක් ගොඩ නැඟුවා. ඒ ව්‍යාපාරය මූලික කරගෙනයි අපට ආණ්ඩුවක් හැටියට නැත්නම් දේශපාලන ව්‍යාපාරයක් හැටියට කාන්තාවන් 20දෙනෙක් මේ පාර්ලිමේන්තුවට ගෙන එන්න, කැටුව එන්න පුළුවන් වුණේ, ජනතාවගේ වරම ලබන්න ඒ සහෝදරියන්

ආශීර්වාද ලබා ගත්තේ. එය මූලධර්මයක් හැටියට ගෙන එනවා විතරක් නොවෙයි, ඒ වෙනුවෙන් ප්‍රායෝගිකව ක්‍රියාමාර්ග ගණනාවකුත් ගනිමින් ඉන්නේ. ඒ එක අවස්ථාවක් තමයි අද කාන්තා දිනය වෙනුවෙන් පවත්වන මේ විවාදය.

අර මූලධර්මවලට සාපේක්ෂව ආණ්ඩුවක් හැටියට, දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි ගනිමින් තිබෙන ක්‍රියාමාර්ග තමයි, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව ඉපයුම් අතර ඇති වන අවස්ථා හඳුනා ගනිමින් එය අවසන් කිරීමට පියවර ගැනීම, ස්ත්‍රීන්ට ඉඩම් සඳහා ඇති අයිතියට අවාසිදායක ලෙස බලපාන නීතිමය හා ප්‍රායෝගික ගැටලු නිරාකරණය කිරීම, වැඩ කරන ස්ත්‍රීන් මුහුණ දෙන විශේෂිත සාධක හඳුනා ගනිමින් ඔවුන්ගේ සේවා සුරක්ෂිත බව තහවුරු වන පරිදි පවතින කම්කරු නීති සහ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සහ අවශ්‍ය නව නීති හඳුන්වා දීම, ස්ත්‍රීන් පීඩාවට පත් කරන අධික පොලී අය කරගන්නා අයුක්තිසහගත ක්ෂුද්‍ර මූල්‍ය ණය බරින් ඔවුන් නිදහස් කිරීම සඳහා පියවර ගැනීම, ස්ත්‍රීන්ගේ ව්‍යවසායකත්ව අවස්ථා ඉහළ නැංවීම සඳහා ඔවුන්ට අවශ්‍ය බැංකු සහ මූල්‍ය පහසුකම් සැපයීම වැනි ක්‍රියාමාර්ග ගණනාවක් ගනිමින් ඉන්න වෙලාවක තමයි ඉදිරියේ එන  කාන්තා දිනය වෙනුවෙන් අපි පාර්ලිමේන්තුවේ අද මේ හඬ නඟන්නේ.

ඇත්තෙන්ම අපේ බලාපොරොත්තුව විපක්ෂයේ මන්ත්‍රීතුමෙකු කිව්වා වාගේ, මේ රට තවත් යුක්තිගරුක දේශයක් ලෙස ගොඩනඟන්නට, සාධාරණ සමාජයක් ලෙස ඉස්සරහට අරගෙන යන්නට, සංවර්ධනය කරන්නට මේ පාර්ලිමේන්තුව ඇතුළට තව තවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් ප්‍රමාණයක්, මම කියන්නේ ජනගහනයේ ඉන්න කාන්තාවන් සියයට 52ට සාපේක්ෂව සාධාරණ පිරිසක් රැගෙන ඒමයි. එවිට මේ රටේ සිටින මුළුමහත් කාන්තාවන් වෙනුවෙන් පාර්ලිමේන්තුව ඇතුළේ අරගළය කරන්නා සේම එළියේ සංවිධානාත්මක අරගළයක් කිරීම සඳහා, තමන්ට ඇති අයිතිවාසිකම් ඔස්සේ ඒ අරගළ කණ්ඩායම් නිර්මාණය කරන්නට, ශක්තිමත් කාන්තා සංවිධාන ගොඩ නඟන්නට අපේ කාන්තාවන්ට හැකියාව ලැබෙනවා.

අපේ රටේ ඉන්න කාන්තාව හැම දාම අසරණයි. ඔවුන් හැම දාම දුක් විඳින කණ්ඩායමක්. ඒකෙන් ඔවුන් නිදහස් කිරීම සඳහා අපි අරගළ කරනවා. අපි පිරිමි අය හැටියට පසුගිය ඉතිහාසයේත්, අදත්, මින් ඉදිරියටත්, ඔවුන්ගේ යුක්තිය, සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටි පිරිස්; පුද්ගලයන්; දේශපාලන ව්‍යාපාරයක්. මේ මොහොතේ පෙනී ඉන්නවා සේම කාන්තාවන්ගේ යුක්තිය, සාධාරණත්වය වෙනුවෙන් අනාගතයේත් අපි පෙනී සිටිනවා කියන පණිවුඩය මේ මුළුමහත් සමාජයට ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.21]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சர்வதேச மகளிர் தினத்தை முன்னிட்டு இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு, அண்மைய காலத்தில் இந்தியாவில் ஏற்பட்டதொரு மாற்றத்தைப் பதிவுசெய்ய விரும்புகின்றேன்.

உலக வரலாற்றில் சில காலகட்டங்கள் மனித முன்னேற் றத்தின் திசையை முழுமையாக மாற்றிவிடும். இன்று நாம் அத்தகையதொரு முக்கியமான காலகட்டத்திலே வாழ்ந்து கொண்டு இருக்கின்றோம். அந்த மாற்றத்தின் மையத்தில் நிற்கும் சக்தி செயற்கை நுண்ணறிவு - artificial intelligence - ஆகும். மனித வாழ்க்கையின் பல துறைகளை மாற்றி அமைக்கும் திறன்கொண்ட இந்தத் தொழில்நுட்பப் புரட்சி, எதிர்கால உலகின் பொருளாதாரத்தையும் சமூக அமைப்புகளையும் தீர்மானிக்கப் போகின்றது. சமீபத்தில் இந்தியாவின் தலைநகர் புதுடில்லியில், இந்தியப் பிரதமர் நரேந்திர மோடி அவர்களின் தலைமையில் நடைபெற்ற செயற்கை நுண்ணறிவு தொடர்பான சர்வதேச மாநாடு, உலக நாடுகள் எதிர்கால தொழில்நுட்ப வளர்ச்சியை எவ்வாறு அணுக வேண்டும் என்பதற்கான ஒரு முக்கியமான திசையை எடுத்துக் காட்டியுள்ளது.

தொழில்நுட்ப வளர்ச்சியை மனித முன்னேற்றத்துடன் இணைத்துப் பார்க்கும் இந்தியாவின் அணுகுமுறை, உலக நாடுகளின் கவனத்தை ஈர்த்துள்ளது. குறிப்பாக, "Digital India", "Startup India", "Innovate India" போன்ற திட்டங்கள்மூலம் இந்தியா இன்று உலகின் முக்கியமான டிஜிட்டல் மற்றும் தொழில்நுட்ப சக்திகளில் ஒன்றாக வளர்ந்து வருகின்றது. ஒரு காலத்தில் தகவல் தொழில்நுட்ப சேவைகளை வழங்கும் நாடாக மட்டுமே பார்க்கப்பட்ட இந்தியா, இன்று உலக தொழில்நுட்ப எதிர்காலத்தை வடிவமைக்கும் ஒரு சக்தியாக மாறியுள்ளது. இந்த மாற்றத்தின் பின்னணியில், தூரநோக்கு கொண்ட அரசியல் தலைமையாகவும் தெளிவான தேசிய கொள்கையுடனும் உள்ள பாரத பிரதமர் மாண்புமிகு நரேந்திர மோடி அவர்கள் உள்ளார். தொழில்நுட்ப வளர்ச்சியை ஒரு நாட்டின் எதிர்காலப் பொருளாதாரத்தின் அடித்தளமாக மாற்றுவதில் இந்தியா எடுத்த முயற்சிகள் பல நாடுகளுக்கும்  முன்னுதாரணமாக உள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உலகம் செயற்கை நுண்ணறிவு மையமாக மாறிக்கொண்டிருக்கும் இந்த நேரத்தில், அதன் தாக்கம் இலங்கையிலும் தெளிவாக உணரப்பட்டத் தொடங்கியுள்ளது. குறிப்பாக, அண்மைக் காலமாக artificial intelligenceஇன் பயன்பாடு அதிகரித்து வருவதன் காரணமாக, பல தகவல் தொழில்நுட்ப நிறுவனங்களில் பணிபுரியும் software engineers மற்றும் தொழில்நுட்ப நிபுணர்கள் தங்களது வேலைகளை இழக்கும் நிலை உருவாகி வருவதாகக் கூறப்படுகின்றது. இதுவொரு சவாலாக இருக்கின்ற அதே நேரத்தில், ஒரு முக்கியமான எச்சரிக்கையாகவும் பார்க்கப்பட வேண்டும். தொழில்நுட்ப மாற்றங்கள் சில வேலை வாய்ப்புகளை மாற்றியமைக்கின்ற அதே நேரத்தில், புதிய திறன்களையும் புதிய தொழில்களையும் உருவாக்கும் என்பது உலக அனுபவமாகும். அந்த மாற்றத்துக்கு நாடுகள் முன்கூட்டியே தயாராக இருந்தால் மட்டுமே அதனை ஒரு பொருளாதார வாய்ப்பாக மாற்ற முடியும். அதனால் இன்றைய உலக சூழ்நிலையில் மிக அவசியமான ஒன்று, கல்வி அமைப்பை எதிர்கால தொழில்நுட்பத் தேவைகளுக்கு ஏற்ப மாற்றுவ தாகும். பல முன்னேற்ற நாடுகள் போலவே, இலங்கையும் பாடசாலை மட்டத்திலிருந்து artificial intelligence, coding, data science, robotics போன்ற தொழில்நுட்பக் கல்விகளை அறிமுகப்படுத்த வேண்டிய அவசியம் ஏற்பட்டுள்ளது.

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

எதிர்கால உலகப் பொருளாதாரத்தில் போட்டியிடப் போகும் தலைமுறை இன்று நமது பாடசாலைகளிலும் பல்கலைக்கழகங்களிலும் கல்வி கற்றுக்கொண்டு இருக்கிறது. அவர்களுக்குத் தேவையான திறன்களை வழங்குவது ஒரு கல்விக் கொள்கை மட்டுமல்ல, அது தேசிய பொறுப்பாகவும் பார்க்கப்பட வேண்டும். இந்த இடத்தில்தான் இந்த மாற்றம் குறிப்பாக, பெண்களைப் பாதிக்கும் நிலையை உருவாக்கும் அபாயமுள்ளது. இன்று தகவல் தொழில்நுட்பத் துறையில் பணிபுரியும் ஆயிரக்கணக்கான இளம் பெண்கள் தங்களது வாழ்க்கையை கட்டியெழுப்பிக்கொண்டு இருக்கின்றார்கள்.

நாம் ஒரு முக்கியமான உண்மையை மறந்துவிடக் கூடாது. இலங்கையில் குறிப்பாக, வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் 90,000க்கும் மேற்பட்ட யுத்த விதவைகள் காணப்படுவதாக இதே உயர் சபையில் 2012ஆம் ஆண்டு அப்பொழுது சிறுவர் அபிவிருத்தி மற்றும் மகளிர் விவகார பிரதி அமைச்சராக இருந்த ஹிஸ்புல்லாஹ் அவர்கள் குறிப்பிட்டிருந்தார். இன்றும்கூட, சிலர் இதனைக் குறிப்பிட்டு இருந்தார்கள். இந்த உண்மையை நாங்கள் யாரும் நிராகரிக்க முடியாது. வடக்கு, கிழக்கு உட்பட இலங்கையின் பல பகுதிகளிலும் இவ்வாறானவர்கள் இருக்கின்ற சூழலில், போர் மற்றும் அதன் பின்னணியில் ஏற்பட்ட சமூகப் பொருளாதார சவால்களின் காரணமாக பெண் தலைமைத்துவக் குடும்பங்கள் அதிகமாக உள்ளன. அந்தப் பெண்களுக்கான நிலையான மற்றும் மரியாதையான வேலைவாய்ப்புகளை உருவாக்குவது ஒரு சமூக நீதிக் கேள்வியாகவும் பார்க்கப்பட வேண்டும். இந்த நிலையில், டிஜிட்டல் பொருளாதாரம் மற்றும் தொழில்நுட்பத் துறைகள் பெண்களின் வாழ்க்கையை மாற்றக்கூடியதொரு பெரிய வாய்ப்பை வழங்குகின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதுவொரு மிக முக்கியமான காலகட்டம்! இன்று நாங்கள் பெண்களைப் பற்றி, அவர்களுடைய எதிர்காலம் பற்றி, குழந்தைகளுடைய எதிர்காலம் பற்றி பேசுகின்றோம். இந்த நாட்டில் வலிந்து காணாமல் ஆக்கப்பட்டவர்களின் குடும்பங்களைச் சேர்ந்த ஆயிரக்கணக்கானவர்கள், பல ஆண்டுகளாக கிட்டத்தட்ட எட்டு ஆண்டுகளாக தெருக்களில் போராட்டங்களில் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றார்கள்; தங்களுடைய பிள்ளைகள் வருவார்கள் என்ற ஏக்கத்தோடு காத்திருக்கின்றார்கள். இவ்வாறு போராட்டங்களை நடத்திய பலர், குறிப்பாக காணாமல் ஆக்கப்பட்டவர்களின் அம்மாமார், அப்பாமார் என கிட்டத்தட்ட 240 பேர் யுத்தத்துக்குப் பின்னரான 16 ஆண்டுகளில் இறந்திருக்கிறார்கள். இவர்களில் அதிகமானவர்கள் யுத்தத்தின்போது தங்களுடைய கணவன்மாரை ஒப்படைத்த மனைவிமாரும் பிள்ளைகளை ஒப்படைத்த அம்மாமாரும் ஆகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உங்களுக்கு எங்களுடைய கலாசாரம் பற்றி தெரியும்! தமிழ்ப் பெண்கள் தங்களுடைய நெற்றியில் குங்குமப் பொட்டு வைப்பது, தன்னுடைய கணவன் உயிரோடு இருக்கிறான் என்பதை உறுதிப்படுத்துவதற்கும் தன்னுடைய திருமணத்தை உறுதிப்படுத்துவதற்கும்தான். அதேபோல, ஒரு சகோதரி தன்னுடைய கழுத்தில் இருக்கின்ற தாலியைக் கழற்றாமல் இருக்கிறார் என்றால், அவருடைய கணவன் உயிரோடு இருக்கிறான் என்பதுதான் அர்த்தம். எங்களுடைய தமிழ்ப் பெண்கள் இப்பொழுதும் நெற்றியில் பொட்டை அழிக்காமல், கழுத்தில் இருக்கின்ற தாலியைக் கழற்றாமல் தங்களுடைய கணவன்மாரின் வருகைக்காகக் காத்திருக்கின்றார்கள். காணாமல் ஆக்கப்பட்டவர்களுக்கு என்ன நடந்தது? அவர்களுக்கான நீதி என்ன? என்பதை இந்த நாடு இன்னும் சொல்லவில்லை. தமது குடும்ப உறுப்பினர்களை ஒப்படைத்த எங்களுடைய சகோதரிகளுக்கான பதில் என்ன? என்பதை இந்தச் சந்தர்ப்பத்தில் நான் கேட்க விரும்புகின்றேன்.

செஞ்சோலையில் பல பெண் குழந்தைகள் கொல்லப் பட்டார்கள். இன்று உலகத்தில் நடக்கின்ற கொலைகள் பற்றி குறிப்பாக பிள்ளைகளின் கொலைகள் பற்றி இங்கு பேசுகின்றார்கள். இவ்வாறுதான் எங்களுடைய மண்ணிலும் நடந்தது. குறிப்பாக, செஞ்சோலையில் இருந்த குழந்தைகள் விமானத் தாக்குதல்மூலம் மிக மோசமாக கொல்லப்பட்டார்கள். அவர்களுக்கான நீதி இதுவரை கிடைக்கவில்லை. வடக்கு மாகாண சபையில் அமைச்சராக இருந்த ஆனந்தி சசிகரன், தன்னுடைய கணவனை ஒப்படைத்ததற்கு அவரே கண்கண்ட சாட்சியம். இவ்வாறு கண்கண்ட சாட்சியமாகப் பலர் இருந்தும் அவர்களுக்கு நீதி கிடைக்கவில்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விடுதலைப் புலிகளுடைய அரசியல் துறையைச் சேர்ந்த இளம்பருதி தன்னுடைய மனைவி, பிள்ளைகளோடு சரணடைந்தார். அதேபோல, விடுதலைப் புலிகளுடைய வனவளப் பிரிவுக்குப் பொறுப்பாக இருந்த சக்தியும் தன்னுடைய மனைவி, பிள்ளைகளோடு சரணடைந்தார். மேலும், தங்கன் தன்னுடைய மனைவி, பிள்ளைகளோடு சரணடைந்தார்; ராஜா பிள்ளைகளோடு சரணடைந்தார்; பாலகுமார் தன்னுடைய மகனோடு சரணடைந்தார்; மஜித் தன்னுடைய மனைவி, பிள்ளைகளோடு சரணடைந்தார். ஆனால், இன்றுவரை இவர்கள் யாரும் திரும்பி வரவில்லை. என்ன காரணம்? இந்த நாட்டில் இவர்களுக்கான நீதி என்ன? "ஒரு நாள் போராளியாக இருந்தால்கூட, ஒரு நாள் விடுதலைப் புலிகளுக்கு உதவியிருந்தால்கூட சரணடையுங்கள்" என்று கூறியே, இவர்களைச் சரணடைய வைத்தார்கள். ஆனால், இன்றுவரை இவர்கள் தொடர்பில் நீதி கிடைக்கவில்லை.

இன்று இந்த நாட்டில் சகோதரி சரோஜா சாவித்திரி போல்ராஜ் அவர்கள் அமைச்சராக இருக்கிறார். கௌரவ அமைச்சர் அவர்களே, இதற்கு உங்களுடைய அரசாங்கம் என்ன பதில் சொல்லப் போகிறது? 2009ஆம் ஆண்டு யுத்தம் முடிந்த பிறகு, மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய மனைவியிடம் பல குழந்தைகள் ஒப்படைக்கப்பட்டார்கள். அந்தக் குழந்தைகளுக்கு என்ன நடந்தது?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ஒரு நிமிடம் தாருங்கள்!

தயவுசெய்து, அந்தக் குழந்தைகளுக்கு என்ன நடந்தது என்பதைச் சொல்லுங்கள்! தலைவர் பிரபாகரனுடைய மகன் என்பதற்காக, சரணடைந்த பாலச்சந்திரனுக்கு 'பிஸ்கட்' கொடுத்து சாப்பிட வைத்துவிட்டுச் சுட்டுக் கொன்றார்கள். இதற்கு என்ன பதில்? சரணடைந்த ஊடகவியலாளரான இசைப்பிரிய அவர்கள் நிர்வாணப்படுத்தப்பட்டு சுட்டுப் படுகொலை செய்யப்பட்டார். இதனை 'சனல் 4' ஆதாரத்துடன்

வெளியிட்டிருந்தது. இதற்கு என்ன பதில்? நாங்கள் இந்த நாட்டில் பாதிக்கப்பட்ட ஓர் இனம்; வடக்கிலும் கிழக்கிலும் 90,000க்கும் மேற்பட்ட யுத்த விதவைகளைக் கொண்டிருக் கின்ற தமிழ்த் தேசிய இனம்! இந்தத் தமிழ்த் தேசிய இனத்தின் ஆதங்கங்களுக்கு, தமிழ் சகோதரிகளின் ஏக்கங்களுக்கு இந்த நாடு என்ன பதில் சொல்லப் போகிறது? எமது நாடு உலகத்தில் முதலாவது பெண் பிரதமரைக் கொண்ட நாடு, பெண் சனாதிபதியைக் கொண்ட நாடென நாங்கள் சொல்லிக் கொள்கின்றோம். இங்கே ஒரு பெண் அமைச்சர் இருக்கிறார். கடந்த காலங்களில் நடந்தவற்றுக்கு நீங்கள் பொறுப்பில்லை என்று சொல்ல முடியாது. ஏனென்றால், -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ஒரு நிமிடம் தாருங்கள்!

கடந்த காலங்களில் நடந்த பல குற்றங்களை இப்போது நீங்கள் கண்டுபிடிக்கிறீர்கள். அதற்கெதிராக நடவடிக்கை யெடுக்க முயற்சிக்கிறீர்கள். அதேபோல், தமிழ் மக்களுக்கு இழைக்கப்பட்ட அநீதிகளுக்கும் குற்றங்களுக்கும் நீதியைப் பெற்றுத் தர வேண்டும். அதுதான் எங்களுடைய மக்களுடைய கோரிக்கையும் ஆகும். நாங்கள் இந்த உயரிய சபையில் பல தடவை கேட்டிருக்கிறோம்; இப்போதும் கேட்கிறோம். காணாமல் ஆக்கப்பட்டவர்களுடைய குடும்பத்தினருக்கு நீதியைப் பெற்றுக் கொடுங்கள்! இன்றும் தங்களுடைய பொட்டை அழிக்காமலும் தாலியைக் கழற்றாமலும் இருக்கின்ற சகோதரிகளின் சார்பில் நான் இந்த உயரிய சபையில் இந்தக் கோரிக்கையை முன்வைக்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ වැඩකටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් අමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.31]

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான சர்வதேச மகளிர் தினத்தை முன்னிட்டு, "தேசிய பொருளாதாரத்திற்கான பெண்களின் ஊழியப் பங்களிப்பினை மதிப்பீடு செய்து, சம்பளமற்ற பராமரிப்பு ஊழியத்தைத் தேசிய பொருளாதாரத்துடன் இணைப்பதற்காகத் தேசிய பராமரிப்புக் கொள்கை ஒன்றைத் தயாரித்தல்" பற்றி மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ அவர்களால் இன்று அவையில் ஒத்திவைப்புப் பிரேரணையொன்று முன்வைக்கப்பட்டிருக்கின்றது. இந்த விவாதத்தில் நாங்கள் இனங்கண்டிருக்கின்ற சில விடயங்களைப் பற்றி பேசுமுன், இன்று முக்கியமாக இங்கு பேசப்படுகின்ற சர்வதேச மகளிர் தினத்தைப் பற்றி நான் ஆரம்பத்தில் சற்றுக் கூற விரும்புகின்றேன்.

சர்வதேச மகளிர் தினம் பெண்களின் போராட்டங்களால் உருவானது. அது பெண்களின் போராட்டங்களால் வரைவிலக்கணப்படுத்தப்பட்டுள்ளது. உலகம் முழுவதும் பெண்கள் போராடிக் கொண்டேயிருக்கிறார்கள். உலகப் போர்களுக்கு எதிராகப் பெண்கள் போராடினார்கள்; இன்னும் போராடிக் கொண்டேயிருக்கிறார்கள். எமது சமகாலத்தில் சிரியா, பலஸ்தீன், உக்ரைன், ஈரான் யுத்தங்களை நாம் கண்டோம்; இன்னும் கண்டுகொண்டிருக்கின்றோம். யுத்தங்கள் கொடியவை என்பதைப் பற்றி எந்தவொரு சந்தேகமும் கிடையாது. வெறுமனே சிதறடிக்க வேண்டிய இலக்குகளை மாத்திரம்தான் யுத்தம் அறியும். போர் என்பது நாடுகளின் எல்லைகளில் மட்டும் இடம்பெறுவதல்ல. பெண்களின் உடலிலும் சிறுவர்களின் எதிர்காலத்தின்மீதுமே இந்த யுத்தங்கள் இடம்பெறுகின்றன. பெண்களின் உடல்களை யுத்தக் களங்களாகப் பயன்படுத்துகின்றார்கள். ஐ.நா. சபையின் அறிக்கையின்படி, காஸா பள்ளத்தாக்குப் பகுதியில் கொல்லப்பட்டவர்களில் 70 சதவீதமானவர்கள் பெண்களும் சிறுவர்களுமே என்பதை நாங்கள் கடந்த காலத்தில் பார்த்தோம்.

போர்கள் இராணுவ வீரர்களை மட்டும் கொல்வதில்லை; அது ஒரு தலைமுறையினை அழிக்கின்றது. ஆழ்ந்த மன வடுக்களையும் இழப்புகளையும் மட்டுமே போர்கள் பரிசளிக்கின்றன. அவை மக்களின் வாழ்நாள் உழைப்பையும் சேமிப்புகளையும் அழித்து, மக்களை நிர்மூலமாக்குகின்ற தன்மையுடையன என்பதை நாங்கள் அனைவருமே அறிந்திருக்கின்றோம். மக்களை அவர்களது நாட்டின் எல்லைக்குள்ளேயே அகதிகளாக மாற்றுகின்றது, இந்த யுத்தங்கள் - போர்கள்! இது இலங்கையில் 30 வருட காலமாக, அதேபோல் உலகத்தில் நாடு நாடாக நாங்கள் கண்டறிந்த உண்மை! இதை மீண்டும் மீண்டும் கவலையுடன் இந்த வேளையிலும் நினைவுகூருகின்றோம். ஏனென்றால், இப்போது நிகழ்கின்ற யுத்தத்தின் காரணத்தால் Gulf பிரதேசத்தில் பாதிப்புக்குள்ளாகியிருக்கின்ற பெண்களைப் பற்றியும் இலங்கையிலிருந்து பணிப்பெண்களாக வேலைக்குச் சென்று அங்கே அவஸ்தைகளுக்கு முகங்கொடுக்கின்ற பெண்களைப் பற்றியும் மிகவும் வருத்தத்துடன் நாங்கள் இவ்வேளையில் நினைவுகூர வேண்டியிருக்கின்றது. அவர்களுக்கு எங்களுடைய சமாதானத்தின் கைகளை நீட்டுவதற்கு எப்போதும் தயாராக இருக்கின்றோம். அதேபோலதான் அங்கே பணியாற்றுபவர்களுடைய இலங்கையிலுள்ள குடும்பங்களுக்கு ஆதரவு தெரிவிக்கவும், தேவையான அனைத்து வசதிகளையும் அவர்களுக்கும் அவர்களது குடும்பத்தினருக்கும் வழங்கவும், உடனடியாக இலங்கைக்கு வருவதற்குத் தேவைப்படுகின்றபோது அவர்களை வரவழைத்துக் கொள்வதற்கான அனைத்து நடவடிக்கைகளையும் மேற்கொள்ளவும் அரசாங்கம் என்ற வகையில் நாங்கள் தயாராக இருக்கின்றோம் என்பதையும் நான் கூற விரும்புகின்றேன்.

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

பெண்களின் இந்தத் தொடர்ச்சியான போராட்டத்தின் போது, ஆரம்ப காலத்தில் தங்களுடைய உரிமைகளுக்காகப் போராடிய நிலையிலிருந்து இப்போது அவர்கள் "personal is political" என்ற சுலோகத்துடன் தங்களுடைய தனிப்பட்ட தேவைகளுக்காக, தனிப்பட்ட உரிமைகளைத் தேடிக்கூட போராடுகின்ற சந்தர்ப்பத்திற்குத் தள்ளப்பட்டிருக்கிறார்கள். ஆகவேதான், இப்போது பொருளாதாரத்தில் சமமான தன்மை, சட்டத்தின் முன் அவர்களுக்கான மதிப்பு மற்றும் அவர்களுக்கான சம உரிமைகளைப் பெற்றுக்கொள்ள வேண்டிய கட்டாயத்தில் அவர்கள் இருக்கின்றார்கள்.

நாங்கள் இன்று முன்வைத்திருக்கின்ற இந்த ஒத்திவைப்புப் பிரேரணைக்கு இணங்க, பெண்களுடைய பராமரிப்பு ஊழியத்தைத் தேசிய பொருளாதாரத்துடன் இணைப்பதற்காக நாங்கள் என்னென்ன வசதிகளை வழங்கி இருக்கின்றோம் என்று பார்க்கும்போது, சட்டம் ஒன்றின் மூலமாகப் பெண்களுக்காகவே ஓர் ஆணைக்குழுவை நியமித்திருக்கின்றோம். பெண்கள் தொடர்பான இந்த ஆணைக்குழுவானது, மகளிருடைய பிரச்சினைகளைத் தீர்க்கக்கூடியதாக சட்ட அமுலாக்கத்தைப் பற்றியும், இந்த நாட்டில் அவர்கள் தமக்கான உரிமைகளைப் பெறுதல் தொடர்பிலும் முழுமையான அர்ப்பணிப்புடன் செயற்படுகின்ற ஓர் அமைப்பாக இருக்கின்றது. 'பெண்களின் வலுவூட்டல்' எனும் சட்டத்தின்கீழ், பெண்களின் உரிமைகள் தொடர்பில் உருவாக்கப்பட்ட இந்த ஆணைக்குழு இந்த நாட்டில் அவர்களுடைய எதிர்காலத்தைச் சிறந்த முறையில் நடைமுறைப்படுத்தும் என்பதை முழுமையாக நாங்கள் நம்புகின்றோம்.

அதுதவிர, இதற்கு முன்னர் தயாரிக்கப்பட்ட 2005ஆம் ஆண்டின் 34ஆம் இலக்க குடும்ப வன்முறைத் தடுப்புச் சட்டத்தில் அடையாளம் காணப்பட்டுள்ள பல குறைபாடுகளையும் நிவர்த்தி செய்யும் நோக்கில் புதியதொரு சட்டமூலத்தைக் கொண்டுவருவதனூடாக, வீட்டு வன்முறைகளுக்கு எதிரான சட்டத்தை அமுல்படுத்துவதற்கான நடவடிக்கைகளை நாங்கள் மேற்கொண்டிருக்கின்றோம். 1954ஆம் ஆண்டில் கொண்டுவரப்பட்ட கடை, அலுவலக ஊழியர் (ஊழியத்தையும் வேதனத்தையும் ஒழுங்குபடுத்தல்) சட்டமானது, பெண்கள் மாலை ஆறு மணிக்குப் பிறகு வேலைத்தலங்களில் பணியில் ஈடுபடுவதைத் தடுக்கும் ஒரு சட்டமாக இருந்து வந்திருக்கின்றது. 2024ஆம் ஆண்டில் இந்தச் சட்டம் திருத்தப்பட்டு, பெண்கள் தொழில் வாய்ப்புகளைப் பெறுவதற்கான தடை நீக்கப்பட்டுள்ளது. அதன் நிமித்தம் இப்போது பெண்கள் மேலதிகமாக இரவு நேரத்திலும் வேலைக்குப் போவதற்கான வழிகாட்டல் நடந்துகொண்டிருக்கின்றது.

2023ஆம் ஆண்டின் ஊழல் எதிர்ப்புச் சட்டத்தில், "பாலியல் ரீதியான இலஞ்சமும் இலஞ்சத்தின் வகைகளில் ஒன்று" என அங்கீகரிக்கப்பட்டுள்ளதன்மூலம், இலங்கையில் வாழ்கின்ற பெண்கள் - அவர்கள் பணிபுரிகின்ற வேலைத்தலங்களிலாக இருக்கலாம், அவர்கள் பணிபுரிகின்ற ஏனைய இடங்களிலாக இருக்கலாம், கல்வி பெறுகின்ற இடங்களிலாக இருக்கலாம் - பாலியல் ரீதியாகச் சுரண்டப்படுவதில் இருந்து தவிர்ப்பதற்கான சட்டமாக அதையும் நாங்கள் பயன்படுத்திக் கொள்ளலாம்.

அதேபோல, இலங்கையில் நுண் கடன் வசதிகளைப் பெற்றுக்கொண்டு அசௌகரியங்களுக்கு முகங்கொடுக்கின்ற பெண்களுக்கு அனைத்துத் துறைகளின் ஊடாகவும் பாதுகாப்பு வழங்குவதற்காக நேற்றைய தினம் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்ட நுண்நிதி மற்றும் கடன் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டமூலத்தினூடாக நாங்கள் நடவடிக்கைகளை மேற்கொண்டிருக்கின்றோம். அது மட்டுமல்லாமல், இலங்கையில் பல்வகையான பொருளாதார நெருக்கடியின்கீழ், குறைந்த வருமானம் பெறுகின்ற பெண்கள் மற்றும் பெண் தலைமைத்துவக் குடும்பங்களாக இருக்கின்ற பெண்கள் என அனைவரையுமே கிராம உத்தியோகத்தர் பிரிவு வாரியாக ஒன்றிணைத்து, மகளிர் செயற்பாட்டுச் சங்கங்கள் ஊடாக அவர்களை வலுப்படுத்துவதற்காக நிதி உதவிகளை வழங்குவதற்கு மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சினூடாக நாங்கள் நடவடிக்கைகளை மேற்கொண்டிருக்கின்றோம். இலங்கையில் ஒட்டுமொத்த பிரதேசங்களிலுமே இவ்வாறாக மகளிர் செயற்பாட்டுச் சங்கங்கள் இருக்கின்றன. அதனூடாகக் கடன் வசதிகளை வழங்குதல், அவர்களுடைய உற்பத்திப் பொருட்களுக்குச் சந்தை வாய்ப்பினைப் பெற்றுக்கொடுத்தல், ஆலோசனை வழங்குதல், கைத்தொழில் ஊக்குவிப்பு வழங்குதல், களஞ்சியப்படுத்தல் மற்றும் பராமரிப்பு வேலைகளில் அவர்களை ஈடுபடுத்தல் போன்ற அனைத்துக்குமே நாங்கள் வழிவகுத்து இருக்கின்றோம்.

அதேபோன்று, வீடுகளில் இருக்கின்றவர்களுக்குக் குழந்தைப் பராமரிப்பு, முதியோர் பராமரிப்புப் போன்ற விடயங்கள் தொடர்பில் வழிகாட்டல்களை வழங்கி, அவர்களைப் பயிற்றுவிக்கப்பட்ட ஊழியர்களாகச் சமூக மயப்படுத்துவதற்கான அனைத்து நடவடிக்கைகளையும் நாங்கள் மேற்கொண்டிருக்கின்றோம். எனவே, இன்று நாங்கள் இங்கே முன்வைத்திருக்கின்ற பிரேரணையின் ஊடாக, எங்களுடைய பெண்களின் பராமரிப்பு ஊழியம் என்பதைச் சமூக ஊழியமாக மட்டுமல்லாமல், பொருளாதார ரீதியாகவும் மனித வளத்தை அபிவிருத்தி செய்கின்ற வகையிலும் ஏற்றுக்கொண்டு செயற்பட நாங்கள் தயாராக இருக்கின்றோம் என்பதை இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන්, ගෘහ සුරැකුම් ආර්ථිකය අපේ ආර්ථිකයට, ජාතික ආර්ථිකයට එකතු කර ගැනීම සඳහා අපේ ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය විසින් අද සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද යෝජනාව අපි අගය කරනවා. අපේ දීර්ඝ කාලීන සටනක, දීර්ඝ කාලීන ඉල්ලා සිටීමක ප්‍රතිඵලයක් හැටියට තමයි අපි අද මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඇත්තටම මෙවර ජාත්‍යන්තර කාන්තා දිනයේ තේමාව හැටියට ඉදිරිපත් කරලා තිබෙන්නේ, "සියලු කාන්තාවන් සහ ගැහැනු ළමයින් සඳහා අයිතිවාසිකම්, යුක්තිය සහ ක්‍රියාකාරිත්වය" යන්නයි. එතැනදී අපි ඇත්තටම ජාත්‍යන්තර තේමාවට සමගාමීව ලංකාවේ තේමාව හැටියට "පොහොසත් රටක අභිමන - ඇය වේ දැයක පෙරමඟ" යන්න ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ජාත්‍යන්තර තේමාවට අදාළවම අපේ අමාත්‍යාංශය වශයෙන් අපි ඒ තේමාව ඉදිරිපත් කරලා තිබෙනවා වාගේම, "ඇය නැඟිටින විට නැඟිටිනවා රට" යන්න පිළිබඳවත් මෙවර කථා කරනවා. සවිමත්ව නැඟිටින ගැහැනියක් තුළින් තමයි රටක් සවිමත්ව නැඟිටින්නේ කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම මෙවර තේමාවට අමතර සංකල්පයක් හැටියට මම ඉදිරිපත් කරන්න, සමාජගත කරන්න කැමැති කාරණාවකුත් තිබෙනවා. ඒ තමයි "කාන්තාවෝද මනුෂ්‍යයෝය" කියන එක. "பெண்களும் மனிதர்களே" - "Women are also human beings" කියන සංකල්පය පෙරදැරිව සියලු ගැහැනුන් දිහා බලන්න කියන ඉල්ලීම විතරයි අපට කරන්න තිබෙන්නේ. "සියලු

ගැහැනුන්ද මනුෂ්‍යයෝය" ඒ අයද මිනිසුන් හැටියට පිළිගන්නවා නම්, මිනිසුන් හැටියට අපි එකිනෙකාට ගරු කරනවා නම් ඒ හැර අන් යමක් නැහැ.

ඒ වාගේම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ වෙනකොට ලංකාවේ කාන්තාවන්ට එරෙහිව, ගැහැනුන්ට එරෙහිව ගැහැනුන් සංවිධානය කිරීමේ දේශපාලන වුවමනාවක් තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, ලෝකයේ විතරක් නොවෙයි, ලංකාවේත් ඕනෑම තැනක ගැහැනුන් අවදි වෙනවා නම්, දේශපාලන සවිඥානික බව ලබනවා නම්, ක්‍රියාකාරිත්වයෙන් ඉදිරියට එනවා නම්, සමාජ භාවිතාව තුළ ඔවුන් ඒ අවස්ථා ප්‍රයෝජනයට ගන්නවා නම්, නායකත්ව අවස්ථා උපයෝගි කර ගන්නවා නම්, අපට එදිරිව වුවද කවර තත්ත්වයක, කවර දේශපාලනයක යෙදී සටන් කිරීමට පෙරමුණ ගන්නවා නම් අපි ඔවුන් සමඟ එකඟ වෙන බව. මොකද, අපට ඔවුන් එක්ක සටනක් නැහැ. ඇත්තටම කියනවා නම්, ගැහැනුන් අතර වන මේ දේශපාලන අරගළය, කාන්තාවන්ගේ දේශපාලන අරගළය තිබෙන්නේ ම සංකල්පීය වශයෙන්, න්‍යායාත්මක වශයෙන් හා ව්‍යූහාත්මක වශයෙන්, කාන්තාවන් සවිබලගන්වලා ඔවුන් සමාජ ක්‍රියාකාරිත්වයට ගෙන ඒම සඳහා මිස, පුද්ගල බද්ධ අරගළයක් හැටියට, ගැටුමක් හැටියට නොවෙයි කියන එක අපි මේ වෙලාවේ කියනවා. උදාහරණයක් හැටියට කියනවා නම්, විශේෂයෙන්ම කාන්තා කොමිසම ඉලක්ක කර ගනිමින් නොයෙක් කථා කියනවා. අපේ විපක්ෂ නායකතුමාත් ඉස්සර වෙලා කිව්වා, කාන්තා කොමිසම අමාත්‍යාංශයට යට කරන්නට උත්සාහ කරනවා කියලා. ඒ කථාව ඇතුළේ තිබෙන්නේම, බල අරගළයක වුවමනාවයි. කොමිසමද, අමාත්‍යාංශයද කියන ගැටුම සමාජගත කිරීමේ වුවමනාවයි. ඒක කුමන්ත්‍රණයක්. ඒ කුමන්ත්‍රණය පිටුපස හුදෙකලා වූ බලවේග, ඒ වාගේම පරාජිත වූ දේශපාලන වුවමනාව තිබෙනවා. හැබැයි, ඒ කුමන්ත්‍රණවලට පිළිතුරු දීම කිසි විටෙක අපට අවශ්‍ය වන්නේ නැහැ, පිළිතුරු දීමට අපි ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ කුමන්ත්‍රණ අපි හොඳින් හඳුනනවා.

අපි අවංකවම දන්නවා, මේ කාන්තා දේශපාලනය ඇතුළේ කාන්තා කොමිසම ස්ථාපිත කිරීම කොයි තරම් අවශ්‍යතාවක්ද, රටේ දැවෙන ප්‍රශ්න පිළිබඳව කාන්තා කොමිසමක භාවිතාව, අවශ්‍යතාව කොයි තරම්ද කියලා. නීති ප්‍රතිසංස්කරණ ගෙන එන්න, තීරණ තීන්දු ගැනීමට, කාන්තාවන් සවිබලගැන්වීම සඳහා මඟ පෙන්වීමට කාන්තා කොමිසම ඉක්මනින්ම ක්‍රියාකාරී විය යුතුයි. මේ සමාජයේ වගකීමට, ඒ පංගුවට කාන්තාවන් උර දිය යුතුයි කියන එක අපි තදින්ම විශ්වාස කරනවා. ඒ නිසාම මේ ගමන් මාර්ගයේදී අපි ඇත්තටම ස්ත්‍රීවාදී දෘෂ්ටි කෝණයකින් බලා බහුමාන දරිද්‍රතාව, ප්‍රචණ්ඩත්වය, කාලීන දරිද්‍රතාව සහ පහත්කොට සැලකීම අවම කිරීම සඳහා ආර්ථික වශයෙන් ගැහැනුන් ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුයි. අපි, කාන්තාව නිවස තුළ වගුරන වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමය ජාතික ආර්ථිකයේ පදනම ලෙස ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගන්නා දේශපාලන ව්‍යාපාරයක් බව මා කියනවා.

එම නව ගමන් මඟෙහි ප්‍රධානම උපාය මාර්ගය වන්නේ කාන්තාවගේ ආර්ථික ස්ථාවරත්වය සහ ස්වාධීනත්වය තහවුරු කිරීමයි. ඒ සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලෙන් කාන්තාවන් මුදා ගැනීම, "ලිය ශක්ති" වැනි වෙළඳපොළ අවස්ථා සකස් කිරීම, මාර්ගගත වෙළඳපොළ සංකල්පය හඳුන්වා දීම, කාන්තාවන්ගේ ඩිජිටල් ආර්ථික සාක්ෂරතාව ඉහළ නැංවීම කියන වැඩසටහන් හරහා ඩිජිටල් සාක්ෂරතාවෙන් යුතු සුහුරු ව්‍යවසායිකාවක බිහි කිරීම සහ ඒවාට සහනදායි ප්‍රාග්ධන පහසුකම් සැලසීම අපේ අමාත්‍යාංශයේ අරමුණු හැටියට තිබෙනවා. ඒ වාගේම සෑම ගැහැනු ළමයෙකුටම සහ කාන්තාවකටම අවශ්‍ය ඕනෑම ක්ෂේත්‍රයක නායකත්වය දැරිය හැකි ලෙස බියෙන් තොර පරිසරයක් සකස් කරමින්, ඔවුන්ගේ අභිමානය සහතික කරමින්, රටේ සැබෑ ආර්ථික සශ්‍රීකත්වය කරා "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වෙනුවෙන් ඇය පෙරට ගෙන ඒම අපේ අරමුණයි.

ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙස අප සියලුදෙනා ස්ත්‍රීත්වය පිළිබඳ දැරිය යුතු උදාර දැක්ම නම්, "කාන්තාවෝද මනුෂ්‍යයෝ"ය යන්නයි. කාන්තාවගේ සැබෑ සවිබල ගැන්වීම යනු, ඇයට තම ජීවිතය පිළිබඳව තීරණ ගැනීමට ඇති ස්වාධීනත්වය සහ එම තේරීම්වලට ගරු කරන සමාජ ව්‍යූහයක් පැවතීමයි. ඇය සවිබලගැන්වූ විට හුදු පුද්ගලයෙක් නොව, මුළු දේශයකම අභිමානය සහ ප්‍රගතිය මෙහෙයවන ජීව ශක්තිය බවට පත්වන බව අපි තදින් විශ්වාස කරනවා. අන්න එවන් රටක් වෙනුවෙන් එකතුවන සියලු කාන්තාවන්ට අපි සුබ ප්‍රාර්ථනා කරනවා. මේ එළැඹෙන මාර්තු 08 කාන්තා දිනයේදී, ලෝකයේ සෑම තැනම සිටින කාන්තාවන් එක්ක -විශේෂයෙන් යුද්ධය නිසා පීඩා විඳින, යුද්ධය නිසා අවතැන් වන, මැදපෙරදිග කලාපයේ දුක් විඳින අපේ සියලු කාන්තාවන් එක්ක- අපි එක්සිත්ව එකට අත්වැල් බැඳගෙන ඉන්නවා. මොකද, කවර ආගමකට, ජාතියකට, ප්‍රදේශයකට, දේශ සීමාවකට අයත් වුවත් ජීව විද්‍යාත්මක ගැහැනුන් හැම කෙනෙක්ම මේ පවතින සමාජ හා ආර්ථික තත්ත්වවලින්, යුදමය වාතාවරණයෙන් බැට කනකොට දරුවන් සමඟ අසරණ වනවා. එසේ අසරණ නොවී, ඔවුන් සියලු දෙනාටම සාමයේ අරුණලු උදා වෙන්න, සැනසීම උදා වෙන්න, ඔවුන්ගේ හදවත් තුළ නිවුණු, සැනසුණු ජීවිතයක් වෙනුවෙන් ප්‍රාර්ථනා දල්වා ගන්න මේ කාන්තා දිනයේදී අපි හැමෝම සවිබලගැන්වූ ගැහැනුන් හැටියට නැගිටින්න ඕනෑය කියන විශ්වාසය අපට තිබෙනවා.

මෙවර කාන්තා දිනය වෙනුවෙන් 08වැනි දා විශාල රැලියක් පැවැත්වෙනවා. ඒ වාගේම අමාත්‍යාංශය හැටියට ලංකාවේ කාන්තා ව්‍යවසායිකාවන් 300දෙනෙකුට ව්‍යවසායක පොළක්, ප්‍රදර්ශනයක් පවත්වමින් විවිධ මට්ටමේ ක්‍රියාකාරකම් සඳහා ඉඩ අවස්ථා ලබා දෙමින් සමරන කාන්තා දිනයේදී අපි හැම කෙනාම ප්‍රාර්ථනා කරන්නේ සවිබලගැන්වුණු ගැහැනියක්. සවිබලගැන්වුණු ගැහැනියක් යනු, ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන්, ආකල්පමය වශයෙන් සවිබලගැන්වුණු නිදහස්, නිවහල් ගැහැනියක්. එවන් ගැහැනියකට ලෝකය ඔසවා තබන්න පුළුවන්, රට ඔසවා තබන්න පුළුවන්, පවුල් ඔසවා තබන්න පුළුවන්. ඔබේ, අපේ, හැම අම්මා කෙනෙකුටම, දියණියකටම, සොයුරියකටම, බිරිඳකටම අන්න ඒ ශක්තිය ලබා දීමට ඔබ අප සියලුදෙනාම එකතු වෙමු කියන යෝජනාව මම කරනවා.

ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.47ට, 2026 මාර්තු 06වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.47க்கு, பாராளுமன்றம் 2026 மார்ச் 06, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.47 p.m. until 9.30 a.m. on Friday, 06th March, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1851/2026 දරන ප්‍රශ්නයට පිළිතුර දීමට ආරක්ෂක අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක මහතා සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட, இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1851/2026ஆம் இலக்க வினாவுக்கு விடையளிப்பதற்கு, பாதுகாப்பு அமைச்சர் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Anura Kumara Dissanayake, Minister of Defence, has requested for two weeks' time to reply to Question No. 1851/2026 raised by the Hon. Ajith P. Perera, appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.